325 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 325 - இல. 02
Volume 325 - No. 02

2026 පෙබරවාරි 05වන බ්‍රහස්පතින්දා
2026 பெப்ருவரி 05, வியாழக்கிழமை
Thursday, 05th February, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

කථානායකතුමාගේ සහතිකය [තීරුව 193]

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 193]

2026.01.11 දින "ඉරිදා ලංකාදීප" පුවත් වාර්තාව [තීරුව 194]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 200]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 207-248]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිසංස්කරණ [තීරුව 249]

පුත්තලම - එළුවන්කුලම - මන්නාරම මාර්ගය ගමනාගමනය සඳහා විවෘත කිරීම [තීරුව 251]

**අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අංශවල ගැටලු විසඳීම සඳහා රජයේ වැඩ පිළිවෙළ:**

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 256]

**සියලු සිසුන් සඳහා සමාන අධ්‍යාපන අවස්ථා සැලසීම:**

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 264]

**ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර වෙළෙඳ සාකච්ඡාවල වත්මන් තත්ත්වය:**

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 268]

**වරප්‍රසාද:**

අකුරණ ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විසින් කරන ලද තර්ජනය [තීරුව 274]

**ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 276-380]

**කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරුව 380-382]

**නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරුව 382-383]

**කල් තැබීමේ ප්‍රශ්න** [තීරු 384-394]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

சபாநாயகரது சான்றுரை [ப: 193]

வாடகை (நீக்கல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 193]

2026.01.11ஆம் திகதிய "இரிதா லங்காதீப" செய்தி அறிக்கை [ப: 194]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 200]**

**வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 207-248]**

**தனி அறிவித்தல் மூல வினா:**

இலங்கை மின்சார சபைச் சீர்திருத்தம் [ப: 249]

புத்தளம்-இலவங்குளம்-மன்னார் வீதியைப் பொதுப் போக்குவரத்துக்காகத் திறத்தல் [ப: 251]

**கல்வி மற்றும் உயர் கல்வித் துறைகளிலுள்ள பிரச்சினைகளைத் தீர்ப்பதற்கான அரசாங்கத்தின் முன்முயற்சி:**

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 256]

**சகல மாணவர்களுக்கும் சமமான கற்கை வாய்ப்பளித்தல்:**

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 264]

**இலங்கைக்கும் அமெரிக்காவுக்குமிடையிலான வர்த்தகப் பேச்சுவார்த்தைகளின் தற்போதைய நிலை:**

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 268]

**சிறப்புரிமை:**

அக்குறணை பிரதேச சபையின் உப தவிசாளரால் விடுக்கப்பட்ட அச்சுறுத்தல் [ப: 274]

**இலங்கை நிலையான சொத்து உயர்தொழிலர்கள் நிறுவகம் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 276-380]

**கொள்கல நிலையத் தொழிற்படுத்துநர்களுக்கு உரிமமளித்தல் சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 380-382]

**கப்பற்றொழில் முகவர்களுக்கு, சரக்கு அனுப்புநர்க்கு, கலன் செயற்படுத்தப்படாப் பொதுக் காவுநர்க்கு மற்றும் கொள்கலம் செயற்படுத்துநர்க்கு உரிமமளித்தல் (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 382-383]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 384-394]

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
- Speaker's Certificate [Col. 193]
- Rent (Repeal) Bill: Petition to the Supreme Court [Col. 193]
- News Report in "Irida Lankadeepa" of 11.01.2026 [Col. 194]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 200]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 207-248]

QUESTION BY PRIVATE NOTICE:
- Reforms of Ceylon Electricity Board [Col. 249]
- Opening of Puttalam-Eluvankulam-Mannar Road for Public Transport [Col. 251]

GOVERNMENT INITIATIVE TO RESOLVE ISSUES IN EDUCATION AND HIGHER EDUCATION SECTORS:
- Statement by Prime Minister, Minister of Education, Higher Education and Vocational Education [Col. 256]

ASSURANCE OF EQUAL EDUCATIONAL OPPORTUNITIES FOR ALL STUDENTS:
- Statement by Prime Minister, Minister of Education, Higher Education and Vocational Education [Col. 264]

CURRENT STATUS OF TRADE NEGOTIATIONS BETWEEN SRI LANKA AND THE UNITED STATES:
- Statement by Minister of Trade, Commerce, Food Security and Co-operative Development [Col. 268]

PRIVILEGE:
- Threat made by Vice Chairman of Akurana Pradeshiya Sabha [Col. 274]

INSTITUTE OF REAL ESTATE PROFESSIONALS, SRI LANKA BILL:
- Read a Second, and the Third time and passed as amended [Cols. 276-380]

LICENSING OF CONTAINER DEPOT OPERATORS BILL:
- Read a Second, and the Third time, and passed as amended [Col. 380-382]

LICENSING OF SHIPPING AGENTS, FREIGHT FORWARDERS, NON-VESSEL OPERATING COMMON CARRIERS AND CONTAINER OPERATORS (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed [Col. 382-383]

ADJOURNMENT QUESTIONS [Cols. 384-394]

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2026 පෙබරවාරි 05වන බ්‍රහස්පතින්දා***
*2026 பெப்ருவரி 05, வியாழக்கிழமை*
*Thursday, 05th February, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 පෙබරවාරි 03 දින "විශ්වවිද්‍යාල (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### வாடகை (நீக்கல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### RENT (REPEAL) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ගෙවල් කුලී (ඉවත් කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.



## III

### 2026.01.11 දින "ඉරිදා ලංකාදීප" පුවත් වාර්තාව
### 2026.01.11ஆம் திகதிய "இரிதா லங்காதீப" செய்தி அறிக்கை
### NEWS REPORT IN "IRIDA LANKADEEPA" OF 11.01.2026

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026.01.11 දින "ඉරිදා ලංකාදීප" පුවත්පතේ, "පාර්ලිමේන්තුවේ 'අයිස් සහ සිගරට්' භාවිත කරන සේවකයන්ට දැඩි ක්‍රියාමාර්ග - කථානායකවරයාගෙන් නියෝගයක්" යන මැයෙන් පළ වූ ප්‍රවෘත්ති වාර්තාවක, 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ අ කොටසේ 7 වැනි වරදට අනුව, පාර්ලිමේන්තුවේ ස්වභාවය පිළිබඳව අපහාසාත්මක ප්‍රකාශයක් අඩංගු වීම හේතුවෙන්, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද සම්බන්ධ වූ එකී කරුණ කෙරෙහි මාගේ අවධානය යොමු වී ඇත.

මෙය පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වන අතර, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 146 යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මෙම කරුණ පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම සඳහා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට මෙයින් යොමු කරනු ලබන බව මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඔබතුමා කිව්වා Rent (Repeal) Bill එක සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් උත්තරයක් ලැබී තිබෙනවාය කියලා. හැබැයි ඒක කියෙව්වේ නැහැ. ඒකට යම් හේතුවක් තිබෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පෙත්සමේ පිටපතක් ලැබී තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

උසාවියට ගිහිල්ලා තිබෙනවා කියලාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔව්. විභාග වුණාට පසුව ඒ පිළිබඳව දැනුම් දෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

හොඳයි, බොහොම ස්තුතියි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the -

(i) Annual Report of the Institute of Policy Studies of Sri Lanka for the year 2024; and

(ii) Annual Report of the Employees' Trust Fund Board for the year 2024.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the -

(i) Order made by the Minister of Finance, Planning and Economic Development under Section 2(3) of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in Gazette Extraordinary No. 2464/14 of 25th November, 2025;

(ii) Order made by the Minister of Finance, Planning and Economic Development under Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in Gazette Extraordinary No. 2465/16 of 04th December, 2025;

(iii) Order made by the Minister of Finance, Planning and Economic Development under Sections 2 and 5 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in Gazette Extraordinary No. 2469/12 of 31st December, 2025; and

(iv) Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235) relating to Import Duties (Gazette Extraordinary No. 2464/15 of 25th November, 2025).

I move that these Orders and the Resolution be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සේවකයින් සම්බන්ධව පුවත් පතක පළ වුණු "අයිස් සහ සිගරැට්" සම්බන්ධ කාරණාවක් ගැන ඔබතුමා නිවේදනයක් නිකුත් කළා. ස්ථාවර නියෝග 118හි තිබෙන්නේ, මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් ඔබතුමා සෑහීමකට පත් වන්නේ නම් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන්න පුළුවන් කියලායි. කාරණය පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. නමුත්, කවුරු හෝ මන්ත්‍රීවරයකු ලවා එම යෝජනාව ඉදිරිපත් කළා නම් හොඳයි කියලා තමයි මම යෝජනා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් Motion එක ඉදිරිපත් කරයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ඒක තමයි මම කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Motion එක ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා එය යොමු කරනවාට වැඩිය, මන්ත්‍රීවරයකු එය ඉදිරිපත් කළා නම් හොඳයි. ඔබතුමාට එය නිවේදනයක් විධියට ඉදිරිපත් කරන්න බැහැ කියන එකයි මම කිව්වේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ලිපි ලේඛනාදිය පිළිගැන්වීම යටතේ, ගරු වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා තේ ශක්ති අරමුදලේ වාර්ෂික වාර්තාව;

(ii) 2019 වර්ෂය සඳහා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ නැඟෙනහිර පළාත් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බලශක්ති අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration) \
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2024 වර්ෂය සඳහා "හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව" හි වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 29(1) යටතේ මගේ වරප්‍රසාද සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනවා.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

මගේ වරප්‍රසාද කඩවීම සම්බන්ධව, මගේ ආරක්ෂාව සම්බන්ධව මම ඔබතුමාගෙන් ලිඛිතව ඉල්ලීමක් කළා. ඒකට තවම පාර්ලිමේන්තුව පැත්තෙන් කමිටුව රැස් කරලා මට අවස්ථාවක් උදා කරලා දුන්නේත් නැහැ. හැබැයි පොලිස්පතිතුමාගෙන් මට එක වරක් ලිපියක් එනවා, "උතුරුමැද පළාත් බුද්ධි තොරතුරු අනුව මට ආරක්ෂාව දීම සුදුසුයි, ඒ සඳහා ඉදිරියේදී කැබිනට් අනුමැතිය මත ක්‍රියාත්මක වීමට හැකියි" කියලා. එදා පාර්ලිමේන්තුවේදී ඒ කරුණ මතු කළාට පස්සේ නැවත පොලිස්පතිතුමා මට ලියුමක් එවනවා, "ආරක්ෂාව ලබා දීමට නොහැක" කියලා. මේ දෙක ඉතාම පරස්පරයි. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මගේ වරප්‍රසාද කඩවීම පිළිබඳව පාර්ලිමේන්තුවට දීපු යෝජනාවට අවශ්‍ය කටයුතු සකස් කර දීලා, ඒ සඳහා කැඳවීමක් කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි කරන්නේ අදාළ recommendation එක පොලිස්පතිතුමාට යවන එක, ඊට පස්සේ ඒ වාර්තාව ලැබුණු පසු ඒ අනුව තමයි වැඩ කටයුතු කරන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 29(1) සහ (2) යටතේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ වරප්‍රසාද කාරණය ගැන කියන්න මට පොඩි අවස්ථාවක් දෙන්න කියලා.

ඒ ගරු මන්ත්‍රීතුමාට threat එකක් තිබෙනවා කියලා පොලිස්පතිවරයා ලිපියක් එවලා තිබුණා. *[බාධා කිරීමක්]* අපටත් - සමස්ත පාර්ලිමේන්තුවටම - මේ පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, තර්ජනය තිබෙනවා කියන එක වාර්තා කරලා තිබෙනවා. හැබැයි, ඒ ආරක්ෂාව අපට ඕනෑ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ඉතිහාසයේ ඉඳලා කථානායකතුමාට තමයි මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව වගකීම තිබෙන්නේ, පොලිස්පතිට නොවෙයි. ඔබතුමා කථානායකවරයා හැටියට නියෝග කරන්න ඕනෑ, මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව රකින්න. ඒක අපට පෙනෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අදාළ නියෝගය විධියට තමයි කටයුතු කරලා තිබෙන්නේ.

අපි නැවත ලිපිලේඛනාදිය පිළිගැන්වීමට යොමු වෙමු. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා පුනරුත්ථාපන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ටවර් හෝල් රඟහල පදනමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා හින්දු සංස්කෘතික අරමුදලේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2018 සහ 2020 වර්ෂ සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා;

(ii) 2015, 2016, 2017, 2018, 2019, 2020, 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා ඉඩම් මැනුම් සභාවේ වාර්ෂික වාර්තා;

(iii) 2022 සහ 2023 වර්ෂ සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තා;

(iv) 2023 සහ 2024 වර්ෂ සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා;

(v) 2023 සහ 2024 වර්ෂ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(vi) 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(vii) 2024 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ කෘෂිකර්ම, පශු සම්පත් අංශ සහ පෙර පැවති වැවිලි කර්මාන්ත අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(viii) 2023 වර්ෂය සඳහා කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයෙකුගේ ආරක්ෂාව සම්බන්ධව වරප්‍රසාද ප්‍රශ්නයක් ඔබතුමාට ඉදිරිපත් කළාම ඔබතුමාගේ කාර්යය ඒක පොලිස්පතිට දන්වන එක නොවෙයි. ඒක ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන එකයි ඔබතුමා කළ යුත්තේ. පොලිස්පතිව ගෙන්වන්න ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට. එතුමා වාර්තා දෙකක් මෙතුමා සම්බන්ධව දීලා තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්. මන්ත්‍රීවරයෙකුගේ ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධයෙන් පොලිස්පතිතුමා,-

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
එක් වාර්තාවක තිබෙනවා, threat එකක් තිබෙනවා, මේ නිවසට ආරක්ෂාව ලබා දීම සුදුසුයි කියලා වාගේ. ඒ අනුව අනුරාධපුර පොලීසියටත් දැනුම් දීලා තිබෙනවා, හතරදෙනෙක් මගේ නිවසේ ආරක්ෂාවට යොදවන්න කියලා. ඊට පසුව නැවත වාර්තාවක් එවා තිබෙනවා, threat එකක් නැහැ, ඒක පක්ෂයේ අභ්‍යන්තර කටයුත්තක් කියලා. ඊට පස්සේ ආයෙත් වාර්තාවක් එවලා, කලින් කිව්ව එකත් නතර කරන්න කියලා පොලීසියට දැනුම් දීලා තිබෙනවා. පොලීසියෙන් ඇවිල්ලා පොතක් දාලා ගිහින් තිබෙනවා. දවස් දෙකක් ඒ පොතේ අත්සන් කර තිබෙනවා, හවසට ඇවිල්ලා කිහිප අවස්ථාවක් මුර සංචාර පොතේ අත්සන් කරනවා කියලා. පොත තිබෙනවා, නිවස ඉස්සරහ එල්ලලා. දවස් දෙකක් ඒ පොතේ අත්සන් කර තිබෙනවා. එච්චරයි. එතකොට මේකද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සම්බන්ධයෙන් තිබෙන ආරක්ෂාව? එක සැරයකට threat එකක් තිබෙනවා කියන්නයි, තව සැරයකට threat එකක් නැහැ කියන්නයි ආදී වශයෙන් සැරින් සැරේට මේක වෙනස් වෙන්න පුළුවන්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නය සම්බන්ධයෙන් අවසාන පිළිතුරක් ලබා දීලා, ඒ ප්‍රශ්නය අවසන් කරන්න. මොකද, ඔය කාරණය සම්බන්ධයෙන් එතුමා දවස් ගණනක් කරුණු මතු කළා. පොලිස්පතිට බලයක් නැහැ, ඒක ගැන තීන්දුවක් ගන්න. ඒ තීන්දුව ගන්න ඕනෑ ඔබතුමා. ඔබතුමායි අපේ නායකයා. ඔබතුමාත් එක්ක මොන ප්‍රශ්න තිබුණත් ඒක තමයි වැදගත් වෙන්නේ. මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔබතුමා වගකීම භාර ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිස්පතිතුමාගේ නිර්දේශය මත තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒක රාජ්‍ය ප්‍රතිපත්තිය.

කාරක සභා වාර්තා පිළිගැන්වීම යටතේ, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

වාර්තාව 1

ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත

වාර්තාව 2

(i) කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත; සහ

(ii) නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තා මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු කථානායකතුමනි, දොම්පේ, මැදලන්ද, අංක 367/1 යන ලිපිනයෙහි පදිංචි ජේ.පී. සරසි තරංගා ජයසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායකවරයා හැටියට මටත් වගකීමක් තිබෙනවා. විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් ඔබතුමාට ඉදිරිපත් කළාට පස්සේ එය දිගින් දිගටම කල් යැවීමේ තත්ත්වයක් තිබෙන මොහොතක, නිශ්චිතව රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාට ලබා දිය යුතු ආරක්ෂාව, "මෙය මෙසේ සිදුවිය යුතුයි" කියන කාරණාව ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුළ මොකක්ද එතුමාට අත්පත් වන ඉරණම? මේ අවස්ථාවේදී මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර අනුරාධපුර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ප්‍රමුඛ ආරක්ෂක අංශ ඉදිරිපත් කර තිබෙන වාර්තාවට අනුව එතුමාට ඒ ආරක්ෂාව ලබා දෙන්න කියලා. දැන් මේක වෙනත් අතකට හරවන්න හදනවා, මේක පක්ෂයේ අභ්‍යන්තරව තිබෙන ගැටලුවක් කියලා. එහෙම කිසිම ගැටලුවක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කරුණාකර මට කථා කරන්න අවස්ථාව දෙන්න, ගරු කථානායකතුමනි. රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාත් එක්ක එහෙම කිසිම අභ්‍යන්තර ගැටලුවක් නැහැ. එතුමාට ලබා දිය යුතු ආරක්ෂාව අනිවාර්යයෙන්ම මේ මොහොතේ සිට ලබා දෙන්නට ඔබතුමා නියෝග කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ ඉල්ලීමක් සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා මතු කරපු අදහස අපි සැලකිල්ලට ගන්නවා. මීට කලිනුත් විපක්ෂයේ මන්ත්‍රීවරු තමන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළාම පොලිස් වාර්තාවක් අරගෙන අවශ්‍ය අයට ආරක්ෂාව ලබා දීලා තිබෙනවා. පොදුවේ ඔක්කෝටම ආරක්ෂාව ලබා දෙන්න ඕනෑ කියන ස්ථාවරයක රජය නැහැ. ආරක්ෂාව අවශ්‍ය අයට පොලිස් වාර්තා මත පදනම් වෙලා තමයි පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඒ තීන්දුව ආරක්ෂක අමාත්‍යාංශයට යොමු කරන්නේ. දැන් එතුමාම කියනවා නම්, පක්ෂ අභ්‍යන්තරයේ ප්‍රශ්නයක් නිසා එතුමාට ආරක්ෂාව පිළිබඳ තර්ජනයක් තිබෙනවා කියලා,- *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. ඒ කියන්නේ, කලින් වාර්තාව ඉදිරිපත් කරපු පොලීසියම තමයි මේ වාර්තාව ඉදිරිපත් කරන්නේත්. *[බාධා කිරීම්]* මේ වාර්තාව ඉදිරිපත් කරන්නේත් කලින් වාර්තාව ඉදිරිපත් කරපු පොලීසියම තමයි. ගරු මන්ත්‍රීතුමා, කලින් ඔබතුමාට ආරක්ෂාව සම්බන්ධයෙන් තර්ජනයක් තිබෙනවා කියලා ඔබතුමා කියන වාර්තාව ඉදිරිපත් කරපු පොලීසියම තමයි දෙවැනි වාර්තාවත් ඉදිරිපත් කරන්න ඇත්තේ. *[බාධා කිරීම්]* ඒ නිසා දෙවැනි වාර්තාව ගැන සැලකිලිමත් වෙන්නට ඕනෑ. *[බාධා කිරීම්]* එහෙම නම් විශේෂයෙන් අපි පොලිස් දෙපාර්තමේන්තුවට, මහජන ආරක්ෂක අමාත්‍යතුමාට කියනවා, ඒ ගැන සැලකිලිමත් වෙන්න කියලා. කොහෙන් තර්ජනයක් ආවත් ආරක්ෂාව ලබා දෙන්න කථානායකතුමාට මැදිහත් වෙන්න පුළුවන්.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
දැන් මේක වැරදි තැනකට ගෙනියන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, කිසිම මොහොතක රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා කියලා නැහැ, එතුමාට පක්ෂ අභ්‍යන්තරයේ තිබෙන තර්ජනයක් පිළිබඳව. පොලීසිය ඉස්සෙල්ලා ආරක්ෂක ප්‍රශ්නයක් තිබෙනවා කියලා ඒක ප්‍රසිද්ධියට පත් වුණාට පස්සේ මේක වෙනත් වාර්තාවක් හරහා වෙනතකට හරවන්න උත්සාහ කරනවා. කරුණාකරලා එතුමාට ආරක්ෂාව ලබා දෙන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මමත් පොලිස්පතිතුමාට කලින් ලියුමක් යැව්වා. *[බාධා කිරීමක්]* විනාඩියක් ඉන්න. කථානායකවරයා හැටියට ඔබතුමාට තමයි වගකීම තිබෙන්නේ, පොලිස්පතිගේ නිර්දේශ පිළිබඳව. පොලිස්පතිතුමා මොකක්ද කියන්නේ? රජය ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා ලු, දෙන්නේ නැහැ කියලා. රජය ඒ ප්‍රතිපත්තිමය තීරණය කැඩුවා නම් දෙන්නම් ලු. එතකොට, මෙතැන දේශපාලන තීන්දුවක් නේ තිබෙන්නේ. ඔබතුමා මැදිහත්වීමක් කරන්නේ නැද්ද මේකට? ගරු කථානායකතුමනි, ඔබතුමාගේ මැදිහත්වීම දෙන්න ඕනෑ. මහ හරින්න එපා, ලිස්සන්න එපා. කරුණාකරලා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීමක්]* ඔබතුමාට අවස්ථාව ලබා දුන්නා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ජගත් විතාන මන්ත්‍රීතුමාට මෙහෙම ප්‍රශ්නයක් ඇවිල්ලා පොලිස් වාර්තාවක් ලැබුණයි කියලා කිව්වාට පස්සේ ඔබතුමාට මතක ඇති, අපි ඒ සම්බන්ධයෙන් ආරක්ෂාව ලබා දුන්නා. ඒ ලබා දුන්නෙත් පොලිස් වාර්තාවක් මත පදනම් වෙලා. ඒ පොලිස් වාර්තාව හරියන්නයි,-

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මේකත් පොලිස් වාර්තාවේ තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
කොයි එකද පොලිස් වාර්තාවේ තිබෙන්නේ? ඔබතුමන්ලාගේම පක්ෂයේ තර්ජනයක් තිබෙනවා කියන එකද?

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
තර්ජනයක් තිබෙනවා,- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒක තමයි. *[බාධා කිරීම්]* පොලිස් වාර්තාවේ තිබෙන්නේ එතුමන්ලාගේ පක්ෂයෙන් තර්ජනයක් තිබෙනවා කියලා ලු. ඉතින් ගරු කථානායකතුමනි, ඒ ගැන පරීක්ෂණයක් කරන්න ඕනෑ නේ. අපි කියන්නේ කරුණාකරලා, පොලීසිය භාර ඇමතිතුමා ඒ ගැන විශේෂයෙන් පරීක්ෂණයක් කරන්න කියලා. ඒක අනිවාර්යයෙන් කරන්න ඕනෑ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ජීවිතයට ප්‍රශ්නයක් තිබෙනවා නේ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමන්ලාගේ පක්ෂයෙන්ම නම් තර්ජනය තිබෙන්නේ,-*[බාධා කිරීම්]*

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, මේ සියලු කථා ඉතා පරස්පරයි නේ. බොහොම පැහැදිලිව ඉස්සෙල්ලාම පොලිස්පතිතුමා කියනවා, මගේ ආරක්ෂාව පිළිබඳව තර්ජනයක් තිබෙනවා කියලා. උතුරු මැද කොට්ඨාසයේ අපරාධ පරීක්ෂණ ඒකකයෙන් එවා තිබෙන report එකේ ඒක තිබෙනවා. Cabinet approval එකක් ආවාම ඒ සඳහා සලකා බලන්නම් කියලා පොලිස්පතිතුමා ඉස්සෙල්ලා එවා තිබෙනවා. ඊට පස්සේ, Cabinet approval එක ආවේ ඒ විධියටද, නැත්නම්, දේශපාලන බලපෑමක් ඇවිල්ලාද දන්නේ නැහැ, එතුමා දෙවනුවට, "ඒක පක්ෂ අභ්‍යන්තරයෙන්..." කියලා -ඒක බුද්ධි තොරතුරු නොවෙයි- එතුමා විසින් සකස් කරපු එකක් මට එවා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අවසාන පොලිස් වාර්තාවට අනුව තමයි වැඩකටයුතු කරන්නේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු කථානායකතුමනි, ඒ නිසා මේ පිළිබඳව ඔබතුමා මට හරියට කියන්න. මට ආරක්ෂාව දෙනවාද, නැද්ද? ආරක්ෂාව දෙනවා නම්, ඒ කවදාද කියලා ඔබතුමා මට හරියට කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මේ සම්බන්ධව අවසාන පොලිස් වාර්තාව ඇවිල්ලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඒ වාර්තාවට අනුව තමයි වැඩකටයුතු කරන්නේ.*[බාධා කිරීම්]*

අපි නැවතත් පෙත්සම් පිළිගන්වන අවස්ථාවට යොමු වෙමු.

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු කථානායකතුමනි, හැටන්, ආරියගම, අංක 64 යන ලිපිනයෙහි පදිංචි ඒ.කේ. මහේන්ද්‍රන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු සුදත් බලගල්ල මහතා**
(மாண்புமிகு சுதத் பலகல்ல)
(The Hon. Sudath Balagalla)
ගරු කථානායකතුමනි, මහනුවර, හන්තාන පාර, ගැමුණු මාවත, දෙවන පටුමඟ, අංක 61/154 යන ලිපිනයෙහි පදිංචි එම්.ඩී. චන්ද්‍රපාල මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පෙත්සම් දෙකයි. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් පැහැදිලිව ප්‍රකාශ කළා නේ. අවසානයේ ලැබුණු පොලිස් වාර්තාවට අනුව තමයි කටයුතු කරලා තිබෙන්නේ.

ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාගේ පෙත්සම් දෙක ඉදිරිපත් කරන්න.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පස්යාල, මක්කනිගොඩ, අංක 40 යන ලිපිනයෙහි පදිංචි ආර්.ඒ.ඩී.ඊ. රණතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) වෙයන්ගොඩ, මාලිගාතැන්න, අංක 104 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. කමල්සිරි මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### 2015 සිට ක්‍රියාත්මක පෞද්ගලික විදුලි ජනන සමාගම්: විස්තර
### 2015 முதல் இயங்கிவரும் தனியார் மின்சார உற்பத்திக் கம்பனிகள்: விபரம்
### PRIVATE ELECTRICITY GENERATING COMPANIES OPERATING FROM 2015: DETAILS

313/2024

**1. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පෞද්ගලික විදුලි ජනන සමාගම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් සමාගමේ නම හා ලිපිනය සහ ජනන ධාරිතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සඳහන් එක් එක් සමාගම ලංකා විදුලිබල මණ්ඩලය වෙත සැපයූ විදුලි ඒකක සංඛ්‍යාව සහ ඒ සඳහා එක් එක් සමාගමට ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි ජනන ධාරිතාව වැඩි කිරීම සඳහා ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(v) එම විදුලි ජනනය සඳහා යොදා ගනු ලබන බලශක්ති ක්‍රමවේද පුනර්ජනනීය බලශක්තියද නැතහොත් තාප බල ශක්තියද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் 2015 முதல் இற்றைவரை இயங்கிவரும் தனியார் மின்சார உற்பத்திக் கம்பனிகளின் எண்ணிக்கையை ஒவ்வொரு வருடத்துக்குமென வெவ்வேறாகவும்;

(ii) அந்த ஒவ்வொரு கம்பனியினதும் பெயர் மற்றும் முகவரியை அதனால் உற்பத்தி செய்யப்படும் கொள்ளளவுடன் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு கம்பனியும் 2015 முதல் இற்றைவரை இலங்கை மின்சார சபைக்கு வழங்கிய மின்சார அலகுகளின் எண்ணிக்கை மற்றும் ஒவ்வொரு கம்பனிக்கும் செலுத்தப் பட்ட தொகை என்பவற்றை வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) மின்சார உற்பத்திக் கொள்ளளவை அதிகரிப்பதற்காக இலங்கை மின்சார சபையால் முன்னெடுக்கப்படவுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) இந்த மின்சார உற்பத்தி முறைமைகள் புதுப்பிக்கத்தக்கனவா அல்லது அனல் மின்சாரத்துக்குரியனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Will he inform this House -

(i) the number of private electricity generating companies operating in Sri Lanka from the year 2015 to date, for each year separately;

(ii) the names and addresses of those companies along with the generating capacity of each company, separately;

(iii) the number of electricity units that each of the above company provided to Ceylon Electricity Board and the amount paid to each company from year 2015 to date, separately;

(iv) the measures to be taken by the Ceylon Electricity Board to increase the electricity generation capacity; and

(v) whether the electricity generation methods are renewable or thermal?

(b) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජනන සමාගම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01හි දක්වා ඇත.

(ii) එක් එක් සමාගමේ නම, ලිපිනය සහ ජනන ධාරිතාව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02හි දක්වා ඇත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමුණුමේ තිබෙනවා කියලා හරියන්නේ නැහැ. අපි දන්නේ නැති නිසා කියවන්න වෙවි. මොකද, නැත්නම්-

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මේක ටිකක් ලොකු පිළිතුරක්, ගරු මන්ත්‍රීතුමා. අද දවස මදි වෙවි, කියවන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැත්නම් අතුරු ප්‍රශ්න අහන්න අමාරු වෙනවා නේද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
කාලය දෙනවා නම් කියවන්නම්.

(iii) එක් එක් සමාගම ලංකා විදුලිබල මණ්ඩලය වෙත සැපයූ විදුලි ඒකක සංඛ්‍යාව සහ ඒ සඳහා එක් එක් සමාගමට ගෙවන ලද මුදල් පිළිබඳ විස්තරයක් ඇමුණුම 03හි දක්වා ඇත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒකේ වැඩිම ගෙවා තිබෙන 10 ඉදිරිපත් කරන්න, CEB එකේ නැති 10.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

(iv) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ජනන ධාරිතාව වැඩි කිරීම සඳහා ගැනීමට නියමිත ක්‍රියාමාර්ග පහත සඳහන් වේ.

- දිගු කාලීන ජනන සැලැස්මට යටත්ව පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් ජාතික විදුලි පද්ධතියට අවශෝෂණය කිරීම.
- පුනර්ජනනීය බලශක්තිය උකහා ගැනීම උදෙසා ජාතික සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් පද්ධතිය පුළුල් කිරීම.
- පුනර්ජනනීය බලශක්තිය ප්‍රශස්ත ලෙස උකහා ගැනීම සඳහා බලශක්ති ගබඩා කිරීමේ පද්ධතිය, එනම් Battery Energy Storage සහ Pumped Hydro Storage හඳුන්වා දීම.
- ඉදිරියේදී කල් ඉකුත් වීමට නියමිත බලාගාර සහ අනාගත බලශක්ති ඉල්ලුම සපුරාලීමට අදාළව තාප බලාගාර අවශ්‍ය නම් ඒ හරහා ස්වාභාවික වායු බලාගාර ඉදි කිරීමට අවශ්‍ය කටයුතු යෙදීම.
- දැනට පවතින ජල විදුලි බලාගාරවල ස්ථාපිත ධාරිතාව පුළුල් කිරීම සඳහා අධ්‍යයනයන් සිදු කිරීම.

(v) ඉදි කිරීමට නියමිත බලාගාර බොහොමයක් පුනර්ජනනීය ගණයට වැටේ. සූර්ය බලාගාර ප්‍රමුඛව එක් කරන අතර සුළං බලාගාර ද සැලකිය යුතු ප්‍රමාණයක් පද්ධතියට එක් කිරීමට, කුඩා පරිමාණ ජල විදුලි බලාගාර හා ජීව ද්‍රව්‍ය බලාගාර ද එක් කිරීමට බලාපොරොත්තු වේ. අතිරික්ත පුනර්ජනනීය බලශක්තිය ගබඩා කර භාවිතයට ගැනීම සඳහා බලශක්ති ගබඩා පද්ධති ද එක් කෙරේ. පද්ධතියේ ස්ථායීතාව, බලශක්ති සුරක්ෂිතතාව සඳහා තාප බලාගාර ඉදි කිරීමට නියමිත ය.

සටහන: මේ පිළිබඳ දත්ත ඇතුළත් 2025-2044 දිගු කාලීන ජනන සැලැස්මෙහි උපුටා ගැනීම ඇමුණුම 04 මඟින් දක්වා ඇත. ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරමි.

ඉදිරි වර්ෂ කීපය තුළ ඉදි කෙරෙන බලාගාර පිළිබඳ සාරාංශය පහත දක්වා ඇත.

| | මුළු ධාරිතා එකතුව (මෙගාවොට්) | | | | | |
|---|---|---|---|---|---|---|
| | තාප බලාගාර | කුඩා ජල බලාගාර | සුළං බලාගාර | ජීව ද්‍රව්‍ය බලාගාර | සූර්ය බලාගාර | බැටරි බලශක්ති ගබඩා |
| 2026 | 235 | 10 | 90 | 15 | 370 | 100 |
| 2027 | 115 | 10 | 260 | 20 | 400 | - |
| 2028 | 200 | 20 | 200 | 20 | 450 | 100 |
| 2029 | - | 20 | 150 | 20 | 450 | 100 |
| 2030 | 130 | 20 | 150 | 20 | 450 | 50 |

(ආ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා කියන්න ඕනෑ, මේ ප්‍රශ්නයට ලැබුණු පිළිතුර ගැන. එහි අහපු ප්‍රශ්න කොටස් 5කින් 4කටම අදාළව පිළිතුරු තිබෙන්නේ ඇමුණුම්වල. ඉතින්, මොනවාද මට අහන්න පුළුවන් අතුරු ප්‍රශ්න? මොකද, අපි දන්නේ නැහැ, ඒ ඇමුණුම්වල තිබෙන්නේ මොනවාද කියලා. මේ විධියට උත්තර දෙනවා කියන්නේ, උත්තරය සභාගත කළා වගේමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අතුරු ප්‍රශ්න අහන්න දත්ත තිබෙන්න ඕනෑ නේද, ගරු කථානායකතුමනි? මෙහෙම වුණාම Standing Ordersවලට අනුව අතුරු ප්‍රශ්න අහන්න අමාරුයි. මොකද, අර්ථවත් අන්දමින් අතුරු ප්‍රශ්නයක් අහන්න අවශ්‍යයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා අද පාර්ලිමේන්තුවට ආපු කෙනෙක් නොවෙයි නේ. ගරු ඇමතිතුමා ඒ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුර ලබා දුන්නා. එම නිසා එතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කියා මම ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, තමා අහපු ප්‍රශ්නවලට ලබා දුන්නු පිළිතුරේ අභ්‍යන්තරය දැන ගන්න මන්ත්‍රීවරයාට අවස්ථාව දෙන්න ඕනෑ. එහෙම නැතුව කොහොමද අතුරු ප්‍රශ්න අහන්නේ? මාර වැඩක් නේ මේක. *[බාධා කිරීමක්]* අද ආවා ද, ඊයේ ආවා ද කියන එක නොවෙයි වැදගත්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, Parliamentary Business Committee එකේදී සාකච්ඡා වුණා, ඇමතිවරයෙකු ඇමුණුම් ගණනාවක් සභාගත කරන කොට, ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයාට ඒවා පරිශීලනය කරලා අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාවක් ලැබෙන්නේ කොහොමද කියලා. මොකද, Standing Ordersවලම තිබෙනවා, ඒ ලබා දෙන උත්තරවලින් පැන නඟින කාරණාවලට අදාළව අතුරු ප්‍රශ්න අහන්නට ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයාට අවස්ථාව තිබෙනවා කියලා. ඇමුණුම් සභාගත කරලා, හැන්සාඩ් එකට ගිහිල්ලා, ඒ ඔක්කොම කියවා බලන කොට මෙතුමාට අතුරු ප්‍රශ්න අහන්න බැහැ. එදා තීන්දුවක් ගත්තා, ඇමුණුම් හැටියට කියන දේවල් ප්‍රශ්නය අහන්න පෙර ඒ ඇමතිවරයා ප්‍රශ්නය අහන මන්ත්‍රීවරයාට ලබා දෙනවා කියලා. ඇයි ඒක ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ ස්ථාවර නියෝග අවුරුදු ගණනාවක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ තිබෙනවා. එහෙම නම් ඇමුණුම් සියල්ල කියවන්න ඕනෑ. Oral Questionsවලට පැයයි වෙන් කරලා තිබෙන්නේ. පැය ඉවර වෙනකොට Oral Questions දෙක නම් අහලා තිබෙන්නේ, ඒ විධියට යමු. ගරු කථානායකතුමනි, උදේ වරුවේ මෙතැන නාට්‍ය කරන්න නේ මේ හදන්නේ. මේ මන්ත්‍රීතුමා අවුරුදු විසිගණනක් පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ඔහොම උත්තර දීලා තිබෙනවා. ඔබතුමන්ලා කවුරුත් දන්නවා, ඔය ඇමුණුම් කියවන්න විශාල වෙලාවක් යනවා කියලා. *[බාධා කිරීමක්]* ඒක පිළිගන්නවා නම්, කරන්න තිබෙන එකම දේ මේකයි. ප්‍රශ්න 10ක් අහන්න වෙන්නේ නැහැ. කීය හරි පැයකදී උත්තර දීලා තිබෙන ප්‍රශ්න ප්‍රමාණයට සීමා වෙලා යමු.

මේ පාර්ලිමේන්තුවේ හැම දාම මෙහෙම තමයි සිද්ධ වුණේ. අනෙක, පාර්ලිමේන්තුව අදින් අවසන් වෙන්නේ නැහැ. මන්ත්‍රීවරයෙකුට ප්‍රශ්නයකට උත්තර ලැබුණාට පසුව තවත් තොරතුරු එනවා තමයි. එතකොට ඒ මන්ත්‍රීතුමාට ඒක Ministerial Consultative Committee එකට යොමු කරන්න පුළුවන්, වැඩිපුර විස්තර ලබා ගැනීම සඳහා. ඕනෑ නම් තවදුරටත් පුළුවන්, ඒක මත පදනම් වෙලා සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයක් අහන්න. ඒක රාජ්‍ය ආයතනයක් සම්බන්ධ ප්‍රශ්නයක් නම් COPE එකට, COPA එකට යොමු කරන්න පුළුවන්. පාර්ලිමේන්තුව කියන්නේ එක කොටසක් විතරක් නොවෙයි. පාර්ලිමේන්තුව කියන්නේ උදේ පැය දෙක විතරක් නොවෙයි. ඒක process එකක්. පැයක් තිබෙනවා, පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට. ඒ පැය තුළ තමයි අපට එම ප්‍රශ්නවලට අවසර දෙන්න වෙන්නේ, ගරු කථානායකතුමනි. එහෙම තමයි පාර්ලිමේන්තුව පවත්වා ගෙන ගිහින් තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, බිමල් රත්නායක ඇමතිතුමා දුන්න උත්තරයත් එක්ක මම මේ කාරණයත් කියන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කාලය ගන්නේ නැතිව කියන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාගේ නම්‍යශීලීභාවයක් නැහැ නේ. මොන Standing Order එක අනුවද point of Order එක අහන්නේ කියලා ඔබතුමා කෙළින්ම අහනවා. "ඒක අදාළ නැහැ, වාඩි වෙන්න" කියලාත් ඔබතුමා කියනවා. මගේ දැනුවත්කම තුළ මම අහන්නේ මේකයි.

ගරු ඇමතිතුමනි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඔබතුමන්ලාගේ ආණ්ඩුවට කියලා තිබෙනවා, විදුලි බිල වැඩි කරන්න ඕනෑ කියලා. මම දන්නේ නැහැ නේ, තිබෙන දත්ත මොනවාද කියලා. ඒ නිසා මට වටෙන් ගිහිල්ලා තමයි ඒ ගැන අහන්න වෙන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පස්වැනි වාරිකය ලැබිලා නැහැ. ඒ වාරිකය ලැබිලා නැති නිසා සියයට 11.8කින් විදුලි බිල වැඩි කරන්න ඕනෑ

කියලා ලංකා විදුලිබල මණ්ඩලය කියනවා. හැබැයි Public Utilities Commission එක කියලා තිබෙනවා, ඒක අසාධාරණයි කියලා. මොකද, ඔබතුමන්ලා ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම තුළ සේවකයන් 2,600ක් ගෙදර යවනවා කියලා කියා තිබෙනවා ලු. ඒකට වැය වන මුදල රුපියල් මිලියන 11,931ක් ලු. පාරිභෝගිකයාගේ විදුලි බිල වැඩි කිරීමේදී ඒකත් එකතු කරලා තිබෙනවා ලු. ඒ අනුව මේ සේවකයන් 2,600 ගෙදර යවනවාද? ලංකා විදුලිබල මණ්ඩලයෙන් සේවකයන් ඉවත් කිරීමේදී ඒ සඳහා වැය වන රුපියල් මිලියන 11,931ක මුදල ගෙවන්නේ පාරිභෝගිකයාද?

ඊළඟට, වීදි පහන් සම්බන්ධයෙන් තිබෙන බිලත් දැන් පාරිභෝගිකයා ගෙවනවා කියලා ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය දන්වා එවා තිබෙනවා කියලා මට කියලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා උත්තරයක් දුන්නා නම් මට මේකට උත්තරයක් ලැබෙනවා. නමුත් ඔබතුමා උත්තරයක් දුන්නේ නැති නිසා සියයට 11.8කින් විදුලි බිල වැඩි කිරීම සාධාරණද කියලා මම අහනවා. එදා රුපියල් 292ට තිබුණු ඩොලරය අද රුපියල් 314යි. ඒ නිසා සියයට 11.8ට තව සියයට 10ක් එකතු කරලා -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය කෙටි කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
උත්තර දුන්නේ නැති නිසා නේ, මම මේවා අහන්නේ. නැත්නම් මම අහන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට උපරිම විනාඩි දෙකයි දෙන්නේ. දැන් අතුරු ප්‍රශ්නයට අදාළ ඒ විනාඩි දෙක ගිහිල්ලා ඉවරයි.

ගරු අමාත්‍යතුමා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රධාන ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි ජනනය පිළිබඳවයි. මේ අහන්නේ අදාළ නැති අතුරු ප්‍රශ්නයක්. ඒ ගැන විස්තරාත්මකව ස්ථාවර නියෝග 27(2) යටතේ ඇහුවා නම් අපට ක්‍රමවත් උත්තරයක් දෙන්න පුළුවන්. ගරු කථානායකතුමනි, මේ අතුරු ප්‍රශ්නය මෙතුමා අසා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නොවන බව මම කියන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ පිළිතුර වැරදියි නේ. මම ස්ථාවර නියෝග 27 (2) යටතේ නොවෙයි, මේක අහලා තිබෙන්නේ. මේ ප්‍රශ්නයට උත්තරයක් ලබා දෙන්න මම අවුරුද්දයි, මාස දෙකක කාලයක් දීලා තිබෙනවා. අවුරුද්දයි මාස දෙකක් කියන්නේ මාස 14ක්. මාස 14ක් ගියාට පසුව මට උත්තරය දීලා තිබෙන්නේ කොහොමද? ඇමුණුම් 4ක් දෙනවා ලු. මගේ ප්‍රශ්නය තුළ මම අසා තිබෙනවා, විදුලිය ජනනය කරන්නේ කොච්චරක්ද කියලා. විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කියලා ඔබතුමන්ලා කිව්වා. ඒ අනුව විදුලිය කොච්චර ජනනය කර තිබෙනවාද? මොකද, පුනර්ජනනීය සම්පත්වලින් විදුලිය ජනනය කළා නම්, විදුලි බිල සියයට 35ක්, 40ක් අඩු කරන්න පුළුවන්. නමුත් එහෙම වෙලා නැති නිසා තමයි මම ඒ ගැන බැලුවේ. ඒ නිසා ඒකකයක මිල කීයද කියන එක තමයි මම අහන්නේ. ඒ සම්බන්ධව අපේ පාරිභෝගිකයන්ට උත්තරයක් ලබා දෙන්නයි මම ඒ ගැන අහන්නේ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ඇත්තටම මේ ඇමුණුම් ගත්තාම, එක ඇමුණුමක පිටු 9ක්, 10ක් විතර තිබෙනවා. කාලය තිබෙනවා නම්, මට ඒවා ඉදිරිපත් කිරීමේ ගැටලුවක් නැහැ. මොකද, මෙතුමා අසා තිබෙන පැනයේ දීර්ඝ අනුකොටස් සහ විස්තරාත්මක බව නිසා තමයි ඇමුණුම් ඒ තරම් විශාල වෙලා තිබෙන්නේ. මම හිතන විදියට ඒක මගේ ගැටලුවක් නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - *[බාධා කිරීමක්]* ඔබතුමාට දෙවැනි අතුරු ප්‍රශ්නයට දීපු වෙලාවත් ඉවරයි. *[බාධා කිරීමක්]* එක වාචික ප්‍රශ්නයකට විනාඩි 6යි ගන්න පුළුවන් වන්නේ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ප්‍රශ්න 10ක් තිබෙනවා, පැයක් ඇතුළත අසන්න. ඔබතුමාට පැයක් වෙන් කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඇහුවේත් ප්‍රශ්නයක් නේ. *[බාධා කිරීමක්]* ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහලා ඉවරයි නේ. *[බාධා කිරීමක්]* ආයෙත් අර පූර්විකාවම බැහැ, ගරු මන්ත්‍රීතුමා. විනාඩි 2ක් ඇතුළත අතුරු ප්‍රශ්නය අහන්න ඕනෑ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඔය point එක මොකක්ද කියලා මට කියන්න. අපිට අතුරු ප්‍රශ්න 2ක් අහන්න අවස්ථාව තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න 2ම අහලා ඉවරයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මේ සභාව නොමඟ යවන්න එපා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. *[බාධා කිරීමක්]* මේ ක්‍රමයට මම කැමැති නැහැ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න. හැබැයි, ආයෙත් කාලය ගන්න එපා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔය හිනා වෙන ස්වරූපයෙන් හිටියා නම්, අපිත් හිනා වෙලා ප්‍රශ්නය අහනවා නේ. නැත්නම් රවලා ප්‍රශ්න අහන්න ඕනෑ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලය ගන්නේ නැතුව ප්‍රශ්නය අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මට අතුරු ප්‍රශ්නය අහන්න දෙන්නේ මිනිත්තු 2යි ලු. ඔබතුමා මිනිත්තු 10කින් විතර උත්තරය දෙන්න.

විදුලි පාරිභෝගිකයින් විදුලි බිල තුනෙන් එකකින් අඩු වෙයි කියා බලාගෙන සිටිනවා. ඒ සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ මොකක්ද? මම දන්නා විධියට, මම අහපු ප්‍රශ්නයට අදාළ පිළිතුරේ Iවෙනි ඇමුණුමේ සඳහන් වන්නේ විදුලිය සියයට 38ක් ජනනය කරන්නේ ගල් අඟුරු තුළින් කියන කාරණයයි. මේ දැන් එන ගල් අඟුරුවල calorific value එක 5,300ට අඩු වෙලා තිබෙන නිසා, තාප බලාගාරවලින් ජනනය කරන නිසා බිල වැඩි වෙනවා. ඒ වාගේම නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියනවා, ඊයේ පත්තරේ තිබුණා, පුනර්ජනනීය බලශක්තිය සහ Battery Energy Storage System – BESS - එකේ 640ක් එකතු වෙලා තිබෙනවාය කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය කෙටි කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සම්බන්ධයෙන් ඔබතුමාට කියන්න පුළුවන්ද? ඒක වුණාම ඒකකයක් කීයකට අඩු වෙනවාද කියලා කියන්න පුළුවන්ද? එතකොට පාරිභෝගිකයන්ට බය නැතුව අඩු මිලක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා -

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, මම මේ සභාවේදී කිහිප වතාවක්ම ප්‍රකාශ කළ පරිදි, අපි විදුලි බිල තුනෙන් එකක් අඩු කරනවාය කියන්නේ, අවුරුදු තුනක් ඇතුළත. මොකද, බිල අඩු කරන්න ඉස්සර වෙලා අනිවාර්යයෙන්ම ජනන මිල අඩු කරන්න ඕනෑ. දැන් කරන්නේ වැඩි ගණනට අරගෙන අඩු ගණනට විකුණන එක. එතකොට අපි මිලදී ගැනීමේ හෝ ජනන මිල හෝ තමයි අඩු කරන්න ඕනෑ. අපි බලයට පත් වෙනකොට average එක වුණේ, ඒකකයක් රුපියල් 37ක්. ඒක දැනට රුපියල් 29ක් දක්වා අපි අඩු කරලා තිබෙනවා. ඒ කියන්නේ සියයට 22ක් දක්වා දැනට ජනන වියදමේ average එක අඩු කරලා තිබෙනවා, technology ඔක්කෝම ගත්තාම. ඒක 25 දක්වා අඩු කිරීම තමයි අරමුණ. අනිවාර්යයෙන් අවුරුදු 3ක් යන්න ඉස්සර වෙලා අපි ඒක අඩු කරනවාය කියලා බොහොම සන්තෝෂයෙන් මම කියන්න කැමැතියි. *[බාධා කිරීමක්]* ඔව්, කිසි ගැටලුවක් නැහැ. ගල් අඟුරුවල-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර අවසන් කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ඒකත් අපි දැන් විසඳාගෙන යනවා. ඒ හැරුණු විට දෙවැනි එක හරි. තුන්වැනි එකේත් අඩුපාඩුවක් තිබුණා. එතැනින් පස්සේ දැන් හයවැනි එක දක්වා බාලා තිබෙනවා; බාගෙන යනවා. *[බාධා කිරීමක්]* මෙහෙමයි. worst-case scenario ගැන කථා කරන්න එපා. මේ, shipments 25ක් තිබෙන්නේ. Shipment එකක්, දෙකක් නොවෙයි. මොකද, ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේදී 2020, 2021දී- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -882/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -912/2025- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය. - *[සභා ගර්භය තුළ නැත.]*

## මත්පැන් බලපත්‍ර: විස්තර
### மதுபான அனுமதிப்பத்திரங்கள்: விபரம்
### LIQUOR LICENCES: DETAILS

1064/2025

**4. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මත්පැන් විකිණීම සඳහා මේ වනවිට නිකුත් කර ඇති නීත්‍යානුකූල බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර වර්ග කවරේද;

(iii) එම බලපත්‍ර හිමියන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති මත්පැන් නිෂ්පාදනය කරනු ලබන ස්කාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ස්කාගාර බලපත්‍ර හිමියන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) දේශීයව නිෂ්පාදනය කරනු ලබන මත්පැන් බෝතලයකින් අය කරනු ලබන බදු මුදල කොපමණද;

(ii) එමඟින් 2024 වර්ෂයේදී සුරාබදු දෙපාර්තමේන්තුව උපයාගෙන ඇති මුළු බදු ආදායම කොපමණද;

(iii) 2024 වර්ෂය තුළදී අලෙවි කර ඇති මත්පැන් බෝතල් සංඛ්‍යාව කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மதுபான விற்பனைக்காக இதுவரையில் வழங்கப்பட்டுள்ள சட்டபூர்வ அனுமதிப்பத்திரங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி அனுமதிப்பத்திர வகைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி அனுமதிப்பத்திரதாரர்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையிலுள்ள மதுபான வடிசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவற்றின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி வடிசாலை அனுமதிப்பத்திரதாரர்களின் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) உள்ளூரில் தயாரிக்கப்படும் மதுபானப் போத்தல் ஒன்றுக்கு அறவிடப்படும் வரி எவ்வளவு என்பதையும்;

(ii) அதனூடாக 2024ஆம் ஆண்டில் மதுவரித் திணைக்களம் ஈட்டிக் கொண்டுள்ள மொத்த வரி வருமானம் எவ்வளவு என்பதையும்;

(iii) 2024ஆம் ஆண்டில் விற்பனை செய்யப்பட்ட மதுபானப் போத்தல்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House of the -

(i) number of liquor licences that have been legally issued for the sale of liquor so far;

(ii) types of such licences; and

(iii) names of the holders of the licences concerned?

(b) Will he also inform this House of the -

(i) number of distilleries that produce liquor in Sri Lanka;

(ii) names of them; and

(iii) names of the licence holders of the said distilleries?

(c) Will he further inform this House-

(i) amount of tax levied on a bottle of locally produced liquor;

(ii) total tax revenue that was earned by the Excise Department from them in the year 2024; and

(iii) number of bottles of liquor sold during the year 2024?

(d) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මත්පැන් විකිණීම සඳහා 2025.01.01 සිට 2025.12.31 දක්වා නිකුත් කර ඇති සංචාරක මණ්ඩල අනුමැතිය සහිත නව බලපත්‍ර සංඛ්‍යාව 142කි.

(ii) i. ර.බී. 07 - සංචාරක මණ්ඩල අනුමත හෝටල් බලපත්‍ර.

ii. ර.බී. 11 - සංචාරක මණ්ඩල අනුමත භෝජනාගාර බලපත්‍ර.

iii. ර.බී. 22බී - සංචාරක මණ්ඩල අනුමත බියර්, ඒල්, ස්ටවුට් හා වයින් ස්ථානීය පරිභෝජනය සඳහා වූ බලපත්‍ර.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

(iii) බලපත්‍ර හිමියන්ගේ නම් ඇමුණුම 01 මඟින් දක්වා ඇත. එය දීර්ඝ ඇමුණුමක්. එම නිසා ඇමුණුම 01 **සභාගත*** කරනවා.

(ආ) (i) මත්පැන් නිෂ්පාදනය කරන නිෂ්පාදනාගාර සංඛ්‍යාව 23කි.

(ii) එම ස්කාගාර හා නිෂ්පාදනාගාරවල නම් ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

ඇමුණුම 02

**Manufacturer Details – 2026**

| No | Manufacture Name |
|---|---|
| 1 | DCSL New Warehouse |
| 2 | DCSL Bandarawatta Warehouse |
| 3 | DCSL No 01 Warehouse |
| 4 | DCSL Nawayalathenna Warehouse |
| 5 | Periceyl Nawayalathenna Warehouse |
| 6 | DCSL Badulla Warehouse |
| 7 | Signature Distilleries Lanka (Pvt) Ltd |
| 8 | Signature Ceylon Beverages Private |
| 9 | International Distillers Ltd |
| 10 | Royal Cask Distilleries (Pvt) Ltd |
| 11 | Sake Royal Cask Distilleries (Pvt) Ltd |
| 12 | VA Distilleries (Pvt) Ltd |
| 13 | Classics Distilleries Private Limited |
| 14 | Scotland Distilleries & Blenders (Pvt) Ltd |
| 15 | Nippon Expo Ltd |
| 16 | Acme Lanka Distillery (Pvt) Ltd, |
| 17 | Rockland Distilleries Private Limited |
| 18 | Uvaglen (Private) Limited |
| 19 | Lion Brewery Bottling Plant |
| 20 | Finnland Distilleries (Pvt) Ltd |
| 21 | Srilanka Distillery (Pvt) Limited (Mestiya) |
| 22 | Hingurana Distilleries (Pvt) Ltd . |
| 23 | Cider Beverage Management Service Private Limited |

(iii) ස්කාගාර සහ නිෂ්පාදනාගාරවල බලපත්‍ර හිමියන්ගේ නම් ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

ඇමුණුම 03

**Liquor Manufacturer Details**

| No | Manufacture Name |
|---|---|
| 1 | **DCSL New Warehouse** |
| 2. | **DCSL Nawayalathenna Warehouse** |
| 3. | **DCSL No 01 Warehouse** |
| 4. | **DCSL Bandarawatta Warehouse** |
| 5. | **Periceyl (Pvt) Ltd Nawayalathenna Warehouse** |
| 6. | **International Distillers Ltd** |
| 7. | **Rockland Distilleries Private Limited** |
| 8. | **Valikamam Distilleries** |
| 9. | **Varani Distilleries** |
| 10. | **Uvaglen (Private) Limited** |
| 11. | **Signature Distilleries Lanka (Pvt) Ltd** |
| 12. | **Finnland Distilleries (Pvt) Ltd** |
| 13. | **VA Distilleries (Pvt) Ltd** |
| 14. | **Nippon Expo Ltd** |
| 15. | **Randenigala Distilleries Lanka (Pvt) Ltd** |
| 16. | **Acme Lanka Distillery (Pvt) Ltd,** |
| 17. | **Synergy Distilleries (Pvt) Ltd** |
| 18. | **Scotland Distilleries & Blenders (Pvt) Ltd** |

*** *පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

| No | Manufacture Name |
|---|---|
| 19. | Hingurana Distilleries (Pvt) Ltd |
| 20. | Royal Cask Distilleries (Pvt) Ltd |
| 21. | Sake Royal Cask Distilleries (Pvt) Ltd |
| 22. | Classics Distilleries Private Limited |
| 23. | Thikkam Distilleries |

(ඇ) (i) දේශීයව නිෂ්පාදනය කරනු ලබන මත්පැන් බෝතලයකින් අය කරනු ලබන බදු මුදල, මද්‍යසාර සැර 33.5%ක් වන අතිවිශේෂ අරක්කු මිලිලීටර් 750 බෝතලයක් සඳහා සුරා බද්ද රු.1,832/-කි.

(ii) සුරා බද්ද (මත්පැන්) රුපියල් බිලියන 213.39කි. (රු. 213,389,597,989කි. )

(iii)

| මත්පැන් වර්ගය | ප්‍රමාණය |
|---|---|
| දේශීයව නිෂ්පාදිත අරක්කු මිලිලීටර් 750 බෝතල් | 29,734,328 |
| දේශීයව නිෂ්පාදිත අරක්කු මිලිලීටර් 375 බෝතල් | 33,049,388 |
| දේශීයව නිෂ්පාදිත අරක්කු මිලිලීටර් 180 බෝතල් | 95,009,539 |
| දේශීයව නිෂ්පාදිත අරක්කු මිලිලීටර් 700 බෝතල් | 7,080 |
| දේශීයව නිෂ්පාදිත විදේශීය මත්පැන් මිලිලීටර් 750 බෝතල් | 5,445,359 |
| දේශීයව නිෂ්පාදිත විදේශීය මත්පැන් මිලිලීටර් 375 බෝතල් | 2,635,288 |
| දේශීයව නිෂ්පාදිත විදේශීය මත්පැන් මිලිලීටර් 180 බෝතල් | 1,778,111 |

(ඈ) පැන නොනඟී.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර අනුව බැලුවොත්, දේශීයව නිෂ්පාදනය කරන මත්පැන්වලින් විශාල බදු ප්‍රමාණයක් රජයට ලැබෙනවා. උදාහරණයකට ගත්තොත්, DCSL එකේ ඒවා. අපේ භාෂාවෙන් කියන්නේ, "ගල් බෝතලය" කියලා. මිලිලීටර් 750ක ගල් අරක්කු බෝතලයකින් රුපියල් 1,832ක් බදු ගන්නවා. එම මත්පැන් වර්ගය තමයි ලංකාවේ වැඩිපුර බොන්නේ. අපි මේ කථා කරන මොහොතෙත් අනිවාර්යයෙන් බොනවා. මළ ගෙවල්වලත් බොනවා; මඟුල් ගෙවල්වලත් බොනවා. ඒ බීපු සියලුදෙනාට අවසානයේදී ඉස්පිරිතාලවලට එන්න වුණාම සෞඛ්‍ය ඇමතිතුමාට තමයි නොමිලේ බෙහෙත් දෙන්න වෙන්නේ. ඒ, ගල් බෝතලේ. *[බාධා කිරීමක්]* ඇහුණේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පොල් එක?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
පොල් නොවෙයි දැන් ගහන්නේ ගල්. මේ දවස්වල වැඩිපුර ගහන්නේ ගල්. මළ ගෙදරත් ගහනවා, ඔක්කොම ගහන්නේ ගල්. ඉතින්, තමුන්නාන්සේලා නව රජය යටතේ නව විධියට ජනතාවට සේවය කරනවා නම් ඉස්පිරිතාලවලට වියදම් කරන එක අඩු කරන්න පුළුවන්, මේ ගල් බෝතලයේ මිල අඩු කළොත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අපි, මත්පැන් ගැන කථා කරන්න එපා, අරවා මේවා කිව්වාට, ඒ බොරු.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මම ප්‍රශ්නය අහනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි දෙකයි දෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
අනේ, ඔබතුමා කේන්ති ගන්න එපා, ගරු කථානායකතුමනි. හැම තිස්සේම කේන්ති ගත්තාම වයසට යනවා, කැත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. අතුරු ප්‍රශ්න සඳහා විනාඩි දෙකයි වෙන් කර තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා. පැයක් ඇතුළත ප්‍රශ්න 10ක් අහන්න ඕනෑ. ප්‍රශ්නයකට වෙන් කර තිබෙන්නේ විනාඩි 6යි. ඔබතුමා අනවශ්‍ය කථා කියනකොට විනාඩි දෙක ගෙවී අවසන්. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ඔබතුමා හැම තිස්සේම අපි එක්ක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නේ හදන්නේ. මේක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නේ. පොඩ්ඩක් ඉන්නකෝ කථා කරනකල්. අපි ප්‍රශ්නයක් අහලා මාස 6ක් විතර ඉන්න ඕනෑ ඒකට පිළිතුරු ගන්න. ඔබතුමා අපිත් එක්ක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නය අහන්නේ නැත්නම් මම ඊළඟ ප්‍රශ්නයට යනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ඔව්, ඔබතුමාට පුළුවන්. ඔබතුමා කථානායක නිසා බලය පාවිච්චි කරලා ඕනෑ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකර අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
හොඳයි. ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්නකෝ. පළමුවෙනි ප්‍රශ්නය අහනකොට නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දෙනවා, කථානායකතුමා මගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩි දෙකක් ගත්තා නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ඉතින්, විනාඩි දෙක ගත්තේ ඔබතුමායි, මමයි රණ්ඩු වෙන්න නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ ගල් බෝතලයේ මිල අඩු කරන්න පුළුවන් නම් ලොකු දෙයක්. ඒක පළමුවන අතුරු ප්‍රශ්නය.

දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි. අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමා දැනට අවුරුද්දකට විතර ඉස්සරවෙලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්න කරුණාකරලා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ප්‍රශ්නය තමයි අහන්නේ මේ. මේක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නේ, දෙවි හාමුදුරුවනේ!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් විනාඩි 3ක් ගත්තා. මොකක්ද මේ කරන්නේ?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
දැන් ප්‍රශ්නය නොවෙයි ද මේ අහන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොනවා කරනවාද දන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
දැන් නියෝජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කළා, පසුගිය රජය බලපත්‍ර 304ක් ලබා දී තිබෙනවා, ඒවා නීත්‍යානුකූලව නොවෙයි ලබා දී තිබෙන්නේ කියලා. අපට පොතක් ඉදිරිපත් කළා. ඒ පොතේ තිබෙනවා, ඒ 304ම බලපත්‍රලාභීන් ගැන. දැන් මේ බලපත්‍ර දිගටම ක්‍රියාත්මක කරනවාද, මේවා නීත්‍යානුකූල නොවෙයිද, මේවා ලබා දී තිබෙන්නේ කොහොමද, මේක අවසන් කරන්න හෝ අවලංගු කරන්න යම් වැඩ පිළිවෙළක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඔබතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නය විධියට ඉදිරිපත් කරපු කාරණය ගැන අපි සලකා බලන්නම්.

දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මේකයි. පසුගිය රජය විසින්, මැතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබෙන අවස්ථාවක තමන්ගේ හිතවතුන්ට දෙන්න විධිමත් නොවන විධියට මේ බලපත්‍ර නිකුත් කළා කියලා කරුණු මතු වෙලා තිබෙනවා. ඒ පිළිබඳව මේ වනකොටත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතිනවා. ඒ නිසා මේ ගැන මෙතැන වැඩි විස්තර කථා කරන එක සුදුසු නැහැ. හැබැයි, ඒ බලපත්‍ර දීලා තිබෙන්නේ, කොන්දේසිවලට යටත්ව. දැන් මෙතැනදී මතුවෙලා තිබෙන ප්‍රශ්නය බලපත්‍රය නීතිවිරෝධී ද කියන කාරණය නොවෙයි. මැතිවරණයක් ප්‍රකාශයට පත් කර තිබෙන වෙලාවේදී තමන්ගේ හිතවතුන්ට බලපත්‍ර දීම නිසා තමයි ප්‍රශ්නය මතුවෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* නමුත්, මම කියන්නේ අධිකරණයේ නඩුවක් තිබෙන නිසා ඒ ක්‍රමවේදය ගැන තවදුරටත් අපි මෙතැන කථා කරන එක සුදුසු නැහැ කියලායි. මොකද, විභාග වෙමින් පවතින නඩුවක් තිබෙනවා, මේ සම්බන්ධයෙන්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
වැරදියි නම් ඒවා අහෝසි කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්න දෙකම අහලා අවසන්. පළමු ප්‍රශ්නයත් ඇහුවා. ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට තමයි අන්තිමට උත්තර දුන්නේ.

## ගොඩ කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති කුඹුරු ඉඩම්: අනුරාධපුර දිස්ත්‍රික්කය

நிரப்புவதற்கு அனுமதி வழங்கப்பட்டுள்ள வயற் காணிகள்: அனுராதபுரம் மாவட்டம்

PADDY LANDS GRANTED WITH APPROVAL FOR FILLING: ANURADHAPURA DISTRICT

1243/2025

5. **ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024-2025 වර්ෂය තුළදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොඩ කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය, එම එක් එක් කුඹුරු ඉඩම හිමිකරුගේ නම, අනුමැතිය ලබා දුන් කුඹුරු ඉඩමේ විශාලත්වය සහ අනුමැතිය ලබා දීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඊට අදාළව, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුතුව නිකුත් කරන ලද ලිපිවල පිටපත් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024-2025ஆம் ஆண்டுக் காலப்பகுதியில் கமநல அபிவிருத்தித் திணைக்களத்தினால் அனுராதபுரம் மாவட்டத்தில் நிரப்புவதற்காக அங்கீகாரம் அளிக்கப்பட்டுள்ள மொத்த வயற் காணிகளின் அளவு, அத்தகைய ஒவ்வொரு வயற் காணியின் உரிமையாளரின் பெயர், அங்கீகாரம் அளிக்கப்பட்டுள்ள வயற் காணியின் பரப்பளவு மற்றும் அங்கீகாரம் அளித்தமைக்கான காரணம் என்பவற்றை வெவ்வேறாகவும்;

(ii) அதற்கமைவாக கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகத்தின் கையொப்பத்துடன் வழங்கப்பட்டுள்ள கடிதங்களின் பிரதிகளைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the total extent of paddy lands in the Anuradhapura District for which approval had been granted by the Department of Agrarian Development for filling during the year 2024-2025, the name of each paddy land owner, the size of the respective paddy land for which approval had been granted and the reasons for granting such approval, separately; and

(ii) whether copies of the letters issued in this regard bearing the signature of the Commissioner General of Agrarian Development will be submitted?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 2024 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයට අදාළව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කුඹුරු ඉඩම් ගොඩ කිරීම සඳහා අනුමැතිය ලබා දී නොමැති අතර, 2025 වර්ෂයට අදාළව 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව කුඹුරු ඉඩම් ප්‍රමාණයක් වී වගා කිරීමක් හැර වෙනත් කාර්යයක් සඳහා භාවිත කිරීමට අවසර ලබා දී ඇති ඉඩම් සම්බන්ධ තොරතුරු පහත වගුවේ පරිදි වේ.

| | ඉඩම හිමිකරුගේ නම හා ගොනු අංකය | අනුමැතිය ලබා දී ඇති බිම් ප්‍රමාණය (පර්චස්) | ලබා දී ඇති අනුමැතිය |
|---|---|---|---|
| 01. | එන්.ඩබ්ලිව්.ආර්. පුෂ්ප කුමාර මයා 7/11/ AN/105 | 2.8 | ව්‍යාපාරික ස්ථානයක් ඉදිකර ගැනීම සඳහා |
| 02. | එස්. අතුල ජානක කුමාරසිරි මයා 7/11/ AN/104 | 10.20 | ව්‍යාපාරික ස්ථානයක් ඉදිකර ගැනීම සඳහා |
| 03. | එම්.එස්. පාතිමා බසිරා මිය 7/11/ AN/106 | 5.80 | ව්‍යාපාරික ස්ථානයක් ඉදිකර ගැනීම සඳහා |
| 04. | එම්.එස්.එම්. නසූර්දීන් මයා 7/11/ AN/107 | 6.0 | ව්‍යාපාරික ස්ථානයක් ඉදිකර ගැනීම සඳහා |
| 05. | එම්.එස්. ෆාතිමා තස්ලිමා මිය 7/11/AN/108 | 8.20 | ව්‍යාපාරික ස්ථානයක් ඉදිකර ගැනීම සඳහා |
| මුළු බිම් ප්‍රමාණය | | 33.0 | |

(ii) ඔව්. එම ලේඛන ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම ඉඩම් ගොඩ කිරීම සම්බන්ධයෙන් පසුගිය කාලයේ බරපතළ ප්‍රශ්න ගණනාවක් තිබුණු බව අපි දන්නවා. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ කුඹුරු ඉඩම් ගොඩ කිරීම සම්බන්ධයෙන් දිගින් දිගටම, දිගින් දිගටම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී පවා ප්‍රශ්න කරන තත්ත්වයට පත් වුණා. මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය කාලයේ කුඹුරු ඉඩම් ගොඩ කිරීමට අදාළව ක්‍රමවේදයක් හදලා තිබුණා. දැනුත් ඒ ක්‍රමවේදය තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුවේ, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ නීති රීති උල්ලංඝනය කරලා හිතුමතේට පසුගිය කාලයේ මේ ඉඩම් ගොඩ කිරීමට අදාළ මැදිහත්වීම් කරලා තිබුණා. එතකොට, දැන් ඒ ක්‍රමවේදය නවත්වා තිබෙනවාද, ඒක වෙනස් කරන්න අමාත්‍යාංශය විධියට යම් මැදිහත්වීමක් කරලා තිබෙනවාද, තවමත් ඒ ක්‍රමවේදයමද කරගෙන යන්නේ කියන එක මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමා අහපු කාරණය නිවැරදියි. පසුගිය කාලය පුරාවටම අත යට මුදල් ගනුදෙනු එක්ක එවැනි කටයුතු සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව අකටයුතුකම් විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙන බව අපට නිරීක්ෂණය වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ සියල්ල නියාමනය කරමින් සිටිනවා, නිවැරදි කරමින් සිටිනවා. මේ වනකොට මේ සම්බන්ධව අලුත් චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම තිබෙන ප්‍රායෝගික තත්ත්වයත් එක්ක සමහර ඉඩම් ඇත්තටම වෙනස් වෙන්නත් ඕනෑ, ඒ වාගේම ගොඩ කිරීම් හරහා සිද්ධ වන පාරිසරික හානිය සහ වෙනත් බලපෑම් නතර වෙන්නත් ඕනෑ. මේකේ දෙපැත්තක් තිබෙනවා. ඒ දෙපැත්තම තුලනය වන විධියට මේ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා අලුත් චක්‍රලේඛයක් හරහා දෙපාර්තමේන්තුව විධියට මැදිහත් වෙමින් සිටිනවා කියන කාරණය මේ වෙලාවේ මම ප්‍රකාශ කරන්න කැමැතියි.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි දන්නවා, පොහොර සහනාධාරය ලබා දීම සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රශ්න මතු වුණු බව. පසුගිය කාලයේ ගොවි ජනතාවට පොහොර ලබා දීමේදී පළමුවෙනි වාරිකය කන්න වගා කරන්න පෙර ලබා දෙන්න ඕනෑය කියන තීරණය අපි ගත්තා. හැබැයි, දෙවැනි වාරිකය ලබා දීමේදී යම් පිරිසකට මේ වනකොට යම් ප්‍රමාදයක් සිදු වී තිබෙනවා. පළමුවෙනි වාරිකය අපි මුලින් ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් මේ මොහොතේදී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තිබෙන මැදිහත්වීම මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩුව ගන්නකොටම ගොවීන්ට දුන් පොහොර ප්‍රමාණය හෙක්ටෙයාර දෙකක් සඳහා රුපියල් 20,000කින් වැඩි කළා. ඒ වාගේම කුඹුරු ඉඩම්වල අතුරු භෝග වගා කරන ගොවීන්ටත් පොහොර සහනාධාරය ලබා දීමේ කටයුතු අපි ආරම්භ කළා. මේ මුදල් ලබා දීමේදී කලින් තිබුණු ක්‍රමවේදය අපි වෙනස් කළා. මීට කලින් පොහොර සල්ලි දුන්නේ වගා කටයුතු ඇරඹුවාට පස්සේ. මොකද, එහෙම නැතිව දුන්නාට පසුව ගොවීන් වගා නොකර සිටියොත්, මූල්‍යමය ගැටලුවක් එන නිසා. එහෙම අවදානමක් තියාගෙනත් අපි ඒ තත්ත්වය වෙනස් කළා, මේ කන්නයේ සිට. එතැනදී කන්න රැස්වීමේදී ගත්ත තීන්දුවත් එක්ක වගා කටයුතු අරඹන්න පෙර පළමු වටයේ - වට දෙකකින් තමයි මේ මුදල් ලබා දෙන්නේ - පොහොර සල්ලි නිදහස් කරන්න අපි තීරණයක් ගත්තා. එතකොට ඒකේ පොඩි අවදානමක් තිබුණා. යම් ගොවියෙක් වගා නොකර හිටියොත්, අපට පුළුවන් දෙවන වටයේදී සල්ලි නොදී ඉඳලා, ඊට පස්සේ ඒ ගොවියා එක්ක ඒ ගනුදෙනුව ඉස්සරහට ගෙන යන්න. පළමු වටයේදී පොහොර සහනාධාර මුදල් කිසි ගැටලුවක් නැතුව ගොවීන්ගේ ගිණුම්වලට බැර වුණා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ගොවිතැන් කරන, මේ ක්ෂේත්‍රයේ ඉන්න කෙනෙක් නිසා හොඳටම දන්නවා, යායෙන් යායට මේ තත්ත්වය වෙනස් කියන එක.

උදාහරණයක් විධියට ගත්තොත්, කලා වැව ආශ්‍රිතව වගා කරන දින වකවානුයි, පරාක්‍රම සමුද්‍රය ආශ්‍රිතව වගා කරන දින වකවානුයි වෙනස්. එතකොට පොහොර සහනාධාර මුදල් එකවර ගොවීන්ට ලැබෙන්නේ නැහැ. ඒ කන්න රැස්වීමේදී ගන්නා තීන්දු අනුව ඒක වෙනස් වනවා. ඒකත් එක්ක පොහොර සහනාධාර මුදල් ලබා දීමේදී දෙවැනි වටයේ යම් කිසි ප්‍රමාදයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. දෙවැනි වටයේදී මේ කටයුතු පමා වෙන්න විශේෂ හේතුවක් තමයි, "දිට්වා" සුළි කුණාටුව. ඒ වාගේම, අපට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් 4,000කට වැඩි පිරිසකගේ පුරප්පාඩු තිබෙනවා. වන්දි ලබා දීමේ ක්‍රියාවලිය අපි පුළුල් කළා, ඒකත් එක්ක ඒ සිටින නිලධාරින්ට වැඩ ගොඩක් කරන්න වුණා.

ඊළඟ කාරණය මේකයි. දෙවැනි වටයේදී ගොවීන්ට පොහොර සහනාධාරය දෙන්න නම්, ගොවියා වගා කටයුතු අරඹා තිබෙනවා කියන තහවුරුව ගන්න ඕනෑ. අන්න ඒ තහවුරුව ලබා ගැනීමේදී විනාශ වුණු ඒවාත් එක්ක, ඒ තිබුණු සංකීර්ණ තත්ත්වයත් එක්ක ඒකේ ප්‍රමාදයක් වුණා. මේ වන විට ප්‍රමාදයක් නැතුව මේ කටයුතු යථාවත් කරන්න පුළුවන් කියන කාරණය මේ වෙලාවේදී මම මතක් කරනවා. මේ වන විට පොහොරවලට අදාළ සියලු මුදල් නිදහස් වෙලා තිබෙනවා. ඒ අනුව ඉදිරි දින කිහිපය ඇතුළත අනිවාර්යයෙන්ම සියලු ගොවි ජනතාවට අදාළ පොහොර සහනාධාර මුදල් ලැබෙනවා කියන සහතිකය අපට මේ වෙලාවේදී ලබා දෙන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, කලින් ප්‍රශ්නය අහපු ගරු මන්ත්‍රීතුමා කුඹුරු ගොඩ කිරීම සම්බන්ධයෙන් තමයි ගරු ඇමතිතුමාගෙන් ඒ ප්‍රශ්නය අහලා තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ අදාළ -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉන්නකෝ, මම කියනකම්. මම අහන ප්‍රශ්නය මෙයයි. ඒ අවස්ථාවේදී ඒ මන්ත්‍රීතුමා පොහොර සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්නයක් ඇහුවා. මේක අපි ඇහුවා නම් කියනවා, "අදාළ නැහැ" කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක සභාව පවත්වා ගෙන යෑමේදී තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. *[බාධා කිරීම්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order. ගරු කථානායකතුමනි, ඒක වැරදියි. ඔබතුමා විධි දෙකක් ක්‍රියාත්මක කරන්න එපා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ. ගරු මන්ත්‍රීතුමනි, එතුමාට පිළිතුරු ලබා දුන්නා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම නැවත අහන්නේ මේකයි. මේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ තිබෙන 5වන ප්‍රශ්නයෙහි (අ) (i) යටතේ තිබෙන්නේ, කුඹුරු ගොඩ කිරීම සම්බන්ධ ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්න මිනිත්තු 9ක් ගියා. අපට දෙන්නේ මිනිත්තු දෙකයි. ඒ තුළ දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා, පොහොර සම්බන්ධයෙන්. මම ප්‍රශ්නයක් ඇහුවාම බලශක්ති ඇමතිතුමා කිව්වා, ඒක ප්‍රධාන ප්‍රශ්නයට අන්තර්ගත නැහැ කියලා. නමුත් ඒක අන්තර්ගතව තිබෙනවා, තිබියදීත් නැහැ කියනවා. මෙතැනදී උත්තර දෙන්නේ කොහොමද? *[බාධා කිරීම්]* ඔබතුමා ප්‍රශ්නය NPP එකෙන් වුණාම එක විධියක්, - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා අතුරු ප්‍රශ්නයක් අහන්න ගියාම අදාළ ප්‍රශ්න නොවෙයි නේ අහන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ඉඳගන්න. *[බාධා කිරීම්]*

ප්‍රශ්න අංක 06, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා point of Order එක මතු කරලා ඉවරයි නේ, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* හොඳයි, කියන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මේ කාරණය අහන්න ඉඩ දෙන්න. ගරු කථානායකතුමනි, අපි මෙතැන නැඟිටලා ඉන්නේ ඔබතුමාව ප්‍රශ්න කරන්න නොවෙයි. අපි මෙතැනදී අහන්නේ ජනතාවට තිබෙන දැවෙන ප්‍රශ්නවලට උත්තර. මම මෙතැන අහන්න බලාගෙන සිටියේ පාරිභෝගිකයින් හැටලක්ෂයක් සඳහා විදුලි බිල අඩු කිරීම සම්බන්ධයෙන් වන ජනනය පිළිබඳවයි. එතකොට මට හරස් වුණා. හැබැයි, පොහොර ප්‍රශ්නය ගැන අහනකොට කිසිම අදාළ බවක් නැතුව ඒකට උත්තර දෙන්න මිනිත්තු 7ක් දුන්නා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා කැමති නිසා පිළිතුරු දුන්නා නේ. මේකේ සම්ප්‍රදායයක් තිබෙනවා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාත් ඒ විධියට ප්‍රශ්න අසා තිබෙනවා. *[බාධා කිරීම්]*

## ශ්‍රී ලංකා ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන: පවතින ඖෂධ ප්‍රමාණය

இலங்கை தேசிய பாலியல் நோய்கள் மற்றும் எயிட்ஸ் தடுப்பு வேலைத்திட்டம்: மருந்து கிடைப்பனவு

SRI LANKA NATIONAL STD/AIDS CONTROL PROGRAMME: AVAILABILITY OF DRUGS

1297/2025

**6. ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන යටතේ පවත්වන සායන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායෙන් සේවා ලබා ගන්නා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

(iii) ඉහත වැඩසටහන පරිපාලනය කිරීමට ස්ථිර අධ්‍යක්ෂකවරයෙකු පත් කර තිබේද;

(iv) නොඑසේ නම්, පරිපාලන කටයුතු සිදු කරන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඒඩ්ස් රෝගය වැළැක්වීම සඳහා ලබා දෙන pre-exposure prophylaxis ඖෂධයෙන් මේ වනවිට පවතින තොග ප්‍රමාණය කොපමණද;

(ii) එම ඖෂධය ශ්‍රී ලංකාවට පරිත්‍යාගයක් ලෙස ලැබෙන්නේද;

(iii) එසේ නම්, එම ඖෂධය ලබා දෙන ආයතනය කවරේද;

(iv) නොඑසේ නම්, එම ඖෂධය සපයා ගනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) (i) ඒඩ්ස් රෝගය සඳහා ලබා දෙන ප්‍රතිවයිරස ඖෂධ වන Tenofovir, Lamivudine සහ Dolutegravir යන එක් එක් ඖෂධයෙන් මේ වනවිට පවතින තොග ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒඩ්ස් රෝගීන්ට අත්‍යවශ්‍ය ප්‍රතිවයිරස ඖෂධ හිඟයක් පවතින බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් වගකීම දරන්නේ කවුරුන්ද;

(iv) ඉහත හිඟය සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை தேசிய பாலியல் நோய்கள் மற்றும் எயிட்ஸ் தடுப்பு வேலைத்திட்டத்தின் கீழ் நடாத்தப்படும் கிளினிக்குகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவற்றின் மூலம் சேவைகளைப் பெறும் நோயாளர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) மேற்படி வேலைத்திட்டத்தை நிருவகிப்பதற்கு நிரந்தரப் பணிப்பாளர் ஒருவர் நியமிக்கப்பட்டுள்ளாரா என்பதையும்;

(iv) இன்றேல், நிருவாக நடவடிக்கைகள் மேற்கொள்ளப்படும் முறைமை யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) எயிட்ஸ் நோயைத் தடுப்பதற்காக வழங்கப்படுகின்ற pre-exposure prophylaxis ஔடதத்தின் தற்போதைய கையிருப்பு எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி ஔடதம் இலங்கைக்கு அன்பளிப்பாகக் கிடைக்கின்றதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி ஔடதத்தை வழங்கும் நிறுவனம் யாது என்பதையும்;

(iv) இன்றேல், மேற்படி ஔடதம் பெற்றுக்கொள்ளப்படும் முறைமை யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) (i) எயிட்ஸ் நோய்க்கு வழங்கப்படும் வைரஸ் தடுப்பு ஔடதங்களாகிய Tenofovir, Lamivudine மற்றும் Dolutegravir ஆகிய ஒவ்வோர் ஔடதத்தினதும்

தற்போதைய கையிருப்பின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) எயிட்ஸ் நோயாளர்களுக்கான அத்தியாவசிய வைரஸ் தடுப்பு ஔடதங்களில் பற்றாக்குறை காணப்படுவதை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், இது தொடர்பில் பொறுப்பு வகிக்கின்றவர்கள் யாவர் என்பதையும்;

(iv) மேற்படி பற்றாக்குறை தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் மேலும் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he state -

(i) the number of clinics that are conducted under the Sri Lanka National STD/AIDS Control Programme;

(ii) the number of patients who receive services from those clinics;

(iii) whether a permanent director has been appointed to administer the above-mentioned Programme; and

(iv) if not, the manner in which the administrative affairs are carried out?

(b) Will he also state -

(i) the volume of the current stock of the pre-exposure prophylaxis drug that is given to prevent AIDS;

(ii) whether the said drug is received as a donation to Sri Lanka;

(iii) if so, the name of the institution that donates the said drug; and

(iv) if not, the manner in which the said drug is procured?

(c) Will he further state -

(i) the volumes of the current stocks of each of the antiviral drugs given to AIDS patients, namely Tenofovir, Lamivudine and Dolutegravir, separately;

(ii) whether he is aware that there is a shortage of essential antiviral drugs given to AIDS patients;

(iii) if so, the name of the person who is responsible in that regard; and

(iv) the steps that will be taken regarding the above-mentioned shortage?

(d) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා විසින් අසන ලද,- *[බාධා කිරීම්]* ඔව්, විශ්වාස භංගය. අගමැතිතුමියට ගෙනෙන එක? *[බාධා කිරීම්]* කෝ ඒක? අත්සන් කරපු එක කෝ? ඒකට මොකද වෙලා තිබෙන්නේ? දැන් අත්සන් කරපු අයත් නැද්ද?

ගරු කථානායකතුමනි, ගරු මරික්කාර් මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් සඳහා පරීක්ෂණ හා ප්‍රතිකාර සායන 41ක් රට පුරා විසිරී පවතී.

(ii)

| රෝගය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| HIV/AIDS | 4,771 |
| Syphilis (උපදංශය) | 1,469 |
| Gonorrhea (සුදු බිංදුම) | 1,035 |
| Herpes | 2,891 |

(iii) ඔව්.

2025.11.06 දින සිට ස්ථිර අධ්‍යක්ෂකවරයෙකු සේවයට වාර්තා කර ඇත.

(iv) පැන නොනඟී.

(ආ) (i) 2025.12.31 දින වනවිට පෙති 36,420ක තොගයක් පවතින අතර එම ප්‍රමාණය මාස 4කට ප්‍රමාණවත් වේ.

(ii) ඔව්.

(iii) 1.ගෝලීය අරමුදල

2.ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමය

(iv) දැනට ගෝලීය අරමුදලෙන්ද - Global Fund එකෙන්ද, ඉදිරියේදී රජයේ අරමුදල්වලින්ද - GoSL fundsවලින්ද - ඖෂධය සඳහා අරමුදල් සපයා ගන්නා අතර හදිසි අවශ්‍යතාවක් ලෙස මෑතකදී ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංවිධානයෙන් ඖෂධය සපයා ගන්නා ලදී.

(ඇ) (i) ප්‍රතිවයිරස ඖෂධ 3ක් ගැන ඔබතුමා කියනවා. ඖෂධ වර්ග 3ක් ලෙස පැවතියත් මෙය සංයෝජනය කරන ලද ඖෂධයකි. මෙය TLD නමින් හැඳින්වෙනවා. ඒ TLD තොග ප්‍රමාණය 2025 දෙසැම්බර් 31 දින වනවිට 101,280ක්ව පවතිනවා.

(ii) දැනට ඒඩ්ස් රෝගීන්ට ලබා දෙන අත්‍යවශ්‍ය ඖෂධවල හිඟයක් නොමැත. ගෝලීය අරමුදලෙන් ලැබෙන ඖෂධ බලාපොරොත්තු වූ කාල සීමාවේදී නොලැබුණු නිසා ඖෂධ මුලින් මාස තුනක් සඳහා නිකුත් කළද පසුව එම කාලය මාසයක් දක්වා අඩු කරන ලදී. ඖෂධ තොග මේ වනවිට ලැබීමට නියමිතව පවතින අතර, ලැබුණු විගස එම කාල සීමාව නැවතත් මාස තුනක් දක්වා දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ කියන්නේ, මාස තුනක කාලය අඩු කළා මිසක් ඖෂධ ලබා දෙන එක නතර කරලා නැහැ.

(iii) ඒඩ්ස් රෝගීන්ට ලබා දෙන අත්‍යවශ්‍ය ඖෂධ නිතිපතා සැපයීම සම්බන්ධ වගකීම දරන්නේ ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන වැඩසටහන හා වෛද්‍ය සැපයීම් අංශයයි.

(iv) දැනට ඒඩ්ස් රෝගීන්ට ලබා දෙන අත්‍යවශ්‍ය ඖෂධවල හිඟයක් නොමැත.

(ඈ) පැන නොනඟී.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -1327/2025- (1), ගරු සුජීව දිසානායක මහතා.
- *[සභා ගර්භය තුළ නැත.]*

## අලංකාලගාල ග්‍රා.නි. කොට්ඨාසයේ රජයේ ඉඩම: ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට වෙන් කිරීම
## அலங்காலகால கிராம அலுவலர் பிரிவில் உள்ள அரச காணி: இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்துக்கு ஒதுக்குதல்
## STATE LAND IN ALANKALAGALA GN DIVISION: ALLOCATION TO SRI LANKA BROADCASTING CORPORATION

1430/2025

**8. ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලංකාලගාල ග්‍රාම නිලධාරි වසමේ, හරක්ගමකන්ද ග්‍රාමයේ, අක්කර පහක පමණ විශාලත්වයකින් යුතු රජයේ ඉඩමක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට වෙන් කර තිබූ බව දන්නේද;

(ii) එම ඉඩම විධිමත් පරිදි සංස්ථාවට බැහැර කර තිබුණේද;

(iii) එම ඉඩම සංස්ථාව විසින් තෙවන පාර්ශ්වයකට ලබා දී ඇති බව දන්නේද;

(iv) එය නීත්‍යානුකූල වන්නේද;

(v) එම තෙවන පාර්ශ්වය කවුරුන්ද;

(vi) අදාළ තෙවන පාර්ශ්වය විසින් ගෙවීමට ඇති හිඟ බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) හිඟ බදු මුදල් ගෙවීමට තිබියදී, ඉහත ඉඩම පෞද්ගලික බැංකුවකට උකස් කර ණය මුදලක් ලබා ගැනීමට අනුමැතිය දී තිබේද;

(ii) එසේ නම් එය, නීති විරෝධී නොවන්නේද;

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

(iii) ඉහත ඉඩම පැවරීමේදී සහ හිඟ බදු මුදල් ගෙවීමට තිබියදී ණයක් ලබා ගැනීමට කටයුතු කිරීමේදී, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව නීතිය උල්ලංඝනය කර තිබේද;

(iv) ඉහත ඉඩම නැවත රජයට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெலிமடை பிரதேச செயலகப் பிரிவிற்குட்பட்ட அலங்காலகால கிராம அலுவலர் பிரிவின், ஹரக்கமகந்த கிராமத்தில் சுமார் ஐந்து ஏக்கர் பரப்பளவைக் கொண்ட அரச காணி, இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனத்திற்காக ஒதுக்கப்பட்டிருந்ததை அறிவாரா என்பதையும்;

(ii) அந்தக் காணி கூட்டுத்தாபனத்திற்கு முறைப்படி கையுதிர்ப்புச் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(iii) கூட்டுத்தாபனத்தினால் மேற்படி காணி மூன்றாம் தரப்பினருக்கு வழங்கப்பட்டிருப்பதை அறிவாரா என்பதையும்;

(iv) அது சட்டரீதியானதா என்பதையும்;

(v) அந்த மூன்றாம் தரப்பினர் யாவர் என்பதையும்;

(vi) சம்பந்தப்பட்ட மூன்றாம் தரப்பினரால் செலுத்த வேண்டிய வரி நிலுவைத் தொகை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வரி நிலுவைத்தொகை செலுத்த வேண்டியிருக்கும்போது, மேற்படி காணியை ஒரு தனியார் வங்கியில் அடகு வைத்து கடன் தொகையொன்றைப் பெற ஒப்புதல் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது சட்டவிரோதமற்றதா என்பதையும்;

(iii) மேற்படி காணியைச் சாட்டுதல் செய்கையில் மற்றும் வரி நிலுவைத் தொகை செலுத்தப்பட வேண்டியுள்ள நிலையில் கடன் தொகை யொன்றைப் பெற நடவடிக்கை எடுத்திருப்பதன்மூலம் காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம் சட்டத்தை மீறியுள்ளதா என்பதையும்;

(iv) அந்தக் காணியை அரசாங்கத்திற்கு மீளக் கையகப்படுத்த நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that a State land of approximately five acres in extent in the Harakgamakanda village in the Alankalagala Grama Niladhari Division of the Welimada Divisional Secretary's Division was allocated to the Sri Lanka Broadcasting Corporation (SLBC);

(ii) whether the said land was properly disposed to the SLBC;

(iii) whether he is aware that the said land has been subleased to a third party by the SLBC;

(iv) whether that is legal;

(v) the name of the said third party; and

(vi) the amount of outstanding lease rental due from the said third party?

(b) Will he also inform this House -

(i) whether approval has been given to mortgage the said land to a private bank to obtain a loan while there is outstanding lease rental;

(ii) if so, whether the said act is not illegal;

(iii) whether the Land Commissioner General's Department has violated the law in transferring the said land and in granting approval to obtain a loan while there is outstanding lease rental; and

(iv) whether steps will be taken to repossess the said land by the Government?

(c) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමා තම ප්‍රදේශයට අදාළ ඉතාම වැදගත් ප්‍රශ්නයක් තමයි අහලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

2010 වර්ෂයේදී යොමු කරන ලද නිර්දේශ වාර්තා පදනම් කරගෙන ගරු අමාත්‍යතුමා විසින් 2011.02.07 අනුමැතිය ලබා දී ඇති අතර, ඒ අනුව 2011.05.12 දිනැතිව ඉඩමේ භුක්තිය භාර දී ඇත.

(iii) ඔව්.

(iv) නැත.

ඉඩම් බදු ගත් පාර්ශ්වය විසින් ඉන් අනතුරුව සිදු කරන ඕනෑම උකස් කිරීමකදී හෝ පැවරීමකදී ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලිඛිතව ලබා ගත යුතු වන අතර, එවැනි ක්‍රියාවලියකින් තොරව සිදු කරන ලද බැහැර කිරීම් නීත්‍යනුකූල නොවේ.

(v) නාලක රත්නායක - අඹේවෙල වින්ඩ් පවර් (පුද්ගලික) සමාගම.

(vi) අතුරු බදු ලබා දීමකදී තෙවන පාර්ශ්වය වෙතින් රජය වෙත බදු ගෙවීමක් සිදු නොවේ.

(ආ) (i) ඔව්.

හිඟ බදු නොගෙවීම මත ගුවන් විදුලි සංස්ථාවේ බදු අනුමැතිය අවලංගු කිරීමෙන් පසු නැවත මෙම ඉඩම බදු දෙනු ලැබූ පාර්ශ්ව දෙකෙන් එක් අයෙකුට උකස් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

(ii) නැත.

(iii) නැත.

රජයේ ඉඩම් ආඥාපනතෙහි රෙගුලාසි හෝ නියෝගයන්හි උකසකදී හෝ අතුරු බදු දීමකදී උකස් ලබා දෙන දිනය දක්වා වන හිඟ බදු අය කළ යුතු බවට සඳහන්ව නොමැත.

(iv) ප්‍රාදේශීය ලේකම්ගේ 2025.09.08 දිනැති ලිපියෙන් 2,867,640ක හිඟ බදු මුදලක් ඇති බව නිරීක්ෂණය වන බැවින් රජයේ ඉඩම් ආඥාපනතේ 85/86 වගන්ති ප්‍රකාරව (212 නියෝග ප්‍රකාරව) කටයුතු කිරීමෙන් අනතුරුව බදුකරය අවලංගු කිරීමට කටයුතු කරන ලෙස 2025.10.03 දිනැතිව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පිළිතුර තුළ කියැවුණා, තෙවන පාර්ශ්වයකට නීත්‍යානුකූල නොවන ලෙස තමයි මේ ඉඩම ලබා දී තිබෙන්නේ කියලා. එහෙම නීත්‍යානුකූල නොවන ලෙස ඉඩම ලබා දී තිබෙනවා. ඒ වාගේම පළමුවැනි පාර්ශ්වයෙන් බදු ගෙවීමක් සිදු වෙලා නැහැ. ඒ නිසා නීත්‍යානුකූල නොවන විධියට අනුමැතියක් රහිතව මේ සම්බන්ධයෙන් ක්‍රියා කර තිබෙනවා. ඒ අනීතික ක්‍රියා සඳහා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද, එහෙම නැත්නම් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියන එක තමයි මට පළමුවෙන්ම දැනගන්න ඕනෑ.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, ඇත්තටම පසුගිය කාලය පුරාම මේ වාගේ අතුරු බදුකරුවන්ට රජයේ ඉඩම් බදු දීලා අයථා ගනුදෙනු සිදු කර තිබෙනවා කියලා අමාත්‍යාංශයට තොරතුරු වාර්තා වෙමින් තිබෙනවා. දිස්ත්‍රික්ක 25 ගත්තාම ඒකෙන් බහුතරයක් දිස්ත්‍රික්කවල -ආසන්න වශයෙන් දිස්ත්‍රික්ක 20කට ආසන්න ප්‍රමාණයක - මෙවැනි වංචා සහගත ඉඩම් ගනුදෙනු පිළිබඳ තොරතුරු වාර්තා වෙමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයිති මෙම ඉඩම් ගනුදෙනුවත් වංචනිකව දේශපාලනික හිතවතුන්ට, තුන්වන පාර්ශ්වයකට ලබා දුන්නා කියන තොරතුරු තමයි අපට වාර්තා වෙමින් තිබෙන්නේ. ඒ නිසා මේ පිළිබඳව ඉක්මනින්ම පරීක්ෂණයක් කරලා අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කිරීමට අමාත්‍යාංශය විධියට දැනට අපි සාකච්ඡා කරමින් සිටිනවා.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒක මා අසා තිබෙන ප්‍රශ්නයේ (ආ) කොටසට අදාළයි. ඒකේ නීතිය ගැන කියනවා; නීතිය හරස් වෙලා තිබෙන කථාවක් තිබෙනවා.

නමුත්, නීතිය කෙසේ වෙතත් රජයට මුදල් අහිමි වෙලා තිබෙනවාය කියන එකයි මම කියන්නේ. හිඟ බදු මුදල් අහිමි වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, ඉඩම අහිමි වෙලා තිබෙනවා. දැන් ඉඩමත්, බදුත් කියන දෙකම අහිමි වන අනතුරුදායක තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධව පරීක්ෂණයක් කරනවාය කිව්වා. බදුකරු සහ නිලධාරින් අතර යම් ළඟැදියාවක් තිබුණේ දැයි පැහැදිලි ලෙසම මෙතැනදී සැකයක් මතු වෙනවා. ඒ ගැන පරීක්ෂා කරමින් මේ හිඟ බදු මුදල් හෝ මේ ඉඩම ඉක්මනින් පවරා ගන්න කියලා මම කියන්න කැමතියි. බදු අය කර ගැනීම, එහෙම නැත්නම් ඉඩම ලබා ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කරන්න බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග මොනවාද කියා මම අහනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, මම මුලින් කිව්වා වාගේම රටේ හිටපු පාලකයින් මේ ඉඩම් පවරා දීම්වල දී රජයට සහ මහජනතාවට අහිමි කළේ ඉඩම පමණක් නොවෙයි. ජනතාවගේ පොදු පරිහරණය සඳහා භාවිත කරන්න තිබෙන රජයේ ඉඩම් විවිධ සම්බන්ධකම් මත තමන්ගේ දේශපාලන ගෝලබාලාදීන්ට, තමන්ගේ සහචරයින්ට ලබා දීම ඉතිහාසය පුරාම සිදු වෙලා තිබෙනවා.

ඒ එක්කම බැඳුණු තවත් වැදගත්ම කාරණය තමයි, රජයට බදු අහිමි වීම. මේ ඉඩම් නිසියාකාරව බැහැර කිරීම් කරලා, නීත්‍යානුකූල කරලා ඒවායෙන් අය විය යුතු බදු මුදල් අය කර ගන්න කටයුතු කරලා නැහැ. මොකද, තමන්ගේ හිතවතුන්, තමන්ගේ පක්ෂයේ මැතිවරණවලට උදවු කරපු මිනිස්සු වෙනුවෙන් සන්තෝසම් විධියට තමයි මෙම ඉඩම් ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා පැවති ආණ්ඩුවලට මේ ඉඩම් බදු දීලා බදු අය කර ගැනීමේ වුවමනාවක් තිබිලා නැහැ. හැබැයි, ඒ සියයට සියයක් නොවෙයි. බොහෝ තැන්වල මෙවැනි සිදුවීම් වාර්තා වෙනවා. සීනි කිලෝවකට බදු ගහලා වක්‍ර බදුවලින් ජනතාව පීඩනයට ලක් වෙද්දී, මෙවැනි ව්‍යාපෘති සඳහා වෙන් කරපු ඉඩම්වලින් වැඩිපුර ආදායමක් උපයා ගන්න තිබියදී ඒවා නොසලකා වක්‍ර බදු මතම ගමන් කරපු ඉතිහාසයක් තිබෙන්නේ. ඒ නිසා මෙය මේ රටේ ආර්ථිකයටත් බලපාන කාරණයක් සේ සලකා බදු නොගෙවන මෙම වංචනිකයින්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම බදු අය කර ගැනීම සඳහාත් දැනට අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළක් ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම මේ අතුරු බදුකරුට නියෝග කරලා තිබෙනවා, 2018 වර්ෂයේ මෙම ඉඩමෙන් බැහැර වෙන්න කියලා. නමුත්, ඔහු දැනට ඒ සඳහා අභියාචනයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ සියලු කරුණු සලකා බලා මේ පිළිබඳව ගත යුතු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්නත්, බදු අය කර ගන්නත් අමාත්‍යාංශය විධියට අපි කටයුතු කරනවා කියන එක තමයි ගරු මන්ත්‍රීතුමාට පිළිතුරක් විධියට ලබා දෙන්න තිබෙන්නේ.

## එක්ස්ප්‍රස් පර්ල් නෞකා අනතුරෙන් පීඩාවට පත් ධීවරයින්: වන්දි

## எக்ஸ்-பிரஸ் பேர்ள் கப்பல் விபத்தால் பாதிக்கப்பட்ட மீனவர்கள்: இழப்பீடு

## FISHERMEN AFFECTED DUE TO "X-PRESS PEARL" DISASTER: COMPENSATION

1491/2025

**9. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

[ගරු අජිත් ගිහාන් මහතා]

(අ) (i) එක්ස්ප්‍රස් පර්ල් (X-Press Pearl) නෞකා අනතුර හේතුවෙන් ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාවට අයහපත් බලපෑමක් සිදු වී තිබෙන බව දන්නේද;

(ii) ඒ වෙනුවෙන් එම ධීවරයන්ට වන්දි ලබා දී තිබේද;

(iii) එසේ නම්, මේ වනවිට ලබා දී ඇති වන්දි මුදල කොපමණද;

(iv) පුත්තලම දිස්ත්‍රික්කයේ ධීවරයන්ට වන්දි ලබා දීම සඳහා මේ වනවිට සකස් කර ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எக்ஸ்-பிரஸ் பேர்ள் (X-Press Pearl) கப்பல் விபத்து இலங்கையின் மீனவர் சமூகத்திற்கு மோசமான தாக்கம் ஏற்பட்டுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) அதற்காக மேற்படி கடற்றொழிலாளர்களுக்கு இழப்பீடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், இதுவரையில் வழங்கப்பட்டுள்ள இழப்பீட்டுத் தொகை எவ்வளவு என்பதையும்;

(iv) புத்தளம் மாவட்ட மீனவர்களுக்கு இழப்பீடு வழங்குவதற்காகத் தற்போது தயாரிக்கப் பட்டுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Fisheries, Aquatic and Ocean Resources:

(a) Will he inform this House -

(i) whether he is aware that the Sri Lankan fishing community has been adversely affected by the "X-Press Pearl" disaster;

(ii) whether compensation has been paid to affected fishermen in that regard;

(iii) if so, the amount of compensation paid so far;

(iv) the plan currently in place to provide compensation to the fishermen in the Puttalam District?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම නිසා පනවන ලද ධීවර තහනම හේතුවෙන් පාර්ශ්ව කිහිපයකට විවිධ වශයෙන් බලපෑම් ඇති විය. එම පාර්ශ්ව ඍජු ලෙස ධීවර රැකියාවේ යෙදෙන කාණ්ඩ 23ක් සහ වක්‍ර ලෙස ධීවර රැකියාවේ යෙදෙන කාණ්ඩ 23ක් වශයෙන් හඳුනා ගන්නා ලදී. මීට අමතරව ධීවර ආම්පන්නවලට සිදු වූ හානිය හා මීගමුව කළපුවේ ජලජීවී වගාකරුවන්ට සිදු වූ හානිය ද හඳුනා ගෙන ඇත.

(ii) ඔව්. ඉහත (i) කොටසේ හඳුනාගත් හානි වෙනුවෙන් වන්දි ගෙවීම සිදු කරන ලදී.

(iii) පළමු අදියරේදී ධීවර ජනතාවට සහ ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිත රැකියාවල නිරත වූ අයට හානිය තක්සේරු කර නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නැවේ රක්ෂණ සමාගම වෙතින් ඇමෙරිකානු ඩොලර් මිලියන 56.90ක වන්දි මුදලක් ඉල්ලුම් කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මත අභියාචනා ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව ඇමෙරිකානු ඩොලර් මිලියන 2.28ක මුදලක් නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නැවේ රක්ෂණ සමාගම වෙතින් නැවත ඉල්ලීම් කරන ලදී.

ඒ අනුව මේ වනවිට අවස්ථා හතරකදී නැවේ රක්ෂණ ආයතනය වෙතින් අගතියට පත් පුද්ගලයන් සඳහා වන්දි ගෙවීම් වෙනුවෙන් රුපියල් මිලියන 2,980.5ක වන්දි මුදලක් ලැබී ඇත. හඳුනාගත් පුද්ගලයන් සඳහා එක් එක් ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා වන්දි ගෙවීම් කටයුතු සිදු කරනු ලබන අතර, ඒ වෙනුවෙන් රුපියල් මිලියන 2,794.96ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමු කොට ඇත.

(iv) පුත්තලම් දිස්ත්‍රික්කයට අදාළ වන අයුරින් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර නොමැත. නමුත් පුත්තලම් දිස්ත්‍රික්කයේද ධීවර ආම්පන්න සහ උපකරණවලට සිදු වූ හානිය සම්බන්ධයෙන් තහවුරු කරන ලද සිද්ධීන් සඳහා අදාළ ගෙවීම් සිදු කොට ඇත.

(ආ) විද්‍යාත්මකව තහවුරු කරන ලද වාර්තාවක් මත පදනම්ව මීගමුව කලපුව සහ මීගමුවේ සිට පානදුර දක්වා වර්ග කිලෝමීටර් 457ක ප්‍රදේශයකට ධීවර තහනම පනවනු ලැබූ අතර, ජීවනෝපාය අහිමි වීම වෙනුවෙන් ඔවුනට වන්දි ගෙවා ඇත. ඊට ඔබ්බෙන් පිහිටි ප්‍රදේශයන්හි ධීවරයන් වෙත ජීවනෝපාය අහිමි වීම හේතුවෙන් වන්දි ගෙවීම් සිදු නොකරන ලදී. නමුත් පුත්තලම් දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වූ ධීවර ආම්පන්න හා උපකරණවලට සිදු වූ හානි සම්බන්ධව තහවුරු කර ගැනීමෙන් අනතුරුව අදාළ ගෙවීම් මේ වනවිට සිදු කර අවසන්ව ඇත.

ගරු කථානායකතුමනි, ඒ අනුව දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වඩා සමස්ත හානිය ගණනය කිරීමෙන් පසුව වන්දි ලබා දීලා තිබෙන බව කියන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණිය: 2020/2021 විභාගයෙන් බඳවා ගැනීම්

இலங்கை கல்வி நிருவாக சேவையின் தரம் III: 2020/2021இலிருந்து பரீட்சை மூலம் ஆட்சேர்ப்பு

GRADE III OF SRI LANKA EDUCATIONAL ADMINISTRATIVE SERVICE: RECRUITS FROM EXAM IN 2020/2021

912/2025

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පළපුරුද්ද සහ කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා 2020/2021 (2022) විභාගයක් පවත්වන ලද බව දන්නේද;

(ii) එම විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම විභාගයේ ප්‍රතිඵල මත විභාග අපේක්ෂකයන්ගේ තොරතුරු කැඳවා තිබේද;

(iv) පත්වීම් ලබා දීම සඳහා විභාගය සමත් අයට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

(vi) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද අපේක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(vii) එම සම්මුඛ පරීක්ෂණයට අදාළ නිර්ණායක කවරේද;

(viii) සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි එක් එක් අපේක්ෂකයා ලබා ගත් ලකුණු වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) විභාග ප්‍රතිඵල මත, තොරතුරු කැඳවීම් මත සහ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත තෝරා ගත් පිරිසකට පත්වීම් ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම පත්වීම් ලබා දුන් දිනය කවරේද;

(iii) ලබා දුන් පත්වීම් සංඛ්‍යාව කොපමණද;

(iv) විශ්‍රාමිකයන්ටද පත්වීම් ලබාදී තිබේද;

(v) එසේ නම්, ඔවුන්ගේ නම් කවරේද;

(vi) විශ්‍රාමිකයන්ට පත්වීම් ලබා දීමට හේතු කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கல்வி நிருவாக சேவையின் தரம் III இற்கு அனுபவம் மற்றும் திறன்களின் அடிப் படையில் ஆட்சேர்ப்பதற்காக 2020/2021(2022) பரீட்சையொன்று நடாத்தப்பட்டுள்ளமையை அறிவாரா;

(ii) மேற்படி பரீட்சைக்குத் தோற்றியுள்ள பரீட்சார்த் திகளின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி பரீட்சைப் பெறுபேறுகளுக்கு அமை வாக பரீட்சார்த்திகளின் தகவல்கள் கோரப் பட்டுள்ளனவா;

(iv) நியமனங்களை வழங்குவதற்காகப் பரீட்சையில் சித்தியடைந்தவர்களுக்கு நேர்முகப் பரீட்சை நடாத்தப்பட்டுள்ளதா;

(v) ஆமெனில், அத்திகதி யாது;

(vi) நேர்முகப் பரீட்சைக்கு அழைக்கப்பட்ட விண்ணப்பதாரிகளின் எண்ணிக்கை யாது;

(vii) மேற்படி நேர்முகப் பரீட்சைக்கான அளவு கோல்கள் யாவை;

(viii) நேர்முகப் பரீட்சைக்குத் தோற்றிய ஒவ்வொரு விண்ணப்பதாரியும் பெற்றுக்கொண்டுள்ள புள்ளிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பரீட்சை பெறுபேறுகள், கோரப்பட்ட தகவல்கள் மற்றும் நேர்முகப் பரீட்சையின் பெறுபேறுகள் என்பவற்றின் அடிப்படையில் தெரிவு செய்யப் பட்டவர்களுக்கு நியமனங்கள் வழங்கப் பட்டுள்ளனவா;

(ii) ஆமெனில், குறிப்பிட்ட நியமனங்கள் வழங்கப் பட்ட திகதி யாது;

(iii) வழங்கப்பட்ட நியமனங்களின் எண்ணிக்கை யாது;

(iv) ஓய்வுபெற்றவர்களுக்கும் நியமனங்கள் வழங்கப் பட்டுள்ளனவா;

(v) ஆமெனில், அவர்களின் பெயர்கள் யாவை;

(vi) ஓய்வுபெற்றவர்களுக்கு நியமனங்களை வழங்கு வதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that an examination was conducted in 2020/2021 (2022) for recruitment to Grade III of the Sri Lanka Educational Administrative Service on the basis of experience and merit;

(ii) the number of candidates who sat for the examination;

(iii) whether information of the candidates was called for based on the results of the examination;

(iv) whether an interview was held for those who passed the examination for making appointments;

(v) if so, such date;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(vi) the number of candidates called for the interview;

(vii) the criteria relevant to the interview; and

(viii) the score obtained by each candidate who appeared at the interview, separately?

(b) Will she also inform this House -

(i) whether appointments were made to a selected group on the basis of the results of the examination, calling for information and the results of the interview;

(ii) if so, the date in which appointments were made;

(iii) the number of appointments made;

(iv) whether retired persons are also among those who were appointed;

(v) if so, their names; and

(vi) the reasons for appointing retired persons?

(c) if not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** **සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) සේවා පළපුරුද්ද සහ කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා 2020/2021 (2022) විභාගයට අයදුම්කරුවන් 625 දෙනෙකු පෙනී සිට ඇත. එම අපේක්ෂකයන් අතුරින් එම විභාගය සමත් වූ 68 දෙනෙකුගේ තොරතුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව, මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

(iii) ඔව්.

(iv) ඔව්. සේවා පළපුරුද්ද සහ කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අංක: 2231 දරන 2021.06.04 දිනැති ගැසට් නිවේදනය මඟින් පුරප්පාඩු 67ක් වෙනුවෙන් අයදුම්පත් කැඳවා ඇති අතර ඒ අනුව ඉහළම සේවා පළපුරුද්ද සහිත තරග විභාගයේදී ඉහළම ලකුණු ලබාගත් නිලධාරින් 68 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇත.

(v) පළමු වටයේ සම්මුඛ පරීක්ෂණ 2024 මැයි මස 18 සහ 19 දෙදින තුළ ද, දෙවන වටයේ සම්මුඛ පරීක්ෂණය 2025.01.15 දින ද, පවත්වා ඇත.

(vi) පළමු වටයේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද අපේක්ෂකයන් සංඛ්‍යාව 62

දෙවන වටයේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද අපේක්ෂකයන් සංඛ්‍යාව 04

මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව 68

(vii) අංක 2231 හා 2021.06.04 දිනැති බඳවා ගැනීම් ගැසට් නිවේදනය ප්‍රකාරව 8.2, 8.3 යන වගන්තිවල අදාළ නිර්ණායක සඳහන් කර ඇත. (ඇමුණුම 01)**

(viii) අංක 2231 හා 2021.06.04 දිනැති බඳවා ගැනීම් ගැසට් නිවේදනය අනුව 8.3.1හි සඳහන් කර ඇති පරිදි පවත්වන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් වෙත ලකුණු ලබා දීමක් සිදු කර නොමැත.

(ආ) (i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පුරප්පාඩු සංඛ්‍යාව අනුව සහ අදාළ විභාග ප්‍රතිඵල මත සහ සම්මුඛ පරීක්ෂණයේ සුදුසුකම් පරීක්ෂාව මත තෝරා ගන්නා ලද නිලධාරින් වෙත පත්වීම් ලබා දී ඇත.

(ii) සේවා පළපුරුද්ද සහ කුසලතා පදනම මත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුර සඳහා 2022.03.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2024.07.03 දින 61 දෙනෙකු වෙත ද, 2025.03.03 දින 4 දෙනෙකු වෙත ද පත්වීම් ලබා දී ඇත.

(iii) 2024.07.03 දින පළමු වටය - 61

2025.03.03 දින දෙවන වටය - 04

මුළු බඳවා ගැනීම් සංඛ්‍යාව - 65

(iv) ඔව්. (මෙම පත්වීම් ලබා දී ඇත්තේ තරග විභාගය පවත්වන ලද දිනය වන 2022.03.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැවින්, එම දිනය වන විටත් සක්‍රිය සේවයේ නිරත වී සිටි නමුත් පත්වීම් පිරිනමන දිනය වන විට විශ්‍රාම ලබා සිටි නිලධාරි 06 දෙනෙකු වෙත ද පත්වීම් ලබා දී ඇත.)

(v) එම පත්වීම් ලබා දී ඇති විශ්‍රාමික නිලධාරින්ගේ ලේඛනය ඇමුණුම 02** යටතේ ඉදිරිපත් කරමි.

(vi) 2021 වර්ෂයේ මෙම තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවුවද එම වකවානුවේ රට තුළ ව්‍යාප්ත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ඉන්පසුව රට තුළ නිර්මාණය වූ ආර්ථික අර්බුදය හේතුවෙන් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධව නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව, එනම්, "2022 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම" යන මැයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් 2021.12.21 දිනැතිව නිකුත් කළ අයවැය චක්‍රලේඛ අංක 03/2021හි 04.1.vi මඟින් සහ 2022.04.26 දිනැතිව "රාජ්‍ය වියදම් පාලනය කිරීම" මැයෙන් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 03/2022හි 03.vii වගන්තියේ විධිවිධාන අනුව නව බඳවා ගැනීම් අත්හිටුවන ලෙස හා කල් තබන ලෙස උපදෙස් ලබා දී තිබූ බැවින් ද, අංක PS/SB/Circular/10/2022 හා 2022.08.15 දිනැතිව ජනාධිපති ලේකම් විසින් නිකුත් කළ චක්‍රලේඛය මඟින් ඉහත සඳහන් ජාතික අයවැය චක්‍රලේඛ 03/2022හි විධිවිධාන අනුව කටයුතු කළ යුතු බවට උපදෙස් ලබා දී තිබූ බැවින් ද, අදාළ බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රමාද විය. එවකට පැවති රජයේ ප්‍රතිපත්ති තීරණ අනුව මෙම බඳවා ගැනීම ප්‍රමාද වූ බැවින් විභාගය සමත් අයදුම්කරුවන්ගේ වයස විශ්‍රාම ගැන්වීමේ සීමාවට එළඹීම නොවැළැක්විය හැක. ඒ අනුව තරග විභාගය පවත්වන ලද දිනය වන 2022.03.26 දින වනවිටත් සක්‍රිය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් වෙත මෙම පත්වීම් ලබා දී ඇත්තේ තරග විභාගය පැවැත්වූ දින සිට වසර 02කට අධික කාලයක් ගතවීමෙන් පසුව බැවින්, ඇමුණුම 02 යටතේ නම් සඳහන් කර ඇති නිලධාරින් පත්වීම් ලබා දෙන අවස්ථාව වනවිට විශ්‍රාම ලබා ඇත.

(ඇ) අදාළ නොවේ.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

## 2015-2024 දක්වා "A","B","C" සහ "D" මාර්ග සංවර්ධනය: ක්‍රියාත්මක කළ ව්‍යාපෘති
2015-2024 வரை "A","B","C" மற்றும் "D" வீதிகளின் அபிவிருத்தி: செயற்படுத்தப்பட்ட கருத்திட்டங்கள்
DEVELOPMENT OF "A", "B", "C" AND "D" ROADS FROM 2015-2024: PROJECTS IMPLEMENTED

1327/2025

**7. ගරු ගයාන් ජනක මහතා (ගරු සුජීව දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு சுஜீவ திசாநாயக்க சார்பாக)
(The Hon.Gayan Janaka on behalf of the Hon. Sujeewa Dissanayake)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති A, B, C සහ D ශ්‍රේණිවලට අයත් මාර්ගවල දුර එක් එක් ශ්‍රේණිය අනුව කිලෝමීටරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ශ්‍රේණියට අයත් මාර්ග නඩත්තු කරනු ලබන ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2024 දක්වා මාර්ග සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘති කවරේද;

(ii) එම ව්‍යාපෘතිවලින් සංවර්ධනය කරන ලද මාර්ගවල දුර කිලෝ මීටර්වලින් කොපමණද;

(iii) එම ව්‍යාපෘති මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාර්ග ඉදිකර තිබේද;

(iv) එසේ නම්, එම මාර්ගවල දුර කිලෝමීටරවලින් කොපමණද;

(v) ඒ සඳහා වියදම් කරන ලද මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள A, B, C மற்றும் D தரங்களைச் சார்ந்த வீதிகளின் தூரம், ஒவ்வொரு தரம் வாரியாக வெவ்வேறாக கிலோமீற்றரில் யாது என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு தரத்தைச் சார்ந்த வீதிகளை யும் பராமரிக்கும் நிறுவனங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் வீதிகளை அபிவிருத்தி செய்வதை நோக்காகக்கொண்டு ஆரம்பிக்கப்பட்ட கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டங்கள்மூலம் அபிவிருத்தி செய்யப்பட்ட வீதிகளின் தூரம் கிலோமீற்றரில் யாது என்பதையும்;

(iii) அக்கருத்திட்டங்கள்மூலம் குருநாகல் மாவட் டத்தில் வீதிகள் நிர்மாணிக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், அவ்வீதிகளின் தூரம் கிலோமீற்றரில் யாது என்பதையும்;

(v) அதற்காகச் செலவிடப்பட்ட மொத்த நிதி எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House the -

(i) distance of the roads belonging to Grades A, B, C and D in Sri Lanka, separately for each grade in kilometres; and

(ii) names of the institutions which maintain the roads belonging to each of the grades mentioned above, separately?

(b) Will he also inform this House -

(i) the projects that were initiated during the period from year 2015 to 2024 for the development of roads;

(ii) the distance of the roads that have been developed under those projects in kilometres;

(iii) whether roads have been constructed in the Kurunegala District under those projects;

(iv) if so, the distance of the said roads in kilometres; and

(v) the total amount spent for that?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

- A ශ්‍රේණියේ මහාමාර්ග - 4,217.42 km
- B ශ්‍රේණියේ මහාමාර්ග - 8,045.42 km
- C සහ D ශ්‍රේණිවල මාර්ග, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවේ.
- E ශ්‍රේණියේ (අධිවේගී) මාර්ග - 315.8 km

(ii)

- ජාතික මහාමාර්ග පද්ධතියට අයත් A ශ්‍රේණිය, B ශ්‍රේණිය හා E ශ්‍රේණියට අයත් මාර්ගවල නඩත්තු කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලැබේ.
- C හා D ශ්‍රේණියට අයත් මාර්ගවල නඩත්තු කටයුතු පළාත් සභා මඟින් සිදු කරනු ලැබේ.

(ආ) (i) මෙම කාල සීමාව තුළ මාර්ග සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘති පහත දක්වා ඇත.

[ගරු ගයාන් ජනක මහතා]

| වසර | | ව්‍යාපෘතිය |
|---|---|---|
| | 5 | දේශීය බැංකු අරමුදල් සහිත ව්‍යාපෘතිය (LBFP) |
| | 6 | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (SRCP) |
| | 7 | මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය (RSAP) - PHASE - 2 |
| | 8 | බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP) |
| | 9 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I - ROAD) |
| | 10 | චීන සංවර්ධන බැංකු ආධාර ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය -3 (අදියර 1) |
| | 11 | චීන Exim බැංකුව (හුනාන් ශාඛාව) අරමුදල් සපයන ව්‍යාපෘතිය |
| | 12 | පිබිදෙමු පොළොන්නරුව |
| | 1 | මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (GOSL ප්‍රතිපාදන යටතේ) |
| | 2 | විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) |
| | 3 | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය (PRP3)-PHASE-1 |
| | 4 | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය (PRP3)-PHASE-2 |
| | 5 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය -NRCP |
| 2019 | 6 | දේශීය බැංකු අරමුදල් සහිත ව්‍යාපෘතිය (LBFP) |
| | 7 | බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP) |
| | 8 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I - ROAD) |
| | 9 | පිබිදෙමු පොළොන්නරුව |
| | 10 | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (SRCP) |
| | 11 | චීන Exim බැංකුව (හුනාන් ශාඛාව) අරමුදල් සපයන ව්‍යාපෘතිය |
| | 12 | කුලුනු මතින් දිවෙන වරාය පිවිසුම් මාර්ගය |
| | 1 | මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (GOSL ප්‍රතිපාදන යටතේ) |
| | 2 | විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) |
| | 3 | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය (PRP3)-PHASE-1 |
| | 4 | ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය (PRP3)-PHASE-2 |
| | 5 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය -NRCP |
| 2020 | 6 | බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP) |
| | 7 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I - ROAD) |
| | 8 | පිබිදෙමු පොළොන්නරුව |
| | 9 | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (SRCP) |
| | 10 | චීන සංවර්ධන බැංකු ආධාර ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය -3 (අදියර 1) |
| | 11 | චීන Exim බැංකුව (හුනාන් ශාඛාව) අරමුදල් සපයන ව්‍යාපෘතිය |
| | 12 | 100,000km මාර්ග සංවර්ධන වැඩසටහන (LBFP) |
| | 1 | මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (GOSL ප්‍රතිපාදන යටතේ) |
| | 2 | විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) |
| | 3 | රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර-1-කහතුඩුව-ඉංගිරිය |
| | 4 | අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) |
| 2021 | 5 | බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP) |
| | 6 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I - ROAD) |
| | 7 | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (SRCP) |
| | 8 | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර - 3 |
| | 9 | චීන Exim බැංකුව (හුනාන් ශාඛාව) අරමුදල් සපයන ව්‍යාපෘතිය |
| | 10 | 100,000km මාර්ග සංවර්ධන වැඩසටහන (LBFP) |
| | 1 | මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (GOSL ප්‍රතිපාදන යටතේ) |
| | 2 | විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) |
| | 3 | චීන සංවර්ධන බැංකු ආධාර ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය -3 (අදියර 1) |
| | 4 | චීන Exim බැංකුව (හුනාන් ශාඛාව) අරමුදල් සපයන ව්‍යාපෘතිය |
| 2022 | 5 | අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) |
| | 6 | බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP) |
| | 7 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I - ROAD) |
| | 8 | දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය (SRCP) |
| | 9 | 100,000km මාර්ග සංවර්ධන වැඩසටහන (LBFP) |
| | 1 | මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (GOSL ප්‍රතිපාදන යටතේ) |
| | 2 | විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) |
| 2023 | 3 | අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) |
| | 4 | බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP) |
| | 5 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (I - ROAD) |
| | 6 | 100,000km මාර්ග සංවර්ධන වැඩසටහන (LBFP) |
| | 1 | මාර්ග පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (GOSL ප්‍රතිපාදන යටතේ) |
| | 2 | විවිධ විදේශාධාර ව්‍යාපෘතිය (MFAP) |
| 2024 | 3 | අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) |
| | 4 | බදුල්ල චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (BCRIP) |
| | 5 | ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන \(I - ROAD) |
| | 6 | 100,000km මාර්ග සංවර්ධන වැඩසටහන (LBFP) |

මෙම ව්‍යාපෘති මඟින් සංවර්ධනය කරන ලද මාර්ගවල මුළු දුර කිලෝමීටර 3,827.90කි.

(ii) දිවයින පුරා සංවර්ධනය කර ඇති මාර්ගවල දුර කිලෝමීටර 3,827.90කි.

(iii) ඔව්.

(iv) එම මාර්ගවල දුර කිලෝමීටර 386.25කි.

(v) ඒ සඳහා වියදම් කරන ලද මුළු මුදල රුපියල් මිලියන 18,988.00කි.

(ඈ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
# தனி அறிவித்தல் மூல வினா
# QUESTION BY PRIVATE NOTICE

## ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිසංස්කරණ
## இலங்கை மின்சார சபைச் சீர்திருத்தம்
## REFORMS OF CEYLON ELECTRICITY BOARD

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි. ඔබතුමාගේ අවසරය පරිදි ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

(a) රජය විසින් සිලෝන් විදුලිබල මණ්ඩලය - CEB - සම්බන්ධයෙන් දැඩි ව්‍යුහාත්මක වෙනසක් සිදු කරන බවත්, විදුලි ගාස්තු Time-of-Use ක්‍රමයට සකස් කරන බවත් ප්‍රකාශ කර ඇති පසුබිමක,

i. CEB තුළ ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ආයතනික, මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිසංස්කරණ මොනවාද?

ii. Time-of-Use ගාස්තු සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන කාලසටහන කුමක්ද?

iii මෙම වෙනස්කම් ගෘහස්ථ, වාණිජ හා කාර්මික පාරිභෝගිකයන්ට ප්‍රතිශත වශයෙන් කෙසේ බලපාන්නේද?

(b) CEB ප්‍රතිසංස්කරණය හෝ liquidate කිරීම සම්බන්ධයෙන් කරුණු පළ වී ඇති බැවින්,

i. එවැනි ක්‍රියාමාර්ග පෙර එකඟ වූ රජයේ ප්‍රතිපත්ති හා පාර්ශ්වකරුවන්ගේ එකඟතාව අනුව සිදු කරන්නේද?

ii. එසේ නොවේ නම් ඒ සඳහා හේතු මොනවාද?

iii. මේ වෙනස්කම් සම්බන්ධයෙන් CEB සේවකයන් හා පිළිගත් වෘත්තීය සමිතිවල විධිමත් එකඟතාවක් ලබා ගෙන තිබේද?

(c) Cyclone "Ditwah" හේතුවෙන් CEB වෙත සිදු වූ රුපියල් බිලියන 20කට, ඒ කියන්නේ කෝටි 200කට ආසන්න වියදම සම්බන්ධයෙන්,

i. මෙම මුදල් රජය විසින් ලබා දී තිබේද?

ii. එසේ නම් මේ ගෙවීම් සිදු කළ දිනයන් හා මුදල් ප්‍රමාණය මොනවාද?

iii. එසේ නොවේ නම් ඒ වියදම ආපසු ලබා ගැනීමට CEB වෙත ලබා දුන් උපදෙස් මොනවාද?

ගරු කථානායකතුමනි, මෙය ජනවාරි 21වැනි දා "Daily Mirror" පත්තරයේ කැලුම් බණ්ඩාර ලියලා තිබෙන එකක්.

(d) CEB සේවකයින් 2,300කට ආසන්න පිරිසක් සඳහා රුපියල් බිලියන 12ක් පමණ වැය වූ ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය (VRS) හා මාර්ග ආලෝක පිරිවැය ආපසු ලබා ගැනීම සඳහා විදුලි ගාස්තු ඉහළ දැමූ බව සත්‍යයක්ද? එසේ නම්,

i. ඒ පිරිවැය ඍජුවම විදුලි පාරිභෝගිකයන් වෙත පවරා තිබේද?

ගරු කථානායකතුමනි, මේක තිබෙන්නේ "දෙරණ", 2026 ජනවාරි 07වැනි දා.

ii. එවැනි පිරිවැය ආපසු ලබා ගැනීම සඳහා කැබිනට් අනුමැතිය සහ මහජන උපයෝගිතා කොමිසමේ අනුමැතිය ලබා ගෙන තිබේද?

e) විදුලි ගාස්තු තුළ පවතින cross-subsidy ක්‍රමය අඩු කිරීම හෝ ඉවත් කිරීම සිදු කරමින් පවතිනවාද?

i. එසේ නම්, ඒ සඳහා හේතු මොනවාද?

ii. එමඟින් අඩු ආදායම් ලබන පාරිභෝගිකයන්ට සිදු වන බලපෑම කුමක්ද?

(f) ප්‍රේෂණ හා බෙදා හැරීමේ පද්ධති වර්ධනය සහ නවීකරණය සඳහා කැපිටල් මුදල් සපයා ගන්නා මූලාශ්‍ර මොනවාද සහ එම ආයෝජන සඳහා නියමිත කාලසටහන් මොනවාද?

ඒ කියන්නේ transmission and distribution systems සම්බන්ධයෙන්, ගරු කථානායකතුමනි.

(g) Battery Energy Storage Systems ඇතුළු නවීන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අධෛර්යයට ලක් වෙමින්, තාප විදුලි උත්පාදනය ප්‍රමුඛ කරගෙන යන බවට ඇති චෝදනා පිළිබඳව රජය අවබෝධයෙන් සිටිනවාද?

i. එවැනි ප්‍රතිපත්ති දිශාවකට හේතු මොනවාද?

ii. ඉන්ධන ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය හිඟය පවතින තත්ත්වයක මෙය කෙසේ සාධාරණ කරන්නේද?

විදේශ විනිමය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙන අවස්ථාවක, මෙවැනි දෙයක් අනුගමනය කරන්නේ ඇයි කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

(h) අවසානයේ ජාතික වාසිය සඳහා විවෘත ආර්ථික, සාධාරණ සහ පුනර්ජනනීය බලශක්තියට හිතකර බලශක්ති ප්‍රතිපත්ති තහවුරු කිරීම සඳහා ගනු ලබන පියවර මොනවාද?

මේ වන විට BESS එක සඳහා ටෙන්ඩර් කැඳවනවා. නමුත්, ඒ සඳහා පිට රටවල අයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. එතකොට විදේශ විනිමය එළියට යන තත්ත්වයක් තිබෙනවා.

ගරු කථානායකතුමනි, මට එක් අතුරු ප්‍රශ්නයකුත් අහන්න තිබෙනවා. මාව අහඟරුවාදා දැනුවත් කළා, ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය - ඔබතුමන්ලා ක්ෂණිකව ක්‍රියා කරපු නිසායි මට මේක අහන්න පුළුවන් වෙන්නේ - Parliament Secretariat එකට ලැබී තිබෙන්නේ ප.ව.3.35ට කියලා. නමුත්, විපක්ෂය දීලා තිබෙනවා 11.55ට. ඒක විදුලිබල අමාත්‍යාංශයට ගිහිල්ලා තිබෙනවා 11.57ට. ඉතින්, එවැනි ප්‍රකාශයක් ආවේ කොහොමද කියන ප්‍රශ්නය, මේ ප්‍රශ්නය ඉදිරිපත් කරද්දී මට තිබෙනවා. කරුණාකරලා ඒ ගැන බලන්න. මට මේ ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම වෙනුවෙන් ලේකම්වරියට මම ස්තුතිවන්ත වෙනවා. මම දන්නේ නැහැ, උත්තරයක් ලැබෙයිද, නැද්ද කියලා. හැබැයි, අවශ්‍ය නම් පසුව උත්තර දුන්නා කියලා ගැටලුවකුත් නැහැ.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, මෙතුමා කිව්ව වාගේම ඇත්තටම 03වැනි දා සවස 5ට ආසන්න වෙලාවක තමයි මේ ප්‍රශ්න ටික අමාත්‍යාංශයට ලැබුණේ. අපි උත්සාහ කළා පිළිතුරු ගෙන්වා ගන්න. දැනුත් එළියට ගිහිල්ලා මම කථා කළේ ඒ ගැන. මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුර ලබා ගන්න තවමත් හැකියාවක් නැහැ. පිළිතුරු දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ ප්‍රශ්නය පෙ.ව. 11.57ට අමාත්‍යාංශයට ගිහිල්ලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන සොයා බලන්නම්.

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

## II
## පුත්තලම-එළුවන්කුලම-මන්නාරම මාර්ගය ගමනාගමනය සඳහා විවෘත කිරීම
## புத்தளம்-இலவங்குளம்-மன்னார் வீதியைப் பொதுப் போக்குவரத்துக்காகத் திறத்தல்
## OPENING OF PUTTALAM-ELUVANKULAM-MANNAR ROAD FOR PUBLIC TRANSPORT

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ், கௌரவ போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சர் அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்தமைக்கு நன்றி!

வடக்கிற்கும், தெற்கிற்குமான பிரதானமான வீதியாகப் பாவிக்கப்பட்டு வந்த புத்தளம் - இலவங்குளம் - மன்னார் வீதி 1989ஆம் ஆண்டு அதிவிசேட வர்த்தமானிமூலம் B 379 எனும் இலக்கமிடப்பட்டு, வீதி அபிவிருத்தி அதிகாரசபையின்கீழ் கொண்டுவரப்பட்டது. 1990ஆம் ஆண்டுகளில் இடம்பெற்ற இடப்பெயர்வுகளுக்குப் பின்னர் கைவிடப்பட்ட இவ்வீதியூடான போக்குவரத்து, 2010ஆம் ஆண்டு மீள ஆரம்பிக்கப்பட்டது. இவ்வீதியூடான போக்குவரத்தின்மூலம் கொழும்புக்கும் யாழ்ப்பாணத்துக்கும் இடையிலான பயணத் தூரம் சுமார் 80 கிலோமீற்றரால் குறைகின்றது.

இந்த வீதியினூடான போக்குவரத்து வனவிலங்குகளுக்கு இடைஞ்சலை ஏற்படுத்துவதாகக் கூறி, அதனூடான போக்குவரத்தை நிறுத்தவேண்டும் என உயர் நீதிமன்றத்தில் ஒரு வழக்குத் தொடரப்பட்டபோதும், இவ்வீதியினூடான போக்குவரத்துக்கு எந்தத் தடையும் நீதிமன்றத்தினால் விதிக்கப்படவில்லை. 2019 யூன் மாதம் வரைக்கும் இதனூடாகப் பொதுப் போக்குவரத்துகள் இடம்பெற்றது. பின்னர் இவ்வீதியின் 37ஆவது கிலோமீற்றரில் அமைந்திருக்கும் பாலம் சேதமடைந்திருப்பதாகக் கூறிப் போக்குவரத்து இடைநிறுத்தப்பட்டதாயினும், இந்தப் பாலத்துக்கு அப்பால் அமைந்திருக்கும் கோயில் மற்றும் தேவாலயங்களில் நடைபெறுகின்ற உற்சவங்களின்போது இந்தப் பாலத்தினூடான போக்குவரத்து இடம்பெற்றது. ஹபரணை நாற்சந்தியில் இருந்து நான்கு பக்கங்களுக்கும் பயணம் செய்யும் வீதிகளும் அம்பாறை - சியம்பலாண்டுவ வீதிகளும்கூட இவ்வாறான பெரும் வனாந்தரத்தின் ஊடாகவே அமைக்கப்பட்டிருக்கின்றன. ஆனால், அவற்றினூடான போக்குவரத்துக்கு எவ்விதத் தடையுமில்லை; விலங்குகளுக்குப் பாதிப்பும் இல்லையென அனுமதி வழங்கப்பட்டு இருக்கின்றது.

ஆயினும், கடந்த ஓகஸ்ட் மாதம் இந்த வழக்கு நீதிமன்றத்தில் எடுத்துக்கொள்ளப்பட்டபோது வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தால், "இந்த வீதி ஊடாகப் பொதுப் போக்குவரத்துக்கு இடமளிக்கப்பட மாட்டாது" என்ற உத்தரவாதம் வழங்கப்பட்டதால், வழக்காளர்களால் அவ்வழக்கு வாபஸ் பெறப்பட்டது. அதன் அடிப்படையில் அந்த வழக்கு முடிவுறுத்தப்பட்டது. ஆனால், ஆச்சரியமான விடயம் என்னவென்றால், 4ஆம் மற்றும் 9 தொடக்கம் 21ஆம் பிரதிவாதிகள் அனைவரும் இந்த வீதியை முழுமையாக மூடுவதற்கு எடுக்கப்பட்ட தீர்மானம் தொடர்பாக மௌனமாக இருந்ததுடன், இவர்களை நம்பி இருந்த மக்களையும் முழுமையாக ஏமாற்றிப் பெரும் துரோகம் செய்துள்ளனர். இச்செயற்பாடுகள் இது ஒரு பாரிய சதித்திட்டமே என்ற சந்தேகத்தை ஏற்படுத்துகின்றன. நான் இது சம்பந்தமான ஆவணங்களை **table*** பண்ணுவதுடன், பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்:

01. 2025.12.13ஆம் திகதி கௌரவ ஜனாதிபதி அவர்களின் தலைமையில் இடம்பெற்ற புத்தளம் மாவட்ட விசேட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில், புத்தளம் - இலவங்குளம் - மன்னார் வீதியினூடாக 1980ஆம் ஆண்டுக்குப் பிறகு பொதுப் போக்குவரத்து நடைபெறவில்லை எனவும், இது சம்பந்தப்பட்ட வழக்கு தீர்ப்பு வழங்கப்பட்டு முடிவுறுத்தப்பட்ட தாகவும் அதிகாரிகளினால் வழங்கப்பட்ட தவறான தகவல்களினால் கௌரவ ஜனாதிபதி அவர்கள் பிழையாக வழிநடத்தப்பட்டுள்ளார் என்பது தெளிவாகத் தெரிகின்றது அல்லவா?

02. தேசிய வீதிப் போக்குவரத்து வலைப்பின்னலில் முக்கியமான ஒரு வீதியாக வீதிப் அபிவிருத்தி அதிகாரசபையினால் பராமரிக்கப்படுகின்ற B 379 இலக்க இவ்வீதியினூடான பொதுப் போக்குவரத்துச் சம்பந்தமான தீர்மானத்தை வனவிலங்குகள் பாதுகாப்புத் திணைக்களம் மேற்கொள்ள முடியுமா?

03. சுமார் 15 வருடங்களாக நடைபெற்ற இந்த வழக்கில் சம்பந்தப்பட்ட முக்கியமானதோர் அரச திணைக்கள மாக விளங்குகின்ற தேசிய வனவிலங்குகள் பாதுகாப்புத் திணைக்களம், நூற்றாண்டுகளாக மக்களால் பாவிக்கப்பட்டு வந்த இவ்வீதி தொடர்பாக இவ்வாறு அதிரடியாக நடந்து கொண்டமையானது மக்களின் தேவைகளைப் புறந்தள்ளுவதாக இல்லையா?

04. நீதிமன்றத்தினால் தீர்ப்பு ஒன்று வழங்கப்படாத சூழ்நிலையில், வன விலங்குகள் பாதுகாப்புத் திணைக்களத்தின் கருத்துகளை அடிப்படையாகக் கொண்டு முடிவுறுத்தப்பட்டுள்ள இந்த வழக்கின் பின்னணியில் உள்ள பெரும் பிரதேசம் ஒன்றின் எதிர்கால அபிவிருத்தியையும் இலட்சக்கணக்கான மக்களின் போக்குவரத்து வசதியையும் கருத்திற் கொண்டு, மீண்டும் இவ்வீதியை மக்கள் பாவனைக்கு விடுவிப்பது தொடர்பாகப் பொருத்தமான நடவடிக் கைகளை எடுக்க முடியுமா?

குறித்த வழக்கின் 17.09.2023ஆம் தேதிய journal entry இன் பிரதியையும் நான் **table***பண்ணுகின்றேன்; அதை ஹன்சாட் அறிக்கையில் உள்ளடக்குமாறு வேண்டுகிறேன்.

எனவே, நீண்டகாலமாகப் பயன்படுத்தப்பட்டு வந்த அந்த வீதியை மீண்டும் மக்களின் பாவனைக்கு வழங்க வேண்டு மென்ற கோரிக்கைக்கு முக்கியத்துவம் வழங்கி, இந்த வீதியைத் திறப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்யுமாறு கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்ளுகின்றேன். நன்றி!

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නය පිළිබඳව මටත් අවබෝධයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය විසඳීම සඳහා අප ප්‍රවේශ වන්නේ ජනතාවයි, පරිසරයයි දෙපැත්තේ තියලා නොවෙයි, එක පැත්තේ තියලායි. ප්‍රතිපත්ති සම්පාදනය තාක්ෂණික දෙයක් නොවෙයි. ඒක සමාජයීය, තාක්ෂණික, නීතිමය ආදි හැම පැත්තක්ම බලා කරන දෙයක්. ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙන ස්ථාවර නියෝග 27(2) යටතේ වන ප්‍රශ්නයට මම පිළිතුර ලබා දෙන්නම්.

01. පුත්තලම් මරිච්චිකඩ්ඩයි මාර්ගය - B 379 - මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගයකි. විල්පත්තු අභය භූමිය හරහා දිවෙන මෙම මාර්ගයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කොටස බොරළු ඇතිරූ මාර්ග කොටසක් වන අතර, එම කොටස කිලෝමීටර් 35ක දිගින් යුක්තය. දැනට මෙම මාර්ග කොටස ගමනාගමනයට සුදුසු තත්ත්වයේ නොමැත.

උතුරු නැඟෙනහිර පැවති යුධමය වාතාවරණය ආරම්භ වීමට පෙර මෙම මාර්ගයේ පොදු ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක වූ නමුත් යුධමය වාතාවරණය ආරම්භයේ සිට 2009 වර්ෂය දක්වා එනම්, යුධමය වාතාවරණය අවසන් වන තෙක් මෙම මාර්ගය පොදු ප්‍රවාහන කටයුතු සඳහා භාවිත කර නොමැත. එම කාල සීමාව තුළ මාර්ග සංවර්ධන අධිකාරියට ද මෙම මාර්ගයේ නඩත්තු කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත.

උතුරු නැඟෙනහිර පැවති යුධමය වාතාවරණය අවසන් වූ පසු එනම්, 2009 වර්ෂයේ පමණ සිට 2018 වර්ෂය දක්වා මෙම මාර්ගය භාවිත කර පොදු ප්‍රවාහන කටයුතු සිදු කර ඇති අතර, එම කාල වකවානුව තුළ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මාර්ග නඩත්තු කටයුතු හැකි අයුරින් සිදු කරන ලදී. එහෙත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් විල්පත්තු අභයභූමියට ඇතුළු වීමට දැක්වූ විරෝධතාව හා පරිසරවේදීන් විසින් වනසතුන්ට හා පරිසරයට හානි සිදු වන බව පවසා ගොනු කර තිබූ නඩුව හේතුවෙන් 2018 වර්ෂයේ සිට මේ වනතෙක් මාර්ග නඩත්තු කටයුතු සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට හැකියාවක් නොලැබුණි.

පොදු ප්‍රවාහන කටයුතු සිදු නොවීම හා මාර්ග නඩත්තු කටයුතු සිදු නොකිරීම සම්බන්ධයෙන් පුත්තලම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලදී නිරන්තරයෙන් සාකච්ඡා කළ ද, මෙම මාර්ගයේ නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට හැකියාවක් නොතිබුණි.

මේ සම්බන්ධයෙන් වසර 15ක් පමණ පැවැති අංක SC/FR/ No. 224/2010 දරන නඩුවේ තීන්දුව 2025 මැයි මස 07 වැනි දින ලැබී ඇති අතර, එම තීන්දුව මඟින් මෙම මාර්ගයේ පොදු ප්‍රවාහන කටයුතු සඳහා අවසර ලබා දී නොමැත. එමෙන්ම විල්පත්තුව අභයභූමිය හරහා දිවෙන මෙම මාර්ගයේ නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත එහි ඇතුළු වීමට ද අවසර ලබා දී නොමැත.

02. අධිකරණ නියෝගය මඟින් මෙම මාර්ගයේ පොදු ප්‍රවාහනය අත්හිටුවා ඇත. නමුත් මෙම මාර්ගය පුත්තලම හා මන්නාරම යා වන ඉතා කෙටි මාර්ගයක් වන බැවින් සියලු ආයතන සමඟ සාකච්ඡා කර සුදුසු තීරණයක් ගත යුතුව ඇත.

03. අධිකරණ නියෝගය මඟින් මෙම මාර්ගයේ පොදු ප්‍රවාහනය අත්හිටුවා ඇත. නමුත් මෙම මාර්ගය පුත්තලම හා මන්නාරම යාවන ඉතා කෙටි මාර්ගයක් වන බැවින් ජනතා ඉල්ලීම පිළිබඳව සියලු ආයතන සමඟ සාකච්ඡා කර සුදුසු තීරණයක් ගත යුතුව ඇත.

04. අධිකරණ නියෝගය මඟින් මේ වන විට මෙම මාර්ගයේ පොදු ප්‍රවාහනය අත්හිටුවා ඇත.

ගරු කථානායකතුමනි, මීට අදාළ කරන නඩු තීන්දුව ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. ඒ නිසා පළමු කරුණ තමයි, මෙතැන නොමඟ යැවීමක් නැහැ කියන එක. එම මාර්ග කිලෝමීටර් 35 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිතියි. ඒ නිසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ සම්බන්ධව තීන්දු තීරණ ගන්න පුළුවන්. ඒ නිසා නොමඟ යැවීමක් නැහැ. නමුත් 2025 මැයි මස 07 වැනි දින ලබා දුන් නඩු තීන්දුවේ මේ සම්බන්ධව කරුණු කිහිපයක් සඳහන්ව තිබෙනවා.

වෙලාව යන නිසා මම කරුණු 3ක් පමණක් ඉදිරිපත් කරන්නම්. එහි තිබෙනවා, මෙන්න මෙහෙම කරුණු තුනක්. මම ඒ කරුණු තුනම කියන්නම්, ඒ කරුණු තුනම නොකිව්වොත් වැරැද්දක් වන නිසා. I quote:

"(1) Public through traffic across the Wilpattu National Park will not be permitted on the Roads within the Park.

(2) Entry into the Park is not permitted to any individual other than members of the Armed forces and Police who are engaged in lawful duties. Any other persons will be allowed in accordance with the procedures prescribed under the Fauna and Flora Protection Ordinance.

(3) Subject to the above, there is no objections for the road to be maintained as a gravel road including undertaking of any necessary repairs and maintenance in that form."

නඩු තීන්දුවට අනුව ඒ අභයභූමිය තුළ තාර දමපු පාරක් හදන්න අපට බැහැ. ඒක අනවශ්‍ය ලෙස public access සඳහා විවෘත කරන්නත් බැහැ. ඒ වාගේම අපි දන්නවා, ඒක ඇතුළේ ආරක්ෂක අංශවල යම් යම් කඳවුරුත් තිබෙන බව. ඒ වාගේම, නාවික හමුදාවත් මේ නඩුවේ පාර්ශ්වකරුවෙක්. නාවික හමුදාවත් දැනුම් දී තිබෙනවා, ඔවුන්ට යම් සීමිත ආකාරයකට මේ පාරවල් පාවිච්චි කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා කියලා. අවසාන කරුණ විධියට කියා තිබෙනවා, මේක ගුරු පාරක් විධියට පවත්වාගෙන යාම සම්බන්ධවත්, අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කිරීම සම්බන්ධවත් ප්‍රශ්නයක් නැහැ කියලා. මේක තමයි තිබෙන ස්ථාවරය.

ගරු කථානායකතුමනි, මන්නාරම තිබෙන්නේ කොළඹින් ගොඩක් දුර නිසාත්, මන්නාරමේ තිබෙන ප්‍රශ්න ගැන කොළඹ අයට සහ ගොඩක් අයට දැනෙන්නේ ටිකක් අඩුවෙන් නිසාත් මේ වාගේ ප්‍රශ්න පිළිබඳව ළං වෙලා බලා තීන්දු ගන්න බැරි වෙලා තිබෙන්නත් පුළුවන්. අපි දකින විධියට ගහ කොළ තිබෙන්නේ වනසතුන් සහ මිනිසුන් වෙනුවෙන්. පාරවල් තිබෙන්නේත් මිනිස්සු වෙනුවෙන්. ගරු මන්ත්‍රීතුමනි, barricades දමාගෙන මේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ. ඒ නිසා මේ නඩු තීන්දුවත් පදනම් කරගෙන ගරු මන්ත්‍රීතුමා ඇතුළු මන්නාරම දිස්ත්‍රික්කයේ නියෝජිතයින්, පරිසර අමාත්‍යතුමා සහ අප සම්බන්ධ වෙලා පරිසරයත් ආරක්ෂා වන විධියක් ගැන සාකච්ඡාවක් කරමු. මොකද, විල්පත්තුවට විකල්පයක් නැහැ. ඒකත් ඇත්ත. ඒ වාගේම මන්නාරමේ මිනිස්සුන්ටත් යන්න තිබෙන පාර ඕක තමයි. ඒ කියන්නේ දැනට ඒගොල්ලන්ගේ ගමනාගමනය අතිදුෂ්කරයි. ඒ නිසා අපි පිළිගන්නවා, ප්‍රශ්නයේ තිබෙන සංවේදීකම. ලංකාවට තිබෙන්නේ එක විල්පත්තුවයි. ගරු කථානායකතුමනි, ඒ නිසා විකල්ප මාර්ග සම්බන්ධයෙන් feasibility studies කරලා බලන්න අපි උත්සාහ කරනවා. ඊට අමතරව පරිසර ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා ප්‍රශ්නයට විසඳුමක් සොයා ගන්නත් අපි කටයුතු කරනවා කියන එක තමයි ගරු මන්ත්‍රීතුමාට කියන්න තිබෙන්නේ.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றி தெரிவித்துக்கொள்கிறேன். இந்த விடயம் சம்பந்தமாக கௌரவ அமைச்சர் அவர்கள் மிகவும் தெளிவாக இருக்கின்றார். அவர் வட மாகாணத்துடன் குறிப்பாக, மன்னார் மாவட்டத்துடன் நீண்ட தொடர்புகளைக் கொண்டவர். கௌரவ அமைச்சர் அவர்களே, journal entryஐப் பார்க்கும்போது இந்தத் தீர்ப்பே குழப்பமாகத்தான் இருக்கின்றது. குறிப்பாக, வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தினர் அந்த வீதியை மக்களுக்குப் பாவிக்க விடமாட்டோம் என்று சொன்னதால்தான் உயர் நீதிமன்றம் இவ்வாறான தீர்ப்பை வழங்கியது. இதில் ஆச்சரியம் என்னவென்றால், 4 மற்றும் 9 தொடக்கம் 21 வரைக்கும் இருந்த பிரதிவாதிகள் மக்களுக்காகவே இருந்தவர்கள். அவர்களாவது எதிர்த்திருந்தால், இந்தத் தீர்ப்பு வந்திருக்காது.

கௌரவ அமைச்சர் அவர்களே, இது ஒரு நிரந்தரத் தீர்வாக அமையவில்லை. இது பல வருடகால போராட்டம்! இதிலுள்ள பிரச்சினைகள் சம்பந்தமாகப் பரிசீலித்து அரசாங்கம்தான் ஒரு முடிவெடுக்க வேண்டும். கடந்த காலங்களில் எடுக்கப்பட்ட முடிவுகளையும் எங்களால் தீர்வாக ஏற்றுக்கொள்ள முடியாது. எனவே, அனைத்துத் தரப்புக்களோடும், சிவில் அமைப்புக்களோடும் கலந்துரையாடி இது தொடர்பில் முடிவெடுப்பதற்கு ஒரு திகதியை நிர்ணயித்து விரைவாக செயற்படுவீர்கள் என்றால், இதன் உண்மைத் தன்மை தெரியும். அதனை வெளிக்கொண்டு வருவதற்கான ஏற்பாடுகளை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු පරිසර ආයතනවලට එහෙම කටයුතු කරන්න වුණු හේතුවක් තිබෙනවා. පසුගිය කාලයේ -අවුරුදු 10ක්, 20ක් විතර තිස්සේ- විශේෂයෙන්ම දේශපාලන ආශීර්වාදය සහ දූෂිත ව්‍යාපාරිකයින්ගේ මැදිහත්වීම මත සුවිශාල වන විනාශයක් කර තිබෙනවා. මන්ත්‍රීතුමාම සාක්ෂි දරනවා, මන්නාරමේ අක්කර 700ක් විතර කැපූ හිටපු සමහර ප්‍රබල දේශපාලනඥයෝ අල්ලාගෙන තිබෙන බවට. ඒ වාගේම විල්පත්තුවම නොවුණත්, විල්පත්තුවට අල්ලපු මරිච්චිකට්ටි ගම්මානයත් එක්ක තිබෙන ප්‍රදේශවල ඇත්තටම වනය විනාශ කර තිබෙනවා. ඒ, විල්පත්තුව නොවෙයි. ඊළඟට, මඩු කැලය දැනුත් කපනවා.

ඒ විධියට රටේ හැම තැනකම පරිසරය විනාශ වෙලා තිබුණා, එවකට පැවති දේශපාලන නායකත්වයේ මැදිහත්වීම මත. ඔතැන වුණේත් ඒකයි. ඔතැනත් පාර කපන්න ගියාම පාර කිලෝමීටරයක් විතර පළලට කපන්න කලින් හිටපු සමහර දේශපාලන නායකයෝ කටයුතු කළා. ගරු කථානායකතුමනි, ඒ නිසා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට සිද්ධ වුණා, මේවා පරිස්සම් කර ගැනීම සඳහා ඉතාම තද තීන්දුවලට යන්න. මන්නාරමේ විතරක් නොවෙයි, වෙන ප්‍රදේශවලත් ඒක තමයි වුණේ. වන සංරක්ෂණ නිලධාරින් ඒ ආකාරයට පරිසරය රැක ගන්න දරපු මහන්සිය අපි අගය කරනවා. නමුත් දැන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි එහෙම වනය විනාශ කරන ආණ්ඩුවක් නොවෙයි. අපි පරිසරයයි, ජනතාවයි දෙකම රැකගෙන කටයුතු කරන්නේ. මම ඒකයි මන්ත්‍රීතුමාට කිව්වේ, මේක barricade එකේ දෙපැත්තක ඉඳිමින් විසඳා ගන්න හදන්නේ නැතුව අපි එක මේසයකට ඇවිල්ලා පරිසර ඇමතිතුමා එක්කත් කථා කරලා උත්තරයක් හොයා ගන්න බලමු කියා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය. 2025.10.10 දින ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අංශවල ගැටලු විසඳීම සඳහා රජයේ වැඩ පිළිවෙළ: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය
## கல்வி மற்றும் உயர் கல்வித் துறைகளிலுள்ள பிரச்சினைகளைத் தீர்ப்பதற்கான அரசாங்கத்தின் முன்முயற்சி: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று
## GOVERNMENT INITIATIVE TO RESOLVE ISSUES IN EDUCATION AND HIGHER EDUCATION SECTORS: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් 2025.10.10 දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. සවිස්තර වාර්තාවක් සභාගත කළ හැකිය.

| | සේවයේ නියුතු සංඛ්‍යාව (අධ්‍යයන කාර්ය මණ්ඩලය) | පුරප්පාඩු සංඛ්‍යාව (අධ්‍යයන කාර්ය මණ්ඩලය) |
|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල | 10,466 | 2,953 |
| බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය | 57 | 23 |
| භික්ෂු විශ්වවිද්‍යාලය | 56 | 09 |
| සාගර විශ්වවිද්‍යාලය | 27 | 13 |
| වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය | 46 | 09 |
| සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 277 | 127 |

ඇමුණුම 01 මඟින් සවිස්තර වාර්තාව දක්වා ඇත. ගරු කථානායකතුමනි, එම ඇමුණුම මම **සභාගත*** කරනවා.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ වන විශ්වවිද්‍යාල

  රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද නිලධාරි කමිටුව වෙත විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන මඟින් ඉදිරිපත් කරන ලද අත්‍යවශ්‍යයෙන්ම සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සම්බන්ධ ඉල්ලීම -ආචාර්යවරුන්ද ඇතුළත්ව- නිර්දේශ සහිතව යොමු කරමින් පවතී.

  2025.01.01 දින සිට 2025.10.09 දින දක්වා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි පවතින ආචාර්ය, කථිකාචාර්ය, මහාචාර්ය යන තනතුරු සඳහා ඉහත පුරප්පාඩු සංඛ්‍යාවෙන් පුරප්පාඩු 1,209ක් පිරවීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දී ඇති අතර, එම බඳවා ගැනීම් අදාළ විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන මඟින් සිදු කරමින් පවතී.

  එම ඉල්ලීම්වලට අනුව අග්‍රාමාත්‍ය ලේකම් විසින් යොමු කරන ලද අංක PMO/RRPPS/2025 හා 2025.01.08 දරන 2025.01.15 දාතමින් යුතුව යොමු කරන ලද ලිපි අනුව ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා වෙන් කර ඇති අය වැය ප්‍රතිපාදන සීමාව ඇතුළත කළමනාකරණය කර ගැනීමට යටත්ව එක් එක් තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටීන්වලට අනුකූලව විධිමත් පරිදි බඳවා ගැනීමට අධ්‍යයන තනතුරු 1,209ක් සඳහා අනුමැතිය හිමි වී ඇති අතර, එම අනුමැතියට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අදාළ විශ්වවිද්‍යාල විසින් සිදු කරමින් පවතී.

02.

- කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 දරන 2025.03.25 දිනැති මහා භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය යටතේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හට 2025.01.01 සිට බලපාන පරිදි වසර 03ක කාලයක් තුළ ක්‍රියාත්මක වන පරිදි වැටුප් හා දීමනා වැඩි කිරීමට පියවර ගෙන ඇත.

  2024 වසරේ සිට දීමනා සහිතව ගණනය කරන ලද වැටුප ඇමුණුම 02 මඟින් දක්වා ඇත. ඇමුණුම 02 **සභාගත*** කරමි.

- 2019 වසරේ සිට මේ දක්වා නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රජය අනුමැතිය ලබා දී නොතිබුණි. එහෙත් 2026 අය වැය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා නව ව්‍යාපෘති 19ක්, 2026-2030 රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් කර ඇත. මෙහි සමස්ත මූල්‍ය වටිනාකම රුපියල් බිලියන 43.9ක් වන අතර, 2026 වසර සඳහා රුපියල් බිලියන 5ක ප්‍රතිපාදන මෙම යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කිරීමට යෝජනා කර ඇත.

- එමෙන්ම මීට අමතරව විශ්වවිද්‍යාලවල දැනට කෙරීගෙන යන ව්‍යාපෘති වෙනුවෙන් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා රුපියල් බිලියන 26ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

*** පුස්තකාලයේ තබා ඇත.**

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

03.

- පාසල් වසා දැමීමේ වැඩසටහනක් ක්‍රියාත්මක නොවන අතර, එක් එක් අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් එක් පාසලක් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහනක් යෝජනා කර ඇත.

- ඒ අනුව, සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සහිත පන්ති කාමරයක විධිමත් ලෙස විෂය මාලාව ක්‍රියාත්මක කෙරෙන පරිදි ක්‍රියාකාරකම් පාදක ප්‍රමිතිගත ප්‍රාථමික අධ්‍යාපනය සිසුන්ට ලබා දීමේ අරමුණෙන් යුතුව මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

04.

i. හැකිය. ඇමුණුම 03 මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම 03 **සභාගත*** කරමි.

ii. **ඉතිහාසය විෂයය**

- ඉතිහාසය හා සෞන්දර්යය විෂයයන් කිසිදු ආකාරයකින් විෂය මාලාවෙන් ඉවත් කර නොමැත.

  ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නයට මීට කලින් අවස්ථා ගණනාවකදී විස්තර සහිතව පිළිතුරු ලබා දී තිබෙනවා. නැවත වතාවක් ඒ සඳහාම තමයි මම මේ උත්තර දෙන්නේ.

- ඉතිහාසය විෂයය 6 වැනි ශ්‍රේණියේ සිට විෂය මාලාවට ඇතුළත් කර ඇත.

- ඉතිහාසය 6-9 ශ්‍රේණි සඳහා අනිවාර්යය විෂයයක් වේ. ඒ අනුව එක් වසරකට වාරයකට මොඩියුල 2 බැගින් පැය 20ක කාලයක් වෙන් කර ඇත. ඒ අනුව වසරකට පැය 60ක කාලයක් ඉතිහාසය විෂයය සඳහා වෙන් කර ඇත.

- 10-11 ශ්‍රේණි සඳහාද ඉතිහාසය විෂයය සෑම සිසු දරුවෙකුම හැදෑරිය යුතු අතර, ඒ සඳහාද වාරයකට මොඩියුල දෙක බැගින් පැය 20ක් සහ වසරක් සඳහා පැය 60ක් ලබා දී ඇත.

**සෞන්දර්යය විෂය**

- සෞන්දර්යය විෂයයන් හැදෑරීම ආරම්භ වනුයේ ප්‍රාථමික අවධියේ සිටමය. ප්‍රාථමික අවධියේදී එය සමෝධානිත - integrated - විෂයයකි.

- 6 ශ්‍රේණියේ සිට ඉහළට -9 ශ්‍රේණිය දක්වා- සෞන්දර්යය විෂයයක් හැදෑරීම සඳහා ලබා දී ඇති කාලය වාරයකට පැය 20 බැගින් වේ.

- ඒ අනුව 6-9 කාලයේදී පැය 240ක් සෞන්දර්යය විෂයය ඉගෙනුම සඳහා වෙන් කර ඇත.

- 10-11 ශ්‍රේණි සඳහාද සෞන්දර්යය විෂයය ඉගෙනීම සෑම ශිෂ්‍යයෙකුටම අනිවාර්ය වේ.

05. 1994 ගුරු සේවා ව්‍යවස්ථාව යටතේ ගුරු සේවය පිහිටවූ දින සිට මේ දක්වා වසර 30ක කාලයක් ගත වී තිබුණද, ගුරු සේවයට අදාළ ගුණාත්මක සේවාවක් ලබා ගැනීම සඳහා වූ විවිධ ක්‍රියාමාර්ග තවදුරටත් ගත යුතුව ඇත.

*** පුස්තකාලයේ තබා ඇත.**

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

එමෙන්ම ගුරු සේවයේ උසස්වීම සඳහා පැවති ක්‍රමවේදය අනුව සම්පූර්ණ කළ යුතු සේවාස්ථ පැය, ක්‍රියාත්මක වූ වෘත්තීය සමාලෝචන ක්‍රියාවලිය ආදියෙන් සමන්විත ඇගැයීම් ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී පැනනැඟී ඇති ප්‍රායෝගික ගැටලු හා ගුරු බඳවා ගැනීමේ සේවා ව්‍යවස්ථාවට අනුගත නොවී ක්‍රියාත්මක වීම යනාදී කරුණු නිරීක්ෂණය වීම මත, එකී ගැටලු ද විසඳමින් ගුරු සේවයේ වැටුප් විෂමතාව ඉවත් කිරීම මෙන්ම අධ්‍යාපනයට සම්බන්ධ සියලු සේවාවන්වල පවතින ගැටලු හා වැටුප් විෂමතා ද ඉවත් කරමින් එම සේවාවල ගුණාත්මකභාවයද වැඩිදියුණු කිරීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් විධිමත් හා නව වැඩ පිළිවෙළක් සකස් කර ගැනීම සඳහා රජයේ අවධානය යොමු වී ඇත.

එම නව වැඩ පිළිවෙළ සකස් කිරීම සඳහා ප්‍රථමයෙන් අධ්‍යාපන සභාව පිහිටුවීමට අවශ්‍ය පසුබිම මේ වන විටත් නිර්මාණය කර ඇති අතර, එම අධ්‍යාපන සභාව ඔස්සේ මෙම වැටුප් විෂමතාවද විසඳීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ඇත.

තවද, අධ්‍යාපන චක්‍රලේඛ 2006/44 අනුව දුෂ්කර හා අතිදුෂ්කර පාසල්වල සේවයේ නියුතු ගුරු හා විදුහල්පතිවරුන්ට පිළිවෙළින් රුපියල් 1,500ක් හා රුපියල් 2,500ක් ලෙස මේ දක්වා ගෙවීම් සිදු කිරීමට විධිවිධාන සලසා තිබුණි. උක්ත චක්‍රලේඛයේ සඳහන්ව තිබූ කරුණු සම්බන්ධයෙන් හඳුනාගත් තවත් ගැටලු සලකා නව නිර්ණායක අනුව දුෂ්කර/අතිදුෂ්කර පාසල් වර්ගීකරණය කර අංක 01/2024(I) දරන නව චක්‍රලේඛය නිකුත් කර ඇත. එම චක්‍රලේඛයේ සඳහන් නිර්ණායක අනුව හඳුනාගත් දුෂ්කර/අතිදුෂ්කර පාසල් සඳහා දැනට ගෙවන දුෂ්කර දීමනාවට අමතරව 2026 අය වැය මඟින් වැඩි කිරීමට යෝජිත රුපියල් 1,500 ද ලබා දීම සඳහා නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට නියමිතය.

06. පිළිතුර ඇමුණුම 04 මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

07. ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට මම මීට පෙර සවිස්තරව උත්තර දී තිබෙනවා.

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය අත්හිටුවමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලදී. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 77/2023 හා 88/2023 දරන නඩු 2025.08.06 දිනැතිව නිෂ්ප්‍රභ කරන ලද අතර, අංක 78/2023 හා 95/2023 දරන නඩු අනුව, අංක 2317 හා 2023.01.27 දිනැති ගැසට් නිවේදනය අනුව විභාගය සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්කරුවන්ගේ උපරිම වයස අවුරුදු 40 යන්න, වයස අවුරුදු 45 දක්වා මෙම අවස්ථාවට පමණක් සීමා වන පරිදි දීර්ඝ කිරීමට නියම කර ඇත.

ඒ අනුව එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අවසන් වුවද, අභියාචනාධිකරණයේ පවතින CA 92/2023 - writ - නඩුවේ අවසන් තීරණයක් ලබා දී නොමැති බැවින් විභාගය පැවැත්වීමට තවදුරටත් නොහැකි වී ඇති අතර, එම නීති කෘත්‍යයේ අවසන් තීන්දුව හා උක්ත නඩු මඟින් ලබා දෙන ලද උපරිම වයස සංශෝධනය කිරීමේ නියෝගය පරිදි එම නඩු තීන්දු ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සපුරනු ලබන අය බඳවා ගැනීමට කටයුතු කිරීම පිණිස පාසල්වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ද ඇතුළුව රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් හා සෙසු උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම මැයෙන් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් 2025.10.08 දිනැතිව මේ වන විට ඉදිරිපත් කර ඇත. ඒ සඳහා 2025.10.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර, එම තීරණය සම්බන්ධව අභියාචනාධිකරණය වෙත කරුණු වාර්තා කළ පසු එම අභියාචනාධිකරණ නඩුව අවසන් කර ඇත. ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුව ප්‍රකාරව රජයේ සේවයේ නියුතු උපාධිධාරීන් හා රජයේ සේවයේ නියුතු නොවන අනෙකුත් උපාධිධාරීන් සඳහා වෙන වෙනම විභාග පවත්වා ගුරු සේවයේ පවතින පුරප්පාඩු සඳහා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමට දැන් ගැසට් නිවේදනය නිකුත් කර තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, අද 2026 පෙබරවාරි 05වැනි දා. පසුගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ 10වැනි දා අහපු ප්‍රශ්නයකට මාස හතරක කාලයක් ගත වෙලා හෝ පිළිතුර ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා. කමක් නැහැ පිළිතුරු ලැබුණා.

විශේෂයෙන්ම ඔබතුමිය පිළිතුරු සැපයුවත්, අපි මතු කර තිබෙන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ පුරප්පාඩු සම්බන්ධයෙන්, විශේෂයෙන්ම බුද්ධිගලනය නිසා ඇති වී තිබෙන පුරප්පාඩු පිළිබඳව පැහැදිලි පිළිතුරක් ලැබුණේ නැහැ. ඒ වාගේම තමයි, පාසල් වසා දැමීමේ ප්‍රතිපත්තිය. පාසල් වසා දමන්නේ නැහැයි කියලා ඔබතුමිය කිව්වත්, පාසල් ගණනාවක එවන් ක්‍රියාවලියක් සිදු වෙනවා කියන එක අපට ප්‍රාදේශීය මට්ටමින් ආරංචි වෙනවා. ඒ පිළිබඳව අපට විධිමත් පිළිතුරක් අවශ්‍යයි.

ඔබතුමියන්ලා බලයට ආවේ ඇත්ත වශයෙන්ම ගුරුවරුන් ඉල්ලුම් කරපු ඉතිරි තුනෙන් දෙකේ දීමනාව ලබා දෙනවාය කියන පොරොන්දුව මත. තවම එය ක්‍රියාත්මක වන්නේත් නැහැ. ඒ වාගේම, මෙන්න මේ කාරණය සම්බන්ධවත් මම ඔබතුමියගේ අවධානය යොමු කරවන්න කැමැතියි. අද වන විට පාසල් පද්ධතිය තුළ දෙමව්පියන්ගෙන් මුදල් එකතු කරලා ටෙලිවිෂන් යන්ත්‍ර, smart boards ලබා ගැනීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. මම ඕනෑ නම් උදාහරණත් කියන්නම්. ඇඹිලිපිටිය, පනාමුරේ තිබෙන වීරබා ආදර්ශ විද්‍යාලයේ, පනාමුරේ තිබෙන ශ්‍රී මේධානන්ද ප්‍රාථමික විද්‍යාලයේ එවැනි මුදල් එකතු කිරීමක් කර තිබෙනවා. රාජකීය විද්‍යාලයේත් එවැනි මුදල් එකතු කිරීමක් සිදුවෙලා තිබෙනවා කියන එක සම්බන්ධයෙන් දෙමව්පියන්ගෙන් අපට තොරතුරු ලැබිලා තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරලා, මේ නිදහස් අධ්‍යාපනය ශක්තිමත් කරන්නට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ අවශ්‍ය උපකරණ ලබා දීම කළ යුතුයි කියන එක මම කියන්න කැමැතියි.

ඔබතුමියන්ලාගේ රජය තුළ ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවා, ජාතික ප්‍රතිපත්තියක් හැටියට digitization ක්‍රියාත්මක කරන්න. හැබැයි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ 1 සිට 5 ශ්‍රේණිය දක්වා - from Grade 1 to 5 - තොරතුරු තාක්ෂණ විෂය ඉගැන්වීමේ කටයුතු ආරම්භ කරන්න ඔබතුමිය අපොහොසත් වෙලා තිබෙනවා. අපේ රටේ අධ්‍යාපන ක්‍රමවේදය තුළ තොරතුරු තාක්ෂණය ආරම්භ වන්නේ Grade 6වලින්. එතකොට digitization කියන එක ඔබතුමියන්ලාගේ ජාතික ප්‍රතිපත්තිය

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

නම්, ඇත්ත වශයෙන්ම - දැන් ලෝක ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ K-12 කියන එක; from Kindergarten to twelfth grade කියන එක - එය කෙසේ වෙතත්, අඩුම ගණනේ පළමුවැනි ශ්‍රේණියෙන්වත් IT අධ්‍යාපනය පටන් ගන්නට ඕනෑ. ඒක ක්‍රියාත්මක වෙන්නත් ඕනෑ ඇත්ත වශයෙන්ම ඉංග්‍රීසි මාධ්‍යයෙන්. ඒ දේ සිද්ධ වෙලාත් නැහැ. ඒ පිළිබඳවත් ඔබතුමියගේ අවධානය යොමු කරවනවා.

අවසාන වශයෙන් මම පැහැදිලි කිරීමක් කරගන්න කැමැතියි. මොකද, මේ ප්‍රශ්නයට උත්තරය ලබා දෙන්න මාස 4ක් ගිහිල්ලා තිබෙනවා. ඒ කාලවකවානුව තුළ මේ ගැටලු උග්‍රවෙලා තිබෙනවා. අපට පැහැදිලිව දැනගන්නට ලැබිලා තිබෙනවා, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ Faculty of Graduate Studies වහන්න යනවා කියලා. ඒ පිළිබඳවත් පැහැදිලි උත්තරයක් අපට අවශ්‍යයි. ඒක ඇත්තද? එහෙම වෙනවා නම් ඒක ඇත්ත වශයෙන්ම නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීමක්. ඒ වාගේම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ Faculty of Dental Sciencesත් ඉවත් කිරීමේ සූදානමක් තිබෙනවා කියලා අපට දැනගන්නට ලැබෙනවා. මේ නිදහස් අධ්‍යාපනය කප්පාදු කරන්නට ඔබතුමියන්ලා කටයුතු කරනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපේ ගරු විපක්ෂ නායකතුමා නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් මේ විධියට පෙනී සිටීම ගැන මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. එතුමා නියෝජනය කරපු දේශපාලන ධාරාවේ තිබුණු ප්‍රතිපත්තිය මේක නොවෙයි. නමුත්, දැන්වත් නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් මේ විධියට කථා කරන එක ගැන මම මුලින්ම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මම ඒ වෙනුවෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මෙතැනදී එතුමා මතු කරපු ප්‍රශ්න ගණනාවක් මම අද උත්තර දුන්න ප්‍රශ්නයට අදාළ නැහැ. ඒ නිසා මේ සියල්ලටම මම මේ වෙලාවේ පිළිතුරු දෙන්න ගියොත් මට සෑහෙන්න කාලයක් ගත වෙනවා. ගරු කථානායකතුමනි, සමාජ මාධ්‍ය හෝ වෙන වෙන විධියට ගොසිප්වලින් එන කරුණු මත ප්‍රශ්න යොමු කරන්න එපා කියලා මම එතුමාගෙන් ඉතාමත්ම කාරුණිකව ඉල්ලා සිටිනවා. අපි නිදහස් අධ්‍යාපනය කප්පාදු කිරීමටවත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ Faculty of Dental Sciences වහන්නවත් කිසිම තීරණයක් අරගෙන නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වික්‍රමාරච්චි එක?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය පිළිබඳ වාර්තාවක් මම මෙතැන සභාගත කර තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමාත් ඒක හොඳට දන්නවා. ඒ ආයතනය ඉතාමත්ම වැරදි විධියට, නිවැරදි තීන්දු තීරණ ගන්නේ නැතිව විවෘත කරලා විවිධ උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා open කිරීම නිසා එතැන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඉතාමත්ම අසරණ තත්ත්වයකට පත් කරලා තිබෙනවා. ශිෂ්‍යයන්ගේ පැත්තේ ඉඳගෙන අපි ඒවා නිවැරදි කරන්න ක්‍රියා මාර්ග ගන්නවා. ඒ පිළිබඳව දේශපාලන තීන්දුවක් නොවෙයි ගත්තේ, UGC එකෙන් පත් කරපු විද්වත් කමිටුවෙන් ලබා දෙන නියෝග තමයි අපි ක්‍රියාත්මක කරන්නේ.

ගරු කථානායකතුමනි, මේ අවුරුද්දට පාසල් පද්ධතියට smart boards 1,500ක් විතර බෙදාදීමේ වැඩ පිළිවෙළ අපි දැන් පටන් අරගෙන තිබෙන්නේ. අපි අමාත්‍යාංශයක් හැටියට මීට අදාළව චක්‍රලේඛ නිකුත් කරලා තිබෙනවා. ඒක මම කලිනුත් කියලා තිබෙනවා. පාසල් මට්ටමින් දෙමව්පියන්ගෙන් මුදල් එකතු කිරීමට කිසිම අවශ්‍යතාවක් නැහැ. ඒක කරනවා නම් වහාම නවත්වන්න කියලා මම ප්‍රසිද්ධියේ කියනවා. මොකද, අපි දැන් ද්විතීයික පාසල් සියල්ලටම smart boards බෙදාදීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ පිළිබඳව කිසිම ගැටලුවකුත් නැහැ.

ගරු කථානායකතුමනි, විෂය මාලා අන්තර්ගතය පිළිබඳ තීරණ දේශපාලන පක්ෂ ගන්නේ නැහැ. ඒවා ගන්නේ ඒවාට අදාළ විද්වතුන්. ඔවුන්ගේ උපදෙස් මත 1-5 වසර සඳහා අපි යම්කිසි විධියකට තාක්ෂණය හඳුන්වාදීමක් කරන අතර ඒක ICT විෂයයක් කියලා වෙනම උගන්වන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒක තමයි අපට දීලා තිබෙන උපදෙස, ඒ මත තමයි අපි ක්‍රියාත්මක වන්නේ. ඔබතුමාත් හොඳින් දන්නවා, මේ වෙලාවේ ඒ පිළිබඳව ගෝලීය වශයෙනුත් සාකච්ඡා වන බව.

මම හිතන්නේ වෙන රටවල වුණත් ICT විෂයයක් කියලා වෙනමම 1-5 වසරට හඳුන්වාදීමක් කරලා නැහැ. නමුත්, තාක්ෂණ ලෝකයට පුරුදු කිරීමක් යම්තාක් මට්ටමකට සිද්ධ වනවා. නමුත් ඒක ඉතාම පරිස්සමින් කරන්න ඕනෑ දෙයක් කියන එක අද ලෝකයේ සිදුවන සාකච්ඡා එක්කත් අපි හඳුනාගෙන තිබෙනවා. කොයි වයසට කොච්චරක් දුරට තාක්ෂණය විවෘත කරනවාද, නැද්ද කියන තීරණය ගන්න ඕනෑ විද්වතුන්ගේ උපදෙස් මත හරි පරිස්සමින්. ඒ පිළිබඳව අපි සංවාදයක් ආරම්භ කරලා තිබෙන්නේ. විද්වතුන් අපට ලබා දෙන උපදෙස් මත ළමා ආරක්ෂණය පිළිබඳවත් තීන්දුවක් අරගෙන, අධ්‍යාපනයේදී වෙන්න ඕනෑ හොඳම පැත්තත් බලලා තමයි අපි ඒක ක්‍රියාත්මක කරන්නේ. එහෙම නැතිව අපි ඒ පිළිබඳව දේශපාලන තීන්දුවක් ගන්නේ නැහැ, ගරු කථානායකතුමනි. විපක්ෂ නායකතුමා කිව්වාට අපි ඒක උපදෙසක් හැටියට ගන්නේත් නැහැ, ඒකට උපදෙස් ගත යුතු අදාළ අය ඉන්නවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) අනුව ප්‍රශ්නයක් ඇහුවාම පිළිතුරු ලබා දීමේදී ඒක නිවැරදිව සිදු වෙන්න ඕනෑ. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ Faculty of Graduate Studies ඉවත් කරනවා කියලා UGC එකේ Secretary උපකුලපතිට යවපු ලිපිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මේක බොහොම වැදගත් දෙයක්, ගරු කථානායකතුමනි. මේ තුළ ඉදිරිපත් කරන කරුණු-කාරණා නිර්ව්‍යාජව ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ වාගේම දැන් එතුමිය කිව්වා, දෙමව්පියන්ගෙන් සල්ලි එකතු කරලා පාසල් පද්ධතියට smart boards ගන්න එපා කියලා. ඒක චක්‍රලේඛයක් හරහා ඉදිරිපත් කරන්න ඔබතුමිය සූදානම්ද, චක්‍රලේඛයක් හරහා පාසල් පද්ධතියේ සියලු විදුහල්පතිවරුන්ට ඒ පණිවුඩය යවන්න ඔබතුමිය සූදානම්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට ස්ථාවර නියෝග 27(2) යටතේ එක පැහැදිලි කර ගැනීමයි කරන්න පුළුවන්.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා නියෝගයක් නිකුත් කරලා තිබෙනවා, එහෙම සල්ලි එකතු කරන්න එපා කියලා.

ගරු කථානායකතුමනි, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ඒ Faculty එක සම්බන්ධව ගෙන තිබෙන තීන්දුව පදනම් වුණු වාර්තාව කියවලා බලන්න කියලා මම ගරු විපක්ෂ නායකතුමාට ආරාධනා කරනවා. ඒ වාර්තාව තුළ තිබෙනවා, UGC එකේ ක්‍රියාමාර්ග කොච්චර violate කරලාද එතැන පාඨමාලා ආරම්භ කළේ කියලා. ඒ විධියට violation එකක් කරලා ශිෂ්‍යයින්ට අසාධාරණයක් සිද්ධ වන විධියට තීන්දු-තීරණ ගත්තාම ඒක නිවැරදි කරන්න අපි තීන්දු-තීරණ ගන්න ඕනෑ. කිසිම අධ්‍යයනයක් නැතිව FGS එක පවත්වාගෙන ගිහින් තිබෙන්නේ හරියට ශිෂ්‍යයින් ඉඳලාත් නැතිව, හරියට ආචාර්ය මණ්ඩලයක් ඉඳලාත් නැතිව. මම කියන දේ පිළිගන්න බැරි නම් ඒ වාර්තාව කියවලා බලන්න කියලා මම විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාර්තාව සකස් කළේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ විශ්වවිද්‍යාල පද්ධතියේම කමිටුවක්. එහෙම නම් එතුමා ඒ කමිටුවේ වාර්තාව ප්‍රතික්ෂේප කරනවාද කියන එක අපට අහන්න වනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, අඩු පාඩුවක් තිබෙනවා නම් ඒක නිවැරදි කරන්නට Faculty එකම වහලා දමන එක වැරදියිනේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඒක විවාදයකට භාජන කරන්න අවස්ථාවක් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඔබතුමා විපක්ෂ නායකතුමා නැඟිට්ටාම එතුමා විපක්ෂ නායක නිසා අවස්ථාව දෙනවා. නමුත්, විපක්ෂ නායකකම හැම අවස්ථාවකම භාවිත කරනවා නම් ඒක සාධාරණ නැහැ. ඒ ආදර්ශය දෙන්න එපා. සමහර කරුණු පාර්ලිමේන්තුවේදී කියන්න ඕනෑ නැහැ, එතුමාට ලේවලින් අත්සන් කරලා දෙන්න පුළුවන්. කරන්න පුළුවන් නේ? විභාග එපා, විභාග පවත්වන්නේ නැතුව ගුරුවරුන් ගන්න, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා, ඒවා සම්බන්ධ තීරණ ලේවලින් අත්සන් කරලා දෙන්න පුළුවන් ඒවා නේ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න. *[බාධා කිරීම්]*

## සියලු සිසුන් සඳහා සමාන අධ්‍යාපන අවස්ථා සැලසීම: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

### சகல மாணவர்களுக்கும் சமமான கற்கை வாய்ப்பளித்தல்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

### ASSURANCE OF EQUAL EDUCATIONAL OPPORTUNITIES FOR ALL STUDENTS: STATEMENT BY PRIME MINISTER, MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, the Answer to the Question raised by the Hon. K. Kader Masthan on 24th November, 2025 under Standing Order No. 27(2) is as follows:

1. Yes.

   Several programmes have already been introduced in accordance with the Government's policy decision to meet the basic needs of school

children. Accordingly, all school students are provided with textbooks, school uniforms and the "Suraksha" Health Insurance. In addition, vouchers are provided to students from Grade 6 to 13 to obtain sanitary pads and also, midday meals are provided to all primary school students and schools with a student population of less than 100. Further, in accordance with the Government's policy decision, vouchers are issued to all students in schools with a student population of less than 250, to students who have passed the Scholarship Exam, but have not been admitted for the "Aswesuma" Social Welfare Relief Programme and to students studying in estate schools with a student population of less than 500.

Accordingly, a provision of Rs. 57.2 billion has been allocated in year 2025 for the above programmes for school students, and necessary measures are to be taken in the future to increase the number of students receiving those benefits.

2. As stated previously in response to question No. 01, the attention of the Ministry of Education has been focused on expanding the above programmes, hence more students who need the above benefits could receive them. We are obtaining further information so that students who really need those benefits would receive them; we are continuously monitoring and updating the data we have about those students.

3. The GCE (O/L) Examination for the year 2025 is scheduled to be held from 17th to 26th February. Those days fall during the holy month of Ramadan for Muslims, and in previous years also - for example, in 2024 - exams had been held during the Ramadan period.

A discussion was held regarding this matter with the Provincial Director of Education, Eastern Province and other Directors and it was decided that it is possible to conduct this examination without any issue.

At another discussion held with the General Secretary of the All Ceylon Jamiyyathul Ulama, ACJU, Mr. Arkam Nooramith, the former Commissioner General of Examinations, Mr. H.J.M.C. Amith Jayasundara and the Commissioner of Examinations (School Examinations Organization and Results), Mrs. M. Jeevarani Punitha, it was stated that conducting the examination during this period would not be problematic.

The Examination Calendar had been designed considering the factors raised in part 3 of the Question. Accordingly, the Grade 5 Scholarship Examination and the GCE (A/L) Examination falls in early August and the GCE (O/L) Exam falls in December every year. That is the schedule we are trying to return to.

4. The third academic semester for students currently studying in Grade 11 was scheduled to end on 19th December, 2025. That happened and accordingly, those students had almost two months to wait for the examination. During that period they were on study leave and had ample time to study. If we further postpone this exam, students will have to wait for a longer time to sit for the exam.

Due to various reasons in the past - for example, the need to change schedules - it was not possible to hold the GCE (Advanced Level) Examination on the relevant dates as scheduled previously. The annual examination timetable was changed due to the COVID-19 pandemic and up to the end of 2025, it was not possible to adjust the annual examination timetable.

As the third semester of Grade 11 students of 2025 ended in December, 2025, enough study time has been given for them and the GCE (O/L) Exam, 2025 will be held in February, 2026. Extra study time has also been included. Therefore, we do not think there is any need to postpone the exam any further.

In the event the GCE (O/L) Exam, 2025, which is scheduled for February, 2026, is postponed, Hon. Speaker, it will affect the 2026 school examination schedule as well. So, we are trying our best to return to the normal time schedule so that the school examination timetable could take place in a regular manner.

The GCE (A/L) Examination, 2025 concluded on the 20th of January, 2026. We had to make several adjustments to that schedule also because of the "Ditwah" interruption, as you know. But, however, with great effort, we managed to conclude that exam by the 20th of January.

So, the time period between the GCE (A/L) Examination, 2025 and the GCE (O/L) Examination, 2025 is short and if we, in any way, change the dates again, it would cause further complications and disrupt the GCE (O/L) and GCE (A/L) Examinations of 2026, which have already been scheduled, as well. Therefore, in order to make sure that justice is done across the board and to ensure that, at least from 2026, we come back to the regular examination schedule, we have been compelled to hold the GCE (O/L) Exam on the scheduled dates. Then, from 2026 onwards, there would no longer be this clash. We understand that there is a concern and here, we are trying our best to get back to the regular calendar so that there is no disruption. If we hold this examination in February as scheduled, then from 2026, we would be able to make sure that it does not clash with any major religious holidays, Hon. Speaker.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

நன்றி. கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பிரதம அமைச்சர் அவர்கள் இதுபற்றி அகில இலங்கை ஜம்இய்யதுல் உலமா சபையின் செயலாளர் மற்றும் ஏனைய முஸ்லிம் பிரதிநிதிகளோடு கலந்தாலோசித்துத் தீர்மானிக்கப்பட்டதாகக் கூறியிருந்தார். நான் நினைக்கின்றேன், அகில இலங்கை ஜம்இய்யதுல் உலமா சபையினர் இந்த விடயம் சம்பந்தமாக விளக்கமாக, செயலாளருக்கோ அல்லது கௌரவ பிரதம அமைச்சருக்கோ சொல்லி, 10 நாட்கள் முன்னராக பரீட்சைத்

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

திகதியை நிர்ணயித்து, 17ஆம் திகதி பரீட்சை முடிவடையக் கூடியவாறு தீர்மானித்திருந்தால், அது சாலப் பொருத்தமாக இருந்திருக்கும். ஏனென்றால், ரமழான் காலத்தில் நோன்பு இருக்க வேண்டும்; இரவில் விழித்திருந்து தொழ வேண்டும். இதனால் மாணவர்களுக்குப் பாரிய பிரச்சினை இருக்கிறது. ஆனால், இலங்கை ஜம்இய்யதுல் உலமா சபையினருடன் பேசி முடிவு எடுக்கப்பட்டதாகச் சொன்னதற்குப் பிறகு இதில் நாங்கள் ஒன்றும் கருத்துச் சொல்வதற்கில்லை.

இலங்கை ஜம்இய்யதுல் உலமா சபையினால் சரியான தெளிவுகள் கொடுக்கப்பட்டிருந்தால், இந்தப் பிழை ஏற்பட்டிருக்காது. உண்மையில் சமய விவகாரங்களுக்குப் பொறுப்பான அமைச்சின்கீழ் முஸ்லிம்களுக்கு அதேமாதிரி இந்துக்களுக்கு என்று ஒவ்வொரு சமயத்துக்குமான பிரிவுகள் இருக்கின்றன. எதிர்காலத்தில் அவர்களுடனும் கலந்தாலோசித்து முடிவுகளை எடுக்க வேண்டும். உண்மையில் நோன்பு இருந்து, இரவு தொழுகையில் ஈடுபட்டு, காலையில் சென்று மாணவர்கள் பரீட்சை எழுதுவது என்பது பாரிய பிரச்சினை. கௌரவ பிரதமர் அவர்களே, இப்பொழுது எடுக்கப்பட்டுள்ள முடிவுக்கு அமைய இம்முறை பரீட்சை நடைபெற்றாலும் இனிவரும் காலங்களில் இவ்வாறு நடைபெறாமல் பார்த்துக் கொள்ளுங்கள்!

மேலும், குறிப்பாக எங்களுடைய பகுதிகளில் 200க்கும் மேற்பட்ட மாணவர்கள் கல்வி கற்கின்ற, கஷ்டப் பிரதேச மற்றும் அதிகஷ்டப் பிரதேசப் பாடசாலை மாணவர்களுக்கு - அங்கு யுத்தத்தினால் ஏற்பட்ட பாதிப்புகள் உட்படப் பல பிரச்சினைகள் காணப்படுகின்ற நிலையில் - அவர்களுக்கு காலணி voucher அல்லது கற்றல் உபகரணங்கள் கொள்வனவுக்குரிய 6,000 ரூபாய் கொடுப்பனவு போன்ற எதுவுமே கொடுக்கப்படுவதில்லை. இந்தத் தகவல்கள் எனக்குப் போனவருடமே தரப்பட்டது. 2025இல் கொடுபடவில்லை, பரவாயில்லை. இப்போது 2026இலும் 200க்கும் மேற்பட்ட மாணவர்களைக் கொண்ட பாடசாலைகளுக்குக் கொடுக்கப்படவில்லை. அதுதான் இதிலிருக்கின்ற பிரதான பிரச்சினை! அந்த விடயம் தொடர்பாகக் கொஞ்சம் பரிசீலனை செய்யுங்கள்! 200க்கும் குறைவான மாணவர்கள் கல்வி கற்கின்ற பாடசாலைகளுக்குக் கொடுப்பனவு வழங்கப்படுவதாக இருந்தாலும், கஷ்டப் பிரதேச, மற்றும் அதிகஷ்டப் பிரதேசப் பாடசாலை மாணவர்களுக்கு அங்கு 200க்கும் மேற்பட்ட மாணவர்கள் என்ற விடயத்தைப் பார்க்காமல், அவர்களுக்கும் குறித்த கொடுப்பனவை வழங்குமாறுதான் நான் கேட்டிருந்தேன். கௌரவ பிரதமர் அவர்களிடம் அதற்குரிய ஏற்பாடுகளைச் செய்து தருமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Hon. Speaker, with regard to examinations, we are doing our best get back to the normal schedule and we are hopeful that from 2026 onwards, there would not be a clash with any major religious festival, which is why we are again scheduling the examinations in August and December, as was the custom earlier.

With regard to welfare benefits, all the students who are from families receiving "Aswesuma" get the stationery allowance. That is given to all such students, irrespective of the number of students in the school. We are trying our best to expand this programme for shoe vouchers as well. This year, in two provinces, we are piloting a programme, under which local manufacturers are providing the shoes. If we are successful with that - the cost would come down if we are able to provide the shoes with local manufacturers - we will do our best to expand that programme further. So, we are trying our best to expand this programme. Actually, in 2026, we have included children who are recipients of the Grade 5 Scholarship also as eligible for receiving shoe vouchers.

So, in this way, every year, we are trying to make sure that all the children who need these social welfare benefits receive them, to enable them to access school. And, we are trying to identify those children correctly so that we could provide them with those benefits as much as possible.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026.01.06 දින ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ මතු කරන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

## ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර වෙළෙඳ සාකච්ඡාවල වත්මන් තත්ත්වය: වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## இலங்கைக்கும் அமெரிக்காவுக்குமிடையிலான வர்த்தகப் பேச்சுவார்த்தைகளின் தற்போதைய நிலை: வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரினது கூற்று

## CURRENT STATUS OF TRADE NEGOTIATIONS BETWEEN SRI LANKA AND THE UNITED STATES: STATEMENT BY MINISTER OF TRADE, COMMERCE, FOOD SECURITY AND CO-OPERATIVE DEVELOPMENT

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ එක්සත් ජනපද අන්‍යෝන්‍ය තීරු බදු සම්බන්ධයෙන් ප්‍රශ්න 8ක් යොමු කර තිබෙනවා. ඒ ප්‍රශ්න 8ට අදාළව පිළිතුරු තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, පිළිතුරු කියවන්නත් පුළුවන්, සභාගත කරන්නත් පුළුවන්, වෙලාව ඉතිරි කර ගැනීම අරමුණු කරගෙන.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, 3 වැනි ප්‍රශ්නයට සහ 5 වැනි ප්‍රශ්නයට පිළිතුර කියවන්න පුළුවන්ද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳයි.

3. දෙරට රජයන් අතර ස්ථාපිත මාර්ග හරහා එක්සත් ජනපදය සමඟ සාකච්ඡා සිදු කරමින් පවතී. එක්සත් ජනපද පාර්ශ්වයෙන් එක්සත් ජනපද වෙළඳ ප්‍රතිපත්තිය හා ජාත්‍යන්තර වෙළඳ සාකච්ඡා සඳහා වගකිව යුතු ප්‍රධානතම නියෝජිතයන් වන එක්සත් ජනපද වෙළඳ නියෝජිත ආයතනයේ - USTR - නිලධාරීන් සමඟින් සාකච්ඡාවට බඳුන් වන කරුණු ප්‍රකාරව එක්සත් ජනපද

රජයේ අනෙකුත් අදාළ නියෝජිතයන් සාකච්ඡාවන්ට සම්බන්ධ වේ.

ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලැබූ මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් මුලසුන දරන කණ්ඩායමක් සාකච්ඡාවලට සහභාගී වන අතර, ශ්‍රී ලංකා මහ බැංකු අධිපති, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමූපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ ගරු ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශක එම කමිටුවේ අනෙකුත් සාමාජිකයන් ලෙස කටයුතු කරයි.

අමාත්‍ය මණ්ඩලයේ තීරණවලට අනුකූලව මෙම සාකච්ඡා සිදු කරනු ලබයි. ඊට අමතරව, සමායෝජිත හා මැනවින් දැනුවත් ජාතික ස්ථාවරයක් සහතික කරනු වස් එක් එක් සාකච්ඡා වටයට පෙර විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය ඇතුළු අදාළ රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මෙන්ම නියාමන නියෝජිතායතන සමඟ උපදේශන පවත්වනු ලබයි. එසේම උචිත පරිදි පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් සමඟ ද උපදේශන පවත්වනු ලැබේ.

එබැවින්, ශ්‍රී ලංකාවේ අභිලාෂයන් සුරක්ෂිත කිරීම පිණිස යෝග්‍ය අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය - inter -agency coordination - සහිතව, නිසි පරිදි බලය පවරනු ලැබූ ආයතනික සැකසුම් හරහා සාකච්ඡා ක්‍රියාදාමය සිදු කරනු ලබයි.

5. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහායෙන් සිදු කරනු ලබන ප්‍රතිසංස්කරණ වැඩසටහන, ආර්ථික අන්තරායකාරී තත්ත්වයන් සහ මෑත කාලීන ආර්ථික සංකෝචන කාල පරිච්ඡේදය ඇතුළුව ශ්‍රී ලංකාවේ අවස්ථානුගත ආර්ථික තත්ත්වයන් රජයේ සාකච්ඡා කණ්ඩායම එක්සත් ජනපදය සමඟ සිය සාකච්ඡාවලදී නිරන්තරයෙන් අවධාරණය කර තිබේ.

ඇමෙරිකානු දූත මණ්ඩලය මෑතකදී මෙරට සිදු කළ සංචාරයේදී, "දිට්වා" සුළි කුණාටුවෙන් ආර්ථිකයට හා සමාජයට සිදු වූ බලපෑම රජය විස්තර කරන ලදී.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
4 වැනි ප්‍රශ්නයට අදාළ ඒ විස්තර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා නේද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්, අනිවාර්යයෙන්ම.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
6 සහ 7වැනි ප්‍රශ්නවලටත් පිළිතුරු කියවන්න. ඒ ඇති.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

6. කලාපයේ ඇතැම් රටවල් සමඟ එක්සත් ජනපදය මෑතකදී ඇති කරගත් වෙළඳ විධිවිධාන මඟින් තීරුබදු රහිත -zero-duty- ප්‍රවේශයක් ලබා නොදෙන බව පැහැදිලි කිරීම වැදගත් වේ. සිය අන්‍යෝන්‍ය තීරුබදු රාමුව යටතේ 2025 ජූලි 31 දින එක්සත් ජනපදය විසින් නිකුත් කළ විධායක නියෝගය ප්‍රකාරව, අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ (ආසියාන්) තෝරාගත් රටවල් සඳහා අදාළ අන්‍යෝන්‍ය තීරුබදු අනුපාත - reciprocal tariff rates - වෙනස් කොට දක්වනු ලැබීය. මෙම රාමුව යටතේ තායිලන්තය හා කාම්බෝජය සියයට 19ක අන්‍යෝන්‍ය තීරුබදු අනුපාතවලට යටත් වන අතර, ලාඕසය ජනරජය වඩා ඉහළ සියයට 40ක තීරුබදු අනුපාතයකට යටත් වේ. ඒ අතර ශ්‍රී ලංකාව සියයට 20ක අන්‍යෝන්‍ය තීරුබදු අනුපාතයකට යටත් වේ. මෙම අනුපාතවලින් නිරූපණය වන්නේ ස්වයංක්‍රීය වරණීය සැලකීම්වලට - automatic preferential treatmentsවලට - වඩා සිය වෙළඳ පාර්ශ්වකරුවන්ට එක්සත් ජනපදය විසින් සිදු කරනු ලැබූ ඒ ඒ රටට විශේෂිත තක්සේරු කිරීම් වේ.

වඩා ගැඹුරු ආර්ථික ඒකාබද්ධතාවක්, වඩා ශක්තිමත් වෙළඳ ශික්ෂාවන් සහ එක්සත් ජනපදය ඇතුළුව ප්‍රධාන වෙළඳ පාර්ශ්වකරුවන් සමඟ තිරසර සබඳතාවක් සඳහා හැකියාව ඇති කරමින් මෙම ආසියානු සාමාජිකයන් වඩා පුළුල් වෙළඳ පද්ධතියක කොටසක් වී ඇත. පසුගිය කාලය මුළුල්ලෙහි, ආසියානු සංගමයේ සාමාජික රාජ්‍යයන් කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරීත්වය -RCEP - වැනි බහු පාර්ශ්වික සහ කලාපීය වෙළඳ ගිවිසුම්වලට එළඹ ඇති අතර එමඟින් ඔවුන්ගේ දේශීය වෙළඳාම සහ නියාමන රාමු ඒවාට ගැළපෙන සේ පෙළ ගස්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපදය ඇතුළුව එම රටවල් සමඟ වෙළඳ සාකච්ඡාවල නිරතවීමේදී, ශ්‍රී ලංකාවට සාපේක්ෂව එම රටවල් වඩා වාසිදායක තත්ත්වයක සිටියි.

සියයට 20ක් වූ ශ්‍රී ලංකාවේ අන්‍යෝන්‍ය තීරුබදු අනුපාතය, පළමුව ප්‍රකාශයට පත් කළ සියයට 44ක අන්‍යෝන්‍ය තීරුබදු අනුපාතය සමඟ සැසඳීමේ දී සාකච්ඡා ආරම්භ වීමෙන් පසුව එක්සත් ජනපදය සමඟ සිදු කළ සාර්ථක සාකච්ඡා ප්‍රයත්නයන් නිරූපණය කරයි. මෙම අඩු කිරීම ඒ ඒ රටට විශේෂිත ඇගයීම් රාමුව තුළ එක්සත් ජනපදය සමඟ සාධනීයව කටයුතු කිරීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව නිදර්ශනය කරයි. ඇතැම් ආසියානු සංගම් සාමාජිකයන් විසින් භුක්ති විඳින ඉහළ වරණීය ප්‍රවේශයක් ලබා ගැනීමට නොහැකි වුවත්, මෙම සාකච්ඡා හරහා ශ්‍රී ලංකාව සිය අපනයන සඳහා වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කර ගැනීමේදී අර්ථාන්විත ප්‍රගතියක් අත් කර ගෙන තිබේ.

7. ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතර වෙළඳ සබඳතාවයේ ස්වභාවය වන්නේ ව්‍යුහාත්මක වෙළඳ අසමතුලිතතාවයකි. එනම්, ශ්‍රී ලංකාව එක්සත් ජනපද වෙළෙඳ පොළට අපනයනය කරන ප්‍රමාණයට වඩා සැලකිය යුතු ලෙස වැඩි

[ගරු වසන්ත සමරසිංහ මහතා ]

ප්‍රමාණයක් එක්සත් ජනපදයෙන් ආනයනය කරයි. එක්සත් ජනපදයේ නව තීරුබදු ක්‍රියාමාර්ග හඳුන්වාදීමට අදාළ සාකච්ඡා ඇතුළුව, මෑතකාලීන මැදිහත්වීම්වලට යටත්ව පවතින වැදගත් සන්දර්භීය සාධකයක් ලෙස මෙම අසමතුලිතතාව ක්‍රියාත්මක විය.

දැනට මෙම අවධියේදී, ශ්‍රී ලංකාව කිසිදු අවසන් කරන ලද හෝ බැඳීම් සහිත එකඟතාවකට එළඹී නොමැත. ශ්‍රී ලංකාවේ ආර්ථික අවශ්‍යතා සහ දේශීය ප්‍රමුඛතාවන් ආරක්ෂා කර ගනිමින්, වෙළෙඳ අසමතුලිතතාවන් විසඳීමට උපකාර කළ හැකි ක්ෂේත්‍ර සහ නිෂ්පාදන හඳුනා ගැනීම කෙරෙහි දැනට පවතින සාකච්ඡා අවධානය යොමු කරයි.

වෙළෙඳ ප්‍රවාහයන් සම්බන්ධයෙන් ගත් කල, 2022 සිට 2024 දක්වා වර්ෂ සඳහා ප්‍රධාන නිෂ්පාදන අංශ අනුව වෙන් කරන ලද, එක්සත් ජනපදය වෙත සිදු කළ ශ්‍රී ලංකාවේ අපනයන සහ එරටින් සිදු කළ ආනයන පිළිබඳ විස්තර යොමුව ඇමුණුම මඟින් මෙම සභාවට ඉදිරිපත් කරමි. 2025 වර්ෂය සඳහා වන දත්ත තවමත් සකස් කරමින් පවතින අතර, ඒවා අවසන් වූ පසු ලබා දීමට කටයුතු කරනු ඇත.

**Annex-I**

**Sri Lanka's Major Export Items to the USA (2022-2024)**

**Value in US$ Mn.**

| HS | Description | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| 61&62 | Apparel | 2277.38 | 1784.22 | 1874.98 |
| 4012.90 | Retreaded or used pneumatic tyres of rubber | 169.89 | 183.18 | 185.93 |
| 40.15 | Articles of apparel and clothing accessories | 70.48 | 47.68 | 57.00 |
| 84.31 | Parts suitable for use solely or principally with the machinery of headings 84.25 to 84.30. | 57.93 | 72.16 | 55.84 |
| 38.02 | Activated carbon; | 61.56 | 43.48 | 49.15 |
| 40.11 | New pneumatic tyres, of rubber | 46.74 | 45.70 | 46.82 |
| 72&73 | Iron and steel | 50.56 | 50.77 | 46.71 |
| 09.02 | Tea | 40.30 | 36.73 | 44.22 |
| 90 | Optical, photographic, cinematographic, measuring, checking, precision, medical or surgical instrument | 29.73 | 31.88 | 38.16 |
| 63 | Other made-up textile articles; sets; | 31.89 | 28.91 | 30.56 |
| 09.06 | Cinnamon and cinnamon-tree flowers | 39.44 | 27.86 | 27.83 |
| 71.03 | Precious stones and semi-precious stones, | 50.34 | 42.31 | 26.33 |
| 16 | Preparations of meat, of fish or of crustaceans | 8.37 | 12.01 | 21.47 |
| 40.08 | Plates, sheets, strip, rods and profile shapes, of vulcanized rubber | 8.40 | 10.61 | 21.06 |
| 99.99 | Other Exports | 348.30 | 344.38 | 383.44 |
| **Total Exports** | | **3,291.30** | **2,761.88** | **2,909.51** |

***Source: Sri Lanka Customs***

**Sri Lanka's Major Import Items from the USA (2022-2024)**

**Value in US $ Mn.**

| HS | Description | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| 23 | Residues and waste from the food industries, prepared animal fodder | 88.61 | 107.22 | 138.09 |
| 90 | Optical, photographic, cinematographic, measuring, checking, precision, medical or surgical instrument | 32.11 | 35.60 | 35.57 |
| 39 | Plastics and articles thereof | 22.11 | 18.03 | 20.35 |
| 84.11 | Turbo-jets, turbo-propellers and other gas turbines | 1.13 | 50.62 | 15.93 |
| 30 | Pharmaceutical products | 19.99 | 86.24 | 14.70 |
| 56 | Wadding, felt & nonwovens special yarns twine, cordage, ropes & cables & articles thereof | 21.30 | 15.23 | 14.67 |
| 38 | Miscellaneous chemical products | 9.77 | 12.64 | 14.26 |
| 48 | Paper and paperboard; | 14.92 | 8.16 | 13.91 |
| 88 | Aircraft, spacecraft, and parts thereof | 6.08 | 4.54 | 13.33 |
| 84 | Nuclear reactors, boilers, machinery and mechanical appliances | 11.23 | 11.13 | 11.30 |
| 10.01 | Wheat and meslin | | 6.52 | 9.86 |
| 54 | Man-made filaments | 17.42 | 12.02 | 9.25 |
| 84.71 | Automatic data processing machines and units thereof; | 3.15 | 5.40 | 8.93 |
| 32 | Tanning or dying extracts | 5.03 | 4.05 | 5.82 |
| 87.03 | Motor cars and other motor vehicles principally designed for the transport of persons | 2.56 | 1.52 | 4.97 |
| 34 | Soap, organic-active agents, washing preparations, lubricating preparations, artificial waxes, preparations | 2.90 | 4.43 | 4.42 |
| 85.17 | Telephones sets including telephones for cellular networks of for other wireless networks | 3.58 | 3.59 | 3.63 |
| 87.04 | Motor vehicles for the transport of goods | 4.76 | 5.99 | 3.47 |
| 47 | Pulp of wood or of other fibrous cellulosic materials waste & scrap of paper or paperboard | 3.14 | 3.68 | 3.36 |
| 24 | Tobacco and manufactured tobacco substitutes | 7.19 | 5.43 | 3.28 |
| 84.14 | Air or vacuum pumps, air or other gas compressors and fans | .59 | .49 | 3.13 |
| 29 | Organic chemicals | 2.72 | 2.33 | 3.07 |
| 21 | Miscellaneous edible Preparations (Except HS 21.01) | 2.04 | 1.72 | 2.76 |
| 99.99 | Other Imports | 109.17 | 98.05 | 84.83 |
| **Total Imports** | | **391.50** | **504.62** | **442.88** |

***Source: Sri Lanka of Customs***

ගරු කථානායකතුමනි, ප්‍රශ්නයේ අංක 1, 2, 4 සහ 8 කොටස් සඳහා පිළිතුරු මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::*
*Rest of the Answer tabled:*

1. වෙළඳාම ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් එක්සත් ජනපදය සමඟ සාකච්ඡා සිදු කරමින් පවතින අතර යෝජිත අන්‍යෝන්‍ය තීරුබදු ගිවිසුමේ - Reciprocal Tariff Agreement - බොහෝ විධිවිධාන සම්බන්ධයෙන් පොදු සම්මුතියකට එළඹ තිබේ. පාර්ශ්වයන් දෙකම සාධනීයව මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටින අතර හැකිතාක් ඉක්මනින් ප්‍රගතියක් අත්කර ගැනීමේ පොදු අභිලාෂය ප්‍රකාශයට පත් කර තිබේ. කෙසේවෙතත් මෙම අවස්ථාවේදී, 2026 මාර්තු ඇතුළුව ස්ථිර කාල රේඛාවක් හෝ ඉලක්ක දිනයක් සම්බන්ධයෙන් විධිමත් එකඟතාවකට පැමිණ නොමැත.

   භාණ්ඩ සඳහා වෙළඳපොළ ප්‍රවේශය, වෙළඳාම් බලාත්මක පරිසරය සහ වෙළඳාම ආශ්‍රිත අනෙකුත් ක්ෂේත්‍ර ඇතුළුව අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන වෙළඳාම ආශ්‍රිත කරුණු ගණනාවක් සම්බන්ධයෙන් එකඟ වූ රාමුවක් මත සාකච්ඡා සිදු කරමින් පවතී. රජයන් දෙක අතර රහස්‍ය සැකසුම්වලට මෙම සාකච්ඡා යටත් බැවින් මෙම අවස්ථාවේදී කෙටුම්පත් ලේඛන හෝ අනාගත බැඳීම් ආශ්‍රිත නිශ්චිත තොරතුරු හෙළිදරව් කිරීම යෝග්‍ය නොවනු ඇත.

   ශ්‍රී ලංකාවේ ආර්ථික අභිලාෂයන් හා ප්‍රතිපත්ති අවකාශය සුරක්ෂිත කරන්නා වූ ආකාරයකින් රජය එක්සත් ජනපදය සමඟ කටයුතු කරයි. සාකච්ඡාවල ප්‍රගතිය සහ අදාළ රහස්‍යභාවය පිළිබඳ අදාළ බැඳීම්වලට අනුගතව උචිත අවස්ථාවකදී වැඩිදුර තොරතුරු බෙදා හදා ගනු ඇත.

2. එක්සත් ජනපදය සමඟ දැනට සිදුකරමින් පවතින සාකච්ඡා වෙළඳාම ආශ්‍රිත ක්ෂේත්‍ර ගණනාවක් හා සම්බන්ධ පුළුල් රාමුවක් තුළ පවත්වනු ලබයි. භාණ්ඩ වෙළඳාම ආශ්‍රිත තීරුබදු පිළිබඳ කරුණු එම සාකච්ඡාවන්හි එක් සංඝටකයක් සම්පාදනය කරන අතරම එම සාකච්ඡා සේවා, ආයෝජන, ඩිජිටල් වෙළඳාම, ශ්‍රමය ආශ්‍රිත ප්‍රතිෂ්ඨාවන් සහ අනෙකුත් උපාය මාර්ගික කරුණු වැනි අනෙකුත් ක්ෂේත්‍ර දක්වා ද ව්‍යාප්ත වේ.

   සාකච්ඡා තවමත් විකාශනය වෙමින් පවතින බැවින් හා රජයන් දෙක අතර රහස්‍යභාවය පිළිබඳ සැකසුම්වලට යටත් බැවින්, සැලකිල්ලට බඳුන් වෙමින් පවතින කරුණුවල විෂය පථය හෝ හර සම්බන්ධයෙන් විස්තරාත්මකව කරුණු දැක්වීම අනුචිත වේ.

   සාකච්ඡා ඉදිරිය කරා යාමේදී ශ්‍රී ලංකාවේ අභිලාෂයන් සහ ප්‍රතිපත්ති අවකාශය පූර්ණව සුරක්ෂිත වන බවට වග බලා ගනිමින් නිසි අවධානයෙන් හා පරිස්සමින් යුතුව මෙම සාකච්ඡාවන් කරා ප්‍රවේශ වීම රජය අඛණ්ඩව සිදු කරයි.

4. දෙරට රජයන් එකඟ වූ රහස්‍යභාවය පිළිබඳ සැකසුම් යටතේ එක්සත් ජනපදය සමඟ දැනට සිදුකරමින් පවතින සාකච්ඡා පවත්වනු ලබයි. එබැවින්, සාකච්ඡා පිළිබඳ විස්තර ප්‍රසිද්ධියට පත් කිරීමට නොහැක. කෙසේවෙතත්, උචිත පරිදි පාර්ලිමේන්තුව දැනුවත් කිරීමට රජය කටයුතු කර ඇත.

   යෝජිත ගිවිසුම අත්සන් කිරීමට පෙර හා පසු රජය නිසි කාර්යය පරිපාටිය අනුගමනය කරනු ඇත.

8. එක්සත් ජනපදය සමඟ ඉදිරියේදී පවත්වනු ලබන ඕනෑම සම්බන්ධතාවයකදී කෘෂිකර්මාන්තය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්( SMEs), ඇඟලුම් සහ ධීවර යන අංශ ඇතුළු අවදානමට ලක් විය හැකි ක්ෂේත්‍ර ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව රජය පූර්ණ වශයෙන් පිළිගනී. සාකච්ඡා තවමත් පවතින බැවින්, මෙම අවධියේදී කිසිදු අවසන් එකඟතාවයකට එළඹ නොමැත.

ශ්‍රී ලංකාවේ සාකච්ඡාමය ප්‍රවේශය තුළ, සංවේදී දේශීය අංශ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපත්තිමය අවකාශයක් සහ ආරක්ෂාවක් සහතික කරනු පිණිස නිෂේධිත ලැයිස්තු (negative lists), අදියරගත ලිබරල්කරණ උප ලේඛනයන් සහ අවශ්‍ය අවස්ථාවලදී කෝටා (quotas) වැනි ප්‍රමාණාත්මක ක්‍රියා මාර්ග ඇතුළුව ස්ථාපිත ආරක්ෂණ යන්ත්‍රණ භාවිත කිරීම පිළිබඳව දැඩි අවධාරණයක් යොමු කරයි. මෙම ප්‍රවේශයන් ශ්‍රී ලංකාවේ දිගුකාලීන වෙළෙඳ ප්‍රතිපත්ති භාවිතය පිළිබිඹු කරන අතර දේශීය ආර්ථික අවශ්‍යතා සුරැකීම සඳහා ඒවා අත්‍යාවශ්‍ය වේ.

මීට අමතරව, ඕනෑම වෙළෙඳ ගිවිසුමකින් ස්වාධීනව ක්‍රියාත්මක වන, දේශීය කර්මාන්තවලට සිදු වන බරපතළ හානි සහ අසාධාරණ වෙළෙඳ පිළිවෙත් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ශක්තිමත් යන්ත්‍රණයක් සපයන 'ආරක්ෂණ පියවර පනත (Safeguard Measures Act) සහ 'ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත (Anti-Dumping and Countervailing Duties Act) ඇතුළු පවතින දේශීය නීතිමය රාමුව මත ශ්‍රී ලංකාව දිගටම විශ්වාසය තබනු ඇත.

සාකච්ඡා තවමත් පැවැත්වෙමින් පවතින බැවින්, මෙම අවස්ථාවේදී විධිමත් ආර්ථික හෝ රාජ්‍ය මූල්‍ය බලපෑම් තක්සේරුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැත. ඇතිවිය හැකි ආර්ථික හා කලාපීය බලපෑම් රජය අඛණ්ඩව නිරීක්ෂණය කරන අතර, ඕනෑම අවසාන ප්‍රතිඵලයක් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන අරමුණු, ආර්ථික ප්‍රමුඛතා සහ නියාමන ස්වාධිපත්‍යය සමඟ පූර්ණ වශයෙන් අනුකූල වන බවට සහතික වනු ඇත.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මම අහන්නේ එක ප්‍රශ්නයයි. ඒ තමයි, අද යුරෝපා හවුලයි, ඉන්දියාවයි ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. ඒ වාගේම, ඒක දැක්කාට පසුව ට්‍රම්ප් ඉන්දියාවත් එක්ක සියයට 18ක ගිවිසුමක් අත්සන් කරලා තිබෙනවා. ඒ අනුව ඔබතුමා මූලිකත්වය අරගෙන, මේ සම්බන්ධයෙන් පුළුවන් තරම් සාකච්ඡා කරලා, ට්‍රම්ප් එක්ක Trade Agreement එක අවසන් කරලා - ගිය අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් මිලියන 3,400ක් තිබෙනවා කියලා අපිට දැන ගන්නට ලැබිලා තිබෙනවා - ඒක සුරක්ෂිත කරන්නේ කොයි ආකාරයෙන්ද කියන එක ගැන මේ පාර්ලිමේන්තුවට දැනුවත් කරන්න පුළුවන්ද? මොකද, මේක ඉතා තීරණාත්මකයි. අපේ මූල්‍ය reserve එක වැඩි කර ගන්න අවශ්‍යයි. අපනයනය කිරීම විතරයි, මේ රට බේරා ගන්න පුළුවන් උපක්‍රමශීලී වැඩ පිළිවෙළ වන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා දන්නවා, නිෂ්පාදනය ඉහළ දමන ආර්ථික ප්‍රතිපත්තියක තමයි අපේ ආණ්ඩුව ඉන්නේ කියලා. ඒ නිසා නිෂ්පාදන ක්ෂේත්‍ර සඳහා වැඩි පහසුකම් ලබා දීම අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක්. ඔබතුමා කිව්වා වාගේම, 2022දී අපේ රටේ අපනයන ආදායම ඩොලර් මිලියන 3,291යි. ඒක 2023දී ඩොලර් මිලියන 2,761 දක්වාත්, 2024දී 2,909 දක්වාත් පහළ යනවා. ඒක ගිය අවුරුද්දේ 3,000කට වඩා වැඩි වුණා. අපි දන්නවා, ඒක තවදුරටත් ඉහළ දමා ගැනීම තමයි අපට තිබෙන විශාලතම පහසුව සහ අවශ්‍යතාව බවට පත් වෙලා තිබෙන්නේ කියන එක. ඒ නිසා ගෝලීය තත්ත්ව පදනම් කරගෙන, ලෝකයේ ඇති වන විවිධ දේශපාලන සුළි කුණාටු, ඒ ඒ රටවල ආර්ථික ප්‍රතිපත්ති සහ ගිවිසුම්වලට එළැඹීම සඳහා පාවිච්චි කරනවා. ඔබතුමා සඳහන් කරපු ඉන්දියාව සහ යුරෝපා හවුල අත්සන් කරපු වෙළෙඳ ගිවිසුම හරහා ඒ දෙපාර්ශ්වයම සියයට 90ත්, 99ත් අතර ප්‍රමාණයකින් බදු නිදහස්වීම් සඳහා දෙපාර්ශ්වය අතර එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. ඒ හා සමානවම නැවත ඉන්දියාව සමඟ ඇමෙරිකාව අත්සන් තබන ගිවිසුමේදීත් සියයට 25කට තිබුණු බදු ප්‍රතිශතය සියයට 18කට අඩු කරනවා, පනවා තිබුණු තවත් සියයට 25ක් ඉවත් කරනවා. එවැනි ක්‍රියාමාර්ග ප්‍රමාණයකට ප්‍රවිෂ්ට වෙලා තිබෙනවා. අපිත් ඔවුන් සමඟ පවත්වා ගෙන යන සාකච්ඡාව අවසන් නැහැ. ඔබතුමා සඳහන් කළා වාගේම, අපිත් ඒ සාකච්ඡා අඛණ්ඩව ඉදිරියට ගෙන යනවා. අපේ වෙළෙඳ පංගුව වැඩි කර ගැනීම සඳහා කටයුතු කරනවා වාගේම, රජයක් ලෙසත්, විශේෂයෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය අපේ අපනයන පාර්ශ්වකරුවන් වැඩි කර ගන්න අවධානය යොමු කරලා තිබෙනවා. අපේ export basket එකේ diversification එක වැඩි කර ගන්න අවධානය යොමු කරලා තිබෙනවා. ඒ හරහා තමයි, අපිට ඩොලර් සංචිතය වැඩි කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ වෙනුවෙන් රජයක් හැටියට අවධානය යොමු කරලා කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද ප්‍රශ්නය. ගරු රියාස් ෆාරුක් මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: අකුරණ ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා විසින් කරන ලද තර්ජනය

## சிறப்புரிமை: அக்குறணை பிரதேச சபையின் உப தவிசாளரால் விடுக்கப்பட்ட அச்சுறுத்தல்

## PRIVILEGE: THREAT MADE BY VICE CHAIRMAN OF AKURANA PRADESHIYA SABHA

**ගරු රියාස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ரியாஸ் பாருக்)
(The Hon. Riyas Farook)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මා සතු වරප්‍රසාද උල්ලංඝනය වීම සහ එල්ල වූ තර්ජන පිළිබඳව දැනුම් දීමයි.

2026 ජනවාරි මස 09වන දින මා විසින් පාර්ලිමේන්තුවේදී සිදු කරන ලද ප්‍රකාශයක් පාදක කර ගනිමින්, අකුරණ ප්‍රාදේශීය සභාවේ උප සභාපති වයි.ජී. චමින්ද තිලකරත්න යන අය විසින් මට එරෙහිව සිදු කරන ලද තර්ජනාත්මක ප්‍රකාශය පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරනු රිසියෙමි. 2026 ජනවාරි මස 13වන දින පැවැති එම ප්‍රාදේශීය සභා මහා සැසිවාරයේදී මාහට ශාරීරිකව පහර දෙන බවට ඔහු ප්‍රසිද්ධියේ තර්ජනය කර ඇත. මන්ත්‍රීවරයෙකු ලෙස පාර්ලිමේන්තුව තුළ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට සහ මගේ ආරක්ෂාවට මෙමඟින් එල්ල වී ඇත්තේ බරපතළ තර්ජනයකි.

එබැවින්, මන්ත්‍රී වරප්‍රසාද ආරක්ෂා කිරීම උදෙසා, මෙම තර්ජනය සම්බන්ධයෙන් වහාම විමර්ශනය කර අවශ්‍ය පියවර ගන්නා මෙන් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නයක් යොමු කළා. මට ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්නේ නැද්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක පාර්ලිමේන්තු පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ගැටලුවක්. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයේ ස්ථාවර නියෝග 29(1), 118(2) යටතේ සඳහන් කර තිබෙන දේවල් සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 29(2) යටතේ මාගේ අවසරය ලබා දෙන්නේ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා. Hon. Bimal Rathnayake, you have 18 minutes. - *[Interruption.]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - *[Interruption.]* ගරු කථානායකතුමනි, මට පොඩ්ඩක් කථා කරන්න ඉඩදෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් මම පැහැදිලිව ප්‍රකාශ කළා, ස්ථාවර නියෝග 29(2) යටතේ තීරණය. *[බාධා කිරීම්]*

## ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත
## இலங்கை நிலையான சொத்து உயர்தொழிலர்கள் நிறுவகம் சட்டமூலம்
## INSTITUTE OF REAL ESTATE PROFESSIONALS, SRI LANKA BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 11.47]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත සහ විෂය අංක 3 - නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ද මා ඉදිරිපත් කරනවා. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු විපක්ෂ නායකතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ වෙස්ට්මින්ස්ටර් සම්ප්‍රදාය තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරනකොට එයට සවන් දීම ඔබතුමාගේත්, සභාවේත් යුතුකමයි. මීට පෙර රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරපු මන්ත්‍රීවරයෙකුට වරප්‍රසාද ප්‍රශ්න ඉදිරිපත් කරන්න අවස්ථාව දුන්නා. ඇයි, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒ පිළිබඳව Standing Order No. 29(2) යටතේ කටයුතු කර තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. *[බාධා කිරීම්]* ස්ථාවර නියෝග 29(2) කියවන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. - *[Interruption.]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මේ අය වාඩි කරලා දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර වාඩිවෙන්න. ඔබතුමන්ලාට Standing Orders තේරෙන්නේ නැහැ. කරුණාකර වාඩිවෙන්න. ස්ථාවර නියෝග 29 (2) කියවන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම හිතන විදියට මෙතුමන්ලාගේ අරමුණ වෙලා තිබෙන්නේ සභාවේ කටයුතුවලට බාධා කරන එක. මොකද, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන විදියක් තිබෙනවා. ඒ අනුව තමයි ඒ මන්ත්‍රීතුමා එය ඉදිරිපත් කළේ. වෙනදාත් වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම ගයන්ත මන්ත්‍රීතුමා එක්කෝ යෝජනාව සම්මත කරනවා. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මම මේ විවාදය ආරම්භ කරමින්,- *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ඔබතුමා මෙතුමාට අර එළියේ මයික් එකක් දාලා දුන්නේ නැති එකේ වැරැද්ද තමයි. මෙතුමාට එළියේ මයික් එකක් දාලා දෙන්න. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මෙතුමන්ලා දන්නේ පාර්ලිමේන්තුව disrupt කරන්න විතරයි. *[බාධා කිරීම්]* ඉතින් ඕනෑ නම්, ඕක ලේවලින් ලියලා දෙන්න. මෙතුමාට එළියේ මයික් එකකුයි, කැමරා එකකුයි දාලා දෙන්න, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]* මේගොල්ලෝ පව්! ගරු කථානායකතුමනි. මේගොල්ලෝ පව්! හරි පක්ෂයකුත් නැහැ. මන්ත්‍රීතුමා, ඔබතුමාත් ගියා නේද, අර සංවර්ධන නිලධාරීන් හම්බ වෙන්න? *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මේගොල්ලන්ට මරු වැඩේ වුණේ. මේගොල්ලෝ ගියා සංවර්ධන නිලධාරීන් හම්බ වෙන්න. සංවර්ධන නිලධාරීන් ජනාධිපතිතුමාව හම්බ වුණාට පස්සේ කිව්වා, "සර්, කට්ටිය ආවා, ගියා; අපි ගණන් ගන්නේ නැහැ" කියලා. *[බාධා කිරීම්]* අයියෝ දයාසිරි! අයියෝ දයාසිරි! අයියෝ! දයා, මේ - *[බාධා කිරීම්]* කාලය කන්නේ නැතිව ඉන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අද දිනයේදී ඉතාම වැදගත් පනත් කෙටුම්පත් තුනක් විවාදයට ඉදිරිපත් කරලා තිබෙනවා. *[බාධා කිරීම්]* ආණ්ඩුව නියෝජනය කරමින් අපි ඔබතුමන්ලාට කියන්න කැමැතියි,- *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමන්ලා ස්ථාවර නියෝග 29(2) කියවන්න. *[බාධා කිරීම්]* කරුණාකර ඉඳගන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඕවා ගණන් ගන්න එපා. ඕවා "ෂෝ" විතරයි. ගරු කථානායකතුමා, ඕවා ගණන් ගන්න එපා. ඕවා "ෂෝ" විතරයි. *[බාධා කිරීම්]* නිකම් "ෂෝ කාරයෝ" මේ. පක්ෂයකුත් නැහැ. *[බාධා කිරීම්]* පක්ෂයකුත් නැහැ. සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාත් මෙතුමාට කැමැති නැහැ. *[බාධා කිරීම්]* ඔව්, එතුමාත් කැමැති නැහැ, මෙතුමාට. මෙතුමාව ගණන් ගන්නේ නැහැ. අරයාට පක්ෂයකුත් නැහැ. අරයා සජබෙන් අස් වුණා.

***[මෙම අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]***
*[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமெழுப்பினார்கள்.]*
*[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]*

හරි, එහෙම නම් සභා ගර්භය මැදට වෙලා ඉන්න. අපි විවාදය කරනවා. *[බාධා කිරීම්]* Points of Order ඉල්ලන්න බැහැ, සභා ගර්භය මැද ඉඳගෙන. Points of Order ඉල්ලන්න පුළුවන්, ආසනයේ ඉඳන්. *[බාධා කිරීම්]* ඔබතුමාත් එනවාද? ලේවලින් ලියා දෙනවාද? විපක්ෂ නායකතුමා, මේකත් ලේවලින් ලියා දෙනවාද? විපක්ෂ නායකතුමා, මේ ගොල්ලන් එක්ක ගියාම ඔබතුමාට තිබෙන ඡන්දත් කැඩෙනවා. හරිද? *[බාධා කිරීම්]* තිබෙන ඡන්දත් කැඩෙනවා. *[බාධා කිරීම්]* මේ මොකක්ද, මේ? මිනිස්සු එපා කියපු "පොහොට්ටුව" මේ. මිනිස්සු ගහලා පන්නපු "පොහොට්ටුව" මේ. *[බාධා කිරීම්]* ඔබතුමාට ඡන්ද එන්නේ නැහැ, මේ වැඩෙන්. මේ අර පොහොට්ටුකාරයෝ නේ. *[බාධා කිරීම්]* මේ පොහොට්ටුකාරයෝ නේ. මේ පොහොට්ටු සංස්කෘතියට ඔබතුමා ගොදුරු වෙන්න එපා. *[බාධා කිරීම්]* විපක්ෂ නායකතුමා, ඔබතුමාට තියෙන ශත දෙකත් නැති වෙනවා, මේ දයාසිරිත් එක්ක ගියාම. *[බාධා කිරීම්]* දයාසිරිත් එක්ක ගියාම තියෙන ශත දෙකත් නැති වෙනවා. *[බාධා කිරීම්]*

මෙයාව ගණන් ගන්නේ නැහැ. ජනාධිපතිතුමා වුණත් ඇවිල්ලා කිව්වා නේ, මෙයා හුළඟ වගේ කියලා. ගරු කථානායකතුමනි, මෙතුමා දැන් කරන දේ මේකයි. මැයි දිනය ළඟ එනවා නේ. *[බාධා කිරීම්]* මන්ත්‍රීතුමා, දැන් ඔබතුමා රිළා නැටුම් පුරුදු වුණා නම් හරි. *[බාධා කිරීම්]* මේ මනුස්සයා අසරණ කරන්නේ නැතුව ගිහිල්ලා වාඩි වෙලා ඉන්න. *[බාධා කිරීම්]* ගිහිල්ලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]* ඔතැන ඉඳන් points of Order කොහොමටවත් ගන්න බැහැ. විපක්ෂ නායකතුමා, ඇත්තටම අපරාදේ! *[බාධා කිරීම්]* ඔබතුමා එක්සත් ජාතික පක්ෂයෙන් කැඩිලා වෙනම පක්ෂයක් හදා ගත්තා. ඔබතුමා ඒ පක්ෂය හදලා රනිල් වික්‍රමසිංහව පැරැද්දුවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, කරුණාකරලා ඉඳගන්න. ස්ථාවර නියෝග 29(2) කියවන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු විපක්ෂ නායකතුමනි, මේ පොහොට්ටුකාරයෝ කීපදෙනෙක් අරගෙන අද ඔබතුමාට මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ අය ඔබතුමාගේ නම කැත කරනවා. *[බාධා කිරීම්]* කවුද, මේ? *[බාධා කිරීම්]* ගරු කථානායකතුමා, ඔබතුමා පයිසෙකට ගණන් ගන්න එපා. මොකද, කවුරුත් ගණන් ගන්නේ

[ගරු බිමල් රත්නායක මහතා]

නැහැ මෙතුමාව. ඊළඟ පාර nomination ගන්න පක්ෂයක් නැහැ. *[බාධා කිරීම්]* මෙතුමා කවුද මේ? මෙතුමා කවුද, ගරු කථානායකතුමනි? මෙතැන ඉන්නවා, කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා, රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා ආදි අය. අපි දන්නවා, ඒ ගොල්ලෝ සජබයේ අය බව. නමුත් මෙතුමා කවුද? *[බාධා කිරීම්]* අනේ! ගරු කථානායකතුමනි, ඔබතුමා මෙතුමාට- *[බාධා කිරීම්]* මට කථා කරන්න දෙන්න. ගරු කථානායකතුමනි, අද දින ඉතා වැදගත් පනත් කෙටුම්පත් තුනක් විවාදයට ගන්න තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, බලන්න මෙතැන කෑ ගහන්නේ කවුද කියලා. එක්කෙනෙක් පොහොට්ටුවේ කෙනෙක්. අනික් එක්කෙනා මන්ත්‍රීකම බදුල්ලේ සල්ලිකාරයෙකුට විකුණපු කෙනෙක්. ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා වාඩි වෙලා ඉන්න, මට කථා කරන්න දීලා. ගරු කථානායකතුමනි, මේ බාධා කරන වෙලාව අඩු කරන්න විපක්ෂයේ කාලයෙන්; මගේ කාලයෙන් නොවෙයි. *[බාධා කිරීම්]*

සජබ වැදගත් පක්ෂයක්. ඒ නිසා ගරු කථානායකතුමනි, ඔබතුමා විපක්ෂ නායකතුමාට එන්න කියලා උපදෙස් දෙන්න, එතුමාගේ වැදගත් තනතුර මේ වෙන වෙන කට්ටියට හැල්ලු කරන්න දෙන්න එපා කියලා. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත, කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත සහ නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙන යන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත් තුනම අපි අද ඉදිරිපත් කර තිබෙනවා. *[බාධා කිරීම්]* වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා රාජකාරි කටයුත්තකට විදේශගත වෙලා සිටින නිසා තමයි අද දින න්‍යාය පත්‍රයේ 2 සහ 3 යටතේ සඳහන් පනත් කෙටුම්පත් දෙකත් මම එතුමා වෙනුවෙන් ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමනි, මම මුලින්ම කියන්න කැමැතියි අද සාකච්ඡා කෙරෙන "ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය" නමැති පනත් කෙටුම්පතෙහි මූලික අරමුණ පිළිබඳව. මේ real estate ක්ෂේත්‍රය ලංකාව තුළ විශාල වර්ධනයකට ලක් වෙලා තිබෙන ක්ෂේත්‍රයක්. ඒ නිසා මේ ක්ෂේත්‍රයට විවිධ වෘත්තිකයන් අවශ්‍ය වෙනවා. ඒ වෘත්තිකයන්ට අදාළ කරන නියාමනයන්, වෘත්තීය ගරුත්වය සහ විනය පද්ධති, ඒ ගොල්ලන් industry එකත් එක්ක නිල වශයෙන් සම්බන්ධ වීම වාගේ දේවල් වැදගත් වෙනවා. ඒ නිසා අපේ රටේ ගොඩක් වෘත්තික ආයතනවලට, වෘත්තීන්වලට විවිධ ආයතන පාර්ලිමේන්තුවෙන් හදලා තිබෙනවා. අද සිද්ධ වන දේ තමයි, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ සංවර්ධන හා ආයෝජන ක්ෂේත්‍රයේ නව යුගයක් ආරම්භ කරමින් ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය - Institute of Real Estate Professionals, Sri Lanka - පිහිටුවීම සඳහා ඉදිරිපත් කර ඇති ඉහත කී පනත් කෙටුම්පත සම්මත කිරීම.

මෙම පනත් කෙටුම්පතේ ජාතික වැදගත්කමක් තිබෙනවා. මෙය හුදෙක් වෘත්තීය ආයතනයක් පිහිටුවීමක් පමණක් නොව, ආර්ථික ස්ථාවරභාවය, මූල්‍ය පාරදෘශ්‍යතාව සහ උගත් මානව සම්පත ජාතික සංවර්ධනයට බද්ධ කිරීම සඳහා ගනු ලබන ව්‍යුහගත ප්‍රතිසංස්කරණයක් විධියටයි මා දකින්නේ. ඇත්තටම ගත්තොත්, මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වැඩිපුරම මහන්සි වුණේ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය අපේ ගරු අනුර කරුණාතිලක ඇමතිතුමායි. එතුමාට ස්තුති කරන්න ඕනෑ, මේ වෙනුවෙන් දරන ලද මහන්සිය වෙනුවෙන්.

ගරු කථානායකතුමනි, අප රට මෑත අතීතයේ මුහුණ දුන් දැඩි ආර්ථික අර්බුදයෙන් පසු නැවත ගොඩ නැඟෙමින් පවතින මේ මොහොතේ දේපළ සංවර්ධන සහ ආයෝජන ක්ෂේත්‍රය ජාතික ආර්ථිකයේ ප්‍රධාන ගාමක බලවේගයක් බවට පත් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 වාර්තාවලට අනුව, real estate activities and ownership of dwellings 2024 වර්ෂය තුළ සියයට 4ක වර්ධනයක් වාර්තා කර තිබෙනවා. එමඟින් පැහැදිලි වන්නේ, කර්මාන්ත, සේවා සහ බැංකු ක්ෂේත්‍රය සමඟ ගැඹුරු සම්බන්ධතාවක් ඇති මෙම අංශය ජාතික ආර්ථිකය ස්ථාවර කර ගැනීමට දක්වන දායකත්වයයි. ගරු කථානායකතුමනි, තවද කොළඹ කොටස් වෙළෙඳ පොළේ දේපළ සංවර්ධන හා ආයෝජන සම්බන්ධ සමාගම්වල වෙළෙඳ පොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 100කට අධික මට්ටමකට ළඟා වී තිබෙනවා. එම නිසා මෙම ක්ෂේත්‍රයට පවතින දේශීය හා විදේශීය ආයෝජක විශ්වාසය කොතෙක්ද යන්න ඔබතුමාට සහ මේ ගරු සභාවට පැහැදිලි වනවා ඇති.

ගරු කථානායකතුමනි, නමුත් මෙවැනි විශාල මූල්‍ය සංසරණයක් සහ ආයෝජන ආකර්ෂණයක් පවතින ක්ෂේත්‍රයක් තවමත් විධිමත් නියාමන පද්ධතියක් නොමැතිව පවත්වාගෙන යාම රටක් ලෙස අපට දැරිය නොහැකි අවදානමක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ අප රට ඇති කරගෙන ඇති වැඩසටහනේ ප්‍රධාන අවධාරණයක් වන්නේ ආයතනික පාලනය, පාරදෘශ්‍යතාව සහ වගවීම ශක්තිමත් කිරීමයි. තථ්‍ය දේපළ සංවර්ධන හා ආයෝජන වැනි උසස් අවදානම් සහිත ක්ෂේත්‍රයක් නියාමනයකින් තොරව පවත්වා ගැනීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හමුවේ අප ලබා ගත් විශ්වාසය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට පටහැනි තත්ත්වයක් වනවා. මෙම පනත් කෙටුම්පත හරහා එම අඩුපාඩුව යම් ප්‍රමාණයකින් හෝ පිරවීමට හැකි යැයි අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ ජාතික වගකීම ඉටු කිරීම ද මෙම ආයතනය පිහිටුවීමේ මූලික හේතුවක්. මූල්‍ය බුද්ධි ඒකකයේ 2024 වාර්ෂික වාර්තාවට අනුව, දේපළ සංවර්ධන හා ආයෝජන ක්ෂේත්‍රය මුදල් විශුද්ධිකරණයට "මධ්‍යම සිට ඉහළ" අවදානම් මට්ටමක පවතින අංශයක් ලෙස හඳුනාගෙන තිබෙනවා. නියාමනයක් නොමැති වීම හේතුවෙන් අපරාධ හරහා උපයන කළු සල්ලි දේපළ වෙළෙඳාම් ගනුදෙනු තුළින් සුදු කර ගැනීමේ අවදානම ඉහළ යන අතර, එමඟින් ඉඩම් හා නිවාස මිල කෘත්‍රිමව ඉහළ ගොස් සාමාන්‍ය පුරවැසියන්ට නිවාස හිමිකම සිහිනයක් බවට පත් වෙලා තිබෙනවා.

2026 වර්ෂයේදී ශ්‍රී ලංකාව මුහුණ දීමට නියමිත FATF - Financial Action Task Force - අන්‍යෝන්‍ය ඇගැයීමට සාර්ථකව මුහුණ දීමට නම්, දේපළ සංවර්ධන හා ආයෝජන වෘත්තියවේදීන් ලියාපදිංචි කිරීම, ඔවුන්ගේ වගකීම් පැහැදිලි කිරීම සහ AML/ CFT - Anti-Money Laundering and Countering the Financing of Terrorism - ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක වන නියාමන ආයතනයක් තිබීම අත්‍යවශ්‍ය වෙනවා.

ගරු කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතේ තවත් වැදගත් මානයක් වන්නේ මානව සම්පත් සංවර්ධනයයි. අද අපේ

විශ්වවිද්‍යාල පද්ධතිය හරහා -විශේෂයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය වැනි ආයතන හරහා- දේපළ කළමනාකරණය, තක්සේරුකරණය සහ ආයෝජන විශ්ලේෂණය පිළිබඳ උගත් උපාධිධාරීන් විශාල පිරිසක් බිහි වෙනවා. නමුත්, ඔවුන්ගේ දැනුම සහ වෘත්තීය හැකියාවන් රටේ ආර්ථිකයට විධිමත් ලෙස යොදා ගැනීමට අවශ්‍ය පාලන ව්‍යුහයක් හරියාකාරව මෙතෙක් අපේ රටේ තිබුණේ නැහැ. එම නිසා මෙම ආයතනය හරහා එම උගත්, තරුණ පරපුරට වෘත්තීය පිළිගැනීමක්, වගවීමක්, වගකීමක් සහ ආචාර ධර්ම රාමුවක් සපයමින් දේපළ සංවර්ධන හා ආයෝජන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අපට හැකි වේ යැයි අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, මෙම ආයතනය පිහිටුවීමෙන් කිසිම වෘත්තියකට අසාධාරණයක් සිදු කිරීමටවත්, එක වෘත්තියකට පමණක් විශේෂ වරප්‍රසාද ලබා දීමටවත් අප කටයුතු කරන්නේ නැහැ. පැහැදිලි ලෙසම බලපත්‍ර ක්‍රමයක්, වෘත්තීය ප්‍රමිතීන් සහ ආචාර ධර්ම නියාමනයන් හරහා දේශීය හා විදේශීය ආයෝජකයින්ට විශ්වාසයෙන් තම ආයෝජන සිදු කළ හැකි පරිසරයක් අපි සකස් කරනවා. එම නිසා මෙම පනත් කෙටුම්පත කිසිදු වෘත්තීය කණ්ඩායමකට එරෙහිව ගෙන එන ලද්දක් නොවෙයි.

ගරු කථානායකතුමනි, පසුගිය කාලය පුරාවටම මේ පනත් කෙටුම්පත පිළිබඳවත්, මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීමෙන් ඇති විය හැකි සමහර ප්‍රතිවිපාක පිළිබඳවත්, දැනටමත් මේ හා සමාන වෘත්තීන්වල සිටින විවිධ වෘත්තිකයින්ට මෙම ආයතනය ස්ථාපිත කිරීමෙන් ඇති වෙන්න පුළුවන් යම් ආකාරයේ ගැටලු පිළිබඳවත් සාකච්ඡා අතිවිශාල ප්‍රමාණයක් සිදු කළා. විශේෂයෙන්ම අපේ එරංග ගුණසේකර නියෝජ්‍ය අමාත්‍යතුමාත්, අනුර කරුණාතිලක අමාත්‍යතුමාත් මේ වෙනුවෙන් විශාල මහන්සියක් දැරුවා. ඒ වාගේම මගේ දැනීමේ හැටියට මුදල් අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් සාකච්ඡා අතිවිශාල ප්‍රමාණයක් පැවැත්වූවා. ඒ සාකච්ඡා සිදු කළේ වෙනත් කිසිදු වෘත්තීය කණ්ඩායමකට අසාධාරණයක් නොවන පරිදියි. නමුත්, අනෙක් පැත්තෙන් දැනට මෙහෙම නිශ්චිත පිළිගත් ආයතනයක් නැතුව සිටින මේ වෘත්තික කණ්ඩායමට ආයතනයක් පිහිටුවීමටත් අපි තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම අපි ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පතට අදාළව අධිකරණයෙන් අපිට clearance ලැබිලා තිබෙනවා. ඒ වාගේම ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී සංශෝධන දෙකක් යෝජනා කරලා තිබුණා. අපි ඒවාත් පිළිගෙන සංශෝධනය කිරීමට බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ඒ සාකච්ඡා තුළදී පුළුවන් තරම් විවිධ වෘත්තීන් අතර සහයෝගයෙන්, සම්මුතියෙන් කර ගැනීමට අවශ්‍ය කරන යම් වෙනස්කම් පවා පනත් කෙටුම්පතේ හරයට වෙනසක් නොවන ආකාරයට සිදු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එම නිසා මේ පනත් කෙටුම්පතේ මූලික අරමුණ තිබෙන්නේ ජාතික ආර්ථිකයේ දීර්ඝ කාලීන ස්ථාවරත්වය, මූල්‍ය පාරදෘශ්‍යභාවය සහ උගත් මානව සම්පතේ නිසි භාවිතය තහවුරු කිරීමට ගෙන එන ප්‍රගතිශීලී පියවරක් විධියටයි. ඒ නිසා මේක පක්ෂ, මතවාද, පෞද්ගලික කණ්ඩායම් මත ගෙනෙන එකක් නොවෙයි. අපි දන්නවා, අපේ රටේ වෘත්තීන් අතර යම් යම් අනවබෝධයන් තිබෙන බව. ඒ අනවබෝධයන් සමහර විට සිද්ධ වෙලා තිබෙන්නේත් දේශපාලන අධිකාරිය විසින් සමහර අවස්ථාවලදී ඒ වෘත්තීන්වලට පොදු රාමුවෙන් බැහැරව ගිහිල්ලා යම් යම් අයිතිවාසිකම් වැඩිපුර දෙන්න කල්පනා කරපු නිසායි. ඒ වාගේ කටයුතු කරලා යම්කිසි කාලයක් ගත වුණාට පසුව ඒගොල්ලන් ඒ ක්‍රමයට පුරුදු වෙනවා. ඒ නිසා ඒගොල්ලන්ගේ වරදක් කියන්නත් බැහැ.

රටක් විධියට ගත්තාම ගරු ජනාධිපතිතුමාත්, අපිත් පසුගිය අවුරුද්දේ වැටුප් වැඩි කිරීමේදී මුහුණ දීපු ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. විවිධ දේශපාලන වුවමනා මත, විවිධ බලපෑම් මත, accommodate කරලා, සමහර විට මැතිවරණයක් ළං වෙලා දීපු පත්වීම් මත, මැතිවරණයක් ළං වෙලා අනුමත කරපු SORs මත, මැතිවරණයක් ළං වෙලා අනුමත කර ගත්ත සමහර ආයතන මත සැලකිය යුතු තරමින් ගැටලු ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අද රටේ ඉන්න වෘත්තිකයින් හැම කෙනාම දන්නවා, ආයතනවල ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙන බව. සමහර වෘත්තිකයින්ට කවදාවත් ඒ ආයතනයේ ඉහළට යන්න බැහැ.

අපි අලුත් ආණ්ඩුවක්. අපි අලුත් ප්‍රතිපත්ති මත වැඩ කරන ආණ්ඩුවක්. කිසිම ගෝත්‍රික භාවයකින් අපි කටයුතු කරන්නේ නැහැ. අපිට ඉංජිනේරුවරයාත් වටිනවා. ඒ වාගේම janitorත් වටිනවා. අපිට ඒ දෙදෙනාම වටිනවා. ඒ දෙදෙනාම රටට අවශ්‍යයි. ඒ නිසා අපි මේ වෘත්තීන් දිහා කිසිම ගෝත්‍රිකභාවයකින් බලන්නේ නැහැ. අධ්‍යාපනය හදාරන්න ගිය විශ්වවිද්‍යාල, ඉස්කෝල ආදී තැන් අපට අදාළම නැහැ. අපිට එහෙම හිතන්න කිසිම ගෝත්‍රික මනසක් නැහැ. අපි රට ගැන ඉහළින්ම කල්පනා කරනවා. මොකද, අපි මේ දේශපාලන ව්‍යාපාරය තුළ පුරුදු පුහුණු වෙලා තිබෙනවා, මිනිස්සුන්ගේ ප්‍රශ්න දිහා පුළුල් විධියට බලන්න. ඒ, කිසිම ආකාරයක ගෝත්‍රිකභාවයක් නැතුවයි. ඒ නිසා ගමට අදින, විශ්වවිද්‍යාලයට අදින, ආසනයට අදින විධියේ මොනවාවත් අපි විසින් සිදු කරන්නේ නැහැ.

හදපු පනත උසාවියෙන් clear වෙලා තිබියදීත්, Sectoral Oversight Committee එකෙන් clear වෙලා තිබියදීත්, ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා මම හිතන්නේ සාකච්ඡා විශාල ප්‍රමාණයක් පවත්වා පුළුවන් තරම් එකඟතාවකට එන්න විශාල මහන්සියක් දැරුවා. අපි මේ කටයුත්ත කරන්නේ සද්භාවයෙන්. නමුත් අපි විශ්වාස කරනවා, මේ ආයතනය නීතිගත වෙලා මාස හයක්, අවුරුද්දක් විතර ක්‍රියාත්මක වෙනකොට තමයි ඒකේ හැඩහුරුකම අපට පෙනෙන්න පටන් ගන්නේ කියන එක. එවැනි අවස්ථාවකදී රටේ ආර්ථිකයට යම්කිසි අසාධාරණයක් වෙනවා නම්, යම්කිසි වෘත්තීය කණ්ඩායමකට අසාධාරණයක් වෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ පිළිබඳව නැවත සාකච්ඡා කරන්න වාගේම නැවත ඒ ගැන සොයා බලන්න අපි ලැහැස්තියි. මොකද, පනත් කියන ඒවා කාලානුරූපීව සංශෝධනය වෙනවා. ඒක තමයි මට මේ පනත සම්බන්ධව කියන්න තිබෙන්නේ. ඒක නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඔබතුමාට ඒ සඳහා අවශ්‍ය කරන ඉතාම කෙටි සංශෝධන ප්‍රමාණය ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, මම තව විනාඩි කිහිපයක් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. නාගරික සංවර්ධන අමාත්‍යාංශයට අදාළ පනතක් මේක. අද ඉතාම කනගාටුදායක සිද්ධියක් ගැන මට කියන්න තිබෙනවා. UDA එකට අයිති "හෙළමුතු සෙවන" නිවාස සංකීර්ණයේ බදාම ස්තරයක් ගැලවී යෑම හේතුවෙන් අවුරුදු 7ක කුඩා දරුවෙක් ඊයේ තුවාල ලැබුවා. අද ඒ දරුවා මිය ගිහිල්ලා තිබෙනවා. එලෙස මිය ගිහිල්ලා තිබෙන්නේ අවුරුදු හතයි මාස හයක දරුවෙක්. හේනමුල්ල පිහිටි "රන්දිය උයන" නිවාස ව්‍යාපෘතියේ A 4 U 18 දරන නිවසේ තමයි ඒ දරුවා ඔහුගේ දෙමව්පියන් සමඟ පදිංචි වෙලා ඉඳලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ගොඩනැඟිල්ලේ බදාම තට්ටුවක් කඩාගෙන වැටීමෙන් තමයි ඒ කුඩා දරුවා මරණයට පත් වෙලා තිබෙන්නේ. මේ ගොඩනැඟිල්ල සම්බන්ධව කථා කළොත්, නාගරික සංවර්ධන අධිකාරියේ "නාගරික පුනර්ජීවන" ව්‍යාපෘතිය යටතේ 2014 ඔක්තෝබර් 28වන දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද හේනමුල්ල පිහිටි "හෙළමුතු සෙවන" නිවාස ව්‍යාපෘතිය "A" හා "B" ලෙස ගොඩනැඟිලි දෙකකින් සමන්විත වන අතර, එය නිවාස ඒකක 1,043කින් යුක්ත වෙනවා. මෙහි ඉදිකිරීම් කටයුතු අවසන්

[ගරු බිමල් රත්නායක මහතා]

කර කොන්ත්‍රාත්කරු විසින් 2019 ඔක්තෝබර් 30වන දින නාගරික සංවර්ධන අධිකාරියට භාර දීලා තිබෙනවා. ඉහත දැක්වූ "A" ගොඩනැඟිල්ලේ 1 A 7 U 24 හා 1 A 7 U 25 දරන නිවාස දෙක අතර පිහිටා ඇති බදාම ස්තරයේ දුර්වල ස්ථානයක කොටසක් කැඩී යාම හේතුවෙන් තමයි මෙම අනතුර සිදු වෙලා තිබෙන්නේ. මේකේ කොන්ත්‍රාත්කරු Sanken Construction (Pvt.) Limited. උපදේශක වෙලා ඉඳලා තිබෙනවා, Central Engineering Consultancy Bureau. ඉදිකිරීම් පිරිවැය ලෙස රුපියල් මිලියන 4,138ක්. උපදේශන පිරිවැය ලෙස රුපියල් මිලියන 125ක් මේ වෙනුවෙන් වැය කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අනතුර සිදු වීමෙන් පසුව දරුවා ඒ පවුලේ අය සහ එම ප්‍රදේශයේ අය විසින් ජාතික රෝහලට ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම එම නිවාස සංකීර්ණයේ කළමනාකරුවන් ඉන්නවා. ඒ අයත් මේ සම්බන්ධයෙන් යම් යම් මැදිහත් වීම් කරලා තිබෙනවා. මේවා පොදුවේ මේ නිවාස සංකීර්ණවල තිබෙන ගැටලු. එතැන තිබෙනවා, බිල්ඩින් 70ක්. ආසන්න වශයෙන් මිනිස්සු ලක්ෂයක් විතර ඒවායේ ජීවත් වෙනවා. ගරු කථානායකතුමනි, නිවාස සංකීර්ණවල තිබෙන පොදු ගැටලු මේවායි. ඉහළ මහලයන්හි බිත්ති පුපුරා තිබෙනවා. අපජලය බැහැර කරනු ලබන නළ පද්ධති විවිධ ස්ථානවලින් කාන්දුවීම සහ බිත්තියට සවි කරන ලද ස්ථානවලින් ගැලවිලා තිබෙනවා. අත්වැටවල් දිරා ගිහිල්ලා තිබෙනවා. Slabs ඉරිතලා තිබෙනවා. මේ ආකාරයට "නාගරික පුනර්ජීවන" ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නිවාස ව්‍යාපෘතිවල ගැටලු අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් විසින් ඒවායේ liftsවල තිබෙන දේවල් සියල්ල ගලවනවා. ඒවායේ තිබෙන බල්බ ගලවනවා. ඒ වාගේ ප්‍රශ්නත් තිබෙනවා. මෙම දරුවාගේ ජීවිතය අහිමි වීම සම්බන්ධයෙන් පැහැදිලිවම නාගරික සංවර්ධන අධිකාරියත් සොයා බැලිය යුතුයි. මේවායේ ජීවත් වෙන්නේ මිනිස්සු කියලා හිතන්නේ නැතුව කරන ලද ඉදිකිරීම්වල ප්‍රතිඵලයක් ලෙස තමයි මෙවැනි සිද්ධි මම දකින්නේ. අපි මේ අමාත්‍යාංශය භාර ගත්තාට පසුව රුපියල් මිලියන 325ක් වෙන් කළා, මේ ගොඩනැඟිල්ලත් ඇතුළුව මෙම ගොඩනැඟිලි 70න් ඉතාම අත්‍යවශ්‍යව පවතින ගොඩනැඟිලි ටික ප්‍රතිසංස්කරණය කරන්න. අපි මෙවැනි සිද්ධියක් සිදු වන බව දැනගෙන නොවෙයි ඒ මුදල් වෙන් කළේ.

ගරු කථානායකතුමනි, තොටලඟ මේ ස්ථානයේම, AIIB බැංකුවේ ණයකින් තවත් අලුත් නිවාස ව්‍යාපෘතියක් හදනවා. "දිට්වා" සුළි කුණාටුව එන්න කලින්, මම මේ අමාත්‍යාංශයේ වගකීම් භාර ගත්තාට පසුව ඒ නිවාස සංකීර්ණය බලන්න ගියා. එතැනදී ඇත්තටම AIIB නිවාස සංකීර්ණය ඉදිකරන නිසා මිනිස්සු කිව්වා, තමන්ගේ නිවාසවල බිත්ති පුපුරන්න පටන් අරගෙන තිබෙනවා කියලා. නමුත්, ඒක එකම හේතුව කියලා මම හිතන්නේ නැහැ. ඒක අද ඊයේ පටන් ගත් එකක් නොවෙයි, කාලයක් තිස්සේ කරන දෙයක්. එම නිසා NBRI report එකක් අරගෙන තීරණයක් ගන්න කියලා මම ඒ වෙලාවේම නියෝග කළා. මම ගෙදරක ඇතුළට ගියාම ඒ ගෙදර පදිංචිකරුවා බිත්ති ඉරි තැළිලා තිබෙනවා මට පෙන්නුවා. ඒ, මේ ගෙදරමද කියලා මම දන්නේ නැහැ. ඇත්තටම ගත්තොත් පෙනෙන්නේ, අඩු ආදායම්ලාභී මිනිස්සුන්ට ගෙයක් හදලා දීලා ඔහේ අත හැරලා දාලා තිබෙනවා කියන එකයි.

ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන අධිකාරියේ සම්පත් සහ මානව සම්පත බෙදීම ගත්තොත්, මිනිස්සු ලක්ෂයක් විතර ඉන්න බිල්ඩින් 70ක ඒකක 24ක් වෙනුවෙන් අවම සම්පත් ප්‍රමාණයක් තමයි වෙන් කරලා තිබෙන්නේ. මානව සම්පත වෙන් කරලා තිබෙන්නේ ඉතාම අඩුවෙන්. මෙහි maintenanceවලට ඉන්නේ කාර්මික නිලධාරීන් පස්දෙනෙකු වාගේ ප්‍රමාණයක්. ඉංජිනේරුවන් එක්කෙනායි ඉන්නේ, එක වාහනයයි තිබෙන්නේ. අපි මීට සති දෙකකට විතර කලින් මේ දේවල් හඳුනා ගෙන, housing කියන අංශයට අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරලා, අපි මානව සම්පත සම්පූර්ණයෙන්ම වෙන් කළා.

ඊළඟට මම මේ කාරණයත් කියන්න ඕනෑ. UDA එක හදලා තිබෙන්නේ තනිකරම elite එකට serve කරන්න. ගරු කථානායකතුමනි, මේ ගෙවල් 14,000ක නඩත්තු කටයුතු සඳහා වෙන් කර තිබෙන නිලධාරීන් ප්‍රමාණයට වඩා, Arcade Independence Square එකයි, Colombo Gold Centre එකයි maintain කරන්න ඉන්න නිලධාරීන් ප්‍රමාණය වැඩියි. මේක තනිකරම regimental. ඒ කියන්නේ මෙහි උඩ සිට පහළ දක්වා සිටින නිලධාරීන් elite එකට සේවා සපයනවා, අර මිනිස්සුන්ට ගෙවල් ටිකක් හදලා දීලා "පුළුවන් නම් ඉඳපන්" කියලා. එම නිසා මම ගිය දවසේ ඉඳන්ම නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් එක්ක විවාද කරලා තිබෙනවා. විවාද කරලා තමයි අපි පසුගිය සතියට කලින් සතියේ තීන්දු කළේ, මෙහි සම්පත් බෙදී යාම සහමුලින්ම වෙනස් කරන්න ඕනෑ කියලා.

ඒ වාගේම මේ නිශ්චිත කරුණ සම්බන්ධව අපි NBRI report එකකුත් ගන්න කියලා තිබෙනවා. නමුත් ඒක අරගෙන නැතිව ඇති කියලා මම විශ්වාස කරනවා. මොකද, "දිට්වා" සුළි කුණාටුවත් ආවා. දිට්වා ආවේ නැතත් මිනිස්සු ගැන තෙතමනයෙන් වැඩ කරන සංස්කෘතියක් නාගරික සංවර්ධන අධිකාරියට නැහැ. ඒක තමයි ඇත්ත; ඒක තමයි ඇත්ත. එම නිසා ඉතාම දරුණු,- තනි තනි නිලධාරියාගේ වැරදි ගැන මම කියන්නේ නැහැ. මම මේ මාසයේම කරලා තිබෙන්නේ හැප්පෙන එකයි. ඒගොල්ලෝ මාත් එක්ක හැප්පෙන්න එනවා නේ. Urban development ideology එක සම්පූර්ණයෙන් තිබෙන්නේ කොල්ලුපිටිය, බම්බලපිටිය, Galle Face එක දියුණු කරන එකටයි. අපි කිව්වොත් modernization එකක් සිදු කරන්න කියලා, දන්නේ parks හදන්න විතරයි. නාගරික, අර්ධ නාගරික ප්‍රදේශවල සිටින සාමාන්‍ය, මධ්‍යම පන්තියේ, working class එකේ මිනිස්සු වෙනුවෙන් එක මලක් වවන්න, එක ප්‍රතිමාවක් - statue එකක් - හදන්න, එක pond එකක් හදන්න හිතෙන්නේ නැති මානසිකත්වයකයි ඒගොල්ලෝ ඉන්නේ. ඒගොල්ලෝ අතිශය දක්ෂයි; දක්ෂ අය ඉන්නවා. හැබැයි ඔබතුමන්ලා දන්නවා, නාගරික සංවර්ධනය කියන එකට දර්ශනයක් අවශ්‍ය බව. එතකොට තමයි ඒ දර්ශනය පෙනෙන්නේ. මේ අධිකාරිය තනිකරම regimental, පොඩි හමුදාකරණයකට ලක් වෙලා තිබුණා. ඒ වාගේම මේ තුළ ඉතා නපුරු මතවාදයක් හැදුවා. ඒ නපුරු මතවාදයේ ගොදුරු බවට මේ දක්ෂ නිලධාරීන් පත් වෙලා ඉන්නවා. අපි ඒක කඩලා තිබෙන්නේ. හැබැයි, ඒක කැඩුවාට මේ ප්‍රශ්නය විසඳා ගන්න අපට බැරි වෙලා තිබෙනවා.

අවංකව ගත්තොත්, මම ඊයේ එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමාට කිව්වා, - මේ දරුවාගේ ප්‍රශ්නය නිසා නොවෙයි - මෙහෙම වෙන්න පුළුවන් කියලා. මොකද, ඒවා ගිනි ගත්තොත් මිනිස්සුන්ව එළියට ගන්න ක්‍රමයක් නැහැ, ගරු කථානායකතුමනි. මිනිස්සු 4,000ක් ඉන්න බිල්ඩින් තිබෙනවා, ඒවායේ යට එක කඩයක් නැහැ. මම මේවා මටමයි කියා ගන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is over now.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අවසාන වශයෙන් මට විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

මම ගොඩක් කනගාටු වෙනවා. මගේ දරුවාට එහෙම දෙයක් වුණා නම් මම අද පත් වෙන තත්ත්වය ගැන මට තේරෙනවා. අපට වන්දි දෙන්න පුළුවන්. අපි වන්දි දෙනවා. නමුත්, දරුවෙකුට සමාන වන්දියක් නැහැ. හැබැයි, වෙන කරන්න දෙයක් නැහැ. ඒ පවුලේ අයට කනගාටුව ප්‍රකාශ කිරීම සහ ඒ පවුලේ අයගෙන් සමාව ඉල්ලනවා හැරෙන්න වෙන කරන්න දෙයක් නැති නිසායි මම එහෙම කියන්නේ. ගරු කථානායකතුමනි, අඩු ආදායම්ලාභී කියලා කොන් කරලා, මුල්ලට දාලා තිබෙන මේ පුංචි මිනිස්සුන්ගේ ජීවිත යහපත් කරන්න අපි උපරිම මහන්සි වෙනවා. ඒ ගොල්ලන්වත් ඒකට දායක කර ගන්න අපි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා.

ඒ වාගේම තමයි කොළඹ කථාව. නාගරික සංවර්ධනය කියන කාරණයේදී යාපනය, කිලිනොච්චිය, මුලතිව්, නුවරඑළිය වාගේ නගර බලන්නේම නැහැ; ඒවා අදාළ නැහැ. ඒවා නිකම් ඔහේ ඇදෙන්න දීලා තිබෙන්නේ. එම නිසා නාගරික සංවර්ධනයේ DNA එක සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න අපට mandate එකක් තිබෙනවා. අපි නාගරික සංවර්ධනයේ DNA එක වෙනස් කරනවා. වෙනස් කරලා මෙවැනි අනතුරු උපරිමයෙන් අවම කර ගන්න අපි උපරිම උත්සාහ කරනවා. ඒ වාගේම ඒ දරුවාට වන්දි ලබා දීම යනාදියත් අපි කරනවා. කොහොමත් ඒ කටයුත්ත UDA එක කරයි. නමුත්, සිදු වුණු ඒ ඛේදවාචකය පිළිබඳව අපි ඒ පවුලෙන් සමාව අයැද සිටිනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. S.M. Marikkar. You have 12 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 12.13]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම මුලින්ම එක් කාරණයක් ඔබතුමියගේ අවධානයට යොමු කරනවා. විශේෂයෙන්ම ස්ථාවර නියෝග 91(ඌ) අනුව බැලුවොත්, ගරු දයාසිරි ජයසේකර මැතිතුමාට ආරෝපිත චෝදනා එල්ල වුණා. එම කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. හැබැයි, එතුමාට චෝදනා කරනකොට කිව්වා, එතුමා පොහොට්ටුවේ සිටියා කියලා. ඇත්ත, එතුමා පොහොට්ටුවේ සිටියා. මෙතැන ඉන්න ජේවීපී එකේ කට්ටියත් 2004 දී මහින්ද රාජපක්ෂ බලයට පත් කරන්න, රාජපක්ෂ පරම්පරාවට මේ රට ලියලා දෙන්න දායක වෙච්ච කට්ටිය. මෙගොල්ලෝ තමයි එතුමාව ගෙනාවේ. ඒ ආණ්ඩුවල ඇමතිකම් දරාගෙන, චන්ද්‍රිකා මැතිනියත් එක්ක ඇමතිකම් දරාගෙන, මහින්ද රාජපක්ෂ මහත්මයාත් එක්ක එකතු වෙලා ඉඳලා, ඊට පස්සේ අපිටත් උදව් කළා. 2015 දී සිරිසේන මහත්මයා ජනාධිපති කරන්න හංසයාට උදව් කළා. දැන් නිකම් මැරිලා ඉපදිලා වාගේ, සුද්දවන්තයෝ වගේ කථා කරනවා. මම ඒ ගැන කථා කරන්න මීට වඩා කාලය ගන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අද තවත් කාරණයකට විශේෂයෙන් අවධානය යොමු කරනවා. බලශක්ති ඇමතිතුමා අද උදේ මේ සභාවේ ඉඳලා පැනලා ගියා. ඇත්ත වශයෙන්ම ජනාධිපතිතුමා හැම වෙලාවේම කියනවා, මේ ආණ්ඩුව රුපියලක්වත් හොරකම් කරන්නේ නැහැ කියලා. රුපියලක්වත් හොරකම් කරන්නේ නැහැ ලු. හැබැයි, මහ දවාලේ සිද්ධ වෙන හොරකම් ටික පෙනෙන්නේ නැහැ. ගල් අඟුරු වංචාව පිළිබඳව අපි කරුණු හෙළි කරනවා; හෙළි කරනවා, නමුත් වගේ වගක් නැහැ. ඒක බේරන්නම තමයි කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලංකා ගල් අඟුරු සමාගමට ගල් අඟුරු ගෙන්වන්න ටෙන්ඩර් එකක් දමනකොට දින 42ක් දෙන්න ඕනෑ. දැන්, මේ අය ඒ ටෙන්ඩර් එක දමනකොටම කාලය දින 21ට අඩු කළා. ඒ ඇයි? පිළිගත් සමාගම්වලට enter වෙන්න බැරි වෙන්න. ඊළඟට, ලංකා ගල් අඟුරු සමාගමට ගල් අඟුරු ගේනකොට අදාළ සමාගම පසුගිය අවුරුදු තුන තුළ මෙට්‍රික්ටොන් ලක්ෂ 5ක් supply කරලා තිබෙන්නට ඕනෑ. මෙට්‍රික්ටොන් ලක්ෂයකින් කිලෝ කැලරි 5,900කට වැඩි ප්‍රමාණයක් supply කරලා තිබෙන්නට ඕනෑ. ඒ එක්කම, last three yearsවලට ඒ company එකේ revenue එක විධියට US Dollars 150 million තිබෙන්නට ඕනෑ. මොකක්ද කළේ? දින 42, දින 21 දක්වා අඩු කරලා, ලක්ෂ පහේ supply එක ලක්ෂය දක්වා අඩු කළා. ඒ ඇයි? දූෂිතයන් වෙනුවෙන්. අධිකරණ ඇමතිතුමා දැන් සභාවට එනවා. එතුමාත් මේක දැන ගන්න ඕනෑ. දූෂිතයන්ට මේක ඇතුළට එන්නම තමයි පාර කැපුවේ. පාර කපලා තමයි මේ ටෙන්ඩර් එක පටන් ගත්තේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්ත වශයෙන්ම මේක වෙන්න කලින්ම අපි මේ ගැන කිව්වා. හැබැයි, මේකට උත්තරයක් දුන්නා. ඒ මොකක්ද? Lowest bidder. ඔව්, lowest bidder වීම අත්‍යවශ්‍යයි. හැබැයි, quality එක? Quality එක කෝ? මේ සමස්ත ක්‍රියාවලියම සිද්ධ වෙන්නේ හිටපු සභාපතිවරයා සිටියදී. අපට ආරංචි විධියට, සභාපතිවරයාට Tender Board එකේ වාඩි වෙන්න බැහැ. ඔහු නිල නොවන වශයෙන් ඔහුගේ approach එක දීලා තිබෙනවා. දීලා ටෙන්ඩර් එක ප්‍රදානය කරන්න කලින් ඔහු ඉවත් වෙනවා. ඒ තමයි අලුත්ම drama එක. වැඩේ කරන්න සැලසුම් කරලා, වැඩේ වෙන්න කලින් අයින් වෙනවා. වැඩේ වෙනකොට වෙන කවුරු හරි තමයි ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊට පස්සේ පළමු නැව එන්න නියමිත දවසට වඩා පරක්කු වෙලා තමයි ආවේ. මම දන්නා තරමට ඒක ආවේ දෙසැම්බර් මාසයේ 30වැනිදා ද කොහේද. ඒ ආවත්, මොකක් හෝ හේතුවක් උඩ අදටත් බලශක්ති අමාත්‍යාංශය දන්නේ නැහැ, ගල් අඟුරු බාපු ගමන් ඒවා බොයිලේරුවලට ගියේ කොහොමද කියලා. බොයිලේරුවලට ගියාම මෙගාවොට් 300ක් නිෂ්පාදනය වෙන්නේ නැහැ කියලා real time report එකේ තිබෙනවා. ඒ චෝදනාව නඟපු වෙලාවේ

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කිව්වා, අපි බොරු කියනවාය කියලා. හැබැයි, අවසානයේ දැන් පිළිගන්නවා, පළමුවැනි නැවෙන් ගෙනාපු ගල් අඟුරු quality failed කියලා. ඒ කියන්නේ, අවශ්‍ය මෙගාවොට් 300ක විදුලි ජනනය කරන්න බැහැ කියලා. දෙවැනි report එක තවමත් අතුරුදහන්. ඒ ගැන කථාවක් නැහැ. හැබැයි, මේ කථාව යද්දී ඇමතිතුමා කියනවා, එහෙම බාල quality ගල් අඟුරු ඇවිල්ලා නැහැ කියලා. ඊළඟට බලශක්ති අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරනවා, එහෙම බාල quality ගල් අඟුරු තිබුණා නම් අපි දඩ මුදල් අය කර ගන්නවා කියලා. එහෙම කරන්නේ කොහොමද? දඩ මුදල් අය කර ගන්නවා කියලා එක පාරටම කියන්න බැහැ. Quality report එක ඉන්දියාවේ ඉඳලා එන්නත් කලින් එහෙම කියනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, ඊළඟට තුන්වැනි නැවත් ආවා, හතරවැනි නැවත් ආවා. තුන්වැනි නැවත් failed; මෙගාවොට් 300ක් ජනනය කර ගන්න බැහැ. අපට ආරංචි විධියට හතරවැනි නැවේ ආපු ගල් අඟුරු ජනවාරි මාසයේ 27වැනි දා බොයිලේරුවලට දාලා තිබෙනවා. ඒ තුළින් මෙගාවොට් 810ක් වෙනුවට මෙගාවොට් 790යි ජනනය වෙලා තිබෙන්නේ. ඉතින්, අපි අහනවා, කාවද මේ රකින්නේ, ඇයි මේ අය රකින්නේ, මොකටද රකින්නේ කියලා. අනෙක් කාරණය මෙයයි. දඩ බඩ ගාලා ඩොලර් මිලියන 2.1ක් දඩ ගැහුවා ලු. ඩොලර් මිලියන 2.1 ගණනය කළේ කොහොමද? පළමුවැනි කාරණය, low-quality coal ගෙනා නිසා ඇති වන පාඩුව ගණනය කළාද? දෙවැනි එක, මේ වාගේ බාල ගල්අඟුරු බොයිලේරුවලට දැම්මාම බොයිලේරුවල equipmentවලට සිදුවන හානිය ගණනය කළාද? තුන්වැනි එක, අවශ්‍ය විදුලිය ප්‍රමාණය ජනනය කරගන්න බැරි වුණාම ඒ ඌනතාව ලබා ගැනීම සඳහා, ඒ හිඩැස පුරවා ගැනීම සඳහා විදුලි බලය මිලදී ගන්නේ කොයි මාෆියාවෙන්ද, ඒකට යන වියදම කොච්චරද? මේ එකක්වත් අද වෙනකම් කියන්නේත් නැහැ. ගණනය කළාද කියලා දන්නේත් නැහැ. අපට ආරංචියි, ඒ වෙනුවට තකහනියේම spot tender එකකට යනවා කියලා. කැබිනට් මණ්ඩලය අන්දලා කියලා මම විශ්වාස කරනවා. කැබිනට් මණ්ඩලයටත් දාලා තිබෙනවා කියනවා. Spot tender ටෙන්ඩර් එකකට ගියාම අනිවාර්යයෙන්ම normal tender එකකට වඩා වැඩිපුර ගෙවන්න වෙනවා. මේගොල්ලන් ටෙන්ඩර් කොන්දේසි කඩ කරලා තිබෙන නිසා දඩ ගහනවා කියලා පූර්ව නිගමනයකට ආවේ කොහොමද කියලා මම අහනවා.

අධිකරණ ඇමතිතුමනි, මේ bidding document එකේ Termination Clause එකේ මෙහෙම තිබෙනවා, I quote:

> "In the event any two different shipments of coal quality parameters are reported outside the absolute minimum/ maximum tolerance limit after, testing of coal samples at Load Port and Jetty Port of the Plant as indicated in 'Clause 5.2 of the Schedules,…."

මේගොල්ලන් කියනවා, ළඟ ළඟ නැව් දෙකක් cancel වෙනවා කියලා. ළඟ ළඟ නැව් දෙකක් කියලා කොහේවත් නැහැ. අපට ආරංචි විධියට, ළඟ ළඟ නැව් දෙකක්, ඒ කියන්නේ තුන්වැනි එකයි, හතරවැනි එකයි fail වෙලා තිබෙනවා. තුනයි, හතරයි fail වුණාම spot tender එකකට යන්න ඕනෑය කියන නීතිය කොහේද තිබෙන්නේ?

ඊළඟට කියන කථාව මම අද කලින්ම කියන්නම්. මේගොල්ලන්ට ඕනෑ ටෙන්ඩර් එක cancel කරවලා, ගල් අඟුරු හිඟයක් ඇති කරලා කරන්ට් කපන්නයි. අපි තමයි කලින්ම කිව්වේ, මෙහෙම ගියොත් කරන්ට් කපන්න වෙනවා කියලා. මොකද, කලින් වතාවේ ගෙනාපු ඒවා පෙබරවාරි මාසය ඉවර වෙනකම් තිබෙනවා. අපට ආරංචි විධියට මේක වහන්න, කලින් ගෙනාපු ගල් අඟුරුත් එක්ක මේ බාල ගල් අඟුරු එකට මිශ්‍ර කරලා බොයිලේරුවලට දාලා වැඩක් කරලා තිබෙනවා.

ගරු අධිකරණ ඇමතිතුමනි, මාලිමාවේ පුද්ගලයෙකු විධියට මට ඔබතුමා ගැන යම් ගරුත්වයක් තිබෙනවා. ඔබතුමා කියන්න ඕනෑ දේ කෙළින් කියන පුද්ගලයෙක්. "රෝහණ විජේවීර මගේ නායකයා නොවෙයි" කියලා කියන්න තරම් කොන්දක් ඔබතුමාට තිබුණා. ඔබතුමා විනිවිදභාවය ගැන කථා කළා. මැතිවරණ කාලයකදී ඔබතුමා තංගල්ල ටවුමේ ඉඳන් කාල්ටන් නිවසට ඇහෙන්න කථා කරපු දේවල් මම social mediaවලින් බලාගෙන හිටියා. ඒ නිසා අඩුම ගණනේ ඔබතුමාගේ අවධානය සඳහා මම මේ කාරණය යොමු කරනවා. මොකද, එක පුද්ගලයෙක් හින්දා ඔක්කෝම කුලප්පු කරගන්නවාද, නැද්ද කියන එක ඔබතුමන්ලා තීරණය කරන්න. මේක පොඩි වැඩක් නොවෙයි. මේ, ඩොලර් මිලියන ගණන්වල ගනුදෙනු. මේ ඇමතිවරයා කිසිදු ඇහුම්කන් දීමක් කරන්නේ නැහැ. කාටවත් සුහද බවක් නැහැ. අඩුම ගණනේ අමාත්‍යාංශයේ ලේකම් එක්ක එකට වැඩ කරන්න බැරි පුද්ගලයෙක් ඇමති වෙලා ඉන්නේ. අනෙක් කාරණය, හොරාට කලින් වැට පනිනවා වාගේ මෙතුමා බේරාගන්න හදන්නේ ඇයි? ඒ මදිවාට දැන් පොඩි media campaign එකකුත් පටන් අරගෙන තිබෙනවා, මේ හොරකම්, වංචා, දූෂණ එළිකරන අයට attack කරන්න. මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ, ජාතික ලැයිස්තුවෙන් ආපු ඇමතිවරයෙක්. මේ, මහජනතාවගේ pulse එක සම්බන්ධයෙන් අවබෝධයක් නැති, පොහොර සංස්ථාවේ වැඩ කරද්දී දූෂණ චෝදනා ලබා අස් කරපු පුද්ගලයෙක්. ජනාධිපතිතුමාගේ නම විකුණාගෙන මේ වාගේ දූෂණ වංචා සිද්ධ කරනවා නම් ඔබගේ ආණ්ඩුවට අබ සරණයි,

ගරු අධිකරණ ඇමතිතුමනි. තව කරුණු ගොඩක් හෙළි වෙන්නට නියමිත බවත් මම විශේෂයෙන් කියන්න ඕනෑ. රුපියලක්වත් හොරකම් කරන්නේ නැහැ කියන කථාව නැවත වතාවක් කියනවා නම්, කණ්ණාඩියක් ඉස්සරහට ගිහින් බලන්න. මම කියන්නේ නැහැ, හැමෝම හොරකම් කරනවා කියලා. හොඳ අය ඇති. මම මීට පෙර ත්‍රිකුණාමලයේ සූළං විදුලි බලාගාරයක් ගැන මතක් කළා. උත්තර නැහැ; උත්තර දෙන්නේ නැහැ. එක, මේ වංචා නිසා රටට පාඩුවක් වෙනවා. දෙක, මේකෙන් විදුලි කප්පාදුවක් ඇති වෙන්නත් පුළුවන්. ගරු අධිකරණ ඇමතිතුමනි, ආණ්ඩු බලය ගන්න අපට වුවමනායි. ඒක ඇත්ත. හැබැයි අපට කාලකණ්ණි වුවමනාවක් නැහැ, මේ රටේ තෙල් පෝලිම් හදලා, කරන්ට් කපලා, ගෑස් පෝලිම් හදලා බලය ගැනීමට. මම අද කිව්වා කියලා මේක ලියලා තියාගන්න. ගරු ඇමතිතුමනි, ඊළඟට මේ ප්‍රශ්නය එන්නේ ගෑස්වලටයි කියන එක ලියලා තියාගන්න. මම මීට වඩා ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ.

මගේ ඉතුරු වෙලාව හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාට ලබා දෙනවා. ඊට කලින් මම අධිකරණ ඇමතිතුමාගෙන් නැවත වතාවක් ඉල්ලීමක් කරනවා. ගරු ඇමතිතුමනි, අඩු ගණනේ මේ ගැන කැබිනට් මණ්ඩලයේදී කථා කරන්න. මේ ගැන කථා කරලා මේ කරන වංචාව, දූෂණය, පාඩුව නවත්වන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට ගරු මරික්කාර් මන්ත්‍රීතුමාගේ ඉතුරු වෙලාව ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඉතුරු වෙලාව ඔබතුමාගේ කථාවේදී දෙන්නම්. *[බාධා කිරීමක්]* හොඳයි, ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ පළමුවැනි පරිච්ඡේදයේ 3(5) වගන්තියේ සහ 127(1), 127(1)ඔ යන වගන්තිවල ප්‍රකාශ කර තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කටයුතුවලට මැදිහත්වීම, එහෙම නැත්නම් එම පරීක්ෂණවලට අදාළ ලේඛන විනාශ කිරීම ඉතා පැහැදිලිවම එම පනතට අනුව බරපතළ දඬුවම් ලැබිය හැකි වරදක් කියලා. මම හිතනවා, අපේ අධිකරණ ඇමතිතුමාත් ඒකට එකඟ වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට ලොකු ගැටලුවක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්තුමා අල්ලස් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනවා, කථානායකතුමාට විරුද්ධව. මීට දින 4කට කලින් තමයි ඒ පැමිණිල්ල ඉදිරිපත් කළේ. එතකොට මෙතැන තිබෙනවා, ලොකු ගැටලුවක්. මගේ අතේ තිබෙනවා, 2026.02.03වැනි දා, ඒ කියන්නේ මීට දවස් දෙකකට කලින් චමීර ගාල්ලගේ මහතා පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියට යොමු කළ ලිපිය.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක් ගැනද ඔය කථා කරන්නේ?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මට එස්. එම්. මරික්කාර් මන්ත්‍රීතුමා ලබා දුන් කාලය. ඒක හින්දා කරුණාකරලා මගේ වෙලාව දෙන්න.

2026.02.03වැනි දින චමීර ගාල්ලගේ මහතා විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියට යවන ලද මෙම ලිපිය මම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමාගේ පෞද්ගලික ලේකම්තුමා වන චමීර ගාල්ලගේ මහතා එම ලිපිය මඟින් ඉතා පැහැදිලිවම මේ පාර්ලිමේන්තුවෙන් ප්‍රශ්න කිහිපයක් අහලා තිබෙනවා, අල්ලස් කොමිසමට යොමු කර තිබෙන පැමිණිල්ලට විරුද්ධව. ඒ හැම ප්‍රශ්නයකින්ම අහලා තිබෙන්නේ මොකක්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ ගැටලුව ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය ලබා ගන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා. විනාඩි 5ක් දැන් ලබා ගෙන lunch time එකෙන් පස්සේ ඉතුරු කාලය ලබා ගන්න. *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. *[බාධා කිරීම්]*

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මොකක්ද, point එක? Point එක මොකක්ද කියලා කියන්නකෝ.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Point එක නොවෙයි, මේ මගේ විවාද වෙලාව.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
ඔබතුමා විවාදයට අදාළව නොවෙයි නේ කථා කරන්නේ, අද විවාදය මොකක්ද?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
කරුණාකරලා මට මයික් එක දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතා පැහැදිලිවම ගරු කථානායකතුමාගේ පෞද්ගලික ලේකම්තුමා පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමියට ලියුමක් එවලා තොරතුරු ඉල්ලනවා, අල්ලස් කොමිසමට යොමු කළ පැමිණිල්ල පිළිබඳව, එහි සම්පූර්ණ විස්තර පිළිබඳව. දූෂණ විරෝධී පනතට අනුව මේක බරපතළ දඬුවම් ලැබිය හැකි වරදක්. අපි අල්ලස් කොමිසමෙන් ඉල්ලීමක් කරනවා, වහාම මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා. මෙහෙම පැමිණිල්ලක් දාලා තිබෙනකොට ඒ පිළිබඳව තොරතුරු අරගෙන ඒ පැමිණිල්ලට අදාළ බරපතළ රාජකාරියට බාධා කිරීමක් තමයි මේ කරන්නේ. අල්ලස් කොමිසමේ කටයුතුවලට බාධා කරන්න කථානායකතුමාගේ ලේකම්තුමාට කිසිම හැකියාවක් නැහැ. එහෙම කොහොමද කරන්නේ? මොන නීතිය යටතේද එහෙම කරන්නේ? අධිකරණ ඇමතිතුමාත් සභාවේ ඉන්නවා. කාට, කොහේ තිබෙන බලයක්ද, මේ පෞද්ගලික ලේකම්තුමාට තිබෙන්නේ? කථානායකතුමා ඇතුළු අපි හැමෝම මේ රටේ නීතියට යටත්. එම නිසා අපි ඉතා ඕනෑකමින් අල්ලස් කොමිසමෙන් ඉල්ලීමක් කරනවා, මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා. මේ ලිපිය මම සභාගත කළා. මේ රටේ මානව හිමිකම් කොමිසමක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා. ඔබතුමා දිවා අහාර විවේකය වෙනකම් කථා කරන්න. ඊට පස්සේ ඉතුරු කාලය ලබාගන්න.

[අ.භා. 12.27]

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Janitha Ruwan Kodithuwakku - Deputy Minister of Ports and Civil Aviation)

මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අද පනත් කෙටුම්පත් තුනක් විවාදයට ගන්නවා. ඒ අතර නාවුක ක්ෂේත්‍රයට ඉතා වැදගත් වන පනත් කෙටුම්පතකුත්, ඒ වාගේම කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාම, නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද වූ විධිවිධාන සැලැස්වීම පිණිස වූ කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පතත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලංකාව මේ කලාපය තුළ තිබෙන නාවුක කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය විශේෂයෙන්ම කොළඹ වරාය හරහා ඉතා විශාල මෙහෙවරක් කරන බව අපි දන්නවා. අපිට ඉතිහාසයේ පළමුවෙනි වතාවට පසුගිය අවුරුද්දේ මිලියන 8ක TEU ධාරිතාව ඉක්මවා යන්න හැකි වුණා. මේ කටයුතු මේ ආකාරයෙන් කරගෙන යනවා වාගේම ඉදිරි වසර ඇතුළත මේ ධාරිතාවට තවත් විශාල ප්‍රමාණයක් එකතු කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. කොළඹ වරායේ බටහිර පර්යන්තය සහ නැඟෙනහිර පර්යන්තය කියන දෙකම මේ අවුරුද්ද තුළ නැවත සේවයට එකතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව බටහිර පර්යන්තයෙන් මිලියන 3ක ධාරිතාවකුත්, නැඟෙනහිර පර්යන්තයෙන් මිලියන 3ක ධාරිතාවකුත් අමතරව මේ අවුරුද්ද තුළ වරාය ධාරිතාවට එකතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ ආකාරයට ගත්තාම, මේ පර්යන්ත දෙකෙන් පමණක් මිලියන 14ක ධාරිතාවක් මේ අවුරුද්ද තුළ වරායට එකතු වෙනවා.

ඒ වාගේම JCT - Phase 5 කියන එකේත් yard capacity එක තව ලක්ෂ 4කින් වැඩි කරනවා. ඒ කියන්නේ, TEUs 0.5 million මේ ධාරිතාවට එකතු වෙනවා. ඒ අනුව ගත්තාම, මේ අවුරුද්ද අග වනකොට වරායේ සම්පූර්ණ ධාරිතාව මිලියන 15කට ආසන්න වෙනවා. අපි හොඳටම දන්නවා, කන්ටේනර් ක්‍රියාවලිය පටන් ගත් 1980 ගණන්වල ඉඳලා අවුරුදු 40කට ආසන්න කාලයක් තුළ ඒ හරහා වසරකට අපට අත්පත් කරගන්න පුළුවන් වුණේ මිලියන 8ක් බව. ඉදිරි වසර ඇතුළතදී අපි වැඩි කරන මිලියන 6.5 වරායට absorb කර ගැනීමේ අභියෝගයක් අපට තිබෙනවා. ඒක නිසා අපි බලාපොරොත්තු වෙනවා, වරාය වාගේම වරායෙන් පිටත කටයුතු ටිකත් ඒ හා සමානව කාර්යක්ෂම කරන්න.

වරාය ගැන කථා කරනකොට ECT එක ගැනත් මම පොඩ්ඩක් සඳහන් කරන්න ඕනෑ. පසුගිය කාලයේදීම දිගින් දිගටම ප්‍රවෘත්ති මවපු කාරණයක් තමයි, නැඟෙනහිර පර්යන්තය - ECT එක. අපි දන්නවා, 2024 අවුරුද්දේ අග භාගයේ අපි රජය භාර ගන්නකොට මෙකේ භෞතික ප්‍රගතිය තිබුණේ සියයට 30ක, 35ක වාගේ ප්‍රමාණයකින් බව. අපිට හැකියාව ලැබුණා, පසුගිය අවුරුද්ද ඇතුළත ඒ ප්‍රමාණය වැඩි කර ගන්න. ඒක අප ලැබූ විශාල ජයග්‍රහණයක්. එහි ප්‍රසම්පාදන කටයුතුවල අඩුපාඩු ගොඩක් තිබුණා. ප්‍රසම්පාදන කටයුතුවලදී සමහර items මඟ හැරී තිබුණා. ඒක නිසා යම්කිසි ප්‍රමාදයක් සිදු වුණත්, මේ අවුරුද්දේ අග වනකොට අපිට මේ jetty එකේ quay wall එක සම්පූර්ණයෙන් අවසන් කරන්න පුළුවන් වෙනවා. ලෝකයේ තිබෙන ලොකුම නැව් 3ක් එකවර ගාල් කරලා මෙහෙයුම් කිරීමේ හැකියාව දැන් ECT එක සතුව පවතිනවා. ඒ වාගේම ECT එක, quay wall එක සහ yard එක වශයෙන් කොටස් 2කින් සමන්විතයි. ඒකේ yard එක lanes 20කින් සමන්විතයි. මේ වෙනකොට අපි ඒ lanes 20න්, 10ක වැඩ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කරලා 5ක testing පවා අවසන් කර තිබෙනවා. අපි මේ මාසයේ අග වනකොට බලාපොරොත්තු වෙනවා, lanes 2ක නැව්වල operation එකත් එක්ක yard එකේ operation එක පටන් ගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු අත්හිටුවන්න වෙනවා. ඔබතුමාට තව විනාඩි 9ක කාලයක් දිවා ආහාර විවේකයෙන් පසුව ලබා දෙනවා.

Order, please! දිවා ආහාර විවේකය සඳහා ගරු සභාවේ කටයුතු පස් වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජනිත රුවන් කොඩිතුවක්කු නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ඉතිරිව තිබෙනවා.

**ගරු ජනිත රුවන් කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு ஜனித ருவன் கொடித்துவக்கு)
(The Hon. Janitha Ruwan Kodithuwakku)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි කථා කරමින් හිටියේ, නැඟෙනහිර පර්යන්තයේ සංවර්ධන කටයුතු සම්බන්ධව. මම මතක් කළා වාගේ අපි දැනට නැඟෙනහිර පර්යන්තයේ quay wall එක අවසන් කරලා තිබෙනවා. ඒ වාගේම lanes 20කින් සමන්විත yard එකේ මේ වෙනකොට අපි lanes 10ක කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර තිබෙනවා. ඉතුරු lanes 10හි කටයුතු සියයට 70ක වාගේ ප්‍රමාණයක් අවසන් කරලා තිබෙනවා. අපි හිතනවා, මේ අවුරුද්ද අග වෙනකොට ඒ lanes 10ත් සම්පූර්ණ කර ගන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම වැඩ අවසන් කළ lanes 10 අපි සම්පූර්ණයෙන්ම දැන් testing කටයුතු ටික අවසන් කරලා, මේ වෙනකොට go live මට්ටමට පත් කරගෙන තිබෙනවා. මම හිතනවා, මේ මාසය අග වෙනකොට අපට yard එකයි quay wall එකයි දෙකම සම්බන්ධ කරගෙන මෙහෙයුම් කටයුතු ආරම්භ කර ගන්න පුළුවන් වෙයි කියලා.

නමුත් මෙතැනදී දිගින් දිගටම පොඩි ප්‍රශ්නයක් මතු වෙනවා, straddle carriers සම්බන්ධයෙන්. මාධ්‍ය හරහාත් දිගින් දිගටම

මේ ප්‍රශ්නය මතු කරනවා. අපි ආණ්ඩුව භාර ගන්නකොට straddle carrier procurement එකේ අක්‍රමිකතා විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබුණා. ඒ නිසා අපට ඒක අවලංගු කරන්න සිද්ධ වුණා. ඊකෙන් පස්සේ අපි නැවතත් procurement කටයුතු පටන් අරගෙන මේ වෙනකොට සියයට 95ක් විතර ඉවර කරලා තිබෙනවා. හැබැයි අපි නැඟෙනහිර පර්යන්තයේ මෙහෙයුම් කටයුතු සඳහා straddle carriers බාධාවක් නොවන විධියට සැලසුම් සකස් කරලායි තිබෙන්නේ. ඒ නිසා අපි හිතනවා මේ මාසයේ අග වෙනකොට straddle carriers නැතුව trucks භාවිත කරමින් සම්පූර්ණ මෙහෙයුම් කටයුතු කර ගන්න පුළුවන් වෙයි කියලා. එතැනදී කාර්යක්ෂමතාවයේ යම්කිසි අඩුවක් - සියයට 10ක පමණ අඩුවක් - තිබේවි කියලා අපි හිතනවා. නමුත් lanes ප්‍රමාණය වැඩි කර ගනිමින් කාර්යක්ෂමතාව අත්පත් කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපි දන්නවා, කොළඹ වරායෙන් සියයට 85ක් විතර ප්‍රතිඅපනයන කටයුතු සඳහා තමයි යොදා ගන්නේ. ඉතුරු සියයට 15 imports and exports සඳහා අපි යොදා ගන්නවා. ඒ සියයට 15 නිසා තමයි පසුගිය කාලයේ අපි කථා කළ වරාය තදබදය ඇති වුණේ. ඒ සියයට 15 අපි නිසි ලෙස කළමනාකරණය කර ගත්තේ නැත්නම්, අනෙක් සියයට 85ටත් ඒකෙන් බලපෑමක් එල්ල වෙනවා. වරාය කියන්නේ තනි පද්ධතියක්. වරාය කටයුතු waterfront operations and land operations කියලා කොටස් දෙකකට බෙදෙනවා. වරාය ඇතුළේ waterfront එකේත් අපි operations ප්‍රමාණයක් කරනවා; එළියේත් operations ප්‍රමාණයක් කරනවා. එළියේ කරන operations කාර්යක්ෂම වුණේ නැත්නම්, ඒක waterfront එකේ operations සඳහා අනිවාර්යයෙන්ම බලපානවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, වරාය සංවර්ධනය වාගේම වරායෙන් එළියේ යටිතල පහසුකම් සංවර්ධනය කරන්නත්, නීති රීති පද්ධතිය සකස් කරන්නත්.

අපි දන්නවා, ගිය අවුරුද්ද ඇතුළත රටේ ආර්ථික සංවර්ධනය සහ දේශපාලන ස්ථාවරත්වයත් එක්ක අපේ ආනයන අපනයන ප්‍රමාණය, TEUs මිලියන 1.1 සිට 1.3 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම general cargo සියයට 30ක වර්ධනයක් අත්කර ගෙන තිබෙනවා. ඒ කියන්නේ අපි දන්නවා දැන් රට ඇතුළට එන භාණ්ඩ ප්‍රමාණය වාගේම පිටවන භාණ්ඩ ප්‍රමාණයත් වැඩි වෙමින් පවතිනවා. ඒ නිසා අපි ඒ සඳහා අවශ්‍ය නීති රීති, රෙගුලාසි සහ යටිතල පහසුකම් හදා ගැනීම අත්‍යවශ්‍යයි. දවසකට කන්ටේනර් 1,500ත්-2,000ත් අතර ප්‍රමාණයක් වරායෙන් එළියට එනවා. අපි දන්නවා, මේ process එක. කන්ටේනර් වරායෙන් එළියට එනවා; ඊළඟට ආනයනය කරපු කෙනාගේ කර්මාන්තශාලාවට යනවා; බඩු ටික බානවා; ඊට පස්සේ කන්ටේනර් ටික ආපසු පාරට නිදහස් වෙනවා. දවසට කන්ටේනර් 2,000ක් ඒ විධියට නිදහස් වෙනවා. ඒ කන්ටේනර් 2,000 කළමනාකරණය කිරීම තමයි container depot operatorsලා කරන්නේ. මොකද, දැනට ඒක ඉතාම අකාර්යක්ෂම සහ පාලනයකින් තොරව සිදු වන දෙයක්. Shipping linesවලින් අපට තිබෙන ලොකු complaint එකක් තමයි කන්ටේනර් නැති වෙනවා, කන්ටේනර් track කර ගන්න විධියක් නැහැ කියන එක. ඒ වාගේම container yardsවල තිබෙන කාර්යක්ෂමතාව අඩුකම නිසා අපේ trucks ගිහිල්ලා ඒ container yardsවල හිර වෙනවා. අපි දන්නවා, අපට prime movers තිබෙන්නේ ඉතාම සීමිත ප්‍රමාණයක්. Container depots දැනට තිබෙනවා 26ක් විතර. ඒ 26හි prime movers 5 ගණනේ හිර වුණොත්, prime movers 130ක්-150ක් විතර ඒවා අස්සේ හිර වෙනවා. ඒ නිසා ඒවා නියාමනය කිරීම සහ ගුණාත්මකභාවය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය කාරණයක්. ඒකට තමයි අපි මේ පනත් කෙටුම්පත ගෙන ආවේ.

ඒ වාගේම වරාය මතින් දිවෙන elevated highway එක ගැනත් කියන්න ඕනෑ. මහාමාර්ග අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරලා, මේ වෙනකොට අපි කාලය සම්බන්ධව තීරණයක් අරගෙන තිබෙනවා; මේ අවුරුද්දේ මාර්තු මාසයේ අග වෙනකොට අපට වරායේ තිබෙන ramp-down එක open කරලා පටන් ගන්න පුළුවන්. එතැනදී terminalsවලින් එළියට එන කන්ටේනර් වරාය ඇතුළේ රවුම් ගහන එක නවත්වලා කෙළින්ම ආපසු පරීක්ෂණාංගණ සඳහා යොමු කරන්න සහ Green Channel එකේ යන ටික එළියට යවා ගන්න අපට පුළුවන් වෙනවා. ඉතින් අපි හිතනවා, මේ කලාපයේ තිබෙන demand එකට ඔරොත්තු දෙන විධියට වරායේ සංවර්ධන කටයුතු ටික කෙරෙනවා කියලා.

හැබැයි, එළියේ තිබෙන පර්යන්තවල කටයුතු කරන්නේ පෞද්ගලික අංශ මඟින්. පෞද්ගලික අංශ නියාමනය කිරීම සඳහා තමයි අපි මෙම පනත ගෙනෙන්නේ. එම අංගණවල සිදු වන්නේ මොකක්ද? නිදහස් වන කන්ටේනර් 2,000ක් විතර එම අංගණ තුළට ගෙන ගියාම එතැනදී තමයි තීරණය වන්නේ ඒවා හිස් බහලුම් විධියට එළියට යනවාද, නැත්නම් ඒවා ආපහු භාණ්ඩ ප්‍රති අපනයනය කිරීම සඳහා යොදා ගන්නවාද කියලා. ඒ තීරණය ගන්න කල් කන්ටේනර් එම yards තුළ තමයි රඳවා තබා ගන්නේ. ඉතින්, එම yardsවලට අවශ්‍ය පහසුකම් සැපයීම සහ කාර්යක්ෂමතාව ඇති කිරීම සඳහා අවශ්‍ය මිල ගණන් පාලනය කිරීමත් මේ වන කල් සිදු වුණේ නැහැ. මෙම පනත හරහා වෙළෙඳ නාවික අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ලැබෙනවා, ඒවායේ මිල පාලනය කිරීම සඳහා. මොකද, shipping linesවල තිබෙන දැඩි bargaining power එකත් එක්ක ඒවායේ මිල දැනට ඉතාම අඩු මට්ටමක තිබෙන්නේ. එම නිසා ඒ yards වැහෙන මට්ටමක තමයි පවතින්නේ. මෙම පනත හරහා අවම මිලක් නියම කරමින් ඒ yards පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න අපට හැකියාව ලැබෙනවා.

ඒ වාගේම තමයි yardsවල කාර්යක්ෂමතාව. මොකද, yardsවල කන්ටේනර් ගබඩා කර තබා ගනිද්දී කාර්යක්ෂමතාවක් තිබිය යුතුයි. Yardsවලට භූමිය සකස් කර, yards හැම තිස්සේම පවත්වාගෙන යා යුතු වන්නේ කිලෝමීටර් 20ක වාගේ ප්‍රදේශයක් ඇතුළත. නමුත්, එම භූමි ඉතා මිල අධිකයි. එතකොට අධික මිලක් වැය කරලා එම භූමි අරගෙන නඩත්තු කරනවාට වඩා වෙනත් ව්‍යාපාර සඳහා ඒගොල්ලෝ යොමු වන ප්‍රවණතාවක් අපට පසුගිය ටිකේ දක්නට ලැබුණා. එම නිසා තමයි අපි මෙම පනත ගෙනැල්ලා, මේ කටයුතු නියාමනය කර, container depot operatorsලාව වැඩිදියුණු කරන්න කටයුතු කරන්නේ. ඉදිරියේදී imports සහ exports වැඩි වනකොට අපට තවත් yards අත්‍යවශ්‍ය වනවා. එම නිසා මෙම පනත හරහා අපි බලාපොරොත්තු වනවා container depot operatorsලාව නියාමනය කිරීම සඳහා වෙළෙඳ නාවික අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය බලය ලබා දෙන්න.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා. ඔබතුමාට විනාඩි 07ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.07]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සුපුරුදු ආකාරයට 24 පැයේම රජය බොරුව, ඇන්දවිල්ල, රැවටිල්ල තුළ තමන්ගේ අසාර්ථක රාජ්‍ය පාලනය ක්‍රියාත්මක කරමින් සිටිනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අද අපේ රටේ විශ්‍රාමිකයන්, ඒ වාගේම වැඩිහිටියන් ලක්ෂ ගණනක් බොහොම ලොකු අසරණභාවයකට ලක් වෙලා තිබෙනවා. අපට මතකයි එදා, වැඩිහිටි පරපුරට, විශ්‍රාමික පරපුරට රුපියල් ලක්ෂ 15ක තැන්පතුවට සියයට 15ක විශේෂිත වූ පොලී ආදායමක් ලැබුණු බව. වර්තමාන රජය බලයට පත් වුණේ වැඩිහිටි පරපුර සුරක්ෂා කරනවාය කියලා. එදා තැන්පතු සඳහා සියයට 15ක් වූ පොලී ප්‍රතිශතයේ සහනය අද සියයට 7ට අඩු වෙලා තිබෙනවා. අපේ වැඩිහිටි ජනතාව ඒ තරමම දැවැන්ත අසහනයකට මේ රජය පත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අපේ රට ආරක්ෂා කරන්නට සිටින ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ වීරෝදාර රණ විරුවන්ට ලැබිය යුතු ප්‍රතිලාභ, වරප්‍රසාද ක්‍රමක්‍රමයෙන් කප්පාදු කරලා තිබෙනවා. අද වන විට ආබාධිත රණ විරුවන්ට පොරොන්දු වුණු වරප්‍රසාද, වරම් කිසිවක්-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

Order, please! මේ අවස්ථාවේ කථානායක ගැලරියේ රැඳී සිටින ගුජරාට් ප්‍රාන්තයේ ආණ්ඩුකාර ගරු ආචාර්ය දේව්වුත් මැතිතුමාගේ සහ නියෝජ්‍ය මහ ඇමති ගරු හර්ෂ් සන්ගාවි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් ඉන්දීය නියෝජිත පිරිස මෙම සභාව විසින් සාදරයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

ගරු විපක්ෂ නායකතුමා, කථාව කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ප්‍රකාශ කරමින් සිටියේ අපේ ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ වීරෝදාර රණ විරුවන්ට ලබා දුන් වරප්‍රසාද කප්පාදු කරලා, ආබාධිත රණ විරුවන්ට ලබා දුන් දීමනා ටික, වරප්‍රසාද ටික කප්පාදු කරලා තිබෙන බවයි. තමන්ගේ බල ප්‍රදේශයේම සේවාවන් කළ සිවිල් ආරක්ෂක ක්ෂේත්‍රයේ නිලධාරින් දුර ඈත පළාත්වලට මාරු කර යවලා. එක් පැත්තකින්, විශ්‍රාමික ප්‍රජාව; වැඩිහිටි ප්‍රජාව අනාථභාවයට පත් කරද්දී රට දැය බේරාගත් ත්‍රිවිධ හමුදාව, පොලීසිය වැනි ආරක්ෂක අංශවල අයගේත් සහන ටික කප්පාදු කරන්නට වර්තමාන රජය කටයුතු කර තිබෙනවා.

පසුගිය දවසක මම මතු කළා කාරණාවක්. ඒකට ආණ්ඩුවට කට උත්තරත් නැහැ; රටට උත්තර දීලාත් නැහැ. ඇමෙරිකා එක්සත් ජනපදයත්, ඉන්දියාවත් අතර ඇති කරගත් වෙළෙඳ ගිවිසුම හරහා ඉන්දියාවට ලැබෙනවා යම්කිසි සහනයක්. ඉන්දියාව සම්බන්ධයෙන් වූ ප්‍රතිවාරක තීරු බදු සියයට 50 සිට සියයට 18 දක්වා අඩු කළා. ශ්‍රී ලංකාවට ලැබී තිබෙන්නේ සියයට 20ක තීරු බද්දක්. එතකොට මොකක්ද අපේ අපනයනවලට වෙන්නේ? විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයේ ගමනාන්තවලට ඒ අපනයන යනකොට; ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙළෙඳ පොළට ඒ අපනයන යනකොට තරගකාරිත්වය පිළිබඳව බරපතළ ගැටලුවක් එනවා. මම දැන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. බැරි වෙලාවත් හෙට අනිද්දාට ඇමෙරිකා එක්සත් ජනපදය බංග්ලාදේශයට ලබා දෙන ඒ ප්‍රතිවාරක තීරු බද්ද සියයට 18ට අඩු කළොත් මොකක්ද වෙන්නේ? එතකොට මොකක්ද අපේ රටේ අපනයන ක්ෂේත්‍රයට වෙන්නේ, මොකක්ද අපේ රටේ ඇඟලුම් ක්ෂේත්‍රයට වෙන්නේ? මොකක්ද එමඟින් අපේ රටේ අනෙකුත් අපනයන ක්ෂේත්‍රවලට සිදු වන අගතිගාමී බලපෑම? මේ පිළිබඳව රජය වහාම රටට උත්තර සපයන්න ඕනෑ.

මේ රජය එක් පැත්තකින්, බොරු කියමින් තමන්ගේ පැවැත්ම උදෙසා කටයුතු කරද්දී, ගල් අඟුරු ක්ෂේත්‍රයේ අමුඅමුවේ මහ දවල් බරපතළ කොල්ලකෑමක් සිදු කරලා තිබෙනවා. ගල් අඟුරුවලින් කොමිස් මුදල් ගහන ගමන් රටේ ජනතාවට කියනවා, "වීදි ලාම්පුවල බිලත් අනාගතයේදී ඔබට ගෙවන්න සිද්ධ වෙයි" කියලා. වෙනදා ඒවා ගැන බලා ගත්තේ පළාත් පාලන ආයතන. පළාත් පාලන ආයතනවලින් පියවපු වීදි ලාම්පුවල විදුලි බිල ජනතාවගේ කර පිට පටවන්න මේ රජය කටයුතු කරන්නේ IMF එකේ උපදෙස් මතද කියලා මම අහන්න කැමැතියි. අපි මේ කාරණයත් දැනගන්න කැමැතියි. කෝ, IMF එකෙන් ලබා දෙනවා කියපු වාරිකය?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම තව පොඩි වෙලාවක් ගන්නවා.

කෝ, IMF එකෙන් ලබා දෙනවා කියපු වාරිකය? මොකක්ද, ඒ වාරිකයට සිද්ධ වෙලා තිබෙන්නේ? IMF එකේ දූත පිරිසක් පසුගිය කාලයේ ආවා. අපි අහන්න කැමැතියි, කවදාද ඒ වාරිකය ලැබෙන්නේ කියලා. ඒ වාරිකය නොලැබෙන්නේ IMF උපදෙස් පරිදි විදුලි බිල සියයට 11.57කින් වැඩි නොකරන නිසාද? අපි අහන්න කැමැතියි, එම වාරිකය නොදෙන්න හේතුව, කාරණාව මොකක්ද කියලා. *[බාධා කිරීමක්]* අපේ චතුරංග නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, හර්ෂ ද සිල්වා මැතිතුමාගෙන් අහන්න කියලා. චතුරංග මැතිතුමනි, මේක පොඩ්ඩක් අවබෝධ කර ගන්න. විපක්ෂයට නොවෙයි වරම ලැබුණේ. ජනතා විමුක්ති පෙරමුණට - NPP එකට - වරම ලැබුණේ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා එදා බලයට ආවේ IMF ගිවිසුම වෙනස් කරනවා කියලා. ලජ්ජයි කියන්න, අද ඔබතුමන්ලා IMF එකේ වහලුන් බවට පත් වෙලා; අතකොළු බවට පත් වෙලා.

ඒ විතරක් නොවෙයි. අපේ රටේ සම්බුද්ධ ශාසනයට නිග්‍රහ කරමින්, මහා සංඝ රත්නයට නිග්‍රහ කරමින්, මහා සංඝ රත්නය වනචාරීන් හැටියට අර්ථකථනය කරන ආණ්ඩුවක් බවට ඔබතුමන්ලාගේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. අපි ඔබතුමන්ලාට කියන්න කැමැතියි, ඔබතුමන්ලා කරුණාකර සම්බුද්ධ ශාසනයත් එක්ක ඔය වාගේ සෙල්ලම් කරන්න එන්න එපා කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවා බලන්න. සම්බුද්ධ ශාසනයට; බුද්ධ ධර්මයට; බුද්ධ ශාසනයට සුවිශේෂී ස්ථානයක් ලැබෙනවා. ඒ වාගේම, සෙසු ආගම්, සෙසු සංස්කෘතීන්, සෙසු ජාතීන් සියල්ලත් සුරක්ෂා වන ආකාරයට මේ සංහිඳියාව, මේ එකමුතුභාවය, මේ සහෝදරත්වය ක්‍රියාත්මක වන්නට ඕනෑ. ජාතිවාදය අවුස්සලා, ආගම්වාදය අවුස්සලා තමුන්නාන්සේලාට මේ රාජ්‍ය පාලනය කරගෙන යන්න බැහැ. මා අවසාන වශයෙන් චතුරංග නියෝජ්‍ය ඇමතිතුමාට කියන්න කැමැතියි, තමුන්නාන්සේලා මේ ක්‍රියාත්මක කරන්නේ, පික්පොකට් න්‍යාය බව.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කාලය තව ටිකක් ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඔබතුමන්ලා පික්පොකට් න්‍යායයි ක්‍රියාත්මක කරන්නේ. ඔබතුමන්ලා මේ රටේ ජනතාවගෙන් පික්පොකට් ගහනවා: දුප්පත් ජනතාවගෙන් පික්පොකට් ගහනවා, මැද පන්තියෙන් පික්පොකට් ගහනවා, විදුලි පාරිභෝගිකයාගෙන් පික්පොකට් ගහනවා. ඔබතුමන්ලා ගල් අඟුරුවලින් හොඳට හම්බ කරනවා. හැබැයි, අද ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය සතුව තිබෙන බලතල, ඒ කියන්නේ මිල කිරීම සහ ඇගයීම - appraisal and evaluation - සම්බන්ධයෙනුත් පික්පොකට් ගහනවා. ඒ වෘත්තියටත් පික්පොකට් ගහන යෝජනා, අණ පනත් අද මේ සභාවට ගෙනැල්ලා තිබෙනවා. ලජ්ජයි! ඒ නිසා මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මේ පික්පොකට් දේශපාලනයට දේශපාලන ආයුෂ අඩු බව. ඔබතුමන්ලාට තවදුරටත් පවතින්න බැහැ.

ඔබතුමන්ලා මේ රටේ ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටින්න ඕනෑ. ඉදිරියේදී ඔබගේ අකාර්යක්ෂමතාව තුළ, ඔබගේ නොහැකියාව තුළ මහා දැවැන්ත ආර්ථික අර්බුදයක් නිර්මාණය වෙනවා කියලා අපට පේනවා. ඒ ආර්ථික අර්බුදය නිර්මාණය වෙන්නේ ඔබගේ නොහැකියාව නිසා. එදා මහා ලොකුවට පම්පෝරි ගැහුවා, ඇමෙරිකා එක්සත් ජනපදයෙන් සියයට 20ක හොඳ tariff rate එකක් හම්බ වුණා කියලා. ඉන්දියාවේ reciprocal tariff එක දැන් සියයට 18ට අඩු කර තිබෙනවා. බැරි වෙලාවත් හෙට අනිද්දාට බංග්ලාදේශයේ tariff rate එක සියයට 18ට අඩු කළොත් අපේ රටේ අපනයනවලට සිද්ධ වෙන්නේ මොකක්ද? ඒ ගැන තමුන්නාන්සේලා කරන්නේ මොකක්ද? ඊටත් වඩා අඩු rate එකක් ලබා ගන්න තමුන්නාන්සේලා ට්‍රම්ප් රජයත් සමඟ සාකච්ඡා කරනවාද? ඒවායේ ප්‍රගතිය මොකක්ද? තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළ මොකක්ද? කරුණාකරලා පික්පොකට් දේශපාලනය ක්‍රියාත්මක කරන්නේ නැතිව, බොරුවෙන්, වංචාවෙන්, හොරකමින්, මුසාවෙන්, මුළාවෙන් රට පාලනය කරනවා වෙනුවට, රටට, ජනතාවට පොරොන්දු වුණු දේවල් ඉෂ්ට කරන්න කියලා අපි මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ස්ථාවර නියෝග 52 යටතේ කාරණයක් මතු කරන්න කැමැතියි.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සඳහා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ලෙස "ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (අහෝසි කිරීමේ) පනත් කෙටුම්පත" ලෙසින් හැඳින්වෙන පනත් කෙටුම්පතක් මම අද උදෑසන පාර්ලිමේන්තුවේ මහ ලේකම් මණ්ඩලයට බාර දුන්නා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සඳහා මම බාර දී තිබෙන ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග පාර්ලිමේන්තුවෙන් ගන්න කියන ඉල්ලීම මම කරනවා. ජනතා විමුක්ති පෙරමුණ සහ ජාතික ජන බලවේගය රජයත් ජනතාවට දුන්නු පොරොන්දුවක් තමයි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරනවා කියන එක. නමුත් මේ වනකොට ඒ විශ්වාසය බිඳ වැටිලා තිබෙනවා. ඒක නිසා තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

So, I would like to request the Parliament Staff and the Secretary-General's Office to expedite the process of taking up my Private Members' Bill to abolish the Prevention of Terrorism Act because the country wants the Prevention of Terrorism Act done away with.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.18]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මේ අවස්ථාව ලංකාවට වැදගත් වෙනස්කමක් සිද්ධ වෙන අවස්ථාවක්. අද අපි විශේෂයෙන්ම logistics සම්බන්ධයෙන්, එහෙම නැත්නම් ආනයන අපනයන ක්ෂේත්‍රය පැත්තෙන් වැදගත් වෙනස්කමක් කරන දවසක්. ඊට අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්න කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු විපක්ෂ නායකතුමනි, අපි පොඩි කාලයේ ඉගෙන ගනිද්දී "අනියමාර්ථයේ අසම්භාව්‍ය" ක්‍රියා ගැනත් ඉගෙන ගත්තා. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා කියන්නේ, යමක් ඉස්සරහට වෙයිද කියලා හිතලා, එය වුණාට පස්සේ මොකද කරන්නේ කියලා අහන එකටයි. එතුමා ගිය අවුරුද්දේ මුල කිව්වා, ඇමෙරිකාව මෙහෙම tariff එකක් ගැහුවොත් අපට කෙළවෙයි කියලා. අද කියනවා, තවත් කොහේ හෝ රටකට මේ tariff එක අඩු කළොත් අපට මෙහෙම වෙයි කියලා. ඒ නිසා අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවෙන් තමයි එතුමා කථා කරන්නේ.

විශේෂයෙන්ම විපක්ෂය දිගින් දිගටම බලාපොරොත්තු වුණා, මේ රටේ ආර්ථිකය බිඳ වැටෙයි කියලා. IMF එක දාලා යයි කිව්වා; World Bank එකේ සහාය නැති වෙයි කිව්වා. American tariff එක නිසා අපනයන ආදායම නැති වෙයි කිව්වා. අන්තිමේදී

[ගරු චතුරංග අබේසිංහ මහතා]

බලාපොරොත්තු වුණා, "දිට්වා" සුළි කුණාටුවෙන් ආර්ථිකය වැටෙයි කියලා. ඔන්න ඔය විධියට තමයි ඒගොල්ලන් බලාපොරොත්තු වෙන්නේ. මොකද, ඒගොල්ලන් දන්නවා ආර්ථිකයේ මොකක් හෝ විචලාතාවක් වුණේ නැත්නම් මේ ආත්මයට ආයේ බලය ගන්න බැහැ කියලා. ඒක ඒගොල්ලන් දන්නවා. ඒ නිසා හැම තිස්සේම ආයෝජකයන්ට, ව්‍යාපාරිකයන්ට, බැංකු ක්ෂේත්‍රයට භයක් ඇති කරන්න උපරිම උත්සාහයක් ගන්නවා.

සාමාන්‍යයෙන් ආර්ථික විශ්ලේෂකයෝ හැම පක්ෂයේම ඉන්නවා, ආර්ථිකය ගැන යම්කිසි අවබෝධයක් තිබෙන අය ඉන්නවා. ආර්ථිකය ගැන මෙලෝහසරක් දන්නේ නැති නායකයෝ ආර්ථිකය ගැන කථා කරන්න ගියාම විහිළුවක් බවට පත් වෙනවා. මොකද, අපේ රටේ ආර්ථිකය කොතැනින්ද ආවේ, එතැනින් පස්සේ IMF Agreement එකෙන් අපි කොහොමද ඉස්සරහට යන්නේ කියලා ඕනෑම පොඩි දරුවෙක් වුණත් දැන් දන්නවා. ඒ Agreement එක 2027 වෙනකම් තිබෙනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අපි ඒක ඉස්සරහට ගෙනියනවා කියලා තිබෙනවා. ඒකේ නිර්ණායක සියල්ලම ඉෂ්ට කරමින් ඉස්සරහට යනකොට දැන් බලනවා ඒක derail කරන්න පුළුවන් කොහොමද කියලා.

විශේෂයෙන්ම කිව්වා වැඩිහිටියන්ට මීට කලින් ඉහළ පොලී අනුපාතයක් ලබා දුන්නාය, දැන් මේ ආණ්ඩුව ඒක අඩු කරලා කියලා. වැඩිහිටියන් බලා ගන්න ආරක්ෂණ ක්‍රම, විවිධ වියදම් අඩු කිරීමේ ක්‍රම ඇති කිරීම, යටිතල පහසුකම් වැඩි කිරීම සිදු කරනවා. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. මේ සියයට 15 ගැන කථා කරපු කෙනාම දන්නේ නැහැ, ඒ සියයට 15 දෙන වෙලාවේ රටේ පොලී අනුපාතය සියයට 28යි, 30යි කියලා. අද රටේ පොලී අනුපාතය සියයට 9යි. රටේ පොලී අනුපාතිකයට සාපේක්ෂව තමයි වැඩිහිටියන්ට වැඩි පොලී අනුපාතයක් ලබා දෙන්නේ. අපේ රජයේ ප්‍රතිපත්තිය තමයි වැඩිහිටියන් රැකබලා ගැනීම, විශ්‍රාමිකයන් රැකබලා ගැනීම. එතකොට පවතින පොලී අනුපාතයට වඩා ඉහළ පොලී අනුපාතයක් තමයි හැම තිස්සේම ලබා දෙන්න පුළුවන් වෙන්නේ.

IMF Agreement එක ගැන දැන් කථා කළා. එහි ප්‍රධානියා ලබන සතියේ ලංකාවට එනවා. අපි විශ්වාස කරනවා, ඊළඟ tranche එක අපට අවශ්‍ය වෙලාවට සිද්ධ වෙයි කියලා. මොකද, මේකට අවශ්‍ය කරන සියලු නිර්ණායක මේ වෙනකොට සකස් කර අවසන්. වැටෙන කල් බලාගෙන හිටියාට අපේ ආර්ථිකය ඉතාම ශක්තිමත් පිම්මක් අරගෙන ඉදිරියට යනවා. විශේෂයෙන්ම අපේ මූල්‍ය ස්ථාවරත්වය, ආර්ථිකයේ මූල්‍ය ස්ථාවරත්වය තිබෙනවා. මේ අය කාලයක් තිස්සේ අපට ප්‍රශ්න දෙකක් ඇති කළා. එකක් තමයි, ආනයන අපනයන පරතරයේ ඇති වෙච්ච ගැටලුව. ඊළඟ එක තමයි අත්තනෝමතික විධියට වියදම් වැඩි කරගෙන, ආදායම් අඩු කරගෙන අය වැයේ ඇති කර ගත්ත පරතරය. ඒ දෙකම දැන් විසඳලා ඉවරයි. ඒ දෙකම විසඳාගෙන ඉතාම තිරසර ආකාරයෙන් රට ඉස්සරහට යන බව අපි විතරක් නොවෙයි කියන්නේ. ජාත්‍යන්තර සමුළුවලට ගිහිල්ලා මහ බැංකු අධිපතිතුමා ඇතුළු විශ්ලේෂකයෝ, අර්ථික විශේෂඥයෝ සියලුදෙනාම කියනවා, මේ රට ආර්ථික විනය ඇති කරගෙන තිබෙනවා, ඒ නිසා නැවතත් මේ රටට ආර්ථික අර්බුදයක් එළැඹෙන්න කිසිම හැකියාවක් නැහැ කියලා.

දැන් විපක්ෂය පුන පුනා කියන එකක් තමයි 2028දී මේක බිඳ වැටෙනවා කියන එක. මම එතුමන්ලාට පැහැදිලිව කියන්න කැමැතියි මේ තිබෙන ආර්ථික ක්‍රියාවලිය අපි කරගෙන ගියොත් 2028දී නොවෙයි ආයේ කිසි කාලයක ලංකාවට ආර්ථික අර්බුදයක් එන්න විධියක් නැහැ. 2025දී විතරක් ඩොලර් බිලියන 3.9ක ණය ගෙවලා තිබෙනවා, රජය 2.2ක් සහ මහ බැංකුව බිලියනයක් විධියට. 2027දී අපට ගෙවන්න තිබෙන්නේ ඩොලර් බිලියන 2.5යි, 2028දී 3.2යි, 2029දී 3.3යි, 2030දී 3.5යි. දැන් තිබෙන තත්ත්වය යටතේ පවා අපට ඒවා ගෙවාගෙන යන්න පුළුවන්. හැබැයි අපි එළැඹිලා තිබෙන්නේ අපනයන අඛණ්ඩව දියුණු වෙන, ආයෝජන අඛණ්ඩව වැඩි වෙන, ප්‍රේෂණ අඛණ්ඩව වැඩි වෙන ආර්ථික තත්ත්වයකට. ඒ වාගේම predict කරන්න පුළුවන්, අනාගතය පුරෝකථනය කරන්න පුළුවන් ආර්ථික තත්ත්වයක් ලංකාවට උදා වෙලා තිබෙන්නේ මේ කාලයේ. ඒ යුගයේ තමයි අපි මේ කථා කරන්නේ.

IMF Programme එක ඇතුළේ සියයට 15.9ක ආදායමක්, සියයට 13ක රාජ්‍ය වියදමක්, සියයට 4ක ප්‍රාග්ධන වියදමක්, 2.5ක ප්‍රාථමික ශේෂයක් රඳවාගෙන, ඒ වාගේම මූල්‍ය ක්ෂේත්‍රයේත් දශම 7ක, 8ක පොලී අනුපාතිකයක්, ඉල්ලුම හා සැපයුම් මත ක්‍රියාත්මක වෙන විනිමය අනුපාතිකයක්, උද්ධමනය සියයට 5ක පමණ මට්ටමක තබා ගැනීමේ ස්ථාවරත්වය අපි උදා කරගෙන තිබෙනවා. මේ ක්‍රියාවලිය ඇතුළේ අපට අපනයන සංවර්ධනය ඉතාම වැදගත් සාධකයක්. ඒකේදී transport and logistics sector එක, එහෙම නැත්නම් ලංකාවේ පිහිටීම නිසා අපට ලැබිලා තිබෙන සුවිශේෂී වාසියේ උපරිම ඵල නෙළා ගන්න දශක 4ක් ඒගොල්ලන්ට බැරි වුණා, මේ ආර්ථිකය මෙහෙයවපු අයට බැරි වුණා. සිංගප්පූරුව එය කර ගත්තා. නමුත්, අපිට බැරි වුණා.

හැබැයි, අපි කියන්න සතුටුයි, මේ අවුරුද්දේ ඒ ක්ෂේත්‍රයේ වැඩිම ආදායම ළඟා කරගෙන තිබෙන බව. ඒක ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9ක් වෙනවා. ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒ ක්ෂේත්‍රය තමයි අපිට අවශ්‍ය වෙන්නේ, ජාත්‍යන්තරයට සුදුසු විධියට විවිධ පහසුකම් සපයලා, ඒ පහසුකම් හරහා තවත් නැව් සමාගම් ලංකාවට ගෙන්වා ගෙන, Logistics Performance Index එකේ අඛණ්ඩව ඉස්සරහට යන්න. ඒ විධියට අඛණ්ඩව ඉස්සරහට යන්න දැවැන්ත ක්‍රියාවලි තොගයක් කරගෙන යනවා. ඒවා ඇස් පනා පිට පෙනෙනවා. ඒකේ එක වෙනස්කමක් තමයි, අද මේ පනත හරහා සිද්ධ කරන්නේ. ඒ වුණාට විපක්ෂය හැම තිස්සේම මන්තරයක් වාගේ මතුරනවා. කන්ටේනර් 323ක් ගැන කියනවා, ගල් අඟුරු ගැන කියනවා, නමුත්, මේ තිබෙන ව්‍යුහාත්මක වෙනස්කම් කිසි දෙයක් ගැන කථා කරන්නේ නැහැ. අහක යන බොරු news එකක් අරගෙන, ඒකෙන් චෝදනාවක් මවන්න උත්සාහ කරමින්, ඒක මතුර මතුර යනවා. ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ. ඒ කියන සියල්ල සම්බන්ධයෙන් ආණ්ඩුව ඉතා විනිවිදභාවයෙන් අවශ්‍ය කරන පරීක්ෂණ කරනවා, පාර්ලිමේන්තු අනුකමිටු පත් කරලා තිබෙනවා. ඒ නිසා ඒවා ගැන කථා කරලා තේරුමක් නැහැ.

ලංකාවේ කොළඹ වරාය ආශ්‍රිත සේවා සංවිධිත කිරීම අපිට වැදගත් වෙන්නේ ඇයි? මේ වසරේ අපේ TEU -Twenty-foot Equivalent Unit - quantity එක මිලියන 8ක උපරිම capacity එකට ඇවිල්ලා තිබෙනවා. එතකොට ඒ මිලියන 8ක ධාරිතාව මේ අවුරුද්දේ තවත් මිලියන 3කින් ECT එකේ වැඩි වෙනවා, තවත් මිලියන 3කින් WCT එකේ වැඩි වෙනවා. එතකොට අපේ පද්ධතියට තවත් මිලියන 6ක capacity එකක් එකතු වෙනවා. ඒක utilize කරනවා කියන්නේ, අනිවාර්යයෙන් ඉදිරි වසර කිහිපය ඇතුළත අපේ තිබෙන අපනයන ආදායම දෙගුණ වෙනවා. ඒ වාගේම තමයි, 2030 වර්ෂය වන විට WCT 2 Terminal එක හරහා තවත් මිලියන 3ක් එකතු කර ගැනීම සඳහා කටයුතු කරමින් යනවා. දැන් ඒවා බලාගෙන ඉන්න බැහැ. මොකද, මෙතුමන්ලාගේ කාලයේ කර ගන්න බැරි වෙච්ච ඒවා අපි කරනවා. ඒ වාගේම හම්බන්තොට වරායත් මේ වෙනකොට මිලියනයක විතර ප්‍රමාණයක තිබෙනවා. නමුත්, ඒක උපරිම ධාරිතාවට ගේන්න තව ගොඩක් වැඩ කරන්න තිබෙනවා.

ඒ වාගේම තමයි, මේ ක්ෂේත්‍රයේ ඩිජිටල් පද්ධතියක් ඇති කරලා, ඩිජිටල් තාක්ෂණය ගෙනැල්ලා කාර්යක්ෂම වරායන් බවට පත් කර ගන්න ඕනෑ. මේ capacity එක වැඩි කර ගන්න පුළුවන් ඊළඟ ක්‍රමය තමයි තාක්ෂණය. ඒ වාගේම Port Community System එකට EoIs call කරලා තිබෙනවා. ඒක ඉදිරියේදී සිද්ධ වෙයි. ඒ වාගේම Single-Window system එක පටන් අරගෙන තිබෙනවා. ඊළඟට, export hub එකක් විධියට දියුණු කරන්න අවශ්‍ය කරන ඉඩකඩම් මේ වෙනකොට සූදානම් වෙමින් පවතිනවා. මේ ක්‍රියාවලිය හරහා අපේ logistics සේවය, එහෙම නැත්නම් ලංකාවට ආවේණික ආනයන - අපනයන වෙළෙඳාම දැවැන්ත දියුණුවක් කරා යනවා. ඒ ක්‍රියාවලිය හරහා තමයි, මේ කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන් සඳහා අවශ්‍ය කරන නියාමනය අපි ගේන්න උත්සාහ කරන්නේ. මෙතැනදී ඇත්තටම දැනට තිබෙන shipping companiesවලට, දැනට සිටින කන්ටේනර් හිමියන්ට බාධාවක් වෙලා තිබෙනවා, මේ ක්ෂේත්‍රය නියාමනය නොවීම කියන එක. මේ පනත හරහා ඒක සිද්ධ වෙනවා. මේක කාලයක් තිස්සේ ක්ෂේත්‍රයේ ඉල්ලීමක්. ඒවා නියාමන පද්ධතියකට ගෙනැල්ලා, ඒ කන්ටේනර් අයිතිකරුවන්ට අවශ්‍ය සේවා සංවිධිත ආකාරයෙන් ලබා දෙන්නත්, මේ නියමනය තුළින් තිබෙන තදබදය අඩු කරලා, මේ ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව තවත් වැඩි කර ගන්නත් අපට හැකියාව තිබෙනවා.

ඒ වාගේම තමයි, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය - Institute of Real Estate Professionals, Sri Lanka - බිහි කිරීම සඳහා වූ පනත අද ගෙන එනවා. එහිදී අපි කල්පනා කරන්නේ, අපේ රටේ වෘත්තිකයන්ට වෘත්තියභාවයක් ලබා දීම සඳහා සෑම වෘත්තියක්ම ඒ සඳහා අවශ්‍ය, පිළිගත් ආයතනවලින් නියාමනය වෙන තත්ත්වයක්, වගකීම් සහගත තත්ත්වයක් අපිට ඇති කර ගන්න ඕනෑ කියන එකයි. ඒක හැම ක්ෂේත්‍රයකම සිද්ධ විය යුතුයි. ඒ නිසා ඒ එක් එක් ක්ෂේත්‍රවල එක් එක් වෘත්තිකයන් හා ඒ අදාළ ආයතන එක්ක කථා කරලා, රජයේ වගකීම තමයි ලංකාවේ වෘත්තීන්වලට වෘත්තීමයභාවයක් ලබා දීම, වෘත්තීමය වගකීමක් ලබා දීම. ඒ ක්ෂේත්‍රවලට දරුවන් නැවත කැඳවන්න අවශ්‍ය කරන වෘත්තීමය ඉල්ලුමක් හදන එක. එතැනදී වෛද්‍යවරු, නීතිඥවරු හා එතැනින් එහාට ගිහිල්ලා තවත් වෘත්තීන් අපි ඉදිරියට ගන්න ඕනෑ. මොකද, ඒ වෘත්තීන් ජාත්‍යන්තර තලයට යන්නත් ඕනෑ. ඒ සඳහා අවශ්‍ය කරන වෙනස්කම් කරන්න මේ රජය මැදිහත් වෙනවා.

ඒ නිසා සියලුම වෘත්තීය කණ්ඩායම් මේ වෙනකොට විවිධ අමාත්‍යාංශ හරහා රජයත් එක්ක සාකච්ඡා කරමින් පවතිනවා. ඒකේ තව අවස්ථාවක් විධියට තමයි ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය බිහිකිරීම සිද්ධ වෙන්නේ. මම අවසාන වශයෙන් කියනවා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා ඉස්කෝලේ ඉගෙන ගත්ත කාලවලටත්, පොත්පත් ලියන්නත් තියාගෙන මේ ආර්ථිකය ගොඩ නඟන්න අවශ්‍ය කරන ශක්තිමත් සහාය විපක්ෂයෙන් ලබා දෙන්න කියලා. විශේෂයෙන්ම විපක්ෂයේ සියලුම දෙනා විපක්ෂයේ සිටින ආර්ථික විශේෂඥයන්ගේ දැනුම සතියකට සැරයක් හරි අරගෙන, එහෙම නැත්නම් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට පැයක් දෙකක් හරි ඇහුම්කන් දීලා ආර්ථිකය ගැන කථා කරනවා නම් හොඳයි කියලා කියමින්, මගේ වචන ස්වල්පය නිමා කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.30]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා සංවර්ධනය ගැන සහ වරාය පුළුල් කිරීම ගැන කිව්වා. ඒක හොඳයි. ඒ නිසා තමයි අපි එදා ඉඳලාම වරායවල් හදන්න පටන් ගත්තේ. හැබැයි ඔබතුමන්ලා තමයි ඒවාට විරුද්ධ වුණේ. මතක ඇති නේ. උද්ඝෝෂණ කරලා, කෑ ගහලා ඒවාට විරුද්ධ වුණා. හැබැයි මම අද සතුටු වෙනවා, ඔබතුමන්ලාගේ කටින්ම ඒවා හොඳයි, ඒවා තව පුළුල් වෙන්න ඕනෑ, වෙනස් වෙන්න ඕනෑ කියලා යෝජනා කිරීම ගැන. *[බාධා කිරීමක්]* හරියටම හරි. අපි සතුටු වෙනවා. ඔබතුමන්ලා එදා අපි කරගෙන ආපු දේවල්වලට, පර්යන්ත හදනකොට විරුද්ධ වෙච්ච විධිය මතකයි නේ? දැන් ඒ විරුද්ධතාව පැත්තක තියලා ඒවා දියුණු කරන්න මහන්සි වීම ගැන අපි සතුටු වෙනවා.

ඒත් එක්කම ඔබතුමාත් දන්නවා, red-labelled containers එළියට දැම්මාම ජාත්‍යන්තර වශයෙන් තිබෙන බලපෑම ගැන. ඒක දන්නවා නේ. නැහැ කියන්න බැහැ. දැන් ඔබතුමන්ලා එහෙම කන්ටේනර්ස් 323ක් එළියට දමා තිබෙනවා. හැබැයි පරීක්ෂණ නැහැ. ඒ වාගේම කුඩු තිබෙන කන්ටේනර් දෙකක් ජාත්‍යන්තර බුද්ධි අංශ වාර්තා තිබෙද්දීත් එළියට දමා තිබෙනවා. ඔබතුමන්ලාගේ න්‍යාය පත්‍රය තුළ ඒවා ගැනත් පරීක්ෂණ නැහැ. අපට එන්න කියලා ඒවා අහනවා. අපට එන්න කියලා අහලා වැඩක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? මෙතුමන්ලාගේ ආණ්ඩුවෙන් පන්නපු කන්ටේනර් ගැන අපෙන් අහලා වැඩක් තිබෙනවාද? ඔයිට වඩා හොඳයි, ඔබතුමන්ලා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතයි, පොදු දේපළ පනතයි එකතු කරලා - 159කුත් ඉන්න එකේ - "දේශපාලන පළිගැනීම" කියලා අලුත් පනතක් හදාගත්තා නම්. එහෙම නම් ඔය පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය මහ ලේකම්තුමා ඇතුළු ඔක්කොම අය ඒ පනතෙන් ගෙනියන්න පුළුවන්. එතකොට කථානායකතුමා අමාරුවේ වැටෙන්නෙත් නැහැ. ඔබතුමන්ලාට දීපු පොරොන්දු ඉටු කරගන්න බැරිවෙනකොට, - අරහේ දිව්වා ගැන කථා කරනවා.

අපි දැක්කා නිදහස් දිනයේදීත් කථා කළ හැටි. රණවිරුවන් යුද්ධය අවසන් කරපු එකවත් ආඩම්බරයෙන් කථා කරන්න බැහැ. ලෝකයේ හැම රටක්ම නිදහස සමරනකොට ඒ brigade එක පිළිබඳව, ඒ unit එක පිළිබඳව, ඔවුන්ගේ ක්‍රියාකාරකම් ගැන ලෝකයට කියනවා. සමහර රටවල් දෙවන ලෝක යුද්ධයේදී, පළමුවන ලෝක යුද්ධයේදී ලබපු ජයග්‍රහණත් කියනවා. හැබැයි, අපේ රටේ? අපි වෙඩි මුර 21 පැත්තක තියමු කෝ. අඩු ගණනේ තමන්ගේ brigade එක ලබපු ජයග්‍රහණ පිළිබඳව, ඒ තරුණ ජීවිත කරපු කැපවීම් පිළිබඳව, තමන්ගේ unit එක ලබපු ජයග්‍රහණ පිළිබඳව රටේ තිබෙන ආණ්ඩුවට ආඩම්බරයෙන් කථා කරන්න බැරි නම්, ඒ ආණ්ඩුවේ ක්‍රියාකලාපය ගැන කථා කරලා වැඩක් නැහැ. ආණ්ඩුව හිතනවා නම් LTTE ත්‍රස්තවාදය පරාජය කරපු එක ජාතිවාදයක් කියලා, එහෙම එකක් නැහැ. ඒක ජාතිවාදය නොවෙයි. අපි දෙමළ ජනතාව එක්ක යුද්ධ කළේ නැහැ. අපි යුද්ධ කළේ ත්‍රස්තවාදීන් එක්කයි. ලෝකයේ කාටවත්ම පරාජය කරන්න බැහැයි කියපු ත්‍රස්තවාදය තමයි අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය විසින් පරාජය කළේ. අපේ රටේ නිදහස් දිනයේදී ඒක අභිමානයෙන් කියන්න රාජ්‍ය නායකයාට කොන්දක් නැත්නම්; ආණ්ඩුවට, රාජ්‍ය නායකයාට ඒක පිළිගන්න හයියක් හෝ ආත්ම ශක්තියක් නැත්නම්, මේ ආණ්ඩුවේ ක්‍රියාකලාපය ගැන කථා කරලා වැඩක් නැහැ. ඔබතුමන්ලාගේ පෞද්ගලික දේශපාලන ගමන තුළ පොලීසිය, හමුදාව එක්ක ප්‍රශ්නයක්

[ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා]

තිබෙනවා. හැබැයි ඔබතුමන්ලාත් සමරනවා නේ කට්ටියව. එහෙම සැමරුවා කියලා අපි ඔබේ දේශපාලන න්‍යාය පත්‍රයට මොනවත් කියන්නේ නැහැ නේ. ඒක ඔබේ දේශපාලනය. අඩු ගණනේ යුද්ධය අවසන් කරන්න කැපවෙච්ච රණවිරුවන්ව ජාතික නිදහස් දිනයේදීවත් අගය කරන්න ආත්ම ශක්තියක්, කොන්දක් නැත්නම් එතැනින් එහාට මේ ආණ්ඩුවේ ක්‍රියාකලාපය ගැන කථා කරලා වැඩක් වෙන්නේ නැහැ.

මේ ආණ්ඩුව අද ආගමික නායකයන්ට ඇහුම්කන් දෙන්නේ නැහැ. අද, ආණ්ඩුවේ මැති ඇමතිවරු ප්‍රසිද්ධියේ ආගමික නායකයන් විවේචනය කරනවා. ඒක ඔබතුමන්ලාගේ ලෝකයේ ආඩම්බර වෙන්න කාරණයක් වෙන්න පුළුවන්. හැබැයි, අපේ සමාජයේ එහෙම එකක් නැහැ. ආගමික නායකයකුව විවේචනය කරන එක ආඩම්බර වෙන්න ඕනෑ කාරණයක් නොවෙයි. ඒක වැරදියි. වැරැද්දක්, වැරැද්දක් විධියට පිළිගන්න නිහතමානී වෙන්න. ඔබතුමන්ලා ජීවත් වෙන ලෝකයේ ඒක මහා ලොකු, ආඩම්බර වෙන්න පුළුවන් කාරණයක් වෙන්න ඇති. හැබැයි, සාමාන්‍ය - සිවිල් - සමාජයේ එහෙම එකක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආගමික නායකයන්ට ඇහුම්කන් දෙන්න ආණ්ඩුව පුරුදු වෙන්න ඕනෑ. අර, ත්‍රිකුණාමලය සිද්ධිය සම්බන්ධයෙන් මහා සංසරත්නය හිරගෙවල්වල දාලා. අනික් පැත්තෙන් යාපනයේ වෙනම හර්තාල් කරනවා, නිදහස් දවසට. ඒවා දැක්කේ නැහැ වාගේ ඉන්නවා. ඒවාට පොලිස් ආරක්ෂාවත් දෙනවා. ඒ අයට අයිතියක් තිබෙන්න පුළුවන්, අදහසක් ප්‍රකාශ කරන්න. හැබැයි, ඒ අයිතිය අනෙක් අයට නැත්තේ ඇයි? ඔබට දේශපාලනික වශයෙන් මූල්‍යමය වාසියක් ලබා දෙන අයට විතරද ඒ අයිතිය තිබෙන්නේ? ඔබට මූල්‍යමය වාසියක් ලැබෙනවා නම් විතරද අයිතිය තිබෙන්නේ? අපි ජාතිවාදය අවුස්සන්නේ නැහැ කිය කියා ගරු ජනාධිපතිවරයාත්, මේ ආණ්ඩුවේ ඔබතුමන්ලාගේ 159ත් ජාතිවාදය අවුස්සනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව විසින් දකුණේ බහුතරය විවේචනය කරන ගමන්, ඩයස්පෝරාව සහ උතුරේ ජනතාවගේ හදවත දිනා ගන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතනවා නම්, ඒක වෙන්නේ නැහැ. ඒක දැන්වත් තේරුම් ගන්න. ඒක එහෙම කරන්න බැහැ.

මම දැක්කා එක පුද්ගලයෙක්; අමාත්‍යවරයෙක්ද, මන්ත්‍රීවරයෙක්ද මම දන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කියනවා, නිදහස් දිනයට ණයට ගත්ත තුවක්කු ගෙනියන්නේ නැහැ ලු; ණයට ගත්ත යුද උපකරණ ගෙනියන්නේ නැහැ ලු. නමුත් cabs 1,700ක් ණයට අරගෙන පදින්න පුළුවන්. *[බාධා කිරීමක්]* ඔව්. ඒ කාලයේ නම් කිව්වේ, ඇඳුමේ ඉඳන් ගන්නේ එක එක අයගෙන් කියලයි. ඉල්ලාගෙන අඳින්නේ කිව්වා, belt එකේ ඉඳන්. ඒවා හොඳයි. තව ඒවාත් අල්ලපු ගෙදරින් ගන්නවා කියලා කිව්වා. මම ඒවා ගැන කියන්න යන්නේ නැහැ. ඒක හොඳයි. හැබැයි, ත්‍රස්තවාදය පරාජය කරවන්න; ජාතික ආරක්ෂාව ගොඩ නඟන්න කටයුතු කළ ලංකාවේ ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ උපකරණ ටික "අපේ යුද ශක්තිය මේක; අපේ ජාතික ආරක්ෂාවේ ශක්තිය මේක" කියන එක මහත් අභිමානයකින් ලෝකයට පෙන්වන්න ලජ්ජයි. පුදුම ආණ්ඩුවක් නේ.

අර ධීවරයා සම්බන්ධ ගැටලුව බලන්න. මුහුදු ගිය ධීවරයන්ට ලංකා මුහුදු තීරය ඇතුළේ පහර දීලා තිබෙනවා. එක පැත්තකින් ඔවුන් ඔවුන්ගේ ධීවර රස්සාව ඇතුළේම තිබෙන අභියෝගයට මුහුණ දෙන්න ඕනෑ, ජීවිතයත් මරණයත් අතර සටන් කරන ගමන්. අනෙක් පැත්තෙන් වියදම. තෙල් මිල වැඩියි. තාක්ෂණය දෙනවා කිව්වා. SMSවලින් මාළු ඉන්න තැන් කියනවා කිව්වා. නමුත් ඒවා නැහැ. හැබැයි, ලංකා මුහුදු තීරය ඇතුළට ඇවිල්ලා, අපේ ධීවරයාට ගහලා යනවා. ඉන්දියන් රජයෙන් කියලා තිබෙනවා මම දැක්කා, Indian Coast Guard එකෙන්වත්, Indian Navy එකෙන්වත් නොවෙයි ගැහුවේ කියලා. ධීවරයෝ කියලා තිබෙනවා, එහි සිංහල කථා කරන අය හිටියා; දෙමළ කථා කරන අය හිටියා කියලා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව පෝෂණය කරන සංවිධානාත්මක අපරාධකරුවන් ද මේ ධීවරයන්ට පහර දුන්නේ කියන ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මේ ආණ්ඩුවේ සංවිධානාත්මක අපරාධකරුවන් පෝෂණය කරන කණ්ඩායමක් ඉන්නවා. අද නාවික හමුදාව දාලා මුහුදුකරය ආරක්ෂා කර ගන්න බැරි නම්, නාවික හමුදාවේ යුද ශක්තිය ජාතික දිනයේදී පෙන්වන්නවත් බැරි නම්, ධීවරයන්ට ඇවිල්ලා ගහලා යන එක අහන්න දෙයක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? ධීවරයාගේ ආරක්ෂාව තහවුරු කරන්න මේ ආණ්ඩුවට වගකීමක් තිබෙනවා කියන එක මේ ආණ්ඩුවට මතක් කරලා දෙන්න ඕනෑ.

ඒ වාගේම අර දිට්වා කුණාටුවත් එක්ක අසරණ වෙච්ච ජනතාව තවම ඉන්නවා. ජනාධිපතිතුමා උත්සවයේදී දීපු ඒ cheques ටිකත් bounce වෙලා; හැරිලා ඇවිල්ලා. ඒවාට තවම සල්ලි දැම්මාද කියන්න අපි දන්නේ නැහැ. හැබැයි ඔබතුමන්ලා, ඔබතුමියලා ඒ පිළිබඳව ගන්නා ස්ථාවරය මොකක්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව තත්ත්පර 10ක් දෙන්න.

ඔබතුමියලාගේ ආණ්ඩුව ඒ සඳහා ගන්නා පියවර මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම අපි ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා ආගමික නායකයෝ විවේචනය කරන එක නවත්වන්න. ජාතිවාදය අවුස්සන්නේ නැහැ කියලා නැති ජාතිවාදයක් අවුස්සන තැනට මේ රටේ සමාජය තල්ලු කරන එක නවත්වන්න. ඔබේ දේශපාලනයේ ඩයස්පෝරාව එක්ක තිබෙන ගනුදෙනුව මූල්‍යමය වශයෙන් කරන එක කර ගන්න. ඒකට මේ රටේ ජනතාව පාවා දෙන්න එපා කියලා අපි ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.39]

**ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද විශේෂ පනත් කෙටුම්පත් තුනක් පිළිබඳව පාර්ලිමේන්තුව ඇතුළේ සංවාද වෙද්දී, අපේ විපක්ෂයේ සිටින මන්ත්‍රීවරු ඒ පනත් කෙටුම්පත් තුන පැත්තක තියලා ඒ පනත් කෙටුම්පත් තුනට අදාළ නැති, තමන් මවා ගත්ත ලෝකයක කරුණු ඇවිල්ලා මෙතැන කියනවා. ගරු

නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ගොල්ලන්ගේ එකම අරමුණ තමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු ටිකක් කියලා යනවා. ඊට පස්සේ ඒ ගොල්ලන්ට තිබෙන media දෙක තුනක් තිබෙනවා. ඒ media දෙක තුනෙන් මේක අද newsවලට දා ගන්නවා. ඒ වාගේම ඒ ගොල්ලන්ට තිබෙන පත්තර දෙක තුනක් තිබෙනවා. ඒ පත්තර දෙක තුනේ හෙට උදේ මේක පළ කරවා ගන්නවා. ඕක තමයි තිබෙන්නේ. ඒක නිසා මේක අදාළද, නැද්ද, වැදගත්ද ඒවා ඒ ගොල්ලන්ට අදාළ නැහැ. පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ගේ වෙලාවේ පව ටිකක් කියනවා. ඊට පස්සේ ඒකට හදා ගත්ත දම්වැලක් තිබෙනවා, ඒ දම්වැලට අනුව බැට් කරගෙන යනවා. හැබැයි, මොකක්ද වෙලා තිබෙන්නේ? මේ විපක්ෂය ඇතුළේ වෙන වෙන ප්‍රතිවිරෝධකම්, අරවා මේවා මීට පෙර තිබුණත්, දැන් තිබෙන එකම අරමුණ මොකක්ද? දැන් ජනතාවාදී ආණ්ඩුවක් ඇවිල්ලා තිබෙනවා. ඒ ජනතාවාදී ආණ්ඩුව ක්‍රමානුකූලව ජනතාවත් එක්ක මේ රට ගොඩ නඟන්න මැදිහත් වෙනවා. එලෙස රට ගොඩ නඟන්න මැදිහත් වෙද්දී අහුවෙන කුමන හෝ එකකින් අර බලු කුණකට කපුටු රැළ වහනවා වාගේ අහුවෙන අහුවෙන එකට කොට කොටා යනවා, මොකක්ද වෙන්නේ කියලා තේරෙන්නේ නැහැ. එම නිසා තමයි අද විපක්ෂයේ මන්ත්‍රීවරුන්ම කියන්න පටන් අරගෙන තිබෙන්නේ, විපක්ෂ නායකතුමෙක් ඉන්නවා, උදේට එක විධියක්, රෑට තව විධියක් කියලා. ඇයි? අනාථ වෙලා ඉන්නේ. අතට අහුවෙන, අහුවෙන එකෙන් ගහනවා, හැබැයි දවස් දෙකයි තුනයි. ඒක නිසා තේ ලේවලින් අත්සන් කරන්න යන්නේ, දැකපු ගමන් උද්ඝෝෂණවලට ගිහිල්ලා voice-cuts දෙන්න පටන් ගන්නේ, පස්සේ මොකක්වත් නැහැ. ඕකම තමයි තිබෙන්නේ.

දැන් මෙතැන කැ මොර දූන් මහත්මයාට අපට කියන්න තිබෙන්නේ මේකයි. අපි ජන වරමට අනුව වැඩ කරගෙන යනවා. ඒගොල්ලන්ගේ බාප්පලා, පුතාලා, තාත්තලා ඔක්කෝම එකතු වෙලා රට පාලනය කළා. බාප්පලා සෙට් එකක් දැන් එළියේ ඉන්නවා. දැන් අධිකරණ ක්‍රියාමාර්ග ගන්නවා. ඒක නිසා පුතාට කියන්නේ බාප්පලා ටික ගෙනැල්ලා නීතියේ ආධිපත්‍යය පිහිටුවන්න සහයෝගය දක්වන්න කියලායි.

ඒ වාගේම අද සංඝ රත්නය ගැනත් සඳහන් කළා. කවුද මේගොල්ලන්? මේගොල්ලන් තමයි අපේ රටේ තිබෙන උත්තරීතර, වන්දනීය සිද්ධස්ථානය බවට පත් වෙලා තිබෙන දළදා මාළිගාව ඉදිරිපිට රේස් පැදලා, බජව් දාලා, එහෙම නටපු මහත්වරු. ඒ අය දැන් ඇවිල්ලා අපට කියනවා, බුද්ධ ශාසනය අපි රකින්නේ නැහැයි කියලා. ඒ අය දැන් නිදහස ගැන කථා කරනවා. ඒ සංවාදයට මොකක්වත් නොකියා ඉන්න බැරි නිසා මම මේ දේවල් කිව්වා විතරයි. ඒක ඒගොල්ලන්ගේ chain එක. ඒ වාගේම අරගළය කරන ඇත්ත සාධාරණ ප්‍රශ්න තිබෙන මිනිස්සුත් මේක දැන් තේරුම් අරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒක නිසා තමයි ඒ මිනිස්සු කියන්නේ, "ජනාධිපතිතුමනි, අපිවත් එක එක වැඩවලට පාවිච්චි කරගන්න හදනවා. නමුත්, අපට එහෙම එකක් නොවෙයි තිබෙන්නේ. ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒකට මැදිහත් වෙලා අපට උත්තර දෙන්න" කියලා. ඒ අනුව ජනතාවත් ඒක තේරුම් අරගෙන තිබෙනවා. නමුත් ඒගොල්ලන්ගේ chain එකට අනුව අපි බලමු, තව කොච්චර කාලයක් ඔය විධියට වැඩ කරගෙන යන්න පුළුවන්ද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද විවාද කරන මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන්න දැන් මම කැමැතියි. විශේෂයෙන්ම අද ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය නැමති පනත් කෙටුම්පතත් පාර්ලිමේන්තුවේ දෙවන වර කියවා විවාද කරනවා. ඒ තුළ අපේ අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ මොකක්ද? අපි දන්නවා, රටක් ගොඩ නැඟෙද්දී අපේ රටේ වෘත්තිකයන්ගේ අවශ්‍යතාව, ඔවුන්ගේ කාර්යභාරයන්හි ගුණාත්මකභාවය, ඒ වාගේම වෘත්තීය ගරුත්වය, ඒවාට වටිනාකම් දීම අනිවාර්යයෙන්ම කළ යුතු බව. මොකද, රටක් ගොඩ නැඟීමේදී වෘත්තිකයාගේ කාර්යභාරය අති විශේෂයි. ඒ නිසා අපි මීට අදාළ අමාත්‍යාංශය විධියට ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය නැමති පනත් කෙටුම්පත අද සංවාදයට අරගෙන තිබෙනවා.

අපි දන්නවා, අපේ රටේ වෘත්තිකයන්ගේ ආයතන ගණනාවක් තිබෙන බව. උදාහරණයක් විධියට ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය, ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය වාගේ තවත් ආයතන ගණනාවක් තිබෙනවා. ඒ ආයතන තමන්ගේ වෘත්තීන්ට අනුව තමන්ගේ වෘත්තීය ගරුත්වයන්, අයිතිවාසිකම් පිළිබඳ වඩා වටිනාකම් හදා ගැනීමේ අරමුණෙන් ඒවා රටටත්, පෙරළා එවැනි වෘත්තිකයන්ටත් අවශ්‍ය ආයතන බවට පත්වෙමින් තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනයත්, අපේ රට ඇතුළේ විශේෂයෙන්ම නව ආර්ථික තත්ත්වයන් ඇතුළේ වැඩි වපසරියක් ආර්ථික ක්‍රියාවලියට එක් කරමින් ඉන්නවා, ඒක නිසා ඔවුන්ගේ වෘත්තියටත් ඒ වටිනාකම, ඒ ගරුත්වය සහ ඒ අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඕනෑය කියලා. හැබැයි, මෙවැනි ආයතන අලුතින් පිහිටුවනකොට නොයෙක් ගැටලු ඇතිවනවා. අපි දන්නවා, සමාන තලයේ වැඩ කරන විවිධ වෘත්තීන් තිබෙන බව. ඒ නිසාම ඒ වෘත්තීන් අතර සියුම් සම්බන්ධතා තිබෙනවා. ඒ නිසා අලුත් ආයතන පිහිටුවන්න ගියාම ඒවා ඇතුළේ ගැටලු ඇති වනවා, සංවාද ඇති වනවා. එම නිසා ආණ්ඩුවක් විධියටත්, අමාත්‍යාංශයක් විධියටත් කිසිසේත්ම අපේ බලාපොරොත්තුවක් නැහැ, එක වෘත්තියක් උඩ තියලා තවත් වෘත්තියක් පහළ දමන්නවත්, තව වෘත්තියක තිබෙන අයිතිවාසිකම් කපා හරින්නවත්.

විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයට මීට පෙර නායකත්වය දුන් අනුර කරුණාතිලක ඇමතිවරයා ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීමට අවශ්‍ය කරුණු ඉදිරිපත් කරමින්, ඒ මැදිහත්වීම කරමින් තිබුණා. අපි අද බලාපොරොත්තු වන්නේ, මේ පනත් කෙටුම්පත් කිහිපය සංවාදයට අරගෙන, අත්‍යවශ්‍ය සංශෝධන කිහිපයක් සිදු කරන්නයි.

මේ වෘත්තිකයින් සියලුදෙනා එක්ක අවස්ථා ගණනාවකදී මමත්, අනුර කරුණාතිලක ඇමතිතුමාත් සාකච්ඡා කළා. ඒ සාකච්ඡා කර ගත් පොදු කරුණු ඇතුළේ මීට අදාළ සංශෝධන කිහිපයක් අපි අද කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. මේ ප්‍රශ්නය සියයට සියයක් ඉවර කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මොකද, ඕනෑම ආයතනයක් මුලින් පිහිටුවද්දී ඒ පිළිබඳව සංවාද, සාකච්ඡා එන්න පුළුවන්කම තිබෙනවා. නමුත්, අපි මේ ආයතනය පිහිටුවා ගත යුතුයි. මේ ආයතනය පිහිටුවා ගනිද්දී අත්‍යවශ්‍ය සංශෝධනවලට යටත්ව එය සිදු කරන්න අප අද දවසේ බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙලාවේ මා මේ පිළිබඳව මීට වඩා යමක් පැහැදිලි කළොත් හොඳයි කියලා හිතනවා. තථ්‍ය දේපළකරුවන් ආයතනයක් වශයෙන් 2008දී සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබෙනවා. ඊට පස්සේ 2017දී එවකට තිබුණු රජයේදී කැබිනට් මණ්ඩලයට මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. මොකද, මේක සමාගම් පනත ඇතුළේ තිබුණාට වැඩක් නැහැ, ඒ කියන්නේ මේක මෙතැනින් එහාට යම් නීතියක්, වටිනාකමක්, ඒ පිළිබඳ තත්ත්වයක් ලැබෙන්න නම් පාර්ලිමේන්තුවේ -ව්‍යවස්ථාදායකයේ- පනතක් මඟින් සම්මත විය යුතුයි. ඒ නිසා ඒ අරමුණෙන් 2017දී කැබිනට් මණ්ඩලයට මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙනවා.

[ගරු එරංග ගුණසේකර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි මෙහිදී යම් ගැටලුවක් මතු වනවා. ප්‍රතිපත්තිමය වශයෙන් එවකට පැවති ආණ්ඩුවත් මේක පිළිගන්නවා. හැබැයි, පිළිගත්තාට මේක නීති සම්පාදනයට යද්දී තක්සේරුකරුවන් පිළිබඳව මෙහි තිබෙන වගන්ති සහ ඒ කරුණු ගැටලුසහගතයි කියලා ඒ ටික වෙනස් කර ගන්න කියන නීති උපදෙස් ටික 2017දී ලැබුණා. ඊට පස්සේ විශේෂයෙන්ම ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පතේ -අද අපි ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ- නමත්, සමහර කරුණුත් සංශෝධනය කරලා 2023දී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. ඊට පස්සේ නව රජය නැවත පත් වුණාට පස්සේ ඒකට අනුර කරුණාතිලක ඇමතිතුමා මැදිහත් වෙලා 2025දී නැවතත් මේ යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළාට පස්සේ තමයි අද මේ සංවාදයට මේ පනත් කෙටුම්පත අපි ගේන්නේ.

මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි, තථ්‍ය දේපළකරුවන් මෙවැනි ආයතනයක් පිහිටුවා ගත්තාට පස්සේ ඒකේ තිබෙන වැදගත්කම මොකක්ද කියන එක. අපේ රටේ තථ්‍ය දේපළ අංශයට මෙම ආයතනය ඇතුළේ එක පැත්තකින් වෘත්තීයභාවයත්, සදාචාරාත්මකභාවයත්, ප්‍රමිතියත්, තිරසාර භාවිතය නැත්නම් සංවර්ධනය සඳහා නියාමනය කරන්න, මැදිහත් වෙන්න ඒ තත්ත්වය - quality එක - උඩට ගෙනෙන්න පුළුවන්කම ලැබෙයි කියන එක අප විශ්වාස කරනවා. ඒ වාගේම මේ ආයතනය පිහිටුවීම තුළින් අපේ රටේ සමාජයීය වශයෙන් සහ ආර්ථික වශයෙන්, විශේෂයෙන්ම අපේ රටේ ඉඩම් සම්පත, ඒ වාගේම අනෙකුත් සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කරන්න, ඒවා පිළිබඳ අරමුණු සහගතව වැඩ කරන්න රටක් විධියට අපට අවස්ථාව ලැබෙයි කියලා අපි හිතනවා. ඒ වාගේම මේක තවත් ටිකක් තේරෙන්න මට මෙහෙම කියන්න පුළුවන්. ශ්‍රී ලංකාව කියන්නේ කුඩා දූපතක් කියලා අපි දන්නවා. අපට උගන්වමින් තිබුණා තමයි අපට සම්පත් ඕනෑ තරම් තිබෙනවා කියලා. නමුත්, අපි කුඩා දූපතක්. විශේෂයෙන්ම අපට ඉඩම් කියන එක ඉතාම සීමිත සම්පතක් ලෙසයි තිබෙන්නේ. ඒ නිසා අපට ඕනෑකම තිබෙනවා, අපේ ආර්ථික සහ සමාජයීය අරමුණු වෙනුවෙන් සැලසුම් සහගත ක්‍රියාවලියකට යන්න. අන්න ඒ සැලසුම් සහගත ක්‍රියාවලියට යෑම සඳහා ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය අපට උපයෝගී කර ගන්න පුළුවන්කම තිබෙනවා කියලා අපි හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම තවත් උදාහරණයක් කියන්නම්. අපි කොළඹ ඉඳන් ප්‍රධාන පාරේ ගියොත් ඕනෑ තරම් බිල්ඩින් භාගෙට හදලා තිබෙන ආකාරය දැකගන්න පුළුවන්. ඒ අතරින් සමහර බිල්ඩින් කඩා වැටෙන්නත් පටන් අරගෙන තිබෙනවා. ඇයි එහෙම වෙන්නේ? මොකද, ඒවා තුළ නිවැරදි තක්සේරුවක්, ආර්ථිකය පිළිබඳ වට්නාකමක්, ඒ වාගේම සමහර උපාය මාර්ගික ගැටලු, පාරිසරික ගැටලු පැන නැඟිලා තිබෙනවා. එම නිසා අපි හිතනවා, මෙන්න මේ තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පිහිටුවීම ඇතුළේ අන්න එවැනි ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අවස්ථාව ලැබෙනවා කියලා. ඒ විතරක් නොවෙයි. මේ ආයතනය පිහිටෙව්වාට පස්සේ අපට පුළුවන්කම තිබෙනවා, විශේෂයෙන්ම ඒ දේපළ වසර ගණනාවකට පාවිච්චි කරන්න ඕනෑ කෙසේද, ඒවාට කුමන ආයෝජනයක්ද කරන්න ඕනෑ, එතැන housing scheme එකක්ද ගහන්න ඕනෑ, නැත්නම් shopping complex එකක්ද ගහන්න ඕනෑ කියන එක මෙතැන් සිට අවුරුදු 10ක්, 15ක් එහාට තක්සේරු කරලා, නැත්නම් වට්නාකම් පිළිබඳ නිර්ණයක් කරලා තීරණයක් ගන්න. ඒක නිසා අපි හිතනවා, එම ආයතනය ඒ තත්ත්වය යටතේ නිර්මාණය කර ගැනීම ඉතාම වැදගත් වෙනවාය කියලා. ඒ වාගේම එම ආයතනයෙන් ජනතාවට තිබෙන ප්‍රයෝජනය මොකක්ද? අපි දන්නවා, සාමාන්‍යයෙන් ආයෝජනය කරන්න කෙනෙක් ආවාම ඔහුට සල්ලි තිබුණාට, ඉඩමක් දැක්කාට, සමහර ඒවාට මුදල් යෙදෙව්වාට ඒවාට අදාළ කරන වට්නාකම ලබා ගන්න හම්බ වෙන්නේ නැහැ කියන එක. හැබැයි, මෙම ආයතනය තුළින් මොකක්ද සිදු වෙන්නේ? ඉඩම් තිබෙන්න පුළුවන්; විවිධ දේපළ තිබෙන්න පුළුවන්. ඒවා පිළිබඳව, අනාගතය පිළිබඳව වට්නාකම් එකතු කරලා ඒ ආයෝජකයාට, අපේ රටේ යම් හැකියාවක් තිබෙන, මුදලක් තිබෙන පුද්ගලයෙකුට මඟ පෙන්වන්න, උපදෙස් දෙන්න මේ ආයතනයට පුළුවන්කම ලැබෙනවා. "ඔබ මෙතැනට ආයෝජනය කරන්න. මේක ඇතුළේ ඔබට තව අවුරුදු 10කින් මෙන්න මේ ආර්ථික වාසිය, මේ ප්‍රයෝජනය එනවා" කියලා උපදෙස් දෙන්න මේ ආයතනය හරහා හැකියාව ලැබෙනවා. ඒ වාගේම සාමාන්‍ය මිනිසුන්ට සල්ලි තිබුණාට සමහර නීති පිළිබඳව, සමහර පරිසර ප්‍රශ්න පිළිබඳව, සමහර දේවල් පිළිබඳව අවබෝධයක් නැහැ. හැබැයි, මෙවැනි ආයතනයක් පිහිටුවා ගත්තාට පසුව ඒ ආයතනය හරහා සාමාන්‍ය ආයෝජකයෙකුට ඒ ආයෝජනයට අදාළ කරන අවස්ථාව ලබා ගන්නට හැකියාව ලැබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු එරංග ගුණසේකර මහතා**
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි දන්නවා, මේ පිළිබඳව නිශ්චිත නියාමනයක් නොකිරීම තුළ විශේෂයෙන්ම වෙනත් මාෆියාවක් නිර්මාණය වෙමින් තිබෙනවාය කියලා. ඒ නිසා සමහර housing schemesවල තිබෙන ගෙවල් අධික ලෙස මිල ඉහළ යන්න පටන් අරගෙන තිබෙනවා. මොකද, ඒවා නියාමනය කිරීමක් සිදු වන්නේ නැහැ. නිශ්චිත ආයතනයක් නැහැ, ඒ පිළිබඳව වට්නාකමක් ලබා දෙන්න. ඉඩම් පිළිබඳ තත්ත්වයත් එහෙමයි. ඒක නිසා අපි හිතනවා, මේ ආයතනය ගොඩනැඟීම තුළ ඒ සඳහාත් අවශ්‍ය කරන මැදිහත්වීම කරන්න පුළුවන්කම ලැබෙනවාය කියලා. ඒක නිසා ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය ඉතාම වැදගත් ආයතනයක් ලෙස අප රට තුළ ස්ථාපනය කර ගත යුතුයි කියලා අපි හිතනවා. අනෙක් ආයතනත් එක්ක තිබෙන ගැටීම අවම කරමින් අපි ඉදිරිපත් කරන සංශෝධනවලට යටත්ව අපේ රටේ තථ්‍ය දේපළකරුවන්ගේ වෘත්තීමයභාවයත්, ඒ වාගේම රටේ ජනතාවට ඔවුන්ගේ උපරිම උපයෝගීතාව ගැනීම වෙනුවෙනුත් මේ පනත් කෙටුම්පත අද අපට සම්මත කර ගන්න පුළුවන් වෙයි කියලා අප බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.52]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் இலங்கை நிலையான சொத்து உயர் தொழிலர்கள் நிறுவகம் பற்றிய விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இலங்கை நிலையான சொத்து உயர்தொழிலர்கள் நிறுவகத்தின் ஊடாக முதலீடுகளை அதிகரித்தல், தொழில் விற்பன்னர்களை அல்லது தொழில் நிபுணத்துவம் பெற்றவர்களை முன்னுக்குக் கொண்டுவருதல், அதன்மூலமாகத் தொழில் விருத்திகளைச் செய்தல் என்பதை இதன் எண்ணக்கருவில் உட்படுத்தியிருக்கின்றது.

இலங்கையைப் பொறுத்தமட்டில், நாடு சுதந்திரமடைந்த காலகட்டத்தில் இங்கு தொழில் சம்பந்தமான விற்பன்னர்கள் அல்லது தொழில் வல்லுனர்கள் அல்லது தொழில் நிபுணத்துவம் பெற்றவர்கள் பெருகி வாழ்ந்திருக்கின்றார்கள். எமது நாட்டில் ஏற்பட்ட பல பிரச்சினைகள் காரணமாக - அது இனப் பிரச்சினையாகக்கூட இருக்கலாம் - இந்தத் தொழில் விற்பன்னர்கள் நாட்டைவிட்டு வெளியேறிப் புலம்பெயர்ந்து வாழ்கின்றார்கள். இந்தத் தொழில் விற்பன்னர்கள் அல்லது தொழில் வல்லுனர்கள் - தொழில் புலமையாளர்கள் என்றுகூட சொல்லலாம் - இந்த நாட்டை அபிவிருத்தி செய்யக்கூடிய வல்லமை பெற்றிருக்கின்றார்கள். இவ்வாறு வல்லமை பெற்றிருக்கின்ற தொழில் வல்லுனர்களை - தொழில் நிபுணத்துவம் பெற்றவர்களை - தொழில் புலமையாளர்களை, இந்த உயர்தொழிலர்கள் நிறுவகம்மூலம் கட்டாயம் எமது நாட்டுக்கு மீண்டும் வரவழைக்க வேண்டிய தேவையிருக்கின்றது.

நாட்டுக்கு முதலீட்டாளர்களை வரவேற்கின்றதொரு கலாசாரம் இங்கு இருக்குமாகவிருந்தால், அந்த முதலீட்டாளர்கள் இந்த நாட்டின் பொருளாதாரத்தில் பங்குபற்றக்கூடிய தொரு சூழலை உருவாக்கக்கூடியதாக இருக்குமாகவிருந்தால், நிச்சயமாக நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்ப முடியும். இது ஒரு நேர்க்கணியமான எண்ணக்கருவாகக் காணப்படுகின்றது. ஏனென்றால், நாடு முன்னேற வேண்டுமாயின் தொழில் முயற்சியாளர்கள் ஊக்குவிக்கப்படுதல் வேண்டும். நாங்கள் ஏதோவொரு வகையில் தொழில் முயற்சியாளர்களை அல்லது தொழில் வல்லுனர்களை ஊக்குவித்து மேம்படுத்தாவிட்டால், அவர்கள் இந்த நாட்டைவிட்டு வெளியேறிப் பிறநாடுகளுக்குச் சென்று அந்த நாடுகளை வளப்படுத்துகின்றவர்களாக மாறுவார்கள். அப்படியில்லாமல், இந்த நாட்டில் தொழில் வல்லுனர்கள் ஊக்குவிக்கப்படுகின்றபோது, முதலீடுகள் செய்வதற்கான சந்தர்ப்பத்தை அவர்களுக்கு அளிக்கின்றபோது, நாடு விரைவாக முன்னேறுவதற்குரிய வாய்ப்பு இருக்கின்றது. எனவே, இந்தச் சட்டமூலம் நடைமுறையில் இந்தத் தன்மைகளைக் கொண்டிருக்க வேண்டும்; ஏற்றுமதி வருமானத்தை அதிகரிக்கக்கூடியதாக அமைய வேண்டும்.

இன்று நாங்கள் இறக்குமதிக்காக அதிகமான பணத்தை செலவழித்துக் கொண்டிருக்கின்றோம். எமக்கு ஏற்றுமதி மூலமாகக் கிடைக்கின்ற வருவாய் என்பது குறைவாக இருக்கின்றது. ஏற்றுமதி வருமானம் குறைந்தும் இறக்குமதிச் செலவு அதிகரித்தும் காணப்படுமாகவிருந்தால் இந்த நாட்டின் பாதீட்டில் துண்டுவிழும் தொகை என்பது தொடர்ச்சியான தொரு நிகழ்வாகத்தான் இருக்கும். இந்தச் சட்டமூலத்தின் மூலமாக நிச்சயமாக தொழில் ஊக்குவிப்பாளர் அல்லது தொழில் வல்லமையாளர்களை அதிகரிக்க வேண்டிய நிலைமை காணப்படுகின்ற அதேநேரத்திலே இனம், மதம், ஜாதி, குல பேதம் பார்க்காமல் திறமையுள்ள தொழில் வல்லமையாளர்களை உரிய ஊக்குவிக்க வேண்டிய நிலைமையும் காணப்படுகின்றது

நான் முன்னர் குறிப்பிட்டதுபோன்று கடந்த காலத்தில் எமது நாட்டிலிருந்த இப்படியானவர்கள் புலம்பெயர்ந்து சென்றிருக்கிறார்கள். இப்போது மேற்குலக நாடுகளைப் பார்க்கின்றபோது, அந்த விற்பன்னர்கள் மூலமாக அந்த நாடுகள் பயனடைந்துகொண்டிருப்பதைக் காணமுடிகின்றது. அவர்களே பலருக்குத் தொழில்வாய்ப்புகளையும் கொடுத்துக் கொண்டிருக்கின்றார்கள். ஆனால், இப்போது எமது நாட்டிலிருக்கின்ற பட்டதாரிகள் தொழிலுக்காக அலைந்து கொண்டிருப்பதும் உண்ணாவிரதம் இருப்பதும் முக்கியமான பிரச்சினையாக இருக்கின்றது. அவர்கள் உண்மையில் எமது நாட்டிலுள்ள பல்கலைக்கழகங்களில் கற்று வெளியேறியவர்கள். இங்குள்ள பல்கலைக்கழகங்களில் கற்று வெளியேறியவர்கள் இங்கு தொழில் கேட்பதில் எந்தவிதமான வாதப் பிரதிவாதமும் இருக்க முடியாது. குறிப்பாக, இப்போது பாடசாலைகளில் அபிவிருத்தி உத்தியோகத்தர்களாகக் கடமையாற்றுபவர்கள் தங்களை ஆசிரியர் சேவையில் இணைக்க வேண்டுமென்று கேட்டுக் கொண்டிருக்கிறார்கள். அவர்கள் அந்தத் துறையில் பயன்படுத்தப்பட்டிருக்கிறார்கள்; அதன் காரணமாக அந்தத் தொழிலைக் கோரிக் கொண்டிருக்கிறார்கள். எனவே, இதற்கான தீர்மானம் என்பது கட்டாயம் அவசியமானதாக இருக்கின்றது.

ஆகவே, பல்கலைக்கழகங்களில் கற்று வெளியேறுபவர்களை தொழிலுக்குரியவர்களாக, சுயமாகத் தொழில் செய்யக்கூடியவர்களாக, மற்றவர்களுக்குத் தொழில் வாய்ப்புகளை வழங்கக்கூடியவர்களாக உருவாக்கும் விதத்தில் பல்கலைக் கழகப் பாடவிதானமானது மாற்றியமைக்கப்பட வேண்டும். ஏனென்றால், இப்போது இருக்கின்ற கற்றலும் பல்கலைக்கழகப் பாடவிதானமும் அவர்கள் கற்று வெளியேறியவுடன் அரசிடம் தொழிலைக் கேட்கிற அளவுக்குத்தான் அமைந்திருக்கின்றது. அவர்கள் அரசாங்கத்தின் பாடவிதானத்தின்படி கற்கைகளை மேற்கொள்கிறார்கள்; பட்டத்தைப் பெறுகிறார்கள்; அரசிடம் தொழில் கோருகின்றார்கள். ஆனால், உயர் தொழிலர்கள் நிறுவகம் என்ற எண்ணக்கருவின் அடிப்படையில் பார்க்கின்றபோது, இந்தப் பட்டதாரிகள் சுயமாகத் தொழில் செய்யக்கூடியவர்களாகவும் மற்றவர்களுக்குத் தொழில் வாய்ப்புகளைக் கொடுக்கக் கூடியவிதத்திலும் இருப்பார்களானால் நிச்சயமாக இந்தப் பிரச்சினைகள் இருக்க முடியாது. எனவே, இந்த உயர் தொழிலர்கள் நிறுவகமானது பல்கலைக்கழகப் பாடவிதானங்களில் மாற்றங்களை ஏற்படுத்தக்கூடிய விதத்திலும் அமைந்திருக்க வேண்டும். ஏனென்றால், பல்கலைக்கழகங்கள் வழங்குகின்ற கல்வி அறிவுசார் கல்வியாக இருக்கின்றதே ஒழிய, மனப்பாங்கில், திறன்களில், பிரயோகத்தில் மாற்றத்தை ஏற்படுத்தக்கூடிய விதத்தில் இல்லை. பிற வளர்ந்த நாடுகளைப் பார்த்தோம் என்றால், அத்தகைய தன்மைகள் அங்குள்ள கல்வி முறைமையில் காணப்படுகின்றன. எனவே, இது ஒரு சாத்தியமான எண்ணக்கருவாக அமைய வேண்டும். இதன்மூலமாக எமது நாட்டை, எமது இளைஞர்களை முன்னேற்றமடையச் செய்வதுடன், எமது ஏற்றுமதி வருமானத்தையும் அதிகரிக்கக்கூடியதாக இருக்க வேண்டும்.

மேலும் ஒரு விடயத்தைச் சொல்லுகின்றேன். அதாவது, மட்டக்களப்பு மாவட்டத்தின் புகையிரத சேவையைப் பற்றி பலமுறை நாங்கள் கூறியிருக்கின்றோம். கடந்த காலத்தில்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

இருந்த புகையிரத சேவை என்பது மக்களுக்குச் சாதகமாக இருந்தது. அப்போது ரொமேனியன் வகைப் புகையிரதம் பயன்படுத்தப்பட்டிருந்தது. இப்போது power set வகைப் புகையிரதம் பயன்படுத்தப்படுகின்றது. ரொமேனியன் வகைப் புகையிரதம் பயன்படுத்தப்பட்டபோது, 10 பெட்டிகள் இணைக்கப்பட்டிருந்தது; முதலாம் வகுப்பு, இரண்டாம் வகுப்பு மற்றும் உறங்கல் இருக்கைகள் காணப்பட்டன. அதன் மூலமாகப் புகையிரதத் திணைக்களம் நாள் ஒன்றுக்கு 1,000,000 ரூபாய் வருமானத்தைப் பெறக்கூடியதாக இருந்தது. தற்போது அது power set வகையான புகையிரதமாக மாற்றப்பட்டுள்ள நிலையில் 5 பெட்டிகள் குறைக்கப்பட்டிருக்கின்ற காரணத்தினால், அந்த வருமானம் 300,000 ரூபாய் வரை குறைவடைந்திருக்கின்றது. அத்துடன், புகையிரத நேர அட்டவணையும் கூட பொருத்தமற்றதாக மாற்றப்பட்டிருக்கின்றது. அதாவது, கடந்த காலத்தில் புகையிரதம் கொழும்பில் இருந்து மாலை 7.00 மணிக்குப் புறப்பட்டால், மட்டக்களப்புக்கு அதிகாலை 4.00 மணிக்குச் சென்றடையும். அது மக்கள் விரும்பக்கூடிய நேர அட்டவணையுடனான சாத்தியமான ஒரு போக்குவரத்தாக இருந்தது. ஆனால், தற்போது அந்தப் புகையிரதம் இரவு 11.00 மணிக்குக் கொழும்பில் இருந்து புறப்பட்டு, மட்டக்களப்பிற்குக் காலை 9.30 மணிக்குச் சென்றடைகின்றபடியால், அலுவலக ஊழியர்கள் உரிய நேரத்தில் கடமைக்குச் செல்லமுடியாத நிலைமை காணப்படுகின்றது. இதன் காரணமாக அவர்களின் ஒரு நாள் மேலதிகமாக விரயமாக்கப்படுகின்றது. அத்துடன், power set மூலமான புகையிரத சேவையில் canteen வசதிகூட இல்லை.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසන්.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Give me one more minute, please.

ஆகவே, கடந்த காலத்தில் இருந்த நேர ஒழுங்கு மற்றும் கடந்த காலத்தில் இருந்த புகையிரத வகை ஆகியவற்றைப் பயன்படுத்துகின்றபோது, நாள் ஒன்றுக்கு 1,000,000 ரூபாய் வருமானம் பெறக்கூடியதாக இருக்கும்! அந்த வகையில், 700,000 ரூபாய் வருமானத்தை இழக்க வேண்டாம் என்று இந்தச் சந்தர்ப்பத்தில் கௌரவ அமைச்சரிடம் கேட்டுக் கொண்டு, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවීන්ද්‍ර බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.59]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අද කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත පිළිබඳවයි.

ඊට ප්‍රථමයෙන්, කාරණයක් කිව යුතුයි. මීට මොහොතකට ඉස්සෙල්ලා සාටකයක් දාගෙන සිටින අපේ ගරු මන්ත්‍රීවරයෙක් කථා කළා. මම දැක්කා, ඊයේත් ඒ හා සමාන ප්‍රකාශයක් කරලා තිබුණා. එතුමා අපට මතක් කර දෙනවා, "අපේ පස්සෙන් එන්න එපා, අපිට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න යන්න එපා, දුන්නු පොරොන්දු ඉටු කරන්න" කියලා. අපි කියන්න ඕනෑ, දුන්නු පොරොන්දු තමයි අපි ඉටු කරන්නේ කියලා. දුන්නු පොරොන්දු ඉටු කරනකොට අඬන්න බැහැ. මොකද, දුන්නු පොරොන්දුවල තිබුණු ප්‍රධානම පොරොන්දුවක් තමයි දූෂිතයින්ට, ඝාතකයින්ට දඬුවම් දෙනවා කියන එක. ඉතින්, ඒ ක්‍රියාවලිය සිද්ධ වෙන එක තමයි පොරොන්දු ඉටු කරනවා කියන්නේ. ඒ මන්ත්‍රීවරයාම මතක් කරලා දෙනවා, පොරොන්දු ඉටු කරන්න කියලා. අපි දුන් ප්‍රධානම පොරොන්දුවක් තමයි ඒ ඉටු වෙන්නේ.

ඒ අතරේ තව නොයෙක් කතන්දර කියාගෙන යනවා. මම දැක්කා, "දිට්වා" සුළි කුණාටුව සම්බන්ධව හා එහි පසු ක්‍රියාකාරීත්වය ගැන කථා කළා. මම ජීවත් වන ප්‍රදේශයට "දිට්වා" සුළි කුණාටුව දරුණු ලෙස බලපෑවා. නාය යෑම් සිදු වුණා, මිනිස් ජීවිත අහිමි වුණා. එවැනි අතීත සිද්ධි තිබෙනවා. එතුමන්ලා බලයට පත් වෙලා ඉන්න කාලයක තමයි මීරියබැද්ද නාය ගියේ. මීරියබැද්ද නාය ගිහිල්ලා ජනතාව පණ පිටින් වැළලුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊට කලින් කියලා තිබුණා, ඒ ප්‍රදේශයෙන් ජනතාව අයින් කරන්න, ඒක අවදානම් ප්‍රදේශයක් කියලා. නමුත්, ජනතාව අයින් කළේ නැහැ.

ඒ වාගේම දැන් ගෙවල් හදන ඒවා ගැන අපට උපදෙස් දෙනවා. මීරියබැද්ද නාය ගියාට පසුව ගෙවල් සම්පූර්ණයෙන් විනාශ වුණු අයට ඒ ගොල්ලන්ගේ කාලයේ ගෙවල් 75ක් හැදුවා. හැබැයි, ඒ ගෙවල් ටික හදලා ඉවර කරන්න අවුරුදු 4ක් ගත වුණා. එතෙක් ඒ මිනිස්සු නොවිඳිනා දුක් විඳිමින් තැන් තැන්වල හිටියා. තවත් ගෙවල් 135ක් හදන්න තිබෙනවා. අපේ ආණ්ඩුව තමයි ඒ ගෙවල් ටික හදන්නේ. එම නිසා එතුමන්ලාට ඒ ඉතිහාසය මතක් කරලා දෙන්න වෙනවා.

ඒ වාගේම පසුගිය දවස්වල පහර දීම් වුණා, ඒවා මේවා වුණා කියලාත් කියනවා මම දැක්කා. පහර දීම් ගැනත් ඉතිහාසයක් තිබෙනවා. පහර දීම් විතරක් නොවෙයි, ඝාතන සංස්කෘතියකුත් තිබෙනවා. ඇත්තටම ඒගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ. ඒගොල්ලන් ගිහිල්ලා එක එක කථා කියන එක නොවෙයි, ලජ්ජා වෙන්න ඕනෑ. මේ දවස්වල ඒගොල්ලන්ගේ කාට එරෙහිවද පරීක්ෂණ පවත්වන්නේ? බාප්පාද, අම්මාද, අයියාද, මල්ලිද, බාප්පාගේ පුතාද, ලොකු තාත්තාගේ පුතාද, ලොකු තාත්තාද ඒ සියල්ලට එරෙහිව පරීක්ෂණ පැවැත්වෙනවා. මිග් යානා ගනුදෙනුව ගැන පරීක්ෂණ පැවැත්වෙනවා. ඒක අර අපි ඉටු කරනවා කියපු පොරොන්දුවලින් එකක්. ඝාතන, පහර දීම් ගැන කථා කරනකොට තාජුඩීන් ගැන මතක් වෙන්නේ නැද්ද? ඒ වාගේම පෝද්දල ජයන්තට පහර දීපු ඒවා ගැන මතක් වෙන්නේ නැද්ද? ඒ අයගේ කකුල් කඩපු විධිය, රැවුල, කොණ්ඩය කපලා ඒවා කට ඇතුළේ ඔබපු විධිය මතක් වෙන්නේ නැද්ද? ඒ වාගේම දරුණු ලෙස පහර දීලා, කෲර ලෙස පහර දීලා ඝාතනය කරපු ඒවා, ලසන්ත වික්‍රමතුංග, එක්නැලිගොඩ, කීත් නොයාර්ලා අතුරුදහන් කරපුවා, ඒගොල්ලන්ට පහර දීම් කරපුවා මතක් වෙන්නේ නැද්ද? නමුත්, දැන් හරිම ලස්සනට කථා කරනවා.

ගෙවල් දීම ගැනත් කථා කළා. මම දන්නවා, එතුමන්ලා මේ කතාව අහගෙන ඉන්නේ නැහැ, කථා කරපු ගමන් එළියට යනවා. එතුමන්ලා හැමදාම එකම දේ කියන්නේ. කිසිම සාරයක් නැහැ. අපේ ගරු ජනාධිපතිතුමා -ජනාධිපති සහෝදරයා- කිව්වා වාගේ ඔයගොල්ලෝ කවදාහරි බලයට එන්න හිතනවා නම් අලුත් දෙයක් කරන්න, අපට වඩා හොඳ වෙන්න. අන්න එහෙම කරන්න. නමුත්, නිල මැස්සෝ වාගේ හැමදාම යන්නේ අසූචි ගොඩට; ජාතිවාදය, ආගම්වාදය කියන අසූචි ගොඩට තමයි හැමදාම යන්නේ. ජාතිවාදය, ආගම්වාදය අවුස්සන එක තමයි

හැමදාම කථාවේ යම් කොටසක් තුළ තිබෙන්නේ. ඒක තමයි අදත් තිබුණේ. ඒකට බුද්ධ දර්ශනය වාගේ උතුම් දේවලුත් යොදා ගන්නවා. ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට, ආගමට තිබෙන ගරුත්වය උපරිමයෙන් ආරක්ෂා කරන ආණ්ඩුවක් තමයි මේ තිබෙන්නේ. ඒගොල්ලෝ කිව්වේ කොහොමද? ජාතික ජන බලවේගය ආණ්ඩුවක් ආවොත් පන්සලට දානේ ටික හම්බ වෙන්නේ නැහැ කිව්වා, පෙරහැර නැහැ කිව්වා. ඒ වාගේ කථා තමයි කිව්වේ. නමුත්, ඒ කටයුතු සියල්ල හොඳින් සිදු වනවා. මේ වෙලාවේ බොහොම ලස්සනට සර්වඥ ධාතු ප්‍රදර්ශනයක් ආරම්භ කිරීමට නියමිතව තිබෙනවා. ඒ දේවල් සිද්ධ වෙනකොට අර මම කිව්වා වාගේ නිල මැස්සා අසූචි ගොඩට යන්නා වාගේ ඒ අය ජාතිවාදය ඇති කරනවා. ඒගොල්ලන්ට ඉන්න බැහැ. එක්කෝ, සිංහල, දෙමළ ජාතිවාදයක් අවුස්සා ගන්න ඕනෑ. එහෙම නැත්නම්, "වඳ කොත්තු, වඳ ඇඳුම්" කියලා ඒ වාගේ එකක් අවුස්සන්න ඕනෑ. ඒ හැර කිසිවක් නැහැ. අලුත් දෙයක් නැහැ.

හැමදාම කන්ටේනර් 323ක් ගැන කථා කරනවා. එතැන කන්ටේනර් ලක්ෂ ගාණක් හුවමාරු වෙනවා. නමුත් එකම දේ කියනවා. සනාථ කරන්න කිසිම දෙයක් නැහැ. එකම දේ වපුරනවා.

ඊළඟට, ගල් අඟුරු ගැන කතන්දර කියනවා. ටෙන්ඩර් දාලා නිසි පටිපාටියට ගල් අඟුරු වැඩේ වෙනකොට, ඒගොල්ලන් ඒ කාලයේ ටෙන්ඩර් නැතිව කටයුතු කරලා මහා පරිමාණ දූෂණ වුණු එකේ වාඩුව ගන්න දැන් ගල් අඟුරු කථාවක් කියනවා. අපි ඉතා පැහැදිලිව පෙන්නුම් කරලා තිබෙනවා, එහෙම කිසිම දෙයක් වෙලා නැහැ, යම්කිසි පාඩුවක් සිදු වුණා නම් වුණේ ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්නයක් නිසාය කියන එක. හැබැයි, ඒ වාගේ තුන්ගුණයක් ඒගොල්ලන්ගෙන් දඩ අය කරනවා. අතීතයේත් එහෙම දේවල් සිද්ධ වෙලා තිබෙනවා. ඊට වඩා දේවල් වෙලා තිබෙනවා. ඒ කියන්නේ ටෙන්ඩර් පටිපාටියකින් තොරව තමයි දීලා තිබෙන්නේ. මෙතැන ඇවිල්ලා දැන් කථා කරනවා, හැමදාම කියන එකම දේ.

අපට කියන්න තිබෙන්නේ මේකයි. එතුමා ඉදිරිපත් වුණා අපි දැක්කා. එහෙම පරීක්ෂණ යයි, තව යන්න වෙයි. හැබැයි, අපේ පොරොන්දුවක් තිබෙනවා, විශේෂ අධිකරණ පිහිටුවා දූෂිතයන්ට, ඒ කියන්නේ මහා පරිමාණ දූෂණ, වංචා සම්බන්ධයෙන් දඬුවම් දෙනවා කියලා. ඒ අධිකරණ පිහිටුවා දැන් ඒ කටයුතු කරමින් යනවා. ඒ නිසා තමයි ඔය කලබල වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ අයට වෙන කෙනකුගේ කථාවක් අහන්න බැහැ, තමන්ගේ කථාව ඉවර වුණු ගමන් සභාවෙන් යනවා. එළියට වෙලා අහගෙන ඉන්න බව අපි දන්නවා. මේ කථාවත් අහගෙන ඉන්නවා. ඉතින් විරුද්ධ අදහසක් අහගෙන ඉන්න පෞරුෂයක් නැත්නම්, ඒ කියන්නේ එතුමන්ලා කියන බොරු ටිකට අපි කියන දේවල් අහගෙන ඉන්න බැරි නම් ඒ ගැන කනගාටුයි. ඒ අයගේ ක්‍රියාකාරිත්වය; ජාතිවාදය අවුස්සලා, හොරකමෙන්, දූෂණයෙන්, පහර දීමෙන්, භීෂණයෙන් ආපු ක්‍රමය තමයි මිනිස්සු system change එකක් ගෙනැල්ලා පහළට දැම්මේ; වළ දැම්මේ. එම නිසා අපි ඒ අයට කියන්නේ වෙනස් වෙන්න කියලායි; වෙනස් වෙලා, අලුත් වෙලා, බිමේ තිබෙන දේශපාලනය තේරුම් අරගෙන නැවත වතාවක් එන්න කියලායි.

ඒකත් එක්කම අපි විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ අයට ඔය කථා කියන අතරම කියන්න පුළුවන්, ලොකු තාත්තාගේ පුතා රට ගිහිල්ලා ඉන්නවා නේ, ඇවිල්ලා ඉදිරිපත් වෙන්න කියලා. බාප්පාට කියන්න, ඇවිල්ලා ඉදිරිපත් වෙන්න කියලා. ඒ අයටත් ඇවිල්ලා ඉදිරිපත් වෙන්න කියන්න. ඉදිරිපත් වෙලා තමන්ගේ නිර්දෝෂීභාවය සනාථ කරන්න කියන්න. අපි දන්නවා, ඒ පරීක්ෂණවල බොහොම අතීත සිදුවීම් තිබෙන බව. පොලිස් පොත්වල පිටු නැහැ. පිටු ගැලවිලා ගිහිල්ලා. දුරකථන සංවාදවල දත්ත මැකිලා. සමහර සාක්ෂිකාරයෝ ඝාතනය වෙලා. එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ. හැබැයි, මතක තබා ගන්න, මම කිව්වා වාගේ ඔබලාගෙන් අමානුෂික ලෙස පහර කාපු හැමෝම අවසාන මොහොතේ හරි හිතපු දෙයක් තිබෙනවා. එම නිසා යම්කිසි දවසක ඒවාට නීතිය ක්‍රියාත්මක වෙනවා. මොනයම් ක්‍රමයකින් හෝ නිවැරදි සාක්ෂි සොයමින් ඒ පරීක්ෂණ සිද්ධ වෙනවා. ඒ කාරණය මම ඒ මහත්මයාට මතක් කරලා දෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තවත් නොයෙක් කථා කිව්වා. ඒ සියල්ලටම මම උත්තර දෙන්නම්. හැබැයි, අද දවසේ මම ඉල්ලීමක් කරනවා, ඊළඟ දවසේ ඇවිල්ලා හෝ අලුත් කතන්දරයක් කියන්න කියලා. මේ රට ගොඩනඟන විධිය, දූෂණයෙන් තොරව ඉස්සරහට යන විධිය ගැන කියන්න කියලා. ජාතිවාදය නැතුව, ජාතිවාදී යුද්ධ නැතුව රට ලස්සනට යනකොට එක පැත්තකින් සිංහල ජාතිවාදය අවුස්සන විධියේ ප්‍රකාශ කරනවා. අනෙක් පැත්තෙන්, දමිළ ජාතිවාදය, මුස්ලිම් ජාතිවාදය අවුස්සන විධියේ ප්‍රකාශ කරනවා.

ඇත්තටම අපි හැම දෙයක්ම නිවැරදි කළමනාකරණයක් තුළ ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. වඩාත් කාර්යක්ෂමතාවකින් යුතුව සේවය සපයන්න ඕනෑ. කන්ටේනර් මෙහෙයුම්කරුවන්ගේ ක්ෂේත්‍රයේ වර්ධනයට ඇති බාධා ඉවත් කිරීම, ඔවුන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යෑම, ඒවා නියාමනය කිරීම සහ ඒවා පාලනය කිරීම සඳහා තමයි සංශෝධන සහිතව කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙන්නේ. මම කියන්න ඕනෑ, එතැනදීත් විපක්ෂය කන්ටේනර් 323ක් ගැන මනෝරාජික අදහස් ඉදිරිපත් කළාට, කොළඹ වරාය 2025දී තමයි තීරණාත්මක සන්ධිස්ථානයකට එමින් ඉතිහාසයේ මෙතෙක් හසුරුවන ලද ඉහළම බහලුම් ප්‍රමාණය, වැඩිම ධාරිතාව හසුරුවනු ලැබුවේ. 2026 ජනවාරිවලත් එහෙමයි. ඒ වාර්තා තිබෙනවා.

අපි රටක් ලෙස ඉස්සරහට යනකොට, ඩොලර් සංචිත වැඩිවෙලා, ඩොලර් එන මාර්ග වර්ධනය වෙලා, විදේශ ප්‍රේෂණවල ඉතිහාසයේ ඉහළම අගය ගිය අවුරුද්දේ වාර්තා කළ බව අපි දන්නවා. ඒ වාගේම එම ඩොලර් එන මාර්ග ගැන කිව්වොත්, 2025 වසර ඉතිහාසයේ වැඩිම සංචාරකයින් පිරිසක් ආපු අවුරුද්ද වුණා. ඒ වාර්තාව නැවත කඩනවා නම් කඩන්නේ 2026දී. අනිවාර්යයෙන්ම ඒ වාර්තාව කැඩෙනවා. ඒ වාගේම අපනයන ක්ෂේත්‍රයෙනුත් ඩොලර් එනවා.

විපක්ෂයේ අනෙක් කණ්ඩායම ගත්තොත්, විපක්ෂ නායකතුමාගේ කථාවේදී වුණත් අසභ්‍යකරණයක් ගැන කිව්වා අපි දැක්කා. ඒගොල්ලන් තමයි ඔය අසභ්‍යකරණ නිර්මාණය කරන්නේ. මම එදාත් කිව්වා, එතුමා අසභ්‍යකරණය ගැන කථා කළාට, පිටුපස හැරිලා බැලුවොත් එතැන තමයි අසභ්‍යකරණය තිබෙන්නේ. අපි දැක්කා, අනුරාධපුර ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් - නම කියන්නත් පිළිකුල්- අන්ත තුච්ඡ වචන පාවිච්චි කරමින් ඉතාම කැත විධියට අගමැතිතුමියට අපහාස කළ ආකාරය. දැන් කථානායකතුමාට අපහාස කරනවා. මම කියන්නේ, ඒක තමයි අසභ්‍යකරණය. අසභ්‍ය වචන පිට වෙච්ච මේ පාර්ලිමේන්තුව බොහොම සභ්‍ය තත්ත්වයට පත් වෙනකොට ඒගොල්ලන් දන්නවා, තමන්ට කරකියාගන්න දෙයක් නැති වන බව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා අලුත් දේශපාලන සංස්කෘතියට හැඩ ගැහෙන්න කියා විපක්ෂයේ ඒ කණ්ඩායම් දෙකෙන්ම ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.09]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, real estate தொழில் செய்பவர்களுக்காக ஒரு සමිතිය ஸ்தாபிப்பதற்கு நடவடிக்கை எடுப்பதற்காகக் கொண்டு வரப்பட்டுள்ள இந்தச் சட்டமூலம் இன்றைய தினம் விவாதத்திற்கு எடுக்கப்பட்டிருக்கின்றது. விசேஷமாக, இலங்கையிலே real estate செய்பவர்களுக்கு இது பிரயோசமான ஒரு விஷயம் என்று நான் நினைக்கின்றேன். அதை ஏற்றுக்கொள்கின்ற அதேநேரத்திலே, அதில் சில திருத்தங்களையும் கொண்டுவர வேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். Real estate செய்பவர்களில் அதிகமானோர் இன்று ஏமாற்றுபவர்களாக இருக்கிறார்கள். காசை வாங்கிக்கொண்டு அதை இல்லாமல் செய்கின்ற சூழ்நிலைகளும் இந்தத் துறையில் உருவாகியிருக்கின்றது. ஆகவே, அது சம்பந்தமாகக் கவனம் செலுத்த வேண்டுமென்று இந்த நேரத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, பெருந்தோட்டத் தொழிலாளர்களுடைய சம்பள அதிகரிப்புப் பற்றிய விடயம் சந்தோஷப்படக்கூடிய ஒன்றாகும். அதாவது, அரசாங்கம் கொடுப்பதாகச் சொன்ன 1,750 ரூபாய் நாட் சம்பளம் கொடுக்கப்பட்டிருப்பதை நாங்கள் நிச்சயமாகப் பாராட்ட வேண்டும். இந்த அதிகரிப்புக்கு அரசாங்கம் 200 ரூபாயும் பெருந்தோட்டக் கம்பனிகள் 200 ரூபாயும் கொடுப்பதாக ஒப்பந்தம் செய்யப்பட்டுள்ளது. கூட்டு ஒப்பந்த நடைமுறைக் காலகட்டத்தில் பெருந்தோட்டக் கம்பனிகள் எக்காரணத்தைக்கொண்டும் சம்பள அதிகரிப்புக்கு இணங்காத ஒரு சூழ்நிலை இருந்தது. மாண்புமிகு அமைச்சர் கே.வி. சமந்த வித்தியாரத்ன அவர்கள் தன்னுடைய பெரு முயற்சியின் காரணமாக இந்த முறை அவர்களைச் சம்மதிக்க வைத்திருக்கின்றார். அரசாங்கம் கம்பனிகளை மிரட்டி அல்லது ஏதோவொரு வகையில் சம்மதிக்க வைத்து 200 ரூபாயைக் கொடுக்கச் செய்ய நடவடிக்கை எடுத்திருக்கின்றது. அத்தோடு அரசாங்கம் 200 ரூபாயைக் கொடுப்பதற்கான உடன்படிக்கை ஏற்படுத்தப்பட்டிருக் கின்றது. அதனால் நாங்கள் அரசாங்கத்திற்கு நன்றி சொல்ல வேண்டும்.

நாங்கள் ஆட்சியில் இருந்த கால கட்டங்களிலே 50 ரூபாய்கூட அரசாங்கத்தால் கொடுக்க முடியாத சூழ்நிலை இருந்தது. ஆனால், இன்று அரசாங்கத்தால் 200 ரூபாய் வழங்கப்படுவதென்பது வரவேற்கக்கூடிய ஒரு விஷயமாகும். ஆகவே, ஒட்டுமொத்தமாக 400 ரூபாய் சம்பள அதிகரிப்புக் கிடைத்திருப்பது நல்ல விஷயம். பெப்ருவரி 10க்குப் பிறகுதான் முழுமையான சம்பளம் வழங்கப்படுவதை நாங்கள் எதிர்பார்க்க முடியும். எது எப்படியிருந்தாலும், சம்பள அதிகரிப்பு என்கின்ற அடிப்படையிலே ஊதியத்தைக் கொடுத்துவிட்டு, அவர்களுடைய கொழுந்து பறிக்கும் அளவில் அதிகரிப்பை ஏற்படுத்தக்கூடாது என்பது எங்களுடைய கருத்தாக இருக்கின்றது. ஏனென்றால், 4 கிலோகிராமைக் கூடுதலாக எடுக்க நிர்ப்பந்தித்தால் அந்த 200 ரூபாய் சம்பளம் அதிகரிப்பு ஒன்றுமில்லாமல் போய் விடும். அப்படி இல்லாமல் தோட்டங்களில் முழுமையாக அந்தச் சம்பளத்தைப் பெறுவதற்கான வாய்ப்பை நீங்கள் ஏற்படுத்திக் கொடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, இன்று கவரவில B பிரிவைச் சேர்ந்த தோட்டப்பகுதியிலே 8 தொழிலாளர்களுக்கு எந்தவிதமான charge sheetஉம் கொடுக்காமல் அவர்களுடைய வேலை நிறுத்தப்பட்டிருக்கின்றது. ஏனைய தோட்டங்களிலிருந்து வந்தவர்களுக்கும் இந்தத் தோட்டத்திலிருப்பவர்களுக்கும் இடையிலான பிரச்சினை காரணமாக அந்தத் தோட்டத்திலே காலங்காலமாக வேலை செய்தவர்கள் வேலையிலிருந்து நீக்கப்பட்டிருக்கிறார்கள். இது தோட்ட முகாமையாளரின் அராஜகமான ஒரு செயல் என்று நாங்கள் சொல்லலாம். இன்று தோட்டங்களிலே தோட்ட அதிகாரிகளுடைய அக்கிரமம் அதிகரித்திருக்கின்றது; தொழிற்சங்கங்களின் பலம் குறைக்கப்பட்டுள்ளது. அமைச்சர்கூட இந்தச் சம்பள உயர்வு சம்பந்தமாக நடவடிக்கையெடுக்கும்போது தொழிற்சங்கங்களைக் கூட்டி அவர்களை மூன்றாவது தரப்பாகச் சேர்த்துக்கொண்டு இந்த சம்பள உயர்வு ஒப்பந்தத்தைச் செய்திருக்கலாம்; அரசாங்கம் அதைச் செய்யவில்லை. இது Horana Plantations PLCஇல்தான் நடந்திருக்கின்றது. இது தொழிற்சங்கத்தையும் மீறிச் செய்யப்பட்ட ஒரு நடவடிக்கையாக இருக்கின்றது. இந்த விஷயம் சம்பந்தமாக உடனடியாகக் கவனம் செலுத்த வேண்டுமென்று நான் காலையில் அமைச்சர் அவர்களுக்குச் சொன்னேன். இப்பொழுது கவரவில தோட்டதில் சத்தியாக்கிரகப் போராட்டம் நடைபெறுகின்றது. ஆகவே, இதை விரைவில் settle பண்ண வேண்டுமென்று நான் அமைச்சர் அவர்களை அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்தபடியாக, கடந்த 2 வாரங்களுக்கு முன்பு நான் பாராளுமன்றத்தில் இல்லாதிருந்தவேளை பேசப்பட்ட ஒரு விஷயத்தை இங்கே தொட்டுக் காட்டலாம் என்று நினைக்கின்றேன். அதாவது, மலையகத்திலே இருக்கின்ற நிறுவனங்களுக்குத் தொண்டமானுடைய பெயரைச் சூட்டக்கூடாது எனச் சிலர் பேசியிருக்கிறார்கள். என்னைப் பொறுத்தவரை நான் அதை ஏற்றுக்கொள்ள மாட்டேன். ஏனென்றால், சௌமியமூர்த்தி தொண்டமான் என்பவர் இந்த நாட்டினுடைய ஓர் அடையாளம்! அவர் ஒரு தேசியத் தலைவர்! அதனால்தான் இன்றைக்குப் பழைய பாராளுமன்றத்தில் அவருக்குச் சிலை வைக்கப்பட்டிருக் கின்றது; இந்தப் பாராளுமன்றத்தில் அவரது உருவப்படம் வைக்கப்பட்டிருக்கிறது. அப்படியான ஒரு தேசியத் தலைவருடைய ஞாபகார்த்தமாக ஏதாவது செய்தால், அவருடைய படத்தை வைக்கக்கூடாது, அவருடைய பெயரைச் சூட்டக் கூடாது என்று சொல்லுவது சிறுபிள்ளைத்தனமாக இருக்கின்றது. ஏனென்றால், சௌமியமூர்த்தி தொண்டமான் என்கின்ற அந்த மனிதன் இந்த நாட்டு மலையக மக்களுக்குச் செய்த சேவைக்கு யாரும் ஈடு கொடுக்க முடியாது! அந்தளவுக்கு அவர் அந்த மக்களுக்கு ஆரம்ப காலத்தில் இருந்து கிட்டத்தட்ட 70-80 வருடங்களாகச் சேவை செய்த ஒரு மனிதனாக இருக்கின்றார். நான் ஏன் இதை இங்கே பேச வேண்டும் என்று யோசித்தேன் என்றால், அவருடைய ஞாபகம் இருக்கும் வரைக்கும் தோட்டத் தொழிலாளர்களால் அவருக்காக நினைவுகூருகின்ற செயலைச் செய்யாதிருக்க முடியாது என்பதற்காகத்தான். அப்படியிருக்கின்றபோது, இந்த அரசாங்கம் வந்த பிறகு, அரசாங்கத்தினுள்ளே இருக்கின்ற சில MPs அவருடைய பெயரை அங்கு வைக்கக்கூடாது எனச் சொல்வது பொருத்தமற்றது என்பதை நான் இங்கே சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

ஒரு நபர் எவ்வளவு சேவை செய்திருந்தார் என்பதற்காக அவரை ஞாபகப்படுத்துவது எங்களுடைய கடமையாக இருக்கின்றது. ஆகவே, அவருடைய பெயரை வைப்பதிலே

எந்தவிதமான தவறும் கிடையாது. யாரேனும் ஊழல் செய்திருந்தால் அதைத் தட்டிக் கேட்பதற்கு எல்லோருக்கும் சந்தர்ப்பம் இருக்கின்றது. ஆகவே, ஊழலைத் தட்டிக் கேட்கலாமே தவிர, பெயரைச் சூட்டக்கூடாது எனத் தடுப்பதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது. மலையகத்திற்காக யார் சேவை செய்தாலும் அதை மறக்க முடியாது. இந்த மாதிரியான ஒரு சூழ்நிலையிலே, உயிர் நீத்த போராளிகளின் பெயரை வைக்கவேண்டும் என்று சிலர் சொல்லுகிறார்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
Hon. Deputy Chairperson of Committees, one second please.

நுவரெலியா townஇல் நாங்கள் 34 போராட்ட வீரர்களின் பெயர் கொண்ட ஒரு ஸ்தூபியை வைத்திருக்கின்றோம். அந்த ஸ்தூபிக்கு இதுவரைக்கும் யாரும் வந்து எதுவும் செய்யவில்லை. அந்த ஸ்தூபி நிறுவப்பட்டது இன்னமும் நிறையப் பேருக்குத் தெரியாது. ஆகவே, போராட்டக்காரர்களுக்கு நாங்கள் அதிகமாகச் செய்திருக்கின்றோம் என்பதை நீங்கள் ஞாபகத்திற்கொள்ள வேண்டும். அந்த வகையில், முடியுமானால் நீங்கள் அந்த ஸ்தூபியை இன்னும் வளப்படுத்துவதற்கான நடவடிக்கையை எடுக்கவேண்டும் என்று நான் உங்களிடத்தில் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සාගරිකා අතාවුද මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) SAGARIKA ATHAUDA took the Chair.*

[අ.භා. 2.17]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑම සඳහාත්, අපේ කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනය සඳහාත් බලපාන යම් යම් සංශෝධන සහිත වැදගත් පනත් කෙටුම්පත් කිහිපයක් සම්බන්ධයෙන් තමයි අද දින පාර්ලිමේන්තුවේදී විවාද කරන්නේ. ඒ යටතේ ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත, කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත, නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ (සංශෝධන) පනත් කෙටුම්පත යන පනත් කෙටුම්පත්වලට අදාළව අද දවසේ අපි විවාද කරනවා. මීට පෙර ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු නියෝජ්‍ය ඇමතිතුමන්ලා, ගරු අමාත්‍යතුමන්ලා මේවා සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය කාල සීමාව තුළ අපේ රටේ විවිධ ක්ෂේත්‍රවල යම් අස්ථාවරත්වයක්, බිඳ වැටීමක්, කඩා වැටීමක් සිදු වුණා. සරලව ගත්තොත්, අපේ රට සැලකිය යුතු ආකාරයකට බංකොලොත් වීමේ තත්ත්වයකට පරිවර්තනය වුණා. ඒ තත්ත්වයට වග කිව යුතු අය කවුද කියන එක පිළිබඳව මේ සමාජය විනිශ්චය කරලා අවසන්. ඒ නිසා තමයි ගරු ජනාධිපති අනුර දිසානායක මැතිතුමා ඇතුළු ජාතික ජන බලවේගය ආණ්ඩුවට මේ ජනවරම ලබා දීලා තිබෙන්නේ. අද විපක්ෂයේ භූමිකාව නිරූපණය කරන මේ කණ්ඩායම් පාලනය කරලා මේ රට වට්ටපු තැනින් ඉහළට ඔසවා තබන්නයි මේ ජනවරම ලබා දී තිබෙන්නේ. ඒ වාගේම, ඒ පැවැති තත්ත්වය පරාජය කරලා රට ඉදිරියට ගෙන යන්නයි මේ ජන වරම අපට ලබා දුන්නේ. ඒ නිසා තමයි 2025 වසර අවසන් වෙද්දී අපේ රටේ ආර්ථික ස්ථාවරත්වය හදන්න, ඕනෑම තත්ත්වයකට ඔරොත්තු දෙන මට්ටමට අපේ ආර්ථිකය ගෙනෙන්න අප සමත් වුණේ. ඒ විතරක් නොවෙයි, අපේ රට ගමන් කරපු විවිධ ක්ෂේත්‍ර ඇතුළේ එතෙක් ඉතිහාසයේ රට පාලනය කරපු ආණ්ඩුවලට අත් පත් කර ගන්න බැරි වෙච්ච යම් යම් ආර්ථික දත්ත, වාර්තා පෙර අවුරුදුවලට වඩා ඉහළ අගයන්ගෙන් සනිටුහන් කරමින් යම් ඉදිරි පියවරක් තබන්න අපට පුළුවන්කම ලැබුණා. ගරු ජනාධිපති අනුර දිසානායක මැතිතුමා ඇතුළු මේ ආණ්ඩුව, පැවැති රජයන්වල තිබුණු දුර්වලතා, වැරදි, දූෂණ ක්‍රියා මාර්ග හඳුනාගෙන ඒවා නතර කරලා රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් නිවැරදි ජනතාවාදී වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන යන නිසා තමයි අපට ඒ මට්ටමේ ස්ථාවරත්වයක් ගෙනෙන්න පුළුවන්කම ලැබුණේ. හැබැයි, මෙය ප්‍රමාණවත් නොවෙන්න පුළුවන්. මේ රට සම්බන්ධයෙන් තවත් වසර ගණනාවක් ඉදිරියට පුරෝකථනය කරලා, ඒක විග්‍රහ කරගෙන මේ රටේ අනාගත පරම්පරාවටත් සුරක්ෂිතව ජීවත් වෙන්න පුළුවන් ආර්ථිකයක්, සමාජයක්, ඊට අවශ්‍ය කරන හර පද්ධතියක් නිර්මාණය කිරීම තමයි අද දවසේ අපේ රජයේ භූමිකාව සහ වගකීම වෙන්නේ. අන්න ඒ නිසා තමයි අපි ඒ සම්බන්ධයෙන් සිතමින් විවිධ ක්‍රියාමාර්ග ගනිමින් කටයුතු කරමින් ඉන්නේ. මේ පනත් සංශෝධන අනාගතයේ ජයග්‍රහණවලට අවශ්‍ය වන, පාදක වන සාධක විධියට තමයි අපට මේවා තේරුම් ගන්න පුළුවන්කම තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද විපක්ෂයේ ඇතැම් අය ඉතාම කේන්තියෙන්, කලබලයෙන් මේ ගරු සභාවේදී අදහස් දක්වනවා මම දැක්කා. මට දැනෙනවා, විපක්ෂයට ලොකු විපතක් වෙලා තිබෙන බවක්. මොකද, පසුගිය සතියේම විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ ඇතැම් අය පාසල් සංවර්ධන නිලධාරීන්ගේ උපවාසය ආශ්‍රය නිශ්‍රය කරගෙන, ඒකට අවශ්‍ය ඔක්සිජන් ටික ලබා දීලා ඒකෙන් ගොඩ යන්න බැලුවා, අපි මේවාට කාලයක් උත්තර නොදී ඉඳියි කියලා හිතාගෙන.

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

විපක්ෂ නායකතුමා ඇතුළු විවිධ අය ගිහිල්ලා විවිධ දේවල් කළත්, පසුගිය 02වැනි දා ගරු ජනාධිපතිතුමාත් එක්ක පැවැති සාකච්ඡාවේදී තමන්ගේ ප්‍රශ්නය විසඳාගෙන අවසානයේ "ජනාධිපතිතුමාට ජයවේවා!" කියලා තමයි ඒ සහෝදර සහෝදරියන්; ඒ සංවර්ධන නිලධාරි මහත්ම මහත්මීන් උපවාසයෙන් ඉවත් වෙලා ගියේ. එතකොට විපක්ෂ නායකතුමාට මොකක් හිතුණාද කියලා මට හිතාගන්න බැහැ. හැබැයි, පත්වීම් ලිපි 16,000ක් විතර ලෙයින් අත්සන් කරන්න බලාගෙන හිටපු එතුමාට එක පැත්තකින් උදව්වක් වෙන්න ඇති, අපි කරන්න ඇත්තේ. අනෙක් පැත්තෙන්, එතුමන්ලා ගිහිල්ලා පෝෂණය කරලා; උපදෙස් - advice - දීලා, අවවාද දීලා මෙහෙයවන්න උත්සාහ කරපු ඒ පිරිස ජනාධිපතිතුමාත් එක්ක කථා කරලා අවසානයේ දින කිහිපයකින් පස්සේ ජනාධිපතිතුමාට ස්තුති කරලා, ජය ප්‍රාර්ථනා කරලා තමයි විසඳුමක් සහිතව ගෙදර ගියේ. මේවා ගැන බලද්දී පෙනෙනවා, විපක්ෂයට ලොකු විපතක් වෙමින් තිබෙනවා කියලා. ඒ අය අල්ලන අල්ලන එක, කියන කියන එක, නැඟිටින්න දරන උත්සාහය දවසෙන් දෙකෙන් අසාර්ථක වෙලා යනවා. ඒ නිසා අද විපක්ෂයට සිද්ධ වෙලා තිබෙන විපත ගත්තොත්, එවැනි විපතක් වනේ වන හතුරෙකුටවත් නොවිය යුත්තක්ය කියලා අපි විශ්වාස කරනවා. විපක්ෂයේ ඒ උත්සාහයන් අද අසාර්ථක වෙලා තිබෙනවා. මේ රටේ හැම කෙනාටම ඒ පිළිබඳව යම් අදහසක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ එක මන්ත්‍රීතුමෙක් මේ ගරු සභාවට ඇවිල්ලා යුද්ධය පිළිබඳව විවිධ දේවල් කථා කරනවා, රණවිරුවන් ගැන කථා කරනවා අපි දැක්කා. එදා එතුමන්ලා ඔක්කෝම -තාත්තා, බාප්පා, ලොකු තාත්තා, පුතාලා, මල්ලිලා, අයියලා ඔක්කෝම- එකතු වෙලා කරපු දේවල් අපි දැක්කා. යුද ජයග්‍රහණය වෙනුවෙන් දායක වෙච්ච ත්‍රිවිධ හමුදාව ඇතුළු අදාළ සියලු අංශවල අප්‍රතිහත ධෛර්යයෙන් ඒ කටයුතු අවසන් කළ බව අපි දැක්කා. ඒක පාවිච්චි කරලා තමන්ගේ බල ව්‍යාපෘතිය සැලසුම් කරපු කණ්ඩායම ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් පාවිච්චි කරපු විධිය අපි දැක්කා. එදා ජෙනරාල් සරත් ෆොන්සේකා මැතිතුමාට කරපු දේවල් මේ සමාජය දැක්කා. ඒ වාගේම, ඒ දේශපාලනඥයන්ගේ වතුවල පොල් අහුලන්න, ඒගොල්ලන්ගේ බල්ලෝ, පූසෝ නාවන්න, ඒගොල්ලන් ගමන් බිමන් අරගෙන යන්න ත්‍රිවිධ හමුදා සාමාජිකයන් පාවිච්චි කළේ, යොදා ගත්තේ කොහොමද කියලාත් මේ සමාජය දැක්කා. නමුත්, අද මේ රජය යටතේ කිසිදු කෙනෙකු වෘත්තීමය වශයෙන් අපහසුතාවට පත් නොවන ආකාරයට, නිසි ගෞරවය -ගරුත්වය- නිර්මාණය වන ආකාරයට අද අපේ ආණ්ඩුව රට මෙහෙයනවා; කටයුතු කරනවා. අපි දන්නවා, එහෙම කටයුතු කරගෙන යනකොට ඒගොල්ලන්ට දරා ගන්න, ඉවසා ගන්න අමාරුයි කියලා.

ඊයේ දිනයේ මුළු රටම 78වැනි ජාතික නිදහස් දිනය ඉතාම අභිමානවත්ව සැමරුවා. "ගොඩනගමු ශ්‍රී ලංකා" වැඩ පිළිවෙළ මුළු සමාජයටම ඒත්තු ගන්වමින්, අතීතයේ තිබෙන සාරයන් එකතු කරගෙන, අතීත කාමයෙන් යටපත් වෙලා ඉන්නවා වෙනුවට මේ රට ඉදිරියට ගෙන යෑම සඳහා, "ගොඩනගමු ශ්‍රී ලංකා" වැඩ පිළිවෙළට මුල් තැන දෙමින් අනාගත රට නිර්මාණය කිරීම සඳහා මේ රටට, මේ රටේ ජීවත් වන හැම කෙනාටම ධෛර්යයක්, අවබෝධයක්, දැක්මක්, හැඟීමක් ඇති වන ආකාරයට අවශ්‍ය කරන ඒ සැමරුම අපි ගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සිදු කළා. ඒවා විපක්ෂය අද බලාපොරොත්තු වුණු දේවල් නොවෙයි. ඒ නිසා තමයි අද විපක්ෂයට කලබලයක් ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අද විපක්ෂයට එක තැනක ඉන්න බැරි වෙලා තිබෙන්නේ. මොකද, මෙහෙම වෙයි කියලා ඒගොල්ලෝ හිතුවේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද විපක්ෂය මුහුණ දී තිබෙන ප්‍රශ්න දෙකක් තිබෙනවා. එකක් තමයි, අප බලයට එන්න කලින් ඒගොල්ලෝ අප ගැන පට්ටපල් බොරු ගොඩක් කියපු එක. ඒගොල්ලන් අප ගැන කියපු බොරු දේවල් එකක්වත් අද අපේ පැත්තෙන් වෙන්නේ නැහැ. ඒ නිසා විපක්ෂය වික්ෂිප්ත වෙලා ඉන්නවා. ඒ වාගේම, අපි ජනතාවට වෙච්ච පොරොන්දු එකින් එක ඉටු කරමින් ඉන්නවා. ඒ නිසාත් විපක්ෂය වික්ෂිප්ත වෙලා ඉන්නවා. මේ පැති දෙකෙන්ම විපක්ෂය අද කලබල වෙලා. මොනවාද, ඒගොල්ලෝ කියපු බොරු?

අපේ ගරු ජනාධිපතිතුමාත් ඉන්දියාවේ ගරු අගමැතිතුමාත් අතර ඇති වූ හමුවේදී අපේ අනුර දිසානායක ජනාධිපතිතුමා කරපු ඉල්ලීමකට ඉන්දියානු රජය ප්‍රතිචාර දක්වමින් සර්වඥ ධාතූන් වහන්සේලා ලංකාවට වැඩම කරවා අද පෙර වරු 6.00 සිට 11වන දා දක්වාම දෙස් විදෙස් සියලු ජනතාවට එම සර්වඥ ධාතූන් වහන්සේලා වැඳ පුදා ගන්න අවස්ථාව ලබා දී තිබෙනවා. ඉන්දියානු රජයත් පළමුවැනි වතාවට තමයි තමන්ගේ රටේ භූමියෙන් බැහැරව ඒ ධාතූන් වහන්සේලා වැඩම කරවන්න තීරණය කළේ. අද එවැනි මට්ටමකට ඉන්දීය රජය මේ රටට සලකා තිබෙනවා. හැබැයි ඔය සජබය ඇතුළු ඇතැම් කණ්ඩායම් එදා කිව්වේ මොනවාද? මාලිමාව ආණ්ඩුව බලයට ආවොත් දළ දා මාළිගාවේ පෙරහැර නැති වෙනවා කිව්වා; පන්සල්, පල්ලි නැති වෙනවා කිව්වා; ආගම ධර්මයට ඉඩක් නැති වෙනවා කිව්වා.

විපක්ෂයේ අය පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරලා මෙතැනදී මොනවා කිව්වත්, මේ රටේ ජනතාවට අද මේ සිද්ධ වන දේවල් පෙනෙනවා; මේ ප්‍රමුඛතාවන් පෙනෙනවා; සිද්ධ වෙන්නේ මොකක්ද කියලා දැනෙනවා. ඒ නිසා විපක්ෂයේ අය කලබල වෙලා ඉන්න බව අපට පෙනෙනවා. ඉතාම පැහැදිලියි, මේ තත්ත්වයන්. මේ තත්ත්වයන් හමුවේ අද තමන්ට යන එන මං නැතුව තමයි ඒ අය යම් යම් ක්‍රියාමාර්ග ගනිමින්, විවිධ දේවල් කථා කරමින් ඉන්නේ.

ජනතාවට අප වෙච්ච පොරොන්දුවක් තමයි දූෂිතයන්ට, වංචනිකයන්ට, අපරාධකරුවන්ට නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම සලසනවා කියන එක. අපි -ආණ්ඩුව- දඬුවම් දෙන්නේ නැහැ. ආණ්ඩුව නඩු අහන්නේ නැහැ. ආණ්ඩුවට කරන්න පුළුවන්, අවශ්‍ය කරන පසුබිම සකස් කරන එකයි. ඒ නිසා ආණ්ඩුව අද නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පසුබිම සලසා තිබියදී, ඒ අදාළ නීතිය පසිඳලන ආයතන, යුක්තිය පසිඳලන ආයතන අවශ්‍ය වග විභාගයන් හරියට කරද්දී, ඒවාට සම්බන්ධ ඇතැම් අය; ඇප පිට ඉන්න අය අද වීරයන් වාගේ මේ රටේ මාධ්‍ය ඉස්සරහට ඇවිත්, "ඒවා දේශපාලන පළිගැනීම්" කියලා කියනවා. අද විපක්ෂයට සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? එක පැත්තකින්, ඒගොල්ලන් බලයට එන්න අප සම්බන්ධව කියපු බොරු අද ඇත්තටම බොරු බවට පත් වෙලා තිබෙනවා, ආණ්ඩුවේ භාවිතාව ඉතා නිවැරැදිව ඉස්සරහට යන නිසා. අනෙක් පැත්තෙන්, අප ජනතාවට වෙච්ච පොරොන්දු ඉටු කරන නිසාත් අද විපක්ෂය අතරමං වෙලා ඉන්නවා. මේ තත්ත්වයට හිර වෙච්ච විපක්ෂය අද අන්ද මන්ද වෙලා ආණ්ඩුවට බාධා කරමින් ඉන්නවා. නමුත් අපි මේ රටේ ජනතාවට කියනවා, ඔබ බලාපොරොත්තු වුණු ආකාරයට නිවැරැදිව, ස්ථාවරව, විධිමත්ව අප මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යන බව. ඒ පණිවුඩයත් මම මේ මොහොතේ ලබා දෙන්න කැමැතියි. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
**(The Hon. Presiding Member)**

ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් හිමි වෙනවා.

[பி.ப. 2.28]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற இலங்கை நிலையான சொத்து உயர்தொழிலர்கள் நிறுவனம் சட்டமூலம் தொடர்பான விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறுகின்றேன்.

இன்று நான் இந்தச் சபையில் இல்லாத வேளையில், கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் பாராளுமன்ற உறுப்பினர் ஒருவருடைய கேள்விக்குப் பதிலளித்திருந்தார். அவருடைய பதில் நியாயமானதாக எனக்குத் தெரியவில்லை என்பதை இந்தச் சபையில் சொல்லிவைக்க விரும்புகின்றேன். நான் இன்றுவரை கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள்மீது நல்லெண்ணம் கொண்டவனாக இருந்தேன். ஆனாலும், மன்னார் - புத்தளம் பாதை சம்பந்தமான அவருடைய கருத்து ஏற்றுக்கொள்ளப்பட முடியாத ஒன்றாகும். கிட்டத்தட்ட 100 வருடங்கள் பழைமை வாய்ந்த RDAக்குச் சொந்தமான B வகையான பாதைதான் மன்னார் - புத்தளம் பாதை. நான் அமைச்சராக இருந்தபொழுது, அந்தப் பாதையை மக்கள் பாவனைக்காகத் திறந்துவைத்தேன். அன்று பயங்கரவாதிகள் எங்களுடைய மண்ணிலிருந்து எங்களையெல்லாம் வெளியேற்றியபோது, அந்தப் பாதை மூடப்பட்டது. அந்தப் பிரதேசத்தில் வாழ்ந்த மக்கள் விரட்டியடிக்கப்பட்டதனால் அந்தப் பகுதியில் யாரும் இல்லாத ஒரு துர்ப்பாக்கிய நிலைமை ஏற்பட்டது.

2009ஆம் ஆண்டு யுத்தம் முடிந்த பின்னர்தான் அந்த மக்கள் மறிச்சுக்கட்டி, கரடிக்குழி, பாலைக்குளி, பெரியமடு, முள்ளிக்குளம் போன்ற தங்களுடைய சொந்த பகுதிகளுக்கு - ஊர்களுக்கு - சென்றார்கள். பாரம்பரியமாக மக்கள் வாழ்ந்த பெரியமடு கிராமம் வனவளத் திணைக்களத்துக்குச் சொந்தமானதென 2012ஆம் ஆண்டு அந்த மக்களுக்கே தெரியாமல் அன்றிருந்த அரசாங்கம் இரகசியமாக gazette பண்ணியிருந்தது. அதேபோல், 2012ஆம் ஆண்டு மறிச்சுக்கட்டி, கரடிக்குழி, பாலைக்குளி, முள்ளிக்குளம், அளக்கட்டு, கொண்டச்சியின் சில பகுதிகளையும் gazette பண்ணியிருந்து. அன்று நான் ஆளுங்கட்சியில் இருந்தாலும், இதற்கு எதிராக தொடர்ந்தேர்ச்சியாகப் பல போராட்டங்களை நியாயபூர்வமாகச் செய்திருந்தேன்.

அப்பொழுது, இந்த நாட்டிலிருந்த பெரும்பான்மை இனத்தைச் சேர்ந்த ஒருசில மதகுருமார் குறிப்பாக, மன்னாரோடு எந்தச் சம்பந்தமும் இல்லாதவர்கள் மன்னாருக்குள் வந்து, ஆர்ப்பாட்டங்களைச் செய்து, காட்டை அழிக்கின்ற ஒருவராக என்னைக் காண்பிக்கின்ற மோசமான செயலைச் செய்தார்கள். அன்று எந்த ஊடகத்தை எடுத்தாலும், எனக்கெதிரான கருத்துக்களும் அந்த மக்களுடைய மீள்குடியேற்றத்துக்கு எதிரான கருத்துக்களுமே வெளியிடப் பட்டன. அவ்வாறானதொரு காலம் இருந்தது. இந்த நிலையில், மன்னார் - புத்தளம் பாதையை மூடுமாறு இந்தப் பாதையுடன் சம்பந்தமில்லாத தென்பகுதியில் இருக்கின்ற ஒருசில சிங்கள மக்கள் நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்தார்கள். அதில் பிரதிவாதிகளின் பெயர்களில் என்னுடைய பெயரும் நான்காவது இடத்தில் இருந்தது. என்னுடைய பெயர் தவிர, Department of Wildlife Conservation, Forest Department, முன்னாள் அமைச்சர் பெஸில் ராஜபக்ஷ ஆகியோரின் பெயர்களும் அதில் இருந்தன. அன்று அந்தப் பகுதிக்குப் பொறுப்பாக இருந்த பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில்தான் என்னுடைய பெயர் அதில் இருந்தது. நாங்கள் அந்த வழக்குக்கு முகங்கொடுத்தோம். அந்தக் காலப் பகுதியில் மஹிந்த ராஜபக்ஷ அவர்களே சனாதிபதியாக இருந்தார்.

வழக்கு விசாரணை நடந்துகொண்டு இருந்த அந்த நேரத்தில், Forest Departmentஉம் Department of Wildlife Conservationஉம் அந்தப் பாதை நிரந்தரமான பாதை என்பதால், அந்தப் பாதை ஊடாக மக்கள் போக்குவரத்துச் செய்வதற்கு அனுமதிக்க வேண்டும் என்ற நிலைப்பாட்டிலே இருந்தன. RDAஉம் அதே நிலைப்பாட்டிலே இருந்தது. அதன்பிறகு, சனாதிபதியாக வந்த மைத்திரிபால சிறிசேனவும் அதே நிலைப்பாட்டிலே இருந்தார். இந்த நாட்டில் நீதிமன்றங்களில் வழக்கு விசாரணைகள் நிறைவடைவதற்குப் பல வருடங்கள் செல்வது வழமை என்பது உங்களுக்குத் தெரியும்! மைத்திரிபால சிறிசேன அவர்களுடைய காலத்திலும் RDA மக்களின் பக்கமே நின்றது. அதேபோல், Department of Wildlife Conservationஉம் AG's Departmentஉம் மக்கள் பக்கமே நின்றன.

மைத்திரிபால சிறிசேன அவர்களுக்குப் பிறகு, ஆட்சிக்கு வந்த கோட்டாபய ராஜபக்ஷ அவர்களுடைய காலத்தில்தான் அந்தப் பாதை மூடப்பட்டது. வழக்கு விசாரணை நடைபெற்றுக் கொண்டு இருந்த சமயத்திலே அந்தப் பாதை மூடப்பட்டது. அதுவரைக்கும் அந்தப் பாதையால் மக்கள் போக்குவரத்துச் செய்தார்கள்; வாகனங்கள் சென்றன. அந்தப் பாதை ஊடாக யாழ்ப்பாணத்திலிருந்து கொழும்புக்கு வந்தால் 100 கிலோமீற்றர் குறைவு! அதேபோல், மன்னாரிலிருந்து புத்தளத்துக்கு வந்தாலும் 100 கிலோமீற்றர் குறைவு! இவ்வாறானதொரு பாதை சிங்களப் பிரதேசத்தில் இருந்தால் - அம்பாந்தோட்டையில் அல்லது கொழும்பில் இருந்தால் அல்லது கம்பஹாவில் இருந்தால் - இவ்வாறானதோர் அநியாயத்தை ஓர் அரசாங்கம் செய்யுமா? என்று நான் கேட்கின்றேன். நான் இதை இனவாதமாகச் சொல்லவில்லை. இதற்கு எதிராக மைத்திரிபால சிறிசேன அவர்களுடைய அரசாங்கம் முடிவு எடுக்கவில்லை; கோட்டாபய ராஜபக்ஷவுடைய அரசாங்கம் முடிவு எடுக்கவில்லை; ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய அரசாங்கம் முடிவு எடுக்கவில்லை; மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கம் முடிவு எடுக்கவில்லை.

உங்களுடைய NPP அரசாங்க காலத்தில் Forest Departmentஉம் Department of Wildlife Conservationஉம் நீதிமன்றத்துக்குச் சென்று, குறித்த வழக்கைத் தாக்கல் செய்த துரோகிகளோடு சேர்ந்து, "நாங்கள் இந்த வழக்கோடு உடன்படுகின்றோம். எனவே, இந்த வழக்கை விடுவியுங்கள்" என்று சொல்லி இருக்கின்றன. இவ்வாறு சொல்லியிருப்பது யாரென்றால், இந்த அரசாங்கம்! இந்த அரசாங்கத்தின் பிரதிநிதிகள்! இந்த அரசாங்கத்தின் அமைச்சர்! இந்த அரசாங்கத்தின் கீழுள்ள Forest Department! Department of Wildlife Conservationதான்! அந்தப் பாதையை மூடுமாறு நீதிமன்றத் தீர்ப்பு வரவில்லை. நாங்கள் திறந்த பாதைக்கு எதிராக, வழக்காளிகளோடு சேர்ந்து முடிவு எடுக்கப்பட்டு இருக்கின்றது. இதுவொரு நியாயமான செயற்பாடு அல்ல.

நேற்று சுதந்திர தினம்! மாண்புமிகு சனாதிபதி அவர்கள் சுதந்திர சதுக்க வளாகத்தில் அழகாகப் பேசுகிறார். வட மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் தமிழ் மக்கள் 'கரி நாள்' எனக் கூறி, சுதந்திர தினத்துக்கு எதிராகத்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

திரளுகிறார்கள். முஸ்லிம் சமூகத்தினராகிய நாங்கள், இனவாதம் இல்லாத அரசாங்கம் என்று உங்கள்மீது நல்லெண்ணம் கொண்டிருந்தோம். இது மாத்திரம்தான் நாங்கள் இந்த அரசாங்கத்தில் காணுகின்ற நல்லதொரு விடயமாக இருந்தது. அப்படிப்பட்ட இந்த அரசாங்கம் இந்தப் பாதையை நிரந்தரமாக மூடுவதற்கான செயற்பாட்டைச் செய்கின்றதென்றால், அதை நாங்கள் பார்த்துக்கொண்டு இருக்க முடியாது. நீங்கள் எதைச் செய்தாலும் நியாயம் என்று சொல்லுகின்ற ஒரு கூட்டம் எமது சமுதாயத்திலும் இருக்கின்றது. இல்லை என்று நான் சொல்லவில்லை. நீங்கள் செய்கின்ற நல்ல விடயங்களை நல்லதெனச் சொல்கின்றோம்; பாராட்டுகின்றோம். கடந்த ஒரு வருட காலப் பகுதியில் நீங்கள் இந்தச் சபையில் கொண்டுவந்த நல்ல விடயங்களுக்கு எதிராக நாங்கள் ஒரு வார்த்தைகூட பேசவில்லை! ஆனால், நீங்கள் புத்தளம் - மன்னார் பாதையை மூடுவீர்களாக இருந்தால், அதை நாங்கள் எதிர்ப்போம்.

மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் மன்னாரில் சொன்னார், "நான் சனாதிபதியாக வந்தால், புத்தளம் - மன்னார் பாதையைத் திறந்து தருவேன்" என்று. அன்று மக்கள் மன்னாரில் wind power திட்டம் வேண்டாமென வீதிக்கு இறங்கிப் போராடியபொழுது, மாண்புமிகு சனாதிபதி அவர்கள் எங்களை சனாதிபதி செயலகத்துக்கு அழைத்துப் பேசினார். அப்போது நாங்கள் அவரிடம் ஒரு கோரிக்கையை முன்வைத்தபொழுது, "இந்த wind power திட்டத்தை மட்டும் செய்ய விடுங்கள்! நாங்கள் மன்னாரை அபிவிருத்தி செய்து தருவோம்" என்று சொன்னார். அப்பொழுது, நான் உட்பட கிறிஸ்தவ பாதிரிமார், முஸ்லிம் மதகுருமார், அரசியல்வாதிகள் ஒரேயொரு விடயத்தைத்தான் கேட்டோம். இனிமேல் மன்னாருக்கு wind power திட்டத்தைக் கொண்டுவரமாட்டோம் என்பதை உறுதிப்படுத்துமாறும், மன்னார் - புத்தளம் பாதையைத் திறந்து தருமாறும்தான் கேட்டோம். இது முஸ்லிம்களுக்கான பாதையோ, தமிழர்களுக்கான பாதையோ அல்ல. மாறாக, இந்த நாட்டின் பாதை!

100 கிலோமீற்றர் குறைவடையும்போது, யாழ்ப்பாணத்தில் உற்பத்தி செய்யப்படும் பொருட்களை கொழும்புக்குக் கொண்டுவரும்பொழுது எவ்வளவு போக்குவரத்துச் செலவு குறைவடையும் என்பதைச் சிந்தியுங்கள்! அதேபோல், பயணிக்க வேண்டிய தூரத்தில் 100 கிலோமீற்றர் குறைவடையும்போது, இந்த நாட்டுக்கு வருகின்ற சுற்றுலாப் பயணிகள் அந்தப் பிரதேசத்துக்கு அதிகமாகச் செல்வார்கள். அப்படிச் சென்றால், அந்தப் பிரதேசம் எவ்வளவு முன்னேறும் என்பதைச் சிந்தித்துப் பாருங்கள்! அதேபோல், 100 கிலோமீற்றர் கூடுதலாகப் பயணிக்கும்போது, எவ்வளவு சுற்றாடல் மாசடையும் என்பதையும் சிந்தியுங்கள்! "விலங்குகளைப் பாதுகாக்கிறோம்" என்று கூறி, மக்களைக் கஷ்டப்படுத்தக்கூடிய ஒரு முடிவை இந்த அரசாங்கம் தயவுசெய்து எடுக்கக் கூடாது.

சுற்றாடலுக்குப் பொறுப்பான அமைச்சர் அவர்களே, வீதிகளுக்குப் பொறுப்பான அமைச்சர் அவர்களே, எங்களையும் வன்னி மாவட்டத்தின் ஏனைய பாராளுமன்ற உறுப்பினர்களையும் யாழ். மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்களையும் புத்தளம் மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்களையும் அவசரமாக பேச்சுவார்த்தை மேசைக்கு அழையுங்கள்! நீங்கள் தேர்தல் காலத்தில் பல வாக்குறுதிகளை வழங்கிவிட்டு, இப்போது அவற்றுக்கு மாறாகப் பேசுகிறீர்கள். YouTubeக்குச் சென்று பாருங்கள்! அன்று அவ்வாறு சொன்னவர்கள், இன்று இவ்வாறு சொல்கின்றார்கள். அதேபோல், மன்னார் - புத்தளம் பாதையைத் திறந்து தருவதாகச் சொல்லிவிட்டு, நீதிமன்றத்தில் 15 வருடங்களுக்கு முன்னர் வழக்குத் தாக்கல் செய்த எதிரிகளோடும் சதிகாரர்களோடும் சேர்ந்து செயற்படுகிறீர்கள்! குறிப்பாக, diasporaஇன் agent உடன் சேர்ந்து, இந்த அரசாங்கத்தில் இருக்கின்ற அமைச்சர் அல்லது அமைச்சுக்குக்கீழ் இருக்கின்ற இரண்டு நிறுவனங்கள் அவ்வழக்கினூடாக அந்தப் பாதையை நிரந்தரமாக மூடுவதற்கு முனையுமாக இருந்தால், அது எங்களுடைய மக்களுக்கு இழைக்கப்படுகின்ற பாரிய துரோகமாகும்.

இந்த நாட்டின் வடக்கு, கிழக்கில் தனிநாடு கேட்டுப் போராடிய வரலாறு இருக்கின்றது. அதேபோல், இளைஞர்-யுவதிகள் 'சயனைட்' வில்லைகளைக் கட்டிக்கொண்டு போராடிய வரலாறு இருக்கின்றது. நாங்கள் நாட்டைப் பிரித்துத் தாருங்கள் என்று கேட்கவில்லை. எங்களுடைய மண்ணுக்குப் போவதற்கான பாதையைத் தருமாறுதான் கேட்கின்றோம். அந்தப் பாதை 100 வருடங்கள் பழைமையானது. அந்தப் பாதையை மூடுவதற்கு அரசாங்கம் முடிவெடுக்குமாக இருந்தால், எங்களைப் பாராளுமன்றத்துக்கு அனுப்பிய மக்கள் கேட்கும் கேள்விகளுக்கு நாங்கள் எவ்வாறு பதில் சொல்வது? இது தொடர்பில் எங்களோடு கலந்தாலோசித்தீர்களா? எங்களை அழைத்துப் பேசினீர்களா? தற்பொழுது, இச்சபையில் கௌரவ முனீர் முலாபர் அவர்கள் இருக்கிறார். தமிழ் மொழி தெரிந்த இன்னும் பல உறுப்பினர்களும் இருக்கிறார்கள். "நாங்கள் முஸ்லிம் சமூகத்தைப் பார்த்துக் கொள்கிறோம்"; "தமிழ் சமூகத்தைப் பார்த்துக் கொள்கிறோம்" என்று சொல்கிறீர்கள். வடக்கில் வாழுகின்ற தமிழ், முஸ்லிம், சிங்கள மக்களுக்கு இந்தப் பாதை பெரும் வரப்பிரசாதமாகும். உங்களுக்கு மனசாட்சி இருக்குமானால், தயவுசெய்து இந்தப் பாதையை மூடுவதற்கு எடுத்துள்ள முடிவை மாற்றுங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව 30 seconds දෙන්න.

அண்மையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் புத்தளத்துக்கு வந்தபோது, மன்னார் - புத்தளம் பாதையில் இருக்கின்ற பெரிய அணைக்கட்டைக் கட்டுவதற்கு 600 மில்லியன் ரூபாய் ஒதுக்குவதாக முடிவெடுக்கப்பட்டு இருக்கிறது. தயவுசெய்து, இந்தச் செயற்பாட்டை உடனடியாக நிறுத்துங்கள்! அந்த அணைக்கட்டு கட்டப்பட்டால், மன்னார் - புத்தளம் பாதை நிரந்தரமாக மூடப்படும். NPP அரசாங்கம் எடுக்கப்போகும் இந்தத் தவறான முடிவு இந்நாட்டுக்குப் பாரிய அழிவுகளை ஏற்படுத்துமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.38]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින පනත් කෙටුම්පත් 3ක් දෙවැනිවර කියවීමේ විවාදයයි පැවැත්වෙන්නේ. ඒ සඳහා මට අදහස් දක්වන්න කාලය වෙන් කර දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපට රජය භාර දෙනකොට, රටේ තිබුණු තත්ත්වයත් එක්ක රට සමාජයීය වශයෙන්, ඒ වාගේම දේශපාලන වශයෙන් සහ ආර්ථික වශයෙන් අස්ථාවරත්වයක තිබුණා. ඒ නිසා අපිට රට නැවත ස්ථාවර කරන්න නම් මේ ක්ෂේත්‍ර 3ම ස්ථාවර කිරීමේ අවශ්‍යතාවක් තිබුණා. රට නැවත ස්ථාවර කරන්න නම් බොහෝ තැන්වල විධිමත්කරණයක් අවශ්‍යයි. ඒ කියන්නේ අමාත්‍යාංශ, නීති අණපනත්, ප්‍රතිපත්ති කියන බොහෝ තැන්වල විධිමත්කරණයක් අවශ්‍යයි. ඒ නිසා අපේ ප්‍රතිපත්ති අනුව අපි බලාපොරොත්තු වුණු, අපි රටට කියපු, ඒ වාගේම ජනතාව අපෙන් බලාපොරොත්තු වුණු සහ ජනතාව අපට භාර දුන් ඉලක්කවලට අනුව අපි රජය හසුරුවන්න පටන් ගෙන තිබෙනවා. එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න - අමාත්‍යාංශවල වෙන්න පුළුවන්, නීති අණපනත්වල වෙන්න පුළුවන්- අපි කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ ආරම්භ කරන වැඩ කටයුතුවලින් එකක් තමයි අද සිද්ධ වෙන්නේ. ඒ අනුව අද පනත් කෙටුම්පත් 3ක් සම්බන්ධව තමයි අපි සාකච්ඡා කරන්නේ. ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත, කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත සහ නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත කියන පනත් කෙටුම්පත් 3 දෙවන වර කියවා පාර්ලිමේන්තුවේදී සම්මත කරගන්නට කටයුතු කරන්නේ ඒ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ වෘත්තිකයන් ඉන්නවා; විද්වතුන් ඉන්නවා. ඔවුන් අපේ රටේ සංවර්ධනයට එකතු කරගන්න ඕනෑ. වෘත්තිකයන් නැතුව රටේ සංවර්ධනයක් ගැන හිතන්න බැහැ. විද්වතුන් නැතුව රටේ සංවර්ධනයක් ගැන හිතන්න බැහැ. වෘත්තිකයන්ට නිදහසේ කටයුතු කරන්න, ඔවුන්ගේ වෘත්තීයමයභාවය රටට පෙන්වන්න නිශ්චිත ක්‍රමවේද හදන්න ඕනෑ. බොහෝ වෘත්තිකයන්ට ආයතනගත ව්‍යුහයන් තිබෙනවා. ඔවුන්ට ඒ සඳහා වෙච්ච නීතිමය පදනමක් හදා දී තිබෙනවා. ඒ නිසා ඔවුන්ට ඒ තිබෙන නීතිමය රාමුව යටතේ ඔවුන්ගේ වෘත්තීයමයභාවය ප්‍රදර්ශනය කරන්න, ඔවුන්ට පැවරුණු ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරන්න අදාළ පහසුකම් හදා දීලා තිබෙනවා. මේ තථ්‍ය දේපළ - real estate - සම්බන්ධ වෘත්තිකයන්ට අදාළ ආයතනයක් තිබුණේ නැහැ. මේ සම්බන්ධයෙන් දීර්ඝ කාලීන සාකච්ඡාවක් තිබුණා. මේ සම්බන්ධයෙන් විවිධ මට්ටමේ සාකච්ඡා, අදහස් දැක්වීම්, යෝජනා තිබුණා. නමුත් එය කෙටුම්පතක් වෙලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත වෙන්නේ අදයි. ඒ නිසා අදින් පසුව ඇත්තටම මේ වෘත්තිකයන්ට ඔවුන්ගේම වෙච්ච වෘත්තීයමය ආයතනයක් තිබෙනවා.

මේ තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය හදන එක සම්බන්ධයෙන් මේ ක්ෂේත්‍රයට සම්බන්ධ, මේ ක්ෂේත්‍රයට ආසන්නව කටයුතු කරන අනෙකුත් වෘත්තිකයන්ගේ යම් යම් යෝජනා සම්බන්ධවත් සැලකිල්ල දක්වා තිබෙනවා. ඔවුන් අප රජය සමඟත් සාකච්ඡා කර තිබෙනවා. ඔවුන්ගේ මැසිවිලිලකුත් තිබෙනවා, මෙයින් ඔවුන්ට අසාධාරණයක් සිද්ධ වෙයිද කියලා. නමුත් ඒ හැම පාර්ශ්වයක් එක්කම කථා කරලා ඔවුන්ගේ යෝජනා හා අදහස් ලබාගෙන, ඒවා සංශෝධන විධියට මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තමයි අද මෙය සම්මත කරන්නේ. ඒ නිසා මේ ඇති වන නීතිමය රාමුව තුළ තථ්‍ය දේපළ වෘත්තිකයන්ට ඔවුන්ගේ වෘත්තීයමය කටයුතු කරන්න අවශ්‍ය ආයතනය ගොඩනැඟෙනවා.

එතැනදී ක්ෂේත්‍රයේ ඉන්න අනෙකුත් වෘත්තිකයන්ට කිසිම බාධාවක් නොවන විධියට කටයුතු කරන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා. ඊට අදාළ සංශෝධන, අදාළ වගන්ති සහිතව තමයි මේ පනත් කෙටුම්පත සම්මත වෙන්නේ. ඒ අනුව අපි බලාපොරොත්තු වෙනවා, මේ වෘත්තිකයන්ගේ දායකත්වයත් අපේ රටේ සංවර්ධනයට ලබා ගන්න. ඒ අනුව ඉතා වැදගත් සේවාවක්, වැදගත් මෙහෙයක් මේ පනත හරහා සිද්ධ වෙයි. ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය තුළින් ඔවුන් මේ ක්ෂේත්‍රයට, රටේ සංවර්ධනයට විශාල දායකත්වයක් සපයයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඇත්තටම දැන් මේ විධිමත්කරණය ගත්තොත්, මම ඉස්සර වෙලා කිව්වා වාගේ අපට අවශ්‍ය වුණා, රට ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් සහ දේශපාලනික වශයෙන් ස්ථාවර කරන්න. විශේෂයෙන්ම ආර්ථික විධිමත්කරණය සම්බන්ධයෙන් ගත්තොත්, ඇත්තටම අපි ආර්ථිකය කොච්චර ස්ථාවර කළාද කියන එක සම්බන්ධයෙන් අද සාකච්ඡා කෙරෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් විවේචන නැති නිසා, ඒ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න බැරි නිසා ඒ සම්බන්ධයෙන් කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් කථා නොකර, වෙනත් වෙනත් සිද්ධිමය විවේචනවලින් ඒක වහන්න හදනවා. අපේ රටේ පසුගිය අවුරුදු එකහමාරක විතර කාලයක් ඇතුළේ, අපේ රජය බලයට පත් වුණාට පස්සේ ආර්ථිකයේ සිදු වුණු ස්ථාවරත්වය යට ගහලා, වෙනත් සිද්ධිමය විවේචනයන්ගෙන් ඒක වහලා රටේ මතයක් හදන්න උත්සාහ ගන්නවා, අපේ ආණ්ඩුවට, අපේ ක්‍රියාකාරිත්වයට විරුද්ධව.

අපේ ආර්ථිකය ගත්තාම, විධිමත්ව, වැඩ පිළිවෙළක් සහිතව, විනිවිදභාවයෙන්, ඒ වාගේම ඉලක්කයක් සහිතව අපි එය හසුරුවමින් ඉන්නවා. 2025 වසරට අදාළව මේ වනකොට අපේ රටේ ආර්ථික ස්ථාවරත්වයේ ජයග්‍රහණ පෙනෙන්න පටන් අරගෙන තිබෙනවා. ආර්ථික ස්ථාවරත්වය සලකා බලන හැම දර්ශකයක්ම, හැම අගයක්ම අනුව අපට පෙන්වා දෙන්න පුළුවන්, හැම පැත්තකින්ම උදාහරණ දෙන්න පුළුවන්, ආර්ථිකය ස්ථාවර වුණා කියලා. අවුරුද්ද අවසාන වනකොට අපි රටේ ඩොලර් ආදායම වාගේම රජයක් විධියට උපයන රුපියල් ආදායමත් වැඩි කරගෙන තිබෙනවා; ආර්ථිකය ශක්තිමත් කරගෙන තිබෙනවා. මම හිතන විධියට, මෑතකදී අපේ විදේශ සංචිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.8ක් ලෙස පෙන්නුම් කළා. ඒ අගය ආවේත් අපි අවුරුදු 5කට විතර පස්සේ රටට වාහන ගෙන්වන්න අවසර දීලා තිබියදීයි. වාහන ගෙන්වන්න ඇමෙරිකානු ඩොලර් බිලියන 2ක් විතර වියදම් කරන්න සිද්ධ වෙලා තිබියදීත් තමයි එවැනි විදේශ සංචිතයක් අපට ලැබී තිබෙන්නේ; අපේ විදේශ සංචිතය ඒ මට්ටමට ඇවිල්ලා තිබෙන්නේ. වාහන ගෙන්වන්න ඇමෙරිකානු ඩොලර් බිලියන 2ක් වියදම් කරන්න අපට සිද්ධ වුණේ නැත්නම්, අපේ විදේශ සංචිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 8 ඉක්මවා යනවා. ඒකෙන්ම අපි පෙන්නුම් කරනවා, අපේ රටේ ආර්ථිකයේ ස්ථාවරත්වය. ඒකෙන් පෙන්නුම් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි, අපි ආර්ථිකයත්, රටත් පිළිවෙළක් ඇතුව, ඉලක්කයක්

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

සහිතව, විනිවිදභාවයක් සහිතව ඉස්සරහට ගෙන යනවා කියන කාරණය. ඒ අනුව හැම අංශයක්ම අපි විධිමත්කරණය කරලා තිබෙනවා.

විශේෂයෙන්ම අද මේ සම්මත කර ගන්නා, විවාදයට ගන්නා පනත් කෙටුම්පත් තුනත් අපි ගෙනැල්ලා තිබෙන්නේ, මෙන්න මේ ක්ෂේත්‍රයන්ගේ විධිමත්කරණය සහ පිළිවෙළ හදන්නයි. නමුත් අපට විවේචන එන්නේ එහෙම නොවෙයි. යම් යම් සිද්ධි අරගෙන, ඒවායේ තිබෙන අහු කොන් හොයාගෙන, ඒවා මත තමයි විශාල විවේචන ගොඩනඟන්නේ; ඒ මත තමයි අපේ ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දුර්මත, කළු පැල්ලම් හදන්න උත්සාහ ගන්නේ. ගල් අඟුරු ටෙන්ඩරය ගත්තත් එහෙමයි. ඒවා මෙතෙක් කල් ටෙන්ඩර් පටිපාටියට පිටින් සිද්ධ වෙච්ච දේවල්. නමුත් අපි බලයට ඇවිල්ලා අන්තර්ජාතික ටෙන්ඩර් පටිපාටියට අනුව, අන්තර්ජාතිකව පිළිගත් ක්‍රමවේදයන්ට අනුව, විනිවිදභාවයෙන් යුතුව එම කටයුතු සිද්ධ කරලා තිබෙනවා. ඒ වාගේම අන්තර්ජාතික තත්ත්වයන්ට අනුව ඒ සඳහා අපි එකඟතා ඇති කරගෙන තිබෙනවා. ඒ නිසාම ඒ සැපයුම්කරුවන්ගෙන් සිද්ධ වන අඩුපාඩු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න, ඔවුන් යම් නීති රීති උල්ලංඝනය කළා නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න අපට ඒ අන්තර්ජාතික එකඟතා අනුවම පුළුවන් වෙලා තිබෙනවා.

නමුත් මේ වාගේ සිද්ධියක යම් එක කොටසක් අරගෙන ඒ මත මහා භයංකාර කතන්දරයක් ගොඩනඟනවා, මෙන්න ගල්අඟුරුවලින් හොරකම් කළා, මෙන්න අවභාවිතාවක් කළා, මේවා මේ ආණ්ඩුවට තේරෙන්නේ නැහැ, මේ ආණ්ඩුව දන්නේ නැහැ කියලා. ඒකම ඒකම කියමින් මහජනයා තුළ වැරදි මතයක් ගොඩනඟන්න මේ අය උත්සාහ ගන්නවා. ඒක තමයි දැන් වෙලා තිබෙන්නේ. හැබැයි, ඒ සිද්ධිමය විවේචන සතියකට වඩා තිබෙන්නේ නැහැ. ඒ නිසා සතියෙන් සතිය, සතියෙන් සතිය, සතියෙන් සතිය මොකක් හරි විවේචනයක් ගන්නවා; ඒ මත යම් මතයක් ගොඩනඟනවා; ඒ ගැන කියනවා. ඒ හැරුණු විට ප්‍රතිපත්තිමය වශයෙන් සාධනීය, විද්‍යානුකූල විවේචනයක් දෙන්න විපක්ෂයේ කාටවත් බැරි වෙලා තිබෙනවා. ඔවුන් කරන්නේ සිද්ධිමය විවේචන විතරයි. අඳින ඇඳුමක් ගැන, කියපු වචනයක් ගැන, අන්න එවැනි සුළු දේවල්වලින් තමයි ඔවුන් විවේචන ගොඩනඟන්න උත්සාහ කරන්නේ.

අපි ආර්ථිකය ස්ථාවරව ගොඩනඟාගෙන එනකොට තමයි "දිට්වා" සුළි කුණාටුව ආවේ. මෑත ඉතිහාසයේ අපේ රටේ ඇති වුණු දැවැන්තම ස්වාභාවික ව්‍යසනය එය බව අපි කවුරුත් පිළිගන්නවා. එම ව්‍යසනය නිසා රටේ ආර්ථිකයටත්, ජන ජීවිතයටත් ඇති වුණු බලපෑම ඉතා විශාලයි. හැබැයි, ආර්ථිකයට එපමණ බලපෑමක් ඇති වෙද්දීත්, එපමණ ආපදාවක් රටට සිදු වී තිබියදීත් අපට පුළුවන් වුණා, සති දෙකක විතර කාලයක් ඇතුළත ජන ජීවිත නැවත ස්ථාවර කරන්න. ඒ ඇති වුණු ස්වාභාවික ආපදාවෙන් ආර්ථිකයට වුණු බලපෑම recover කර ගනිමින්, ආර්ථිකයේ බිඳ වැටීමක් නොවී නැවත රට ඉස්සරහට අරගෙන යන්න අපට පුළුවන් වුණා. ඒ, අපි වැඩ පිළිවෙළක් සහිතව ආර්ථිකය හසුරුවන නිසායි.

"දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේ සිදු වුණු දේවල් සම්බන්ධව, ඒ අවස්ථාවේ රජය ගත් ක්‍රියාමාර්ග සම්බන්ධව කොහේවත් විවේචන නැහැ. ඒ සම්බන්ධයෙන් විපක්ෂයට කියාගන්න දෙයක් නැහැ. හැබැයි, ඒ කටයුතුවලත් යම් යම් පොඩි පොඩි දේවල් අරගෙන මහා භයංකර කතන්දර ගොඩනඟන්න හදනවා. අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුවෙන් බොහෝ නිවාසවලට හානි වුණු බව. නිවාස 6,000කට පූර්ණ වශයෙන් හානි සිදු වුණා. 110,000කට ආසන්න නිවාස සංඛ්‍යාවකට අර්ධ වශයෙන් හානි සිදු වුණා. එම හානිය වෙලා මාස එකහමාරක් යන්න කලින් අපි ඒ ජනතාවට නිවාස හානි සඳහා ලොකු මුදලක් වෙන් කරලා ලොකු ආධාර මුදලක් ලබා දෙන බව ප්‍රකාශයට පත් කළා. අපි ඒ සම්බන්ධව ජනතාවට පොරොන්දුවක් දුන්නා. අපි ඒ කටයුත්ත ඒ වාගේම ආරම්භ කළා. සම්පූර්ණයෙන් හානි වුණු නිවාසයකට රුපියල් ලක්ෂ 50ක් දෙනවාය කියන්නේ සුළුපටු දෙයක් නොවෙයි. මීට කලින් කිසිම ආණ්ඩුවක් එහෙම වන්දි මුදලක් දීලා නැහැ. අපි ඇයි එහෙම කළේ? එම ජනතාවට තමන් හිටපු ජීවන තත්ත්වයට වැඩිය හොඳ ජීවන තත්ත්වයක් උදා කර දීම තමයි අපේ අරමුණ වුණේ. අර්ධ හානි වුණු නිවාසයකට උපරිම රුපියල් ලක්ෂ 25ක් ගෙවන්න අපි තීරණය කළා. එම වැඩකටයුතු අපි ආරම්භ කළා. හැබැයි, ඒකෙත් කොස්සක් හොයා ගත්තා. පූර්ණ හානි වුණු නිවසක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 50ක් දෙන්න තීරණය කළ එක හොඳයි නේ. එම වන්දි මුදල් ලබා දීම කඩිනමින් ආරම්භ කළ එක හොඳයි නේ.

පූර්ණ හානි වූ නිවසක් සඳහා රජයෙන් රුපියල් ලක්ෂ 50ක් දෙනකොට එම මුදල් අවභාවිත වෙන්නේ නැතුව ඒ මුදලින් නිශ්චිතව එම කාරණයම ඉෂ්ට කරනවාද, ඒකෙන් නිවස හදාගන්නවාද, ඒ නිවස ප්‍රමිතියකින් යුක්තද කියලා හොයා බලන එකත් හොඳයි නේ. රජයේ සාමාන්‍ය වැඩකටයුතු තිබියදී තමයි රාජ්‍ය යන්ත්‍රණය මෙම වන්දි ගෙවීම් හා ආධාර මුදල් ගෙවීම් සිදු කරන්නේ. එම නිසා ඔවුන් අතින් යම් යම් අතපසුවීම් වෙන්න පුළුවන්; යම් යම් දේ මඟ හැරෙන්න පුළුවන්. ඒ වාගේම ජනතාවගේ පැත්තෙන් ගත්තාමත් ඔවුන්ට විශාල මුදලක් ලැබෙන නිසා ඔවුන් කරන්න පුළුවන් හොඳම දේ ගැන හිතනවා; තීරණ වෙනස් කරනවා. එම නිසා මේ චෙක්පත් සම්බන්ධවත් ගැටලුවක් මතු වුණා. ගිවිසුමක් අත්සන් කරලා අපි මේ චෙක්පත් ලබා දෙනවා. ඊට පසුව ජනතාව සහතික කරන්න ඕනෑ, ඔවුන් නිවස හදාගන්නේ කොතැනද, නිවසක් මිලදී ගන්නේ කොහෙන්ද කියලා. රුපියල් ලක්ෂ 20ක් අතට හම්බ වුණාට පසුව ඇතැම් අය කල්පනා කරනවා, නැහැ, අපි හිටපු තැන නොවෙයි, වෙන තැනක ඉඩමක් අරගෙන නිවස හදාගන්නවා, එහෙම නැත්නම් වෙන තැනකින් හදපු නිවසක් මිලදී ගන්නවා කියලා. එම නිසා ඔවුන් අත්සන් කළ ගිවිසුම එහාට මෙහාට වෙන්න ගන්නවා. ඒ නිසා එම චෙක්පත්වලින් මුදල් ලබා ගැනීමේදී දවස් 5ක, 6ක ප්‍රමාදයක් වුණා. විපක්ෂය ඒකත් කර තබාගෙන මහා ඝෝෂාවක් නැඟුවා.

ජනාධිපතිතුමා මුල්ගල් තැබූ සහ චෙක්පත් ලබා දුන් නිවාසවලට මම පසුගිය දවසක ගිහින් බැලුවා. ඒ අය නිවාස හදන්න පටන් අරගෙන තිබෙනවා, නැවත කවදාවත් ගංවතුරකින් හානියක් නොවන ආකාරයට. සමහර අය නිවස අඩි 4ක්, 5ක් උස්සලා හදන්න පටන් අරගෙන තිබෙනවා. බොහෝදෙනෙක් තට්ටු දෙකට නිවස හදන්න පටන් අරගෙන තිබෙනවා. තවත් අය ඔවුන්ගේ පවුලට ගැළපෙන විධියට කාමර කිහිපයක් සහ නානකාමරයත් නිවස ඇතුළේම තිබෙන විධියට, ඉංජිනේරුමය සැලසුමක් සහිතව විධිමත් විධියට හොඳ ප්‍රමිතියෙන් යුතුව නිවස හදන්න පටන් අරගෙන තිබෙනවා. එච්චර වැඩකටයුත්තක් කර තිබියදී විපක්ෂය ඒකෙන් අහුළා ගන්නේ පොඩි කොටසයි. විපක්ෂය එහෙම තමයි මත ගොඩනඟන්නේ. හැබැයි සතියකින් එම ගැටලුවත් අවසන් වුණා. දැන් මිනිසුන් නිවාස හදන්න පටන් අරගෙන තිබෙනවා. හැබැයි, විපක්ෂය තවම ඒ ප්‍රශ්නය කරේ තබාගෙන යනවා.

පසුගිය 30වැනි දා වනකොට පූර්ණ හානි වුණු නිවාස 136ක් වෙනුවෙන් අපි වන්දි ගෙවන්න පටන් අරගෙන තිබෙනවා. අර්ධ හානි වුණු නිවාස 1,580ක් වෙනුවෙන් අපි ආධාර ලබා දීමේ වැඩකටයුතු අවසන් කර තිබෙනවා. ඒ අනුව මේ වනකොට අපි පවුල් 2,000කට විතර ආධාර ලබා දීමේ වැඩකටයුතු ආරම්භ කරලා තිබෙනවා. මේ අයට සිද්ධිමය විවේචන හැර, ප්‍රතිපත්තිමය විවේචන නැහැ.

ඒ සිද්ධිමය විවේචන මතින් තමයි ගමන් කරන්නේ. ඒවා සතියයි පවතින්නේ. ඒ නිසා සතියෙන් සතියට මාතෘකා හොයන්න ගන්නවා. හෙට අනිද්දා වනකොට තව එකක් හොයා ගනීවි. ඒ නිසා අපි රටේ ජනතාවට කියනවා, අපව විශ්වාස කර ඔබ අපට භාර දුන් අභිලාෂය අප ඉෂ්ට කරමින් සිටින බව. මේ අණපනත් සම්මත වන්නේත් ඒ අර්ථයෙන්. ඒ අනුව අපි ඉදිරියට යමින් සිටිනවා. ඔබේ විශ්වාසය දිගටම අපත් එක්ක තබා ගන්න කියා ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.52]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

වෙළෙඳාමට ඇති බාධා ඉවත් කිරීම තමයි රටක අඩු මිලට භාණ්ඩ ලබා ගන්න තිබෙන එකම ක්‍රමය. ඒ නිසා වෙළෙඳාමට ඇති බාධා ඉවත් කිරීම සඳහා ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ආණ්ඩුව පැත්තෙන් ගන්න කියන ඉල්ලීම මම කරනවා. ඒකට හේතුව තමයි, ලෝකයේ කොහේ හෝ රටක ඉඳලා ලංකාවට භාණ්ඩයක් ගෙනාවත්, ලංකාවේ සිට වෙන රටකට භාණ්ඩයක් ගෙන ගියත් ඒවා ඉක්මනටම අදාළ ගමනාන්තයට යවා ගන්නට අවශ්‍ය වීම. ඒ නිසා මේ ප්‍රමාද වීම් ඇතුළු සියලු දේවල් සම්බන්ධයෙන් හැකිතාක් නීති, අණපනත් වෙනස් කරලා, මේක ක්‍රියාත්මක කර ගන්න ඉඩ දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරපු බිමල් ඇමතිතුමා පසුගිය දවසක මැනිං මාර්කට් එකට එනවා මම දැක්කා. මොකද, දැන් මේ ගෙනෙන භාණ්ඩ ටික මැනිං මාර්කට් එකට දාලා තමයි ඊට පසුව ඒවා ලංකාව පුරා බෙදා හරින්නේ. හැබැයි, එතුමා එතැනට එනකොට අර සාමාන්‍ය ඇමති කෙනෙක් එනකොට වාගේ, එතැනින් ඇතුළට යන මාර්ග ටික වැහුවා. ඉතින් ඒ දේවල් ටික බලලා එතුමා එතැනින් ගියා මිසක්, එතැන තිබෙන ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව පරීක්ෂා කරපු බවක් ඒ වෙලාවේ මැනිං මාර්කට් එක ඇතුළේ හිටපු මම දැක්කේ නැහැ.

මේ අවස්ථාවේදී මට විශේෂ ඉල්ලීමක් කරන්න තිබෙනවා. තොග වෙළෙඳාම සිද්ධ වන එම ස්ථානයේ ඉවතට යාම සඳහා එක මාර්ගයයි තිබෙන්නේ. මාළු මාර්කට් එකෙනුත්, අනික් පැත්තෙන් එළවලු සහ පලතුරු මාර්කට් එකෙනුත් එළියට එනකොට ඒ ස්ථානයේ විශාල තදබදයක් ඇති වෙනවා. ඒ නිසා ආණ්ඩුවෙන් මම ඉල්ලීමක් කරනවා, පොඩි වියදමක් දරලා මැනිං මාර්කට් එකෙන් ඉවතට යාමට සහ ඇතුළට පැමිණීමට එහි තව මාර්ග කිහිපයක් හදන්න කියලා. ඒ හරහා ඉතා ඉක්මනින් සහ පහසුවෙන් මේ භාණ්ඩ හුවමාරුව රට පුරා කරගෙන යන්න පුළුවන් වනවා. එම නිසා ඒ කාරණය ගැන අවධානය යොමු කරන්න. මොකද, බාධා අවම වීමෙන් තමයි වෙළෙඳාමේ ප්‍රධාන වාසිය ලැබෙන්නේ. වෙළෙඳාමට වෙනත් බාධා ඇති වීම, වියදම් වැඩිවීමට සහ අනෙකුත් බොහෝ දේවල් ඇති වීමට හේතුවක් බවට පත් වෙනවා.

ඒ වාගේම, මේ සාකච්ඡාව සිද්ධ වන අතරතුර මේ කාරණයත් මම කියන්න කැමැතියි. ඊයේ හෝ පෙරේදා දවසේ මගේ ඉන්දියානු සංචාරය පිළිබඳව මන්ත්‍රීතුමෙක් අදහසක් ඉදිරිපත් කර තිබෙනවා මම දැක්කා. ඒ, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ බෑග් එක අරගෙන යන්න මම ගියපු බව කියමින්. ඒ පිළිබඳව මට කියන්න තිබෙන කථාව මේකයි. ඔව්, අපි ඉන්දියානු සංචාරයක් ගියා. ඒ ඉන්දියානු සංචාරයට අපි ගියේ මීට මාස 6කට කලින්. මමත්, චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාත්, වෙනත් පක්ෂ ගණනාවක මන්ත්‍රීවරුන් එක්ක ඉන්දියානු සංචාරයකට ගියා. ඒ වෙලාවේදී ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්තුමියත් මුණ ගැහුණා. ඒ ස්ථානයේදී හමු වුණු ආචාර්ය සමන්තා මහත්මිය තමයි අපට ඒ ආරාධනාව කළේ. අපිත් එතුමියට ආරාධනා කළා, ලංකාවට එන්න කියලා. එතුමිය පාර්ලිමේන්තුවේදී විපක්ෂ නායකතුමාව හමු වුණා. එතුමිය කරපු ආරාධනාවකට අනුව අපේ පක්ෂයෙන් මන්ත්‍රීවරු හතරදෙනෙක් ඉන්දියාවට යන්න තීරණය කළා. ඒ විධියටම පොදුජන පෙරමුණත් මුණ ගැසී කරන ලද ආරාධනාවකින් ඒ කණ්ඩායමත් ඉන්දියාවට ගියා. ඒ වෙලාවේදී ජනතා විමුක්ති පෙරමුණ සහ අනෙකුත් පක්ෂ ගණනාවක නියෝජිතයින් ඉන්දියාවට ගියත්, ඒ අය මේ සබඳතා හදා නොගැනීම නිසා ඒ අයට ආරාධනා කරන්නේ නැතුව ඇති. හැබැයි, මේ පක්ෂ දෙකට ආරාධනා කළාම එතැන සිටින ජ්‍යෙෂ්ඨතම දේශපාලකයාට තමයි ඒ සංචාරය යද්දී ඒ කණ්ඩායමේ නායකත්වය හිමි වෙන්නේ. ඒ අනුව ජනාධිපති අපේක්ෂකයෙක් වුණු, කැබිනට් අමාත්‍ය ධුරයක් දරපු නාමල් රාජපක්ෂ මැතිතුමා තමයි ඒ වෙලාවේදී ඒ කණ්ඩායමේ නායකයා වුණේ. මම හිතනවා, මෙතැන ඉන්න මන්ත්‍රීවරු ඒ ගැන දන්නවා ඇති කියලා. මොකද, එතුමන්ලා ඒ ගැන නොදැන ඉන්න හේතුවක් නැහැ.

හැබැයි, ඒ කාරණාවත් එක්ක මතු වුණු ඊළඟ කාරණාව තමයි, මම ඒ සංචාරය යන අතරතුර නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ බෑග් එක අරගෙන ගියා කියන එක. මට ඒ පිළිබඳව කියන්න තිබෙන දේ මේකයි. ලංකාවේ පාර්ලිමේන්තුවේ ඉන්න අය මේ ගැන දන්නවා. පිටස්තරව ඉන්න අයත් මේ ගැන දන්නවා. තමන්ගේ වැදගත්ම ලියවිලි ටික, එහෙම නැත්නම් තමන්ට අත්‍යවශ්‍ය දේවල් ටික අරගෙන යන බෑග් එක ජනාධිපති අපේක්ෂකයෙක් වුණු නාමල් රාජපක්ෂගේ ආරක්ෂක නිලධාරින් සිටියදී, ලේකම්තුමා සිටියදී, මාධ්‍ය කණ්ඩායම සිටියදී -මේ ඔක්කොම සිටියදී- වෙනත් පක්ෂයක මන්ත්‍රීවරයෙක් අතට දෙනවා කියලා හිතන්නේම ජවිපෙට ඡන්දය දුන් මිනිස්සු සහ ඒ ඡන්දවලින් පත් වෙච්ච මන්ත්‍රීවරු විතරයි. ඒ මට්ටමට තමයි ඒ අය ගැන හිතන්න වෙන්නේ. ඒ වෙලාවේදී එහෙම හැර වෙන කිසිම කෙනෙක් ඒ විධියට හිතන්නේ නැහැ.

හැබැයි, මට ඔය කාරණය පිළිබඳව කියන්න තිබෙන්නේ වෙන අදහසක්. ඔය මට්ටමට හිතන මිනිස්සු කණ්ඩායමක් මේ රටේ ඉන්න නිසා තමයි මේ පාලන බලයට ඔබව ගෙනාවේ. ඒ නිසා සත්‍යය වෙනුවට බොරුව සමාජගත කර, ලංකාව පුරා සිටින මිනිස්සුන්ට මේක ඇත්තක් කියන මට්ටමට විශාල ප්‍රචාරයක් ගෙන යෑමේ හැකියාව ඔබට තිබෙනවා. ඒ ප්‍රචාරය තමයි ඒ වෙලාවේදී භාවිත කළේ. හැබැයි, ඔය සිද්ධිය ගැන කියන්න තිබෙන දේ මෙයයි. අපට ඔය විධියට චෝදනා එල්ල කළාට මාත් එක්ක නාමල් මන්ත්‍රීතුමා කිව්වා, ඒ දවස්වල මහින්ද මහත්මයාව හමු වෙන්න JVP එකේ අය එද්දී ගේට්ටුව ළඟින් සෙරෙප්පු දෙක ගලවලා අතේ අරගෙන තමයි ගෙදරට ආවේ කියලා. එහෙම තමයි නාමල් මන්ත්‍රීතුමා කිව්වේ. එතුමාගෙන් අහගන්න ඇත්ත, බොරු. මම ඒවා ගැන දන්නේ නැහැ. ඊළඟට, මහින්ද මහත්මයා වාඩි වෙනකල් හිටගෙන හිටියේ කිව්වා. මහින්ද මහත්මයා ඉස්සරහ කොන්ද කෙළින් තබාගෙන ඉන්න photo එකක් පුළුවන් නම් පෙන්වන්න කියලා නාමල් මට කියන්න කිව්වා. මහින්ද මහත්මයා

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඉස්සරහ කොන්ද කෙළින් තියාගෙනවත් ඉන්න බැරි, සෙරෙප්පු දෙක අතේ අරගෙන ගෙදරට ගියපු මිනිස්සු අපට කියලා දෙන්න එනවා, බැග් අරගෙන යෑම පිළිබඳව.

ඊළඟ කාරණය මේකයි. රාජපක්ෂලා විසින් තමන්ගේ දේශපාලනයට ජවිපෙ භාවිත කරපු විදිය පිළිබඳව අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* රිදෙන්නේ ඒකයි, රිදෙන්නේ ඒකයි. මේක අහගන්නකෝ. ඔබතුමා එදා පෝස්ටර් ගහපු එක්කෙනෙක්.

2005 මැතිවරණයේදී මහින්ද මහත්මයාගේ පෝස්ටර් ටික ගහලා, canvassing ගිහිල්ලා, TV programmesවලට ඇවිල්ලා කියන්න පුළුවන් සේරම ටික කියලා ඒ මනුස්සයා බලයට පත් කළා. එතුමා බලයට පත් කරගෙන ඊට පස්සේ ඔයගොල්ලන්ව කඩේ යැව්වා. ඊළඟට, ඔබතුමන්ලාට අපේක්ෂක ලැයිස්තුවක් දීලා, ඒකෙන් මන්ත්‍රීවරු පත් කරගෙන, ඒක ඇතුළේ ඉන්න හොඳම දේශපාලන කියැවීමක් තිබුණු ප්‍රචාරක ලේකම් ඇතුළු කණ්ඩායමම පක්ෂයෙන් කඩලා අරගෙන, හප ටික ඉතුරු කරලා අනෙක් සියලුදෙනා භාවිත කරලා ජවිපෙ කොහොමද දේශපාලනිකව ජයග්‍රහණයට පාවිච්චි කරන්නේ කියලා මේ රටේ ඉතිහාසය තුළ රාජපක්ෂලා විසින් පෙන්වා දී තිබෙනවා. ඒ නිසා රාජපක්ෂලා විසින් මිනිසුන්ව පාවිච්චි කරන්නේ කොහොමද කියන උදාහරණයට ජවිපෙ ගත්තාම අපිට ඇති. ඒ නිසා අපිව එහෙම පාවිච්චි කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඒකට උදාහරණයක් කියනවා වාගේම ස්තුතියක් පළ කරනවා. මොකද, ජවිපෙ අතීතයේ එහෙම නොකළා නම් අපිත් ඒවාට අහු වෙන්න ඉඩ තිබුණා. හැබැයි, ඔබතුමන්ලාව රාජපක්ෂලා භාවිත කරපු විදිය සහ ඒ හේතුවෙන් මේ කාරණා ටික නිර්මාණය වීම පිළිබඳව අපට තිබෙන්නේ ඇත්තටම කනගාටුවක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තත්පර 30කින් කථාව අවසන් කරන්නම්.

ඒ වාගේම වැදගත්ම දේ මේකයි. දේශපාලනය ඇතුළේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා දැන ගන්න නම් කරුණාකර වෙනත් රටවලට යන්න. එහෙම වෙනත් රටවලට නොගියොත් සිද්ධ වෙන දේ මේකයි. යනකොට පෝලිම මාරු වෙලා වෙන තැනක හිට ගන්නවා; බොත්තම් මාරු වෙලා තවත් තැනකට යනවා. ඒ වාගේ දේවල් වෙන්නේ විපක්ෂයේ සිටියදී මේ වාගේ තැන්වලට නොයන නිසායි. අවසාන වශයෙන්, මම ජනාධිපතිතුමාගෙනුත්, ආණ්ඩුවේ ප්‍රධානීන්ගෙනුත් ඉල්ලනවා, ඔබතුමන්ලා වෙනත් රටවලට යද්දී මේ ඉන්න පාපිසි ටිකත් එක්කගෙන ගිහිල්ලා රාජ්‍ය තාන්ත්‍රිකව ගනුදෙනු කරන්නේ කොහොමද කියන එක කියලා දෙන්න කියලා. එහෙම සිදු නොවන තාක්කල් අපේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු පිට රටවලට යද්දී ඔය වාගේ කුහක අදහස් සමාජගත කරනවා. ඒකෙන් බේරෙන්න නම් ජනාධිපතිතුමා සහ අගමැතිතුමිය ඇතුළු සියලු දෙනාගෙන්ම ඉල්ලනවා, මේ පාපිසි ටිකත් පිට රට එක්කගෙන ගිහිල්ලා ලෝකය කොයි වාගේද කියලා පෙන්වන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.58]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.* அஸ்ஸலாமு அலைக்கும்! ஆயுபோவன்! வணக்கம்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று விவாதிக்கப்படும் விடயங்கள் நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்தக்கூடிய முக்கிய விடயங்களாக இருக்கின்றன. இந்த விவாதத்தைச் சரியான முறையில் எதிர்க்கட்சியினர் பயன்படுத்துகின்றார்களா என்றால், 'இல்லை' என்றுதான் கூற வேண்டும். அதாவது, இந்த விவாதம் தொடர்பான விஷயங்களைக் கதைக்காமல், வெவ்வேறு விஷயங்களைக் கதைத்துக்கொண்டு இருக்கின்றார்கள். அதில் முக்கியமாகக் கூறக்கூடிய ஒரு விடயந்தான், புத்தளம் பற்றிய விடயம்! இந்தத் தருணத்தில் நானும் சில விஷயங்களைச் சுட்டிக்காட்ட வேண்டி இருக்கின்றது.

முன்னைய காலங்களில் மன்னார் மாவட்டத்தில் இருந்து புத்தளம் மாவட்டத்துக்கு வந்த மக்களை நாங்கள் இரண்டு கைகளாலும் அணைத்து வரவேற்று, ஆதரித்தோம். அந்த வகையில், அவர்கள் புத்தளத்தில் அதிகமாக இருக்கிறார்கள். இதைச் சரியாகப் பயன்படுத்தியவர்கள் அந்தக் காலத்தில் இருந்த அரசியல்வாதிகள்! அவர்கள் என்ன சொன்னார்கள் என்றால், புத்தளத்தில் சனத்தொகை அதிகமாகி விட்டது; மருத்துவத் தேவைகள் அதிகமாக உள்ளன. அதனால் புத்தளத்தில் இருக்கின்ற வைத்தியசாலையைத் தரமுயர்த்த வேண்டும் என்றுதான். அதுமட்டுமல்லாமல், புத்தளத்திலுள்ள மன்னார் மக்கள் - *[இடையீடு]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කරුණාකරලා කියන්න පුළුවන්ද, මේ සම්බන්ධ විෂය භාර ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා මේ අවස්ථාවේදී සභාවේ සිටිනවාද කියලා? මොකද, වැදගත් පනත් කෙටුම්පත් කීපයක් පිළිබඳව තමයි විවාද කරමින් සිටින්නේ. නමුත්, මේ සභාවේ ඊට අදාළ කවුරුවත් නැහැ.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
கடந்த காலத்தில் இருந்த அரசியல்வாதிகள் தேர்தல் காலங்களில் புத்தளத்தில் வாழ்ந்த மக்களிடம், அவர்களுக்குத்

தேவையானவற்றைச் செய்து தருவதாகக் கூறி, அவர்களிடம் வாக்குகளை வாங்கி வென்றதற்குப் பிறகு, அவர்களுக்கு எதையும் செய்ததாக இல்லை. அரசாங்கம் அமைக்கின்ற ஆளுங்கட்சிக்கு ஆசனங்கள் குறைவாக இருந்தவேளை, இவர்களை அழைக்கும்போது தங்களுக்குக் கிடைத்த ஆசனங்களைக் கொண்டு உதவினார்கள். மக்களிடம் வாக்குகளைப் பெறுகின்றபோது நிறைவேற்றுவதாகக் கூறியவற்றை அரசாங்கத்திடம் இருந்து கேட்டுப் பெற்றுக் கொண்டார்களோ, இல்லையோ, அந்த அரசாங்கத்துக்கு ஆதரவளித்ததன் மூலம் தங்களுக்குத் தேவையான அமைச்சுப் பதவிகளையும், பாதுகாப்பு வசதிகளையும், அதிகளவான வெளிநாட்டுப் பயணங்களையும் கேட்டுப் பெற்றுக் கொண்டார்கள். "நாங்களும் கடந்த காலங்களில் அரசாங்கத்தில் இருந்தோம்" என்று இன்று வெட்கமில்லாமல் கூறுகிறார்கள். அன்று 10-12 வருடங்களாக Cabinetஇல் இருந்த அமைச்சர்கள்கூட, எங்கள் மக்களுக்கு இவற்றைச் செய்து தந்தால் நாங்கள் அரசாங்கத்துடன் இணைகிறோம் என்று கூறவில்லை. அப்படிக் கேட்காது, தங்களுடைய தேவைகளை மட்டும் நிறைவேற்றிக்கொண்டு, சுகபோக வாழ்க்கை வாழ்ந்துகொண்டு, இன்றும் மக்களைக் கஷ்டத்தில் ஆழ்த்திக்கொண்டு இருக்கிறார்கள்.

அதுமட்டுமல்ல, தேசிய மக்கள் சக்தி வெற்றி பெற்றால், இவ்வாறு நடக்கும், இவ்வாறான பிரச்சினைகள் வரும், தொப்பி அணியவிட மாட்டார்கள், பெருநாளைக் கொண்ட முடியாது போகுமென கடந்த சனாதிபதித் தேர்தல் காலத்தில் பிரசாரம் செய்தார்கள். “புத்தளம் தள வைத்தியசாலையை நாங்கள் தரமுயர்த்தித் தருவோம்” என்ற ஒரேயொரு வார்த்தைக்காக, எமது அரசாங்கம் பதவியேற்று ஒரு வருடத்துக்குள் அவ்வைத்தியசாலையைத் தரம் உயர்த்து வதற்கான வேலைகளை ஆரம்பித்துவிட்டோம். "இன்ஷா அல்லாஹ்! " இந்த வருடத்துக்குள் அதற்கான அனைத்து வேலைகளையும் செய்வதற்கான ஏற்பாடுகளையும் எமது அரசாங்கம் செய்துள்ளது. அதற்காக மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் அரசாங்கத்துக்கும் எமது புத்தளம் மக்கள் சார்பில் நன்றியைக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

‘‘புத்தளம் - மன்னார் பாதையைத் திறந்து தருவோம்” என்று கூறி வாக்குகளைப் பெற்று, கடந்த அரசாங்கத்துக்கு ஆரதவு கொடுத்த அமைச்சர்கள்கூட, "அதனைத் திறந்து தந்தால் நாங்கள் உங்களுக்கு ஆதாரவளிக்கின்றோம்” என்று அப்போது கூறவில்லை. மாறாக, அந்த அமைச்சர்கள் தமது குழுக்களை வைத்து அந்தப் பாதையை திறக்க விடாமல் நீதிமன்றத்தில் வழங்குத் தாக்கல் செய்தார்கள். வழக்குத் தாக்கல் செய்தமையால்தான் அந்தப் பாதையைத் திறக்க முடியாமல் போனது. அவர்களால் செய்துகொள்ள முடியாத அந்த விடயத்துக்கு நாங்கள் தடையாக இருப்பதாக இன்று இந்தச் சபையில் கூறிக்கொண்டு இருக்கின்றார்கள். இன்ஷா அல்லாஹ்! எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் புத்தளம் தள வைத்தியசாலையைத் தரமுயர்த்திக் கொடுப்பதைப்போல, புத்தளம் - மன்னார் பாதையையும் மக்கள் போக்குவரத்துக் காகத் திறந்து வைக்கும் என்பதை நாங்கள் கூறிக்கொள்ள விரும்புகின்றோம்.

இங்கு இதற்கு முன்னர் பேசியவர்கள், தேசிய மக்கள் சக்தி அரசாங்கம் போதைப்பொருள் விடயத்தில் அதிகமாக ஈடுபடுவதாகக் கூறினார்கள். முன்னைய அரசாங்க காலத்தி லிருந்த அமைச்சர்கள், பிரதி அமைச்சர்கள், பாராளுமன்ற உறுப்பினர்கள் இந்தச் செயலில் ஈடுபட்டிருப்பார்கள் என்று நான் நினைக்கின்றேன். மலையகத்தில் கஞ்சா செடிகள் வளர்வது குறைவாக இருக்கும். அப்படியென்றால், எப்படி மலையகத்தில் கஞ்சா வந்தது? சென்ற அரசாங்கத்திலிருந்த அமைச்சர்களும் பாராளுமன்ற உறுப்பினர்களும்தான் தங்களுடைய வாகனங்களில் அவற்றைக் கொண்டுசென்று இருப்பார்கள். அவர்களுடைய வாகனங்கள் சோதனை செய்யப்படாமல் இருந்ததும் அதற்கொரு காரணமாகும்.

அதுமட்டுமல்ல, நாங்கள் இனவாதத்தை உருவாக்குவதாக இங்கு பேசுகின்றார்கள். இனவாதத்தை உருவாக்கியவர்கள் யார்? இனவாதத்தை இல்லாமல் ஆக்கியவர்கள் யார்? சென்ற அரசாங்க காலங்களில் எங்கு பார்த்தாலும், பள்ளிவாசல்கள் உடைக்கப்படுவதும் சிலைகள் உடைக்கப்படுவதும் எங்கேயாவது முஸ்லிம்-சிங்கள பிரச்சினைகளை உருவாக்கு வதும் என நிறையப் பிரச்சினைகள் இருந்தன. சென்ற அரசாங்கங்கள் இனவாதத்தைப் பரப்பியே ஆட்சியைக் கைப்பற்றின. கடந்த ஒரு வருட காலமாக நாட்டில் எங்கேயும் இனவாதம் தொடர்பான ஒரு வார்த்தைகூட பேசப்படவில்லை; எங்கேயும் பள்ளிவாசல்கள் உடைக்கப்படவில்லை; எங்கேயும் சிலைகள் உடைக்கப்படவில்லை. இனவாதத்தை அழித் தொழிப்போம் என்று கூறிய தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஒரு வருடத்தில், இந்த நாட்டில் இனவாதம் பற்றிய பேச்சுக்களை இல்லாதொழிப்பதற்கான எல்லா வேலைகளையும் செய்துள்ளது.

எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் வெள்ளத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு அதிகமான உதவிகளைச் செய்ததோடு, புத்தளம் மாவட்ட மக்களையும் மறக்கவில்லை. அதிகமான உதவிகளை அம்மாவட்ட மக்களுக்குச் செய்துள்ளது. இங்கு பேசிய எதிர்க்கட்சி அரசியல்வாதிகள், இந்த அரசாங்கத்தில் இருக்கின்றவர்களுக்கு மனசாட்சி இல்லையென்று சொல்லிக்கொண்டு இருக்கின்றார்கள். இந்த அரசாங்கத்தை நம்பி வாக்களித்த எமது மக்களுக்கு, தேசிய மக்கள் சக்தி அரசாங்கம் ஒரு மாற்றத்தைக் கொண்டுவர வேண்டுமென்று வாக்களித்த மக்களுக்கு, எமது அரசாங்கம் சிறந்த முறையில் சேவை செய்துகொண்டு இருக்கின்றது. அந்த மக்கள் இன்று நாட்டில் நிம்மதியுடன் எந்தக் கஷ்டமும் இல்லாமல் இருப்பதற்கான எல்லா நடவடிக்கைகளையும் அரசாங்கம் செய்து வருகின்றது.

அதேபோல, இன்று நாட்டில் ஊழல், மோசடிகளை இல்லாதொழிப்பதில் எமது அரசாங்கம் மிகவும் உறுதியாக இருக்கின்றது. சென்ற அரசாங்க காலங்களில் ஊழல்களும் மோசடிகளும் நிறைந்து காணப்பட்டன. அத்தகைய ஊழல், மோசடிகளை எமது அரசாங்கம் இன்று கட்டுப்பாட்டுக்குள் கொண்டுவந்துள்ளது. எமது அரசாங்கத்தின் வளர்ச்சி அதிகரித்திருப்பதைக் கண்டு, ஏனைய நாடுகள் அதிர்ச்சிக்கு உள்ளாகியுள்ளன. அதுமட்டுமல்லாமல், எமது நாட்டிலிருக் கின்ற நிறுவனங்கள்கூட எமது அரசின் வளர்ச்சியைப் பார்த்து வியந்துபோய் இருக்கின்றன. முன்னைய அரசாங்கங்களுக்கு IMF ஊடாகவும், உலக வங்கி ஊடாகவும், ஆசிய அபிவிருத்தி வங்கி ஊடாகவும் வழங்கப்பட்ட முதலீடுகளும் கடன்களும் முறையாகப் பயன்படுத்தப்படாமல் இருந்ததனால் வெளிநாடுகள்கூட எமது நாட்டின்மீது அதிருப்தியைக் கொண்டிருந்தன.

ஆனால், IMF ஊடாகவும், உலக வங்கி ஊடாகவும், ஆசிய அபிவிருத்தி வங்கி ஊடாகவும் கிடைக்கின்ற கடன்களையும் முதலீடுகளையும் சரியான முறையில் பயன்படுத்துவதற்கான எல்லா ஏற்பாடுகளையும் இப்பொழுது எமது அரசாங்கம் செய்து, நாட்டின் பொருளாதாரம் வளர்ச்சியடைவதற்கான முயற்சிகளைச் செய்து கொண்டு இருக்கின்றது. எல்லா மக்களுக்கும் சட்டம் சமமாக இருப்பதும் நாட்டின் பொருளாதாரம் வளர்ச்சியடைவதற்கு வழிவகுத்திருக்கின்றது.

[ගරු මුහම්මද් ෆයිසාල් මහතා]

இன்று எமது நாட்டில் ஏற்றுமதி மற்றும் இறக்குமதித் துறைகளில் வெளிநாட்டு முதலீட்டாளர்கள் முதலீடுகளைச் செய்ய முன்வந்துள்ளனர். இதற்குக் காரணம், எமது நாட்டில் சட்டம் யாவருக்கும் சமமாக இருப்பதாகும். முதலீட்டாளர்களுக்கான பாதுகாப்பு மற்றும் இன்னோரன்ன உதவிகளையும் வழங்கி, இந்த நாட்டின் பொருளாதார வளர்ச்சியை மேம்படுத்தும் இந்தத் திருத்தச் சட்டமூலம் தொடர்பில் விவாதிக்கச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[3.08 p.m.]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Presiding Member, I am happy to speak on the Licensing of Container Depot Operators Bill because I think it is very timely and brings legitimacy to a trade that has been operating unregulated. I must compliment the team for doing so as well as the Association of Inland Container Depot Operators led, I know, by Chairman Shiran Dissanayake. This trade has been given lukewarm support.

One thing that has got to be done, if you are looking at the bigger picture of making this country a logistics hub in the world, is, we need to be proactive with our legislation and that is the reason why it is very important. This Bill is not anti-business; it is pro-trade and more than that, pro-efficient. It also ensures a sense of competition and that is what is needed for us to move forward.

There are around 13 container depots that are operating professionally. I guess that while there must be competition, there must also be fair revenue generation through these operations because logistics is something that could absolutely take Sri Lanka to the next level. Singapore is what it is today owing to their logistics operations, which they had the sagacity to take forward. Unfortunately, Sri Lanka got caught up in all the trade union activities with the sense of competitiveness being lost out to those factors and we basically gave that on a platter to Singapore. Therefore, before we lose it out to Port Klang, to Dubai, to Port Salalah or elsewhere, ensure that Sri Lanka gets it in its proper perspective.

What is the reason for the container depots, which hitherto were operating in a non-legal manner, being made to operate legally now? The shipping lines are the ones which essentially get the best out of them. They come, they operate, they do not have to pay any taxes at all, basically squeeze every dollar out of the container depots and move out. So, I think there has to be a fair revenue or a fair return to our local entrepreneurs for the services they render. Then, we must also ensure that there is digital connectivity. It is not just legislation that brings in revenue, but we must cater to the 21st Century world, where digital connectivity needs to be improved.

Then, when it comes to fair competition, we have to embrace the standards in compliance with what is adopted worldwide. ASYCUDA and all that which comes in thereafter would make it a professional outfit that is operating in Sri Lanka. After all, the Port of Sri Lanka is recognized as the 25th best port in the world at the moment. I remember that when my political guru Lalith Athulath Mudali started to make the Colombo Port as a port to be reckoned with, it was ranked in the 12th or the 13th position in the world. While we are in the 25th position at the moment in port ranking, our logistics ranking is 76th in the world. Therefore, we need to rectify or correct the existing anomalies and make sure that we move on.

While we bring in the needed legislation, we must also bear in mind that we have got to look at the net revenue that comes into the country. Now, we have the SAGT, the CICT, the Hambantota Port and the Colombo West International Terminal operating and I am happy about it. But, the Customs officers operating in those terminals take more than three to four days for clearances. When that happens, the importers in this country have to pay demurrage and demurrage amounts to almost 40 to 45 per cent of the total revenue from container operations. Of the four terminals I mentioned, the Jaya Container Terminal, which is 100 per cent operated by us, and the Colombo East Container Terminal are operated by Sri Lanka. But, the revenues and dividends of the other two I mentioned go out of the country and it is almost worth US dollars 600 million. That is the reason why මම ඇහුවේ ඇමතිතුමා හරි නියෝජ්‍ය ඇමතිතුමා හරි මෙතැන නැත්තේ ඇයි කියලා. මොකද, මේ ගැන කියන්න. ඒ අය තමයි මේක ඉදිරියට ගෙන යන්න අවශ්‍ය. නමුත්, එතුමන්ලා දැන් මෙතැන නැහැ, ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලාවත් උත්තරයක් ලබා දෙන්න. So, I hope that this is rectified and gets up to the correct level. Also, ensure that we get a response to this.

Next, ensure that we optimize the port space and that ships come in and move out quickly after discharging containers because, today, there are large feeder vessels operating and they are operating on a very expensive budget. So, one hour lost due to delays at a port means a loss of millions of rupees for them. On that basis, if they find that the Colombo Port is taking a longer time to load or discharge containers, what happens is, they would bypass Sri Lanka. We have lost out many shipments during the past particular period to India owing to the fact that our delivery and discharge of containers have been far too slow to the expectations of the shipping lines.

Hon. Presiding Member, I would like to mention here that India is maintains a vessel-turnaround time of 0.9 days. In Singapore, it is one day, in the UAE, 1.1 days and in Germany and the USA, it is between 1.3 and 1.5 days. So, the standard vessel-turnaround time in the Asian region is between one and 1.2 days, but Sri Lanka is still lagging behind. Therefore, we need to catch up because, otherwise, what will happen is, we will lose the

opportunity to be competitive, providing cost-efficient rates for shipping lines and getting the maximum out of it. We have roughly 8.1 million containers moving out of Sri Lanka. Of that, about 70 per cent comes from India. But, now, we also see that India is developing its own ports. So, if we do not compete in the manner that is expected of us, before too long, Sri Lanka would lose the competitive edge we have. After all, we are happy that the Adani Ports is operating in Colombo, but they also have their own port in Kerala, the Vizhinjam International Seaport So, ensure that we meet the needs to be competitive and provide the necessary answers.

So, while we are talking of that, as I mentioned, the port must basically be able to relieve itself of the congestion. The best way to reduce congestion is to ensure that we have dry ports outside the main port and there are many which are being looked into. But, we are taking time to ensure that they are put into operation. So, make sure that we put those dry ports into operation so that, then, we would be able to provide the shipping lines with speedy delivery. Also, ensure that the Colombo Port becomes competitive without any problems.

Then, when you look at the options that are there, you would understand why it is necessary to become competitive. Look at India. India had entered into a very extensive Free Trade Agreement with the European Union. When India agreed on a Free Trade Agreement with the USA, President Donald Trump, who earlier imposed a 50 per cent tariff on India, immediately reduced it to 18 per cent. So, Sri Lanka has now been given a jolt on competition at the moment because the tariff imposed on us by the USA is between 20 to 21 per cent, while it is 18 per cent on India. Moreover, India has zero tariff entry into the European Union on garments, fisheries and rubber-based items. So, where does Sri Lanka, which roughly has exports worth US Dollars 3.2 billion to the USA and send almost 35 per cent of exports to the European Union worth about US Dollars 1.9 billion to 2 billion, stand? If we basically lose out to the Free Trade Agreements of India, our exporters will have a difficult time. That is the reason why we need an efficient logistics service. Having very efficient and quick container deliveries and ship turnaround times would help us overcome the problems that we face at this particular moment. ඒ නිසා තමයි මම මේ අවස්ථාවේදී මොහොතක් කථා කළේ, තරගකාරී තත්ත්වය ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට මිනිත්තු 12ක් තිබෙනවා නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මිනිත්තු 11යි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම්, තවත් මිනිත්තු 3ක් තිබෙනවා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව මිනිත්තු 2යි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ අවස්ථාව උපයෝගී කරගෙන, තරගකාරී තත්ත්වයක් අවශ්‍ය වන්නේ ඇයි කියන එක ගැන සොයා බැලීම තමයි අවශ්‍ය වන්නේ. අපේ රුපියල දෝලනය වන මේ අවස්ථාවේ input cost එකට මොකක්ද වෙලා තිබෙන්නේ? මේකේ cost-push inflation එකක් ඇති වෙලා, වැඩි වන අවස්ථාවේ අපේ හැම සතයක්ම පාවිච්චි කරන්න ඕනෑ තරගකාරී තත්ත්වයක් ඇති කරන්නයි. අපට 2028 වනකොට ණය ගෙවන්න තිබෙනවා. මීට අවුරුදු 4කට ඉස්සෙල්ලා ණය ගෙවන්න බැහැ කියලා මහ බැංකුව ප්‍රකාශයට පත් කරපු නිසා අපේ රට ලොකු ප්‍රශ්නයකට මුහුණ පා තිබෙනවා. 2028දී බිලියන 14ක් ගෙවන්න තිබෙනවා. අපනයනය කිරීම තුළින් තමයි අපට ඒ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වන්නේ. ඉතින් එය විසඳන්න පුළුවන් අවස්ථාව තියාගෙන, තවම අතපත ගාමින් ඉන්නවා විතරයි. මෙන්න මේ නිසා තමයි මේ වාගේ කෙටුම්පත් ගෙනැල්ලා නීතිගත කිරීම අත්‍යවශ්‍ය වන්නේ. And, we congratulate you for doing so.

Now, you are amending the Licensing of Shipping Agents, Freight Forwarders, Non-Vessel Operating Common Carriers, and Container Operators Act which has been in place since 1972, and its modernization is absolutely required. But, having legislation alone is not enough, because in our country, we have a five-star legal system with a one-star democracy in operation. මෙවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ. තරු පහේ නීති පද්ධතියක් තිබෙනවා. නමුත්, තරු එකේ ප්‍රජාතන්ත්‍රවාදයක් තමයි අනුගමනය කරන්නේ. ඒ නිසා මෙහිදී අප නිසියාකාරව කටයුතු කරන්න අවශ්‍ය වෙනවා.

So, digitalization in freight forwarding, which would have connectivity to ASYCUDA et cetera is absolutely essential. Therefore, modernization and digitalization are required to put Sri Lanka on the map and to help overcome the problems we have in competing with our peer countries. Then, ඒ තුළින් වෘත්තියභාවයක් - professionalism - ඇති වෙනවා. මා හිතන්නේ අපි ඒක ස්ථාපිත කරන්න අවශ්‍යයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
So, I am looking forward to the modernization process.

Also, we should consider having the Sri Lanka Customs operating on a 24-hour basis. We have been

[ගරු රවී කරුණානායක මහතා]

requesting for that regularly, and the response from the Sri Lanka Customs has been that they are capable of operating 24 hours, but the other line authorities do not help them to do so. That is why we are asking you to bring the ASYCUDA system into operation. Also if the Department of Inland Revenue, commercial banks and other authorities involved in import regulation work online, it would help the Sri Lanka Customs to operate on a 24-hour basis. Today, I call upon the Government to ensure that it works. If we are to move forward to the next level, providing exporters with a trouble-free service and if we want to be competitive with the rest of the world, we must ensure that the Sri Lanka Customs operates on a 24-hour basis. Operating on a 24-hour basis does not mean that Customs Officers have to be in offices all that time, but that any shipment would be cleared immediately upon arrival. This is essential, if we are to move forward to the next level.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I know that time is restraint.

So, I would basically call upon the Government to ensure that we take this technology to the next level and that we move forward. That is a step in the right direction. Let us move forward and do away with all the antiquated laws such as the Customs Ordinance, which has been in place for the last 150 years. So, get it amended and take it to the next level.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය.

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු මුනීර් මුලාෆර් මහතා**
(மாண்புமிகு முனீர் முலாபர்)
(The Hon. Muneer Mulaffer)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රිසාඩ් බදියුදීන් මහත්මයා මගේ නම සඳහන් කළා. විශේෂයෙන්, මගේ දේශපාලන හෘදය සාක්ෂිය පිළිබඳව විමසා සිටියා. එතුමාගේ දේශපාලන හෘදය සාක්ෂිය පිළිබඳව නම් මේ රටේ ජනතාව හොඳින්ම දන්නවා කියලා මම හිතනවා. පසුගිය කාලයේ එතුමා කටයුතු කළේ කොහොමද කියලා ජනතාව දන්නවා. ඒ පාර සම්බන්ධව එතුමාම එකඟ වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ලබා දීපු නඩු තීන්දුවක් මා ළඟ තිබෙනවා. එතුමාට කියවා බලන්න කියා මේ අවස්ථාවේ මා එය **සභාගත*** කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.22]

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்றைய தினம் 78ஆவது சுதந்திர தினத்தைக் கொண்டாடிய இலங்கைப் பிரஜையாக அதிலும் குறிப்பாக, மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் பெண்ணாக இன்றைய தினம் இந்தச் சபையில் உரையாற்றுவதையிட்டு மிகவும் சந்தோச மடைகின்றேன்.

விசேடமாக, 1948ஆம் ஆண்டு சுதந்திரம் கிடைத்த போதிலும், 1949ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட குடியுரிமை சட்டத்தால் மலையக மக்கள் குடியுரிமையை இழந்தார்கள். சுமார் 78 வருடங்களுக்கு முன்னர், அதாவது சுதந்திரம் கிடைத்த காலத்திலே குடியுரிமை பறிக்கப்பட்ட, வாக்குரிமையை இழந்த மலையக சமூகத்தைப் பிரதிநிதித்துவப்படுத்தித்தான் இன்று நான் இங்கு பேசிக்கொண்டு இருக்கிறேன். சுதந்திரம் பெற்றும் கல்வி உரிமை உட்பட பல உரிமைகள் மறுக்கப்பட்ட சமூகத்திலிருந்து வந்த நான், மக்கள் போராட்டத்துக்குப் பின்னர் 2024ஆம் ஆண்டு உருவாக்கப்பட்ட தேசிய மக்கள் சக்தி அரசாங்கத்தோடு இணைந்து இருப்பதையிட்டு மகிழ்ச்சி அடைகின்றேன். மலையகச் சமூகத்துக்கு உண்மையான சுதந்திரம் எங்களுடைய ஆட்சிக் காலத்திலே கிடைத்தது என்று சொன்னால், அது மிகையாகாது. உண்மையான சுதந்திரத்தின் பிரதிபலனாகத்தான் மலையகத்திலிருந்து முதன்முறையாகப் பெண்கள் மக்கள் பிரதிநிதிகளாகப் பாராளுமன்றத்தில் வீற்றிருப்பதற்கு வாய்ப்புக் கிடைத்திருக்கிறது. இதுதான் உண்மையான சுதந்திரம்! இந்தச் சுதந்திரத்தை எங்களுடைய அரசாங்கம் பெற்றுக்கொடுத்து இருக்கின்றது. அன்று குடியுரிமை பறிக்கப்பட்டு எத்தனையோ பிரச்சினைகளுக்கும் போராட்டங்களுக்கும் முகங்கொடுத்த மலையக சமூகத்தின் பல பிரச்சினைகளை இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒரு வருடமும் மூன்று மாதங்களுக்குள் தீர்த்து வைத்திருக்கின்றது என்று நாங்கள் தைரியமாகச் சொல்லலாம்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

மலையகச் சமூகமானது, இவ்வளவு காலமாக ஓர் அடிமைச் சமூகமாக இருந்ததுடன், அரசியல்வாதிகள் அவர்களை வாக்கு வங்கியாகப் பயன்படுத்தி அரசியல் செய்துகொண்டும் ஆட்சி அமைத்துக்கொண்டும் இருந்தார்கள். அத்தகையதொரு நிலையில் இருந்த சமூகத்தினருக்கு இன்று தங்களுடைய பிரதிநிதிகள்மூலம் தங்களுடைய தேவைகளை நிறைவேற்றிக் கொள்வதற்கான, உரிமைகளைப் பெற்றுக்கொள்வதற்கான, இலங்கையில் இருக்கின்ற பெரும்பான்மைச் சமூகம் உட்பட ஏனைய சமூகங்களைப்போல கௌரவமான பிரஜைகளாக இந்த நாட்டில் வாழ்வதற்கான வாய்ப்பை இந்த அரசாங்கம் பெற்றுக்கொடுத்தது. அதனால்தான், 78ஆவது சுதந்திர தினத்தன்று உண்மையான சுதந்திரத்தைப் பெற்றுக்கொண்ட சமூகமாக மலையகச் சமூகம் காணப்படுகின்றது.

இத்தனை வருடங்களாக அவர்கள் கேட்டுக்கொண்டு இருக்கின்ற காணி உரிமையாக இருக்கட்டும், வீட்டுரிமையாக இருக்கட்டும், சம்பள உயர்வாக இருக்கட்டும், இவை அனைத்தும் இந்த ஒரு வருடமும் மூன்று மாத காலப்பகுதிக்குள் வழங்கப்பட்டு இருக்கின்றன. இவை பூரணமாகக் கிடைக்கா விட்டாலும், மலையகச் சமூகம் தேசிய நீரோட்டத்தோடு இணைக்கப்பட்டு, ஏனைய சமூகங்களுக்குக் கிடைக்கின்ற எல்லா வரப்பிரசாதங்களும் அவர்களுக்கும் கொடுக்கப் பட்டுக்கொண்டு இருக்கின்றன.

சில குறைபாடுகள் இருக்கத்தான் செய்கின்றன. எனினும், கடந்த 78 வருட காலமாக கல்வியிலும் அரசியலிலும் அரசியல் பிரதிநிதித்துவத்திலும் புறக்கணிக்கப்பட்டு பின்னடைந்து காணப்பட்ட சமூகமானது, இந்த ஒன்றரை வருட காலப் பகுதியில் பாரிய முன்னேற்றத்தை நோக்கிச் சென்றுகொண்டு இருக்கின்றது என்று சொன்னால் அது மிகையாகாது. அதுதான் உண்மை! இது போதுமா? என்று சிலர் இதையும் விமர்சிக்கலாம். எங்களுக்கு இன்னும் நான்கு வருடங்கள் இருக்கின்றன. இந்த முதல் வருடத்தில் நாங்கள் கைப்பற்றிக் கொண்ட வெற்றிகள் போதுமானவை. இதனையும் தாண்டி மலையக மக்களுக்குக் கௌரவமான வாழ்க்கை முறையைப் பெற்றுக்கொடுப்பதற்கான முயற்சிகளைச் செய்துகொண்டு இருக்கின்றோம். அதனையும் விரைவில் செய்து கொடுப்போம் என்பதும் உறுதியானது.

எங்களுடைய சமூகத்தின் அபிவிருத்தி வேலைத்திட்டங்கள் தொடர்பில் முக்கியமாகச் சொல்லவேண்டிய சில விடயங்கள் இருக்கின்றன. குறிப்பாக, பாதைகள் அபிவிருத்தி தொடர் பாகக் குறிப்பிட வேண்டும். இரண்டு மாதங்களுக்கு முன்னர், என்னுடைய தொகுதியில் e-libraryஐ ஆரம்பித்தோம். அதேபோல், mini-government ஒன்றையும் ஆரம்பித்தோம். இவ்வாறான வேலைத்திட்டங்களை மேற்கொண்டு எங்களுடைய இளைஞர்களுக்குத் தொழிற் பயிற்சிகளை வழங்க வேண்டும், எங்களுடைய சமூகத்தில் வாழ்கின்ற பிள்ளைகளுக்குக் கல்வியறிவைப் புகட்ட வேண்டும் என்ற நோக்கத்தோடுதான் நாங்கள் வேலை செய்துகொண்டு இருக்கின்றோம். அபிவிருத்தி வேலைத்திட்டங்களாக இருக்கட்டும், கல்வியாக இருக்கட்டும், தொழிற் பயிற்சியாக இருக்கட்டும், எல்லா விடயங்களிலும் எங்களுடைய மலையக சமூகத்தையும் இந்த அரசாங்கம் இணைத்துக்கொண்டு, முன்நோக்கிச் செல்வதற்கான வேலைகளைச் செய்துகொண்டு இருக்கின்றது.

විශේෂයෙන්ම කියනවා නම්, ආණ්ඩුවක් හැටියට කඳුකර ජනතාව ගැන අපි විශේෂයෙන්ම සලකපු අවුරුද්දක්, මේක. ඒ වාගේම 2024 පටන් ගත් මේ ආණ්ඩුව සමරපු දෙවන නිදහස් උත්සවය, මේක. "අවුරුදු 78කට පසුව සමරපු මේ නිදහස් උත්සවය තමයි කඳුකර ජනතාවගේ සැබෑ නිදහස් උත්සවය" කියලා කියනවා නම්, ඒක තමයි නිවැරදි. විශේෂයෙන්ම ඒ ජනතාවගේ සංවර්ධන වැඩ පිළිවෙළ වේවා, මාර්ග සංවර්ධන වැඩ පිළිවෙළ වේවා, ඒවා සිද්ධ වෙලා තිබෙනවා. මම කිව්වා වාගේ ඒ දරුවන්ගේ ජීවිත ඉහළ නංවනු පිණිස අපි e-library එකක් පටන් ගන්නවා. ඒකට මුල් ගල් තියලා අපි ඒක පටන් ගන්නවා. ඒගොල්ලන්ට වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් හරහා වෘත්තීය පුහුණුව ලබා දීමටත්, කඳුකර ජනතාව වෙසෙන ස්ථානවලම,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

හොඳයි.

ඒගොල්ලන්ට අවශ්‍ය කර්මාන්ත කරන්න පුළුවන් mini-government එකක් අපි පටන් ගන්නවා. ඒ වාගේම ජනතාවගේ ජීවන රටාව ඉහළ නංවමින්, විශේෂයෙන්ම ඒ ජනතාවට ගෞරවනීය ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කරනවා. කඳුකර ජනතාව නිරත වන දලු කැඩීම කියන්නෙත් වෘත්තියක්. ඒක හෑල්ලු කරන වෘත්තියක් නොවෙයි. ඒකත් වෘත්තියක් හැටියට සංවර්ධනය කරනවා වාගේම tourism පැත්තෙන්, ඒ වාගේම කර්මාන්ත පැත්තෙන් ආදී ලෙස සියලු ආකාරයෙන්ම මේ පැත්තේ ජනතාවගේ ජීවන රටාව ඉහළ නංවමින් ඒ ජනතාවටත් අනෙක් සියල්ලන්ටම වාගේ සලකන්නා වූ ආණ්ඩුවක් අපට ලැබී තිබෙනවා. ඒ ජාතික වැඩ පිළිවෙළ හරහා කඳුකර ජනතාවද, සියලු ජනතාවද එක ලෙස සලකන ආණ්ඩුවක් ලැබී තිබෙනවා. මේක තමයි කඳුකර ජනතාව ලබා ගත්තා වූ සැබෑ නිදහස; සැබෑ ජයග්‍රහණය. මේ අවුරුදු එකහමාර තුළ මෙච්චර ලොකු ව්‍යාපෘතියක්, වැඩ පිළිවෙළක් කරනවා නම්, තව අවුරුදු හතරක් ගත වෙලා මේ අවුරුදු පහ නිම වෙනකොට ලොකු ජයග්‍රහණයක් අත්පත් කර ගත්තා වූ, නිදහස ලබා ගත්තා වූ, නිදහස භුක්ති විඳින්නා වූ ජාතියක් හැටියට කඳුකර ජනතාවටත් නැඟී සිටින්නට පුළුවන් වෙයි. ඒ වාගේම පාර්ලිමේන්තුව තුළත්, ප්‍රාදේශීය සභා තුළත්, දේශපාලන අධිකාරීන් සම්බන්ධ වන ඒ සියලු ආයතන තුළත් කඳුකර ජනතාවගේ නියෝජිතයෝ බැබළෙනවා. ඒකට හොඳ මාර්ගයක් අපි විවෘත කර තිබෙන බව කියමින්, මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.31]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ප්‍රථමයෙන්ම, Institute of Real Estate Professionals, Sri Lanka Bill එක ගැන කථා කළොත්, මුලින්ම මේ ආයතනය සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ ආයතනයක්. පාර්ලිමේන්තු පනතක් තුළින් එය සංස්ථාගත කිරීම ඒ ආයතනයට ලොකු ගෞරවයක් හැටියට මම දකිනවා.

[ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2025 සැප්තැම්බර් මස 18වන දින ගැසට් පත්‍රයේ පළ කරන ලද පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත ගැන මට විශේෂයෙන්ම කථා කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. මෙම කෙටුම්පත ජනවාරි 20 දින න්‍යාය පුස්තකයට ඇතුළත් කරලා තිබෙනවා. මම මේ කෙටුම්පත දකින්නේ යකාගේ නීතියක් හැටියටයි. අපි දන්නවා, පදිංචිකරුවෙක් නීත්‍යනුකූල පදිංචිකරුවෙක් නම්, ඒ පුද්ගලයාට අපි ආරක්ෂාව සැපයිය යුතුයි කියලා. නමුත් මෙය සහාධිපත්‍ය දේපළක් හෝ නිවසක් කුලියට ගෙන මාස තුනක් හිටියා නම්, කුලී පැහැර හැරියත් ජලය, විදුලිය සහ අනෙකුත් පොදු පහසුකම් ලබා ගැනීමේ නෛතික තත්ත්වයක් ඒ නෛතික නොවන පදිංචිකරුවාට හිමි වීමේ පනතක්ය කියන කාරණය මෙහිදී කියන්නට ඕනෑ. එය ඉතාම භයානක තත්ත්වයක් කියලා මා හිතනවා.

අද වන විට අපේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය විශාල ප්‍රගතියක් ලබා තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම, සහාධිපත්‍ය දේපළ තුළින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල වර්ධනයක් ඇතිවෙලා තිබෙනවා. 2024 වර්ෂයේ දත්ත අරගෙන බැලුවොත්, දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 4ක් අපේ ඉදිකිරීම් ක්ෂේත්‍රය අත් පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම, සහාධිපත්‍ය දේපළ තැනීම තුළින් බදු වශයෙන් හැම ව්‍යාපාරයකින්ම සියයට 42ක් විතර ආණ්ඩුවට හිමි වෙනවා. ඒ නිසා, මම හිතන විධියට සහාධිපත්‍ය දේපළ තැනීමේදී ආණ්ඩුවට විශාල බදු ආදායමක් ලබා දෙනවා. අපේ රට කුඩා දූපතක්. අපි වාගේ කුඩා රටක නිවාස ප්‍රශ්නයට එකම විසඳුම සහාධිපත්‍ය ඉදිකිරීම් තුළින් විසඳිය හැකි බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ඒ වාගේම සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ගත්තාම, Apartment Ownership Law එක අනුව එම පනතේ විධිවිධාන තිබෙනවා, Condominium Management Authority එකට විදුලිය, ජලය, වැනි දේවල්වලට National Water Supply and Drainage Board එකට සහ CEB එකට ගෙවන්න. ඒ නිසා මේ පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත තුළින් සහාධිපත්‍ය දේපළවලදී Condominium Management Authority එක, විදුලි බිල සහ ජල බිල්පත් ඒ සහාධිපත්‍ය ඒකකය වෙනුවෙන් ගෙවනවා. ඒ වාගේම ගෙවල් හිමියාට වගකීමක් තිබෙනවා, මේ Condominium Management Authority එකට ගෙවන්න. හැබැයි, මේ කෙටුම්පත පනතක් වුවොත්, සහාධිපත්‍ය දේපළවල සිටින කුලී නිවැසියන් බදු පැහැර හැරියත් ජලය, විදුලිය සහ පොදු පහසුකම් ලබා ගැනීමේ වරම ඔවුන්ට තිබෙනවා. ඒ තුළින් ඉදිකිරීම් ක්ෂේත්‍රයට ලොකු පහරක් වදිනවා කියලා මම මේ අවස්ථාවේදී වගකීමකින් කියනවා. මේ පනත් කෙටුම්පත සැකසීමේදී, මෙයට වග කිවයුත්තෝ කවුද කියලා මම දන්නවා. අධිකරණ ඇමතිතුමා ඉතාම නිහතමානී ලෙස කියනවා, මෙම කෙටුම්පත පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරලා දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. මේ ක්ෂේත්‍රයේ නියැළී සිටින ව්‍යාපාරිකයන්, ඒ වාගේම ගෙවල් හිමියන්ට මේ සම්බන්ධයෙන් ලොකු භයක් ඇති වෙලා තිබෙනවා. මම හිතන විධියට, මෙම පනත් කෙටුම්පත සම්මත වුණොත්, කිසිම කෙනෙක් කැමැති වෙන්නේ නැහැ තමන්ගේ දේපළ කුලියට දෙන්න. ඒ නිසා ලොකු අවදානම් තත්ත්වයක් තිබෙනවා කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

අපි අද ඇමතිතුමාත් එක්ක මේ ගැන සාකච්ඡා කළා. මේ පනත් කෙටුම්පතේ පළමුවෙනි ප්‍රශ්නය වන්නේ නෛතික පදිංචිකරු කවුද කියන එක අර්ථ නිරූපණය කරලා නැතිකම. ඒ නිසා මේ පනත් කෙටුම්පත ප්‍රයෝජනයට ගෙන බදු ගිවිසුම උල්ලංඝනය කරමින් මුදල් නොගෙවා, විදුලියට සහ ජලයට නොගෙවා ගෙවල්වල කුලියට සිටින උදවියට උසාවියට ගිහිල්ලා අයථා ප්‍රයෝජන ගන්න පුළුවන්. හේතුව, මේ පනත් කෙටුම්පත අනුව බදුකරුවෙකුට එවැනි නෛතික අයිතියක් ලබා දෙනවා. හැබැයි අපේ රටේ නීතිය ප්‍රගතිශීලීයි. අපේ රටේ "wrongdoer principle" කියලා දෙයක් තිබෙනවා. ඒ කියන්නේ කිසිම කෙනෙකු තමන්ගේ වරදින් ප්‍රතිලාභ නොලැබිය යුතුයි කියන නෛතික සිද්ධාන්තය. නීත්‍යනුකූල නොවන විධියට බදු ගිවිසුමක් උල්ලංඝනය කළ පුද්ගලයකුට මේ කෙටුම්පතෙන් නෛතිකභාවයක් දෙනවා උසාවියට ගිහිල්ලා "මට විදුලිය දෙන්න, මට ජලය දෙන්න, මට පොදු පහසුකම් දෙන්න" කියන්න. ඒ නිසා තමයි මේ ක්ෂේත්‍රයේ ඉන්න අය මේ පනත් කෙටුම්පතට විරුද්ධව, මෙම කෙටුම්පතේ නෛතිකභාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහින් තිබෙන්නේ.

මෙම විෂය භාර ඇමතිතුමා වන අපේ අධිකරණ ඇමතිතුමා මෙම කෙටුම්පතේ ප්‍රශ්න සලකා බලලා, කතිකාවකට යොමු කරලා ඒ ප්‍රශ්න විසඳනවා නම් ඉතාම හොඳයි. හේතුව, මෙම සහාධිපත්‍ය දේපළවලට අදාළ associations පවා දැන් උසාවියට ගිහිල්ලා තිබෙනවා. අපට අවශ්‍ය මේ රටේ ඉදිරි ගමන නම්, මෙම කෙටුම්පත ගැන සලකා බලනකොට සහාධිපත්‍ය දේපළවල නියැළී ඉන්න අයට අත දෙන්න; සහාධිපත්‍ය දේපළවල ආයෝජනය කරන්න මිනිස්සුන්ට අත දෙන්න අපට වගකීමක් තිබෙනවා. හැබැයි, දැන් කෙනෙකුට ගෙයක් කුලියට දෙන්න භයක් සැකයක් ඇති වෙන, එවැනි වාතාවරණයක් තිබෙනවා. අපි දන්නවා විශ්‍රාම ගිය හුඟක් උදවිය ඒ අය වැඩ කරන කාලයේදී සහාධිපත්‍ය දේපළවල ආයෝජනය කරලා තිබෙන බව. ඒගොල්ලන්ගේ එකම ජීවන මාර්ගය ඒගොල්ලන්ට ලැබෙන ගෙවල් කුලිය. හැබැයි මෙම පනත් කෙටුම්පත තුළින් නීති විරෝධී ලෙස එම දේපළේ සිටින පුද්ගලයා අධිකරණයෙන් නෙරපා දමන තෙක් ඒ පුද්ගලයාට විදුලිය, ජලය සහ අනෙකුත් පහසුකම් ලබා දීමේ වගකීම ඇති කරනවා. අපේ පොදු නීතියට අනුකූලව කෙනෙකු නීති විරෝධී ලෙස යම් දේපළක සිටියත් බලහත්කාරයෙන් ඉවත් කරන්න බැහැ. ඒ වෙන ප්‍රශ්නයක්. හැබැයි, මේ ප්‍රශ්නය වෙනස්. බදු ගිවිසුමක් උල්ලංඝනය කළ හෝ බදු කාලයට පසු නීත්‍යනුකූල නොවන අන්දමින් යම් දේපළක සිටින පුද්ගලයකුට මෙම පදිංචිකරු ආරක්ෂා කිරීමේ නීතිය යටතේ රැකවරණය ලබා ගෙන නීති විරෝධී ලෙස ඒ දේපළෙහි සිටීමේ අවකාශය ලබා දෙනවා. ඒ නිසා, මෙම කෙටුම්පතට විශාල සංශෝධන ප්‍රමාණයක් අවශ්‍යයි කියා මම විශ්වාස කරනවා. විශේෂයෙන්ම නෛතික පදිංචිකරු කවුද කියන එක අපි අර්ථ නිරූපණය කරන්නේ නැත්නම්, මෙම කෙටුම්පතේ කිසිම හරයාත්මකභාවයක් නැති බව මම මේ අවස්ථාවේදී වගකීමෙන් ප්‍රකාශ කරනවා.

ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සාගරිකා අතාවුද මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) சாகரிகா அதாவுத அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) SAGARIKA ATHAUDA left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 3.40]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදයට ගැනෙන පනත් කෙටුම්පත් අතරින් විශේෂයෙන්ම ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත පිළිබඳව කාරණා කිහිපයක් කියන්න මම බලාපොරොත්තු වනවා. මේ තක්සේරුකරුවන්ගේ ආයතනය, නැත්නම් තක්සේරුකරුවන්ගේ ක්‍රියාවලිය තුළ තිබෙන ප්‍රධානම දේ තමයි, තක්සේරුකරණ උපාධිය.

තක්සේරුකරණ උපාධිය පළමුව 1972දී කොළඹ විශ්වවිද්‍යාලයෙන් පටන්ගෙන තිබුණා. කොළඹ විශ්වවිද්‍යාලයේ අවුරුද්දක කාලයක් පමණයි එය තිබුණේ. කොළඹ විශ්වවිද්‍යාලයෙන් පටන් ගත්ත මේ උපාධිය ලබා දීම 1973 වර්ෂයේ ඉඳලා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ගෙන ආවා. එහිදී විශේෂ උපාධියක් විධියට එම කටයුත්ත අලුතෙන් ආරම්භ කළා. පළමුවැනි මොහොතේදී සිසුන් 25ක් විතර -කුඩා ප්‍රමාණයක් - තමයි ඒ සඳහා ඇතුළත් කර ගන්නේ. එවැනි පිරිසක් ඇතුළත් කරගෙන විශේෂ තත්ත්වයක් යටතේ එම විශ්වවිද්‍යාලය මේ උපාධිය පිරිනැමුවා. එතකොට තක්සේරු උපාධියක් තිබෙන අයට එතැනින් එහාට තමන්ගේ තක්සේරු වෘත්තිය කරගෙන යන්න පුළුවන්. නමුත්, සමහර අය තක්සේරු වෘත්තිය කරනවා වෙනුවට වෙනත් රැකියා තෝරා ගත්තා. අපි දන්නවා, ඒ අතර ගුරු වෘත්තියට ගිය අය පවා ඉන්න බව. නමුත්, තක්සේරුකරණය පිළිබඳව ආයතනයක් තිබෙනවා. ඒ උපාධිය ලබා ගන්න අය ඒ ආයතනයේ ලියාපදිංචි වෙච්ච තක්සේරුකරුවන් බවට පත් වනවා. ඒ උපාධිය ලබා ගන්නා අය තක්සේරුකරණ ආයතනයේ සාමාජිකයින් බවට පත්වෙලා ලියාපදිංචි වුණාට පසුව ඒ අයට හිමිකමක් ලැබෙනවා, රජයේ සහ පෞද්ගලික අංශයේ ඕනෑම දේපළක් පිළිබඳව තක්සේරු කටයුතුවලට සම්බන්ධ වන්න. උපාධියක් ලබාගෙන විශ්වවිද්‍යාලයෙන් එළියට ඇවිල්ලා, වසර ගණනාවක් තිස්සේ තමන්ගේ වෘත්තීය දැනුම පාවිච්චි කරලා, එහෙම නැත්නම් ලබා ගත් අධ්‍යාපන සුදුසුකම පාවිච්චි කරලා, තමන්ගේ රැකියාව කරගෙන යන්න ඒ හැම කෙනෙක්ම උත්සාහ කරනවා. අපි දන්නවා, ඒ පිරිසෙන් කොටසක් රජයේ විවිධ තැන්වලට, විවිධ ආයතනවලට සම්බන්ධ වෙන්න පටන් ගන්න බව. ඒකේ ප්‍රධානම කණ්ඩායමක් නාගරික සංවර්ධන අධිකාරියට සම්බන්ධ වනවා. සමහර අය නගර සභා සහ මහනගර සභාවලට සම්බන්ධ වනවා. ඒ විධියට තමයි, තක්සේරුකරණ උපාධිය ලබා ගත් අය තමන්ගේ වෘත්තීය ජීවිතය ආරම්භ කරන්නේ. කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ, මේ ආයතනවල වෘත්තීය කටයුතුවලට සම්බන්ධ වුණු අය ඒ කටයුතු දිගින් දිගටම කරගෙන පාඩුවේ ඉන්නවා.

ඒ අතරතුරදී මේ සම්බන්ධයෙන් නැවත අදහසක් එන්නේ, මේ පනත් කෙටුම්පතට අදාළ ආයතනය ස්ථාපිත කරන්න ගියාට පස්සේ ඇති වුණු තත්ත්වය මතයි. එතකොට මේ ආයතනය ස්ථාපිත කළත් ගැටලුවක් ඇවිල්ලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මූලික ගැටලුව නිර්මාණය වන්නේ, මේ ආයතනය නිර්මාණය කිරීමත් එක්කම තක්සේරුකරණ ආයතනයේ, තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවය කරන අය දැනට කරන තක්සේරු කටයුතු, නාගරික සංවර්ධන අධිකාරියේ සේවය කරන අයටත් ලැබෙනවා කියන අදහසක් මේ පනත් කෙටුම්පත ගෙන ඒම තුළ සාකච්ඡාවීමත් එක්කයි. ඒ නිසා මේ පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා විවිධ අවස්ථාවලදී විවිධ යෝජනා ඉදිරිපත් කරලා, එහෙම නැත්නම් සාකච්ඡා කරලා, ඒ සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට තමයි පනත් කෙටුම්පතක් සකස් කර ගැනීම වෙනුවෙන් මේ ක්‍රියාවලිය ඉදිරියට ඇවිත් තිබෙන්නේ. ඒ විධියට මේ ක්‍රියාවලිය එනකොට විවිධ අදහස් ඉදිරිපත් කරමින්, විවිධ තැන්වලදී මේ පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා.

අපි දන්නවා, මෙවැනි පනතක් සම්මත කළාට පස්සේ ඒක නීතියක් බවට පත් වන බව. ඒ විධියට මෙය නීතියක් බවට පත් වුණාට පස්සේ, ඒ ආයතනනවල රාජකාරිවල යෙදිලා ඉන්න අයට වෘත්තීයමය ගැටලුකාරී තත්ත්වයක් නැවත නිර්මාණය වුණොත්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳවත් අවස්ථා කිහිපයකදී සාකච්ඡා කරලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපි දන්නවා මේකට අධිකරණ තීන්දුවක් ලැබී තිබෙන බව. මේ පනත් කෙටුම්පත හරහා මේ ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් යම් යම් අවස්ථාවල ගත්ත තීන්දු සම්බන්ධයෙන් අධිකරණයට ගිහිල්ලා, අධිකරණයෙන් යම් තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ඒ අධිකරණ තීන්දුවෙන් පස්සේ මේ සම්බන්ධව නැවත උපදෙස් මාලාවකුත් ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අධිකරණ තීන්දුවෙන් පස්සේ මේ දෙපාර්ශ්වය අතර, ඒ කියන්නේ මේ ආයතනය පිහිටුවූවාට පස්සේ ජාතික වෘත්තීය තක්සේරුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයින් සහ මේ අනෙකුත් කණ්ඩායම් අතර, එකම රාජකාරියක් කිරීමට අවස්ථාව දීම සම්බන්ධයෙන් ගැටුමක් ඇති විය හැකි යැයි කියන විශ්වාසය මත උපදෙස් කිහිපයක් දීලා තිබෙනවා. ඒ අනුව ශ්‍රී ලංකා තථ්‍ය දේපළ හා තක්සේරුකරුවන්ගේ වෘත්තීයමය පරිචය නිගමනය කිරීම සඳහා තථ්‍ය දේපළ හා තක්සේකරුකරණ ආයතනය ස්ථාපිත කිරීම, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂණය යටතේ සන්දේශයේ අමුණා ඇති පනත් කෙටුම්පත මත පදනම්ව, එම අරමුණ සඳහා සුදුසු නීති සම්පාදනය කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට දන්වා තිබෙනවා.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

එහිදී කියා තිබෙනවා, නිශ්චිත වශයෙන්ම එකම කාර්යය ආයතන දෙකකට, එහෙම නැත්නම් කණ්ඩායම් දෙකකට ලැබීමෙන් ඒ ආයතන දෙක අතර, එහෙම නැත්නම් කණ්ඩායම් දෙක අතර ගැටුමක් ඇති වෙන්න පුළුවන් කියන අදහස. මේ ආයතනය පිහිටුවීම පිළිබඳව කිසි ගැටලුවක් නැහැ. ඇත්තටම අපි විශ්වාස කරනවා, ඕනෑම කෙනෙකු තමන්ගේ වෘත්තිය කරගෙන යන අවස්ථාවේදී, තමන් ලබා ගත් දැනුම පාවිච්චි කරලා රටට සේවයක් කරන්න වැඩ කරගෙන යන අවස්ථාවේදී, ඒ කාර්යය වඩා හොඳින් කරගෙන යන්න, තමන්ගේ වෘත්තියට අදාළව රැකවරණය ලබා ගන්න, ඒ වාගේම තමන් විසින් අනුගමනය කරන නිශ්චිත ක්‍රියාවලට නීතිමය වටිනාකමක්, නිශ්චිත රාමුවක් හදාගන්න මෙවැනි ආයතනයක් ස්ථාපිත කිරීම පිළිබඳව ප්‍රශ්නයක් මතු වන්නේ නැහැ කියලා.

නමුත් අපි දන්නවා, ඒ ගැටලුව මතු වන්නේ මේ ආයතන දෙකට, එහෙම නැත්නම් වෘත්තීය කණ්ඩායම් දෙකට එකම වෘත්තීයමය කටයුත්තක් කරන්න අවස්ථාව දීම සම්බන්ධයෙන් කියන එක. එම නිසා තමයි දීර්ඝ කාලයක් සාකච්ඡා කරලා, අවස්ථා කිහිපයකදී මේ පිළිබඳව මැදිහත් වෙලා, ඒ මැදිහත් වුණු හැම අවස්ථාවකදීම මේ පිළිබඳව සංවාදයක් හැදිලා තිබෙන්නේ. ඒ නිසා අපි විශ්වාස කරනවා, අද සාකච්ඡා කරන පනත් කෙටුම්පතට අදාළව පිහිටුවන ආයතනය පිළිබඳව කාගේවත් විරෝධයක් නැහැ කියලා. ඒ වුණත් මේ ආයතනය නිර්මාණය කිරීම සඳහා සකස් කරන නීතිමය රාමුව නැත්නම්, මේ සකස් කරන පනත් කෙටුම්පතේ ඇතුළත් වන කරුණු පිළිබඳව නැවත සලකා බලමින් එහි යම් අඩුපාඩු තිබෙනවා නම් ඒවා සංශෝධනය කරමින්, මේ කණ්ඩායම් දෙක අතර ඉදිරියේදී හෝ නැවත ගැටුමක් ඇති නොවන්න, එහෙම නැත්නම් වෙනසක් ඇති වීම වළක්වා ගන්න මැදිහත් වෙන්න පුළුවන් මට්ටමට මේ පනත් කෙටුම්පත සංශෝධනය කරමින් මේ ආයතනය පිහිටුවිය යුතුය කියන තැන අපි ඉන්නවා. ඒ නිසා මම හිතනවා, ආණ්ඩුවක් හැටියට විශේෂයෙන් වර්තමානයේ අපේ ආණ්ඩුව පිළිබඳව සමාජය තුළ ගොඩනඟා තිබෙන විශ්වාසය තවදුරටත් තහවුරු කර ගන්න අපට පුළුවන්කම තිබෙන්න ඕනෑය කියලා.

අපි හදන නීතියක්, පනතක්, එහෙම නැත්නම් අපි ගොඩනඟන ආයතනයක තිබෙන ප්‍රශ්නයක් විසඳීම වෙනුවෙන්, එහෙම නැත්නම් රාජ්‍ය පාලනයට වඩා හොඳින් දායක කර ගැනීම වෙනුවෙන්, රාජ්‍ය පාලන ක්‍රියාවලියට ශක්තියක් ලබා දීම වෙනුවෙන් අපි මේ කටයුත්ත අනිවාර්යයෙන් කළ යුතුයි. හැබැයි, අපි එහෙම කරගන්න අසමත් වුණොත්, එහෙම නැත්නම් මේ තිබෙන තත්ත්වය ඇතුළේ මේ ආයතන, නැත්නම් ඒ කණ්ඩායම් අතර මතවාදයක්, එහෙම නැත්නම් ඒ අය අතර තිබෙන ක්‍රියාවලියේ යම් වෙනසක් හැදුණොත්, ගැටුමක් හැදුණොත් අපි ගත්ත තීරණය සම්බන්ධව ප්‍රායෝගික වශයෙන් යම් ගැටලුවක් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා මම හිතනවා, නිශ්චිත වශයෙන්ම මෙවැනි ආයතනයක් රටට අවශ්‍යයි කියලා. එවැනි ආයතන ශක්තිමත් කිරීමෙන් තමයි අපේ රජයේ වැඩ පිළිවෙළ, එහෙම නැත්නම් රජයේ කටයුතු සාර්ථකව ඉස්සරහට ගෙනියන්න පුළුවන් වෙන්නේ. ඒ වාගේම අපි මේ පනත් කෙටුම්පත මඟින් නිර්මාණය කරන ආයතනය පිහිටුවීමෙන් අතුරු ප්‍රශ්න පැන නඟිනවා නම් ඒවා වළක්වා ගැනීම වෙනුවෙනුත් මැදිහත් විය යුතුය කියන අදහසත් ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 29 (1) යටතේ අද මම වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න හැදුවා. නමුත් ගරු කථානායකතුමා ඒකට ඉඩ දුන්නේ නැහැ. ඒක සම්පූර්ණයෙන් වැරදියි. මීට පෙර ඉතිහාසයේ කවදාවත් මේ වාගේ තත්ත්වයක් පාර්ලිමේන්තුවේ ඇති වෙලා තිබුණේ නැහැ. ඒ නිසා පළමුවෙන්ම, අද මම ඉදිරිපත් කරන්න උත්සාහ දරපු වරප්‍රසාද ප්‍රශ්නය **සභාගත*** කරනවා.

ඊළඟට, එතුමාට විරුද්ධව චමින්ද කුලරත්න නියෝජ්‍ය මහ ලේකම්තුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබෙන පැමිණිල්ලේ පිටපතකුත් මම **සභාගත*** කරනවා.

මූලික විමර්ශනය සඳහා ගෙවීම්වලට අදාළ මේ චක්‍රලේඛය නිකුත් කරන්නේ 2025.10.24වැනි දා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්. එහිදී මූලික විමර්ශන වාර්තාව ඉදිරිපත් කිරීමට රුපියල් 4,000ක් සහ චෝදනා පත්‍ර පිළියෙළ කර ඉදිරිපත් කිරීම සඳහා රුපියල් 1,000ක් වශයෙන් රුපියල් 5,000යි ගෙවන්න පුළුවන්. නමුත් ගරු කථානායකතුමාගේ මේ වැඩ පිළිවෙළ යටතේ එතුමා මේකට ගෙවලා තිබෙනවා, රුපියල් 274,975ක මුදලක්. මම මේවා ගැන තමයි ප්‍රශ්න කරන්න බැලුවේ. විශේෂයෙන්ම එතුමා හිතාමතා කර තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳව ගත්තොත්, රාජ්‍ය දේපළ අවභාවිතය, රජයට මූල්‍යමය පාඩු සිදු කිරීම සම්බන්ධයෙන් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 111 වගන්තිය යටතේ "දූෂණය" යන වරදට ගැනෙන වැරදි විශාල සංඛ්‍යාවක් එතැන ඇතුළත් වෙලා තිබෙනවා.

අනෙක් කාරණයත් මම කියන්නම්. ඒක තමයි, රජයට අයත් නිල නිවාස දෙකක් නීති විරෝධී ලෙස භාවිත කිරීම. මේ යටතේ එතුමා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් ලෝරිස් පාරේ පිහිටි මහල් නිවාස සංකීර්ණයක නිවසක් එතුමාගේ නමට වෙන් කරගෙන තිබෙනවා. ඒ වාගේම කථානායක නිල නිවසත් එතුමා පාවිච්චි කර තිබෙනවා. නමුත් ඒක දෙන්න කිසිම අයිතියක් නැහැ, පාර්ලිමේන්තුවේ රැස් වන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශක සභාවට එතුමා කියලා තිබෙන විධියට. කැබිනට් මණ්ඩලය විසින් ගත්ත තීන්දුවක් අනුව උපලේඛනගත නිවාස යටතේ ලංකාවේ තිබෙන්නේ නිල නිවාස තුනයි. එකක්, ජනාධිපති නිල නිවස. අනෙක් එක, අග්‍රාමාත්‍ය නිල නිවස. ඊළඟ එක, කථානායක නිල නිවස. ඇත්තවශයෙන් මේ කථානායක නිල නිවස අපේ ආයතන සංග්‍රහය යටතේ තිබෙන නිල නිවසක්. ඒ වෙනුවෙන් මුදල් ගන්නේ නැහැ. ඒ නිසා මේ නිල නිවස කිසිම වෙලාවක කාගේවත් නමකට දෙන්න විධියක් නැහැ. ඉතින්, මම කනගාටු වෙන්නේ වෙන කාරණාවක් හින්දා නොවෙයි,

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ දූෂණය සම්බන්ධව තිබෙන කාරණා එක්ක මගේ යෝජනාව තිබුණේ වෙන එකක් නොවෙයි. මේ පැමිණිල්ල විභාග කරලා අවසන් වනතුරු එතුමා කථානායක ධුරයේ සේවයේ යෙදීමෙන් හා එතුමාගේ පෞද්ගලික

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ලේකම්වරයා එම ධුරයේ සේවයේ යෙදීමෙන් යම්කිසි විධියකින් වැළකී ඉන්න කියන ඉල්ලීම විතරයි අපි කරලා තිබෙන්නේ. මොකද, එවැනි

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මේ පුටුවේ තියා ගෙන අපිට තවදුරටත් වැඩ කරන්න බැහැ. ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට තමයි

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

රාශියක් එල්ල වෙන්නේ. ඒ නිසා අද එතුමාට මේකෙන් ගැළවෙන්න විවිධ කථා කියන්න පුළුවන්. නමුත්, ඇත්තවශයෙන්ම මම කියන්න කැමතියි, මේ ක්‍රියාදාමය තුළ එතුමා ඒ ගෞරවය විනාශ කරගෙන තිබෙනවාය කියන එක.

පාර්ලිමේන්තුවේ මමත් අවුරුදු 21කට වැඩිය ඉඳලා තිබෙනවා. කථානායකවරු විශාල සංඛ්‍යාවක් එක්ක අපි වැඩ කරලා තිබෙනවා. 1994 ඉඳලා අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. නමුත්, ඒ කිසිම අවස්ථාවක මෙවැනි තත්ත්වයක් මේ පාර්ලිමේන්තුවේ උද්ගත වුණේ නැහැ. මොකද, මේ ආණ්ඩුවේ පළමුවැනි කථානායකතුමාව එතුමන්ලාට ඉවත් කරන්න සිද්ධ වුණා. හැබැයි, අද

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තවදුරටත් පුටුවේ තියා ගන්න මේ ආණ්ඩුව ක්‍රියා කරමින් ඉන්නවා. ඇත්තවශයෙන්ම මේ ආණ්ඩුවේ සුජාතභාවය සම්පූර්ණයෙන්ම මේ ක්‍රියාදාමයත් එක්ක කෙලෙසිලා තිබෙන්නේ. මොකද, ආණ්ඩුව පුළුවන් තරම් උත්සාහ කරනවා, හොරකමෙන්, දූෂණයෙන් තොරව ඉතා ක්‍රමානුකූලව වැඩ කරන්න. හැබැයි, අපිට නායකත්වය දෙන මේ ඉහළ පුටුවේ ඉන්න

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තිබෙනවා. ඒවා නිකම්ම චෝදනා නොවෙයි. රාජ්‍ය දේපළ අවභාවිත කිරීම සම්බන්ධව චෝදනාවක් තිබෙනවා. අනෙක් පැත්තෙන්, තවත් චෝදනා ගණනාවක් තිබෙනවා. මෙවැනි චෝදනා තිබියදී එතුමාව මෙම ධුරයේ තබා ගැනීම මේ ආණ්ඩුවට බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ නිසා මම ගරු ජනාධිපතිතුමාගෙනුත්, මේ ආණ්ඩුවෙනුත් ඉල්ලන්න කැමතියි, කරුණාකරලා එතුමාට විරුද්ධව තිබෙන මේ චෝදනා විභාග කරලා අවසන් වනතුරු එතුමාට මේ ධුරයේ යෙදීමෙන් වැළකී ඉන්න ලෙස දැනුම් දෙන්න කියලා. මොකද, අපිට අනාගතයේ දී එතුමාත් එක්ක තවදුරටත් වැඩ කරන්න බැරිව යයි, මේ ක්‍රියාදාමයත් එක්ක. දැන් එතුමා කෙරෙහි තිබෙන ගෞරවය කෙලෙසිලා තිබෙන්නේ. මොකද, මේ වාගේ කාරණයක් පිළිබඳව එතුමාට තීන්දුවක් ගන්න තිබුණා, ඒ සම්බන්ධව අවශ්‍ය කරන ක්‍රියාමාර්ගය ගන්න. මට එදා අවස්ථාව දුන්නා නම් ඒ වැඩ පිළිවෙළ ඉදිරියට ක්‍රියාත්මක කරන්න තිබුණා.

ඊළඟට මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමතියි. "දී කිරට බළල්ලුත් සාක්කි ලූ" කිව්වා වාගේ කවුද අද මෙතැන කථා කළේ?

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මහත්මයා. එතුමා තමයි මේ කන්ටේනර් 323 නිකරුණේ යවලා ඇමතිවරයා විධියට කිසිම බලයක් නැතුව,- *[බාධා කිරීම්]* පොඩ්ඩක් ඉන්න. *[බාධා කිරීම්]* හිච්චි අම්මේ, පොඩ්ඩක් ඉන්න. මම මේ කාරණයත් කියන්න කැමතියි. *[බාධා කිරීම්]* කලබල වෙන්නේ නැතුව ඉන්න. ඔබතුමන්ලාට අමාරුයි තමයි. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාට අමාරුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට වැඩිපුරත් කාලය දුන්නා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථා කළේ කවුද? *[බාධා කිරීම්]* මොකක්ද? *[බාධා කිරීම්]* හරි, හරි. මට නඩු දමන්න. ප්‍රශ්නයක් නැහැ. මට නඩු දමන්න කියන්න. කලබල නැතුව ඉන්න මහත්තයෝ, ඔයිට වැඩිය හොරකම් දැන් මෙතැන කරලා තිබෙන්නේ. අද කථා කරන්නේ කවුද? තමන්ගේ ඇමති ධුරයත් නැති කර ගත්තා, ඒ කන්ටේනර් 323 පන්නපු එකෙන්. ඒ අය තමයි අද කථා කරන්නේ. ඒ නිසා මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගන්න කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.55]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කන්ටේනර් 323 පිළිබඳ කාරණය ගැන මේ ගරු සභාවේ කථා කරන නිසා මම පළමුවෙන්ම මේක කියන්න ඕනෑ. ඇත්තටම පාර්ලිමේන්තුව විසින් පත් කරන ලද විශේෂ කාරක සභාවක් තිබෙනවා, මේ කන්ටේනර් 323 සම්බන්ධව විපක්ෂයෙන් කරන ලද චෝදනාව සම්බන්ධයෙන් විමර්ශනය කරන්න. මට ඉස්සෙල්ලා කථා කරපු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් ඒ කන්ටේනර් සම්බන්ධව විමර්ශනය කරන්න පත් කර තිබෙන විශේෂ කමිටුවේ සාමාජිකයෙක්. එතුමන්ලා ඉල්ලපු හැටියට කමිටුවකුත් පත් කරලා, විමර්ශනය කරන්න ඒ මන්ත්‍රීතුමාව පත් කළාට පසුව එතුමාගේ වැඩේ තමයි, ඒ කමිටුවට සම්බන්ධ වෙලා ඒ කාර්යය කරන එක. එහෙම නැතුව නැවත මේ සභාවට ඇවිල්ලා ඒ ගැන අවලාද නඟන එක නොවෙයි එතුමා කරන්න ඕනෑ. වගකීමෙන් මම මේ කාරණය කියන්නේ. ඒ කමිටුවේ දී දෙන තීරණවලට ඔබතුමා බැඳී ඉන්නවා. ඔබතුමා මෙතැන ඇවිල්ලා විකාර කිව්වාට ඒ කමිටුවේ තීරණවලට බැඳී ඉන්නවා. ඒක ඔබතුමා තේරුම් ගන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
What is your point of Order? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වේලාව දෙන්න එපා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මගේ නම කිව්වා නේද?

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මොකක්ද, නම කිව්වාය කියන්නේ? ඔබතුමා කථා කළා කියලා නේ කිව්වේ. *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමු කාරණය ඒක. දෙවැනි කාරණය මේකයි. *[බාධා කිරීමක්]* මගේ වේලාව එතුමාට ලබා දෙන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමියට බාධා කරන්නේ නැහැ, කාන්තාවක් නිසා. ඒ නිසා ඔබතුමිය කථා කරගෙන යන්න. *[බාධා කිරීමක්]* අපි කලබල කරන්නේ නැහැ. මොකද, මම ඒ කමිටුවේ ඉන්නවා. මම කමිටුවේ අවශ්‍ය කරන වැඩ කටයුතු ටික කරන්නම්. මම කමිටුවේ ඒවා මෙතැන කථා කළේ නැහැ. ඔබතුමිය කථා කරගෙන යන්න. කලබල වෙන්න එපා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තාවක් නිසා කියලා කවුරුවත් මෙතැන සුවිශේෂී සැලකීම් ඉල්ලන්නේ නැහැ. කාන්තාවන් හැටියට අපි ඔය මන්ත්‍රීවරුන්ගෙන්, මහත්වරුන්ගෙන් ඉල්ලන්නේ ගරුත්වයක් ඇතුව හැසිරෙන්න කියන එක විතරයි. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඕනෑ නම් නැවත වෙලාව අරගෙන නැඟිටලා ඒ ගැන කියන්න. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කොහොමටත් ඒ ගැන පුරුද්දක් නැහැ කියන එක අපි දන්නවා.

දෙවැනි කාරණය මේකයි. මීට වඩා වැදගත් කාරණයක් ගැන අපි කථා කරන්නට ඕනෑ. ඊයේ අපේ රටේ නිදහස් දිනය. ලංකාවේ නිදහස් දිනය පෙබරවාරි 04වැනි දා. අද දවසේ අපේ රටේ ජාතික අභිමානය, නිදහස ගැන මම හිතන විධියට සමහර මන්ත්‍රීවරුන්ගෙන් වැරැදි කතන්දර විශාල ප්‍රමාණයක් කියැවුණා. ජාතිවාදයට සම්බන්ධ කරමින්, ඊයේ පැවති නිදහස් දිනයට අවලාද නඟමින්, අපේ ත්‍රිවිධ හමුදාව යම්කිසි අවතක්සේරුවකට ලක් කරමින් එතුමන්ලා මෙතැන කථා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කථා තුළින් තේරුම් ගන්නට ඕනෑ දෙයක් තිබෙනවා. ජාතිවාදය වෙනුවෙන් ඉතාම විශාල වන්දියක් ගෙවපු රටක තමයි අපි ජීවත් වෙන්නේ. අපට ඉතා විශාල වන්දියක් ඒ වෙනුවෙන් ගෙවන්න සිදු වුණා. අවුරුදු 30ක යුද්ධයක් හමුවේ අපේ ආර්ථික සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය, දේශපාලන, ආර්ථික ස්වෛරීත්වය ඉතාම නරක ලෙස හානි කර ගත් රටක තමයි අපි ජීවත් වෙන්නේ. ඒ වාගේම, අපේ රටේ ජාතීන් අතර තිබෙන සම්බන්ධතා ඉතා බරපතළ ලෙස හානි කර ගත් රටක තමයි අපි ජීවත් වෙන්නේ. එහෙම ජනතාව ජීවත් වන රටක දේශපාලන නායකත්වයට ලොකු වගකීමක් පැවරී තිබෙනවා. මොන පක්ෂයේ වුණත් එවැනි රටක දේශපාලන නායකත්වයට වගකීමක් තිබෙනවා, තවදුරටත් ජාතිවාදයට තිත තියන්න. සිංහල, දෙමළ, මුස්ලිම් කියන මොන පැත්තෙන් වුණත් නැඟී එන ජාතිවාදයට උදවු නොකරන, ඒක ප්‍රවර්ධනය නොකරන සහ ඒකෙන් වාසි නොගන්නා දේශපාලනයක් කිරීමට අපි හැමෝටම වගකීමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම කනගාටුදායක ලෙස අපේ විපක්ෂයේ සමහර පක්ෂ මේ වනකොටත් තමන්ගේ දේශපාලනය සැලසුම් කරන්නේ මේ රටේ මිනිසුන්ව බෙදන එකට. මේ රටේ මිනිසුන්ව ජාතීන් ලෙස, ආගම් ලෙස, සංස්කෘතික වශයෙන් බෙදන එකට තමයි මේගොල්ලන් දේශපාලනය සැලසුම් කරන්නේ. මෙතැනදී අපි මෙන්න මේ කාරණය තේරුම් ගන්න ඕනෑ. අපේ රටේ සමහර දේශපාලනඥයින් ඉන්නවා, සමහර දේශපාලන පවුල් ඉන්නවා, ඒ වාගේම සමහර දේශපාලන පක්ෂ තිබෙනවා, ඒගොල්ලන් පෙන්වන්න හදනවා අපේ ගම්වල ඉන්න, අපි හැමෝගේම පවුල්වල ඉන්න, අපි නියෝජනය කරන සිංහල බෞද්ධ ජනතාව කියන්නේ, ඔවුන්ගේ ජාතිවාදයට අහු වන, ඔවුන්ගේ මජර දේශපාලනයට අහු වන, ඔවුන් වාගේම හොරු කැලක් කියලා. සිංහල බෞද්ධ මිනිස්සු අන්දන එක තමයි මේගොල්ලන්ගේ දේශපාලනය; ඒක තමයි ඒගොල්ලන්ගේ දේශපාලනය. ඒක තමයි හැම දාම ඇවිල්ලා මෙතැන කරන්නේ. ඒ නිසා තමයි මේ සභාවේදී අපේ ස්වාමීන් වහන්සේලා සම්බන්ධයෙන් වාගේම අපේ සිංහල බෞද්ධ ජනතාව සම්බන්ධයෙන් කථා කරමින් ඉන්නේ. ඒගොල්ලන් සිංහල බෞද්ධ ජනතාවගේ එකම නියෝජිතයා වාගේ තමයි කථා කරන්නේ. අපි මෙතැනදී තේරුම් ගන්න ඕනෑ දේ මෙන්න මේකයි. ගම්වල අපිත් එක්ක ඉන්න දෙමළ, මුස්ලිම්, විශේෂයෙන් සිංහල බෞද්ධ ජනතාව ඒගොල්ලන් කියන ආකාරයේ, ඒගොල්ලන්ට උල්පන්දම් දෙන ආකාරයේ ජනතාවක් නොවෙයි.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා අද කථා කළා. හැම දාම වාගේ එතුමා දවල් වරුවේ තමයි කථා කළේ. එතුමා කථා කරනකොට පෙන්වන්න හදනවා, තමන් තමයි මේ රටේ ජාතිය වෙනුවෙන්, ආගම වෙනුවෙන් පෙනී සිටින්නේ කියලා. ස්වාමීන් වහන්සේලාට අපහාස කරන්න හොඳ නැහැ ලු. එතුමා තමයි ඒ ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පෙනී සිටින්නේ. කියන හැටියට එතුමා තමයි ඒ වෙනුවෙන් පෙනී සිටින්නේ. කවුද මේ පුද්ගලයා? මේ පුද්ගලයා අඩු ගණනේ ලංකාවේ දකුණු පළාතෙන් ඡන්දය ඉල්ලලා පාර්ලිමේන්තුවට එන්න බැරි වෙච්ච පුද්ගලයෙක්. මේ, දකුණේ සිංහල බෞද්ධ ජනතාවගේ ඡන්දයෙන් පාර්ලිමේන්තුවට එන්න බැරි වෙච්ච පුද්ගලයෙක්. අද ඔහු සිංහල බෞද්ධ ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ කොහොමද? සිංහල මිනිස්සු වෙනුවෙන් කොහොමද පෙනී සිටින්නේ? ඔහුට ඒ සඳහා කිසිම අයිතියක් නැහැ. මේගොල්ලන් විකාර කියවලා මිනිස්සු භේද කරලා, ඒ මිනිස්සු අතර ප්‍රශ්න ඇති කරලා, අන්තිමට ජාතික අභිමානය නොවෙයි, රට බංකොලොත් කළා. අපිව ලෝකය ඉස්සරහ දණ ගැස්සුවා. රටක් බංකොලොත් වෙනවා කියන්නේ, ලෝකය ඉස්සරහ දණ ගහනවා කියන එකයි. අපිවත් ලෝකය ඉස්සරහ දණ ගැස්සුවා. ඒ නිසා අදටත් අපට ඒකේ විපාකවලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා.

එහෙම තිබෙද්දී මේගොල්ලෝ තවත් ලජ්ජා නැතුව මෙතැනට ඇවිල්ලා සිංහල බෞද්ධකම target කරගෙන, දේශපාලනය කරන්න ලැහැස්ති වෙනවා. මේ රටේ සිංහල, බෞද්ධ ඇතුළු හැමෝම ඉන්නවා. ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරුන් විධියට සිංහල, බෞද්ධ, දෙමළ, මුස්ලිම් හැමෝම ඉන්නවා. අපි ජාතිවාදයට ඉඩ දෙන්නේ නැහැ. මේගොල්ලෝ කියන ආකාරයට මේ රටේ සිංහල මිනිස්සු හොරු නොවෙයි. මේ රටේ සිංහල මිනිස්සු මේගොල්ලෝ කියන ආකාරයේ මජර වැඩවලට සහාය දෙන මිනිස්සු නොවෙයි. ඒ මිනිස්සුන්ගේ කීර්ති නාමයයි මේගොල්ලෝ නැති කළේ. මේගොල්ලෝ බොරුවට සිංහල, බෞද්ධයන් වාගේ පෙනී ඉඳිමින් කරන්න පුළුවන් ඔක්කෝම හොරකම් කරනවා, කරන්න පුළුවන් ඔක්කෝම මැරකම් කරනවා, ත්‍රාඩකම්, මිනී මැරුම් ඔක්කෝම කරනවා. ඒවා කරන ගමන් සිංහල බෞද්ධයෝ වාගේ පෙනී ඉන්නවා. එහෙම සිංහල බෞද්ධයෝ ලංකාවේ නැහැ. අපේ රටේ මිනිසුන් ආචාරධාර්මිකයි, අනෙක් මනුස්සයා ගැන හිතනවා, යහපත්. "දිට්වා" ආපදාව වෙලාවේ අපි දැක්කේ මොකක්ද? අපේ රටේ සියලුම ජනතාව තමන් ගැන විතරක් නොවෙයි, අසල්වැසියා ගැනත් හිතනවා, අනෙක් මනුස්සයාගේ දුක ගැන හිතනවා, අනෙක් මනුස්සයාගේ දුක දැනෙනවා, අනෙක් මිනිස්සුන්ට ගරු කරනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ගෙනාපු අර අසභ්‍ය කතිකාව මෙතුමන්ලාට හකුළන්න වුණේ ඇයි? කථානායකතුමා ගැනත් දැන් ඒ වාගේ ප්‍රලාපයක් හදාගෙන යනවා. ඇයි, ඒක හකුළන්න වුණේ? ඇයි, ඒ අසභ්‍ය කතිකාව හකුළන්න වුණේ? මේ රටේ සිංහල, බෞද්ධ මිනිස්සු ඒකට විරුද්ධයි. අපේ රටේ ගම්වල ඉන්න අම්මලා ඒකට විරුද්ධයි, තාත්තලා විරුද්ධයි. මේගොල්ලන්ට ඒක හකුළා ගන්න සිද්ධ වුණේ ඒක නින්දායි. ඒ නිසා නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට සහ සිංහල මිනිසුන්ව, බෞද්ධ මිනිසුන්ව අන්දන්න එන මේ සභාවේ ඉන්න හැමෝටම අපි කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ රටේ උතුරේද, දකුණේද, නැගෙනහිරද, බටහිරද ඉන්න හැම වර්ගයකම, හැම ආගමකම, ජාතියකම ජනතාව ඡන්දය දීලා තිබෙන්නේ ජාතිවාදයට විරුද්ධවයි. ජාතිවාදයට විරුද්ධව දීපු ඡන්දයක්, මේක. සිංහල මනුස්සයාත්, දෙමළ මනුස්සයාත්, මුස්ලිම් මනුස්සයාත් තමන්ගේ ආත්ම ගරුත්වය වෙනුවෙන් දීපු ඡන්දයක්, මේක. ලෝකය ඉස්සරහ කෙළින් හිට ගෙන -බොරුවට රඟපාන්න නොවෙයි - ඇත්තටම කෙළින් හිටගෙන, දීපු ඡන්දයක්. අපි ආර්ථිකමය වශයෙන් ස්වෛරී වෙලා, දේශපාලනමය වශයෙන් ස්වෛරී වෙලා, සංස්කෘතිකමය වශයෙන් ඉහළ මිනිසුන් බවට පත්වෙලා, අනෙකාගේ අම්මාට, නංගිට, අක්කාට අගෞරව කරන්නේ නැති මිනිසුන් බවට පත්වෙලා, මොන ජාතියක්, මොන ආගමක් නින්දාවත් තමන්ගේ අසල්වැසියාට නොසලකා නොහරින, වෙනස්කම් නොකරන ජාතියක් බවට පත් වෙන්න දීපු ඡන්දයක්, මේක. ඒ මිනිසුන්ගේ ආත්ම ගෞරවය නැති කරන්න එපා. ඒ මිනිස්සු වෙනුවෙන් පෙනී ඉන්නවා වාගේ හැසිරිලා මෙතැන බොරුවට නටන්න එපා. අපි මේ මන්ත්‍රීවරුන්ට එක දෙයක් මතක් කරලා දෙන්න ඕනෑ. අපේ රටේ ත්‍රිවිධ හමුදාවත්, අපේ රටේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලාත් මේ ජාතිවාදයට අහු වෙන්නේ නැහැ. අහු වුණේත් නැහැ, අහු වෙන්නේත් නැහැ. ඔවුන්ට ආත්ම ගරුත්වයක් තිබෙනවා. ඔවුන්ට අනෙකා වෙනුවෙන් ගැහෙන, සහකම්පනයක් තිබෙන හදවතක් තිබෙනවා. ඒක ඒ මිනිසුන්ගෙන් අයින් කරන්න එපා.

මේගොල්ලෝ හිතාගෙන ඉන්නවා, මෙතැනට ඇවිල්ලා විකාර කියවලා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙතැනට ඇවිල්ලා විකාර කියවලා, ඒවා සමාජ මාධ්‍යවල ප්‍රචාරය කරලා, කුණුහරුප, අපහාස ප්‍රචාරය කරලා, අනික් මිනිසුන්ට අගෞරව වන ආකාරයේ දේශපාලන පණිවුඩ යවලා, මේ ගොල්ලෝ හිතනවා අපේ රටේ ජනතාව පාගන්න පුළුවන් කියලා. එහෙම කරන්න බැහැ. අපේ රටේ ජනතාව එහෙම පාගන්න පුළුවන් ජනතාවක් නොවෙයි. මේ රටේ සිංහල, බෞද්ධ, දෙමළ, හින්දු, මුස්ලිම් හැම මනුස්සයෙක්ම,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි 2ක කාලයක් ලැබී තිබෙනවා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ කාරණය මෙතැන අහගෙන සිටින හැමෝටම නැවතත් මම මතක් කර දෙන්න ඕනෑ. අපි දැක්කා නේ, ත්‍රිකුණාමලයේ සිංහල අම්මලා මොකක්ද ගිහිල්ලා කිව්වේ කියලා. එතැන නාඩගම් නටන්න එන මිනිස්සුන්ට කිව්වා, "මෙතැන විකාර කරන්නේ නැතුව යන්න" කියලා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට ඡන්දය ඉල්ලන්නවත් හයියක් තිබුණේ නැහැ. ඇයි ඒ? ඇයි, ඡන්දය ඉල්ලන්න බැරි? ඒක තමන් දන්නවා. තමන් දන්නවා, මේ රටේ ගම්වල සිටින සිංහල මනුස්සයෝ කවුද කියලා. තමන් දන්නවා, මේ රටේ ගම්වල සිටින බෞද්ධ මනුස්සයෝ කවුද කියලා. බොරුවට ඒ මිනිසුන්ව මහහැරලා, ඡන්දය ඉල්ලන්නේ නැතුව ඉඳලා, ඊට පස්සේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මෙතැන ලොකු කතන්දර කියන්න එනවා, තමන් ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් කථා කරනවා කියලා. අපේ රටේ බෞද්ධ ස්වාමීන් වහන්සේලා සම්බන්ධයෙන්, අපේ රටේ බෞද්ධ ජනතාව සම්බන්ධයෙන්, සිංහල ජනතාව සම්බන්ධයෙන්, ඔවුන්ගේ නියෝජනය සම්බන්ධයෙන් අප තුළ ලොකු ගරුත්වයක් තිබෙනවා. මේගොල්ලෝ නින්දා ලංකාවේ සාමාන්‍ය මිනිසුන්ගේ ආගමික ජීවිතය, සංස්කෘතික ජීවිතය විනාශ වෙලා තිබෙන්නේ.

බලන්න, අපේ රටේ දවසකට කොච්චර නම් අපචාර සිද්ධ වෙනවාද, කොච්චර හොරකම්, මැරකම් සිද්ධ වෙනවාද කියලා? මේ රට මේ තත්ත්වයට පත් වෙනකල් කවුද පාලනය කළේ? මේ රට සංස්කෘතිකමය වශයෙන් පිරිහෙන තත්ත්වයට පාලනය කරලා දැන් ඇවිල්ලා විවිධ දේවල් කියනවා. පෙබරවාරි 04වැනි දා "දිට්වා" සුළි කුණාටුව ගැන කිව්වා වාගේම කියන්න ඕනෑ, අපේ රටේ ත්‍රිවිධ හමුදාව "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේදී ඉතා විශාල කාර්යභාරයක් ඉෂ්ට කළා, රට සාමාන්‍යකරණය කිරීම සඳහා සහ අපේ රටේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා. ජනතාව ගලවා ගැනීම සඳහා ඔවුන් අතිවිශාල කාර්යභාරයක් ඉෂ්ට කළා. ඒ කාර්යභාරය වෙනුවෙන් අපි ඔවුන්ට ගෞරව දක්වන්න ඕනෑ නැද්ද? අපි ඒක මතක් කරන්න ඕනෑ නැද්ද? අපි පෙබරවාරි 04 සමරන්න ඕනෑ ඔවුන්ව අමතක කරලාද? එහෙම නැහැ. අපි ඔවුන්ට සලකන්න ඕනෑ, ඔවුන්ට ඒ ගෞරවය ලබා දෙන්න ඕනෑ.

ඒ වාගේම මේ රට ගොඩනැඟීම සඳහා, මේ රටේ ජනතාව අතර ජාතික සමඟිය ගොඩනැඟීම සඳහා, ජනතාව ඉදිරියට ගෙනයෑම සඳහා අපේ රටේ ත්‍රිවිධ හමුදාවට, අපේ රටේ ස්වාමීන්

[ගරු නිතිෂා ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

වහන්සේලාට - බෞද්ධ භික්ෂූන්ට, අපේ රටේ ජනතාවට, විශේෂයෙන්ම අපේ රටේ බහුතරයක් වන සිංහල, බෞද්ධ ජනතාවට විශේෂ වගකීමක් තිබෙනවා. එම නිසා අපි ඔවුන්ට ඉතාම කරුණිකව හා ගෞරවයෙන් ආයාචනා කරනවා, ඔබ ප්‍රතික්ෂේප කළ දේශපාලන සම්ප්‍රදාය දිගටම ප්‍රතික්ෂේප කරන්න කියලා. ඒ වෙනුවෙන් අපි පෙනී සිටිනවා. මේ රට තුළ නැවත ජාතිවාදයට හිස ඔසවන්න අපි ඉඩ දෙන්නේ නැහැ. නාමල් රාජපක්ෂලාට නැවතත් ජාතිවාදයෙන් දේශපාලනය කරන්න අපි ඉඩ තියන්නේ නැහැ. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.08]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමිය රාජපක්ෂලාගේ වැරදි රාශියක් කිව්වා. අපි ඒවා පිළිගන්නවා. අපට මතකයි, 2005දී එදා අපේ පක්ෂයේ නායකයා විධියට තරග කළේ රනිල් වික්‍රමසිංහ මහත්මයා බව. එදා අපට පෝස්ටරයක්වත් ගහන්න දුන්නේ නැහැ. ඔබතුමන්ලා, ඔබතුමියලා, අද ආණ්ඩුවේ සිටින සියලුදෙනාම එදා රාජපක්ෂලාට සහයෝගය දුන් නිසා තමයි ඔවුන් ලක්ෂ තුනකින් ඡන්දය දිනුවේ. ඉතින්, අද ආණ්ඩු පක්ෂයේ ඉන්න සියලුදෙනාම තමයි ඒ වැරදිවල කොටස්කාරයෝ වෙන්න ඕනෑ. 2005දී රාජපක්ෂලා ජයග්‍රහණය කරවන්න අපි කවුරුවත් කටයුතු කළේ නැහැ. මට මතකයි, පොළොන්නරුවේ රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පෝස්ටරයක්වත් ගහන්න අපට ඉඩ දුන්නේ නැහැ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පෝස්ටර් campaign එක සම්පූර්ණයෙන්ම දියත් කළේ ජනතා විමුක්ති පෙරමුණ. ඒක හොඳටම කළා. එදා එහෙම කරලා, රාජපක්ෂ මහත්මයා ලක්ෂ තුනකින් ජයග්‍රහණය කළා. අද ආණ්ඩු පක්ෂයේ සිටින ඇමතිවරු, මන්ත්‍රීවරු එදා රාජපක්ෂලාට සහයෝගය දුන්නේ නැත්නම් ඔවුන් දිනන්නේ නැහැ. මේ වෙලාවේ ඒ කාරණයත් මතක් කරන්න ඕනෑ.

ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ, විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ වෙනකොට සුඛෝපභෝගී වාහන 1,000කට වැඩි ප්‍රමාණයක් වරායට ඇවිල්ලා තිබෙනවා. එයින් රජයට විශාල මුදලක් අය කර ගන්න පුළුවන්. ලංකාවට වාහන ගෙන්වපු ව්‍යාපාරික නොවන 400ක පමණ පිරිසක් ඉන්නවා. ඒ වාහන අවුරුද්දක විතර කාලයක් වරාය තුළ තිබෙනකොට එක පැත්තකින් ඒ වාහන දිරලා යනවා. ඒ වාගේම, එම වාහනවල computerize කරපු කොටස් ඔක්කෝම විනාශ වෙලා යනවා. එම නිසා මම විශේෂයෙන් යෝජනා කරනවා, වරායේ තිබෙන එම වාහන 1,000 ගැන අවධානය යොමු කරන්න කියලා. විශාල මුදලක් වැය කරලා ඒ වාහන ගෙන්වපු ව්‍යාපාරිකයෝ මෙන්ම ව්‍යාපාරික නොවන විශාල පිරිසකුත් ඉන්නවා. රජය ඒ එක වාහනයකින් සියයට 300ක විතර බද්දක් අය කරනවා. ඒ සියයට 300ත්, තවත් සියයට 50කුත් බදු ගහලා දැන් ඒ වාහන එළියට දමන්න හදනවා කියලාත් කියනවා. ඒක සාධාරණ නැහැ. සාධාරණ බද්දක් අය කරලා ඒ වාහන ටික එළියට ගත්තොත්, රජයට විශාල මුදලක් අය කර ගන්නත් පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 ජනවාරි මාසයේ 19-21 බොට්ස්වානාවේ ගැබරෝන් නුවර පැවැති මානව-වනජීවී සහජීවනය පිළිබඳ ජාත්‍යන්තර පාර්ලිමේන්තු සම්මන්ත්‍රණයට ගරු විපක්ෂ නායකතුමාගේ නියෝජිතයෙකු විධියට මමත්, අපේ ගරු පරිසර නියෝජ්‍ය ඇමතිතුමාත් සම්බන්ධ වුණා. ඒක ඉතාම හොඳ වැඩසටහනක්. අප්‍රිකානු රටවල් 10කට ආසන්න සංඛ්‍යාවක පාර්ලිමේන්තු නියෝජනය කරන මන්ත්‍රීවරුන්, නිලධාරින් ඒ සම්මන්ත්‍රණයට සම්බන්ධ වුණා.

ඒ සම්මන්ත්‍රණයේදී සාකච්ඡා වුණේ, ඒ ඒ රටවල පවතින අලි-මිනිස් ගැටුම කෙබඳුද, අනෙකුත් වන සතුන්ගෙන් වගාවන් බේරා ගන්නේ කොහොමද, සංචාරක කර්මාන්තය දියුණු කරන්නේ කොහොමද කියන කරුණු පිළිබඳවයි. "අලි-මිනිස් ගැටුම නිසා අපේ රටේ වසරකට මෙපමණ අලි ප්‍රමාණයක් මිය යනවා, මිනිස් ඝාතන මෙච්චර ප්‍රමාණයක් සිදු වෙලා තිබෙනවා, දේපළ හානි සිදු වෙලා තිබෙනවා, මේක අවම කර ගන්නේ කොහොමද?" කියලා ඒ සාකච්ඡා පැවැති අවස්ථාවේ අපි ඇහුවා. ඒ අයට තිබෙන්නේත් අපට තිබෙන ප්‍රශ්නයම තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දකුණු ආසියාවේ වර්ධනය වන අලි-මිනිස් ගැටුම පිළිබඳ ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කරන යුරෝපා සංගමයට අනුබද්ධ ආයතනයක් වන Inter Pares ආයතනයත් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවත් ඒකාබද්ධව වැඩසටහනක් කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියා මම යෝජනා කරනවා.

මෙහිදී තවත් කාරණයක් කිව යුතුයි. දීර්ඝ කාලයක් තිස්සේ පවතින අලි-මිනිස් ගැටුම අවම කරන්න එස්.ඩබ්ලිව්. වික්‍රමරත්න මහත්මා යෝජනා ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ යෝජනාවලිය ඇතුළු ලේඛන කීපයක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා, ගරු පරිසර ඇමතිතුමාගේ දැනගැනීම සඳහා.

දේශපාලන වශයෙන් මොන කුමන්ත්‍රණ තිබුණත් මෙම අලි-මිනිස් ගැටුම අවම කර ගන්න නම් ජාත්‍යන්තරයේ උදවු ගන්න අපට සිදු වෙනවා.

අප මොන විධියේ අලි වැටවල් නිර්මාණය කළත් ඒවා සාර්ථක වෙලා නැහැ. ලෝකයේ අලි වෙසෙන අනෙක් රටවල් දිහා බැලුවත් අපට දැනගන්න ලැබුණේ මේ දේවල්මයි. මේ ප්‍රශ්න අවම කර ගන්න නම් මොනවා හරි වැඩ පිළිවෙළක් දියත් කරන්න අපට සිදු වෙනවා. ඒක මොකක්ද කියන එක තවම කවුරුවත් තේරුම් අරගෙන නැහැ. මේ රජය බලයට පත් වුණු ගමන්, අපේ රටේ අලි කොච්චර ඉන්නවාද, රිළවු කොච්චර ඉන්නවාද, වඳුරෝ කොච්චර ඉන්නවාද, මොනරු කොච්චර ඉන්නවාද කියලා ගණන් හැදුවත්, දැන් ඒවාට වෙච්ච දෙයක් නැහැ. දැන් නැවතත් පැවැති තත්ත්වයටම තමයි ඇවිත් තිබෙන්නේ. ඉතින් මම මේ නව රජයෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. අලි-මිනිස් ගැටුම අවම කර ගන්න නම් අපට ජාත්‍යන්තරයේ සහයෝගය ලබා ගන්න වෙනවා. අපේ ගරු පරිසර නියෝජ්‍ය ඇමතිතුමාත්, මමත් සහභාගි වුණු ඒ සම්මන්ත්‍රණය ඉතාම සාර්ථක වැඩසටහනක් කියලායි මා හිතන්නේ.

ඒ වාගේම, ජාතික වනෝද්‍යාන ගැනත් එහිදී කථා කළා. අප්‍රිකානු රටවල ජාතික වනෝද්‍යාන පරිහරණය වෙන්නේ කොහොමද කියන එක බොහොම සරල විධියට එහිදී අපට පැහැදිලි කරලා දුන්නා. අපේ රටේත් ජාතික වනෝද්‍යාන

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තිබෙනවා. විශේෂයෙන්ම යාල ජාතික වනෝද්‍යානය ගත්තොත්, මේ වන විට එහි සියලුම campsites ටික වහගෙන ඉන්නවා. ඒ වාගේම එහි Block 2 එකට යන්න බැහැ; ඒකත් වහගෙන ඉන්නවා. ඉතින්, සංචාරකයන් අපේ රටට එන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැමෝටම අවස්ථාවක් නැහැ, ජාතික වනෝද්‍යානයක් ඇතුළේ තිබෙන බංගලාවක් වෙන් කර ගන්න. ඒ නිසා තමයි ඒ campsites තිබෙන්නේ. මේ කාලය තමයි පරිසරය ලස්සනම කාලය. ඉතින් ඒ campsites ටික විවෘත කර තබන්න වෙනවා. රජයට තව මුදල් උපයා ගන්න අවශ්‍ය නම් ඒ campsites ටික අරින්න වෙනවා. ඒ වාගේම Block 2 එක අරින්න වෙනවා, ජාතික වනෝද්‍යානයක් විධියට කුමන පැත්තට යන්න. මේ වනකොට යාල වනෝද්‍යානයේ Block 2 එක සතුන් දඩයම් කරන අයගේ පාරාදීසයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ, කිසිම සංචාරකයෙකුට යන්න දෙන්නේ නැති නිසා. ඒ නිසා මම යෝජනා කරනවා, එහි Block 2 එක ඇරලා, ඒ campsites ටික ඇරලා අපේ රටේ තිබෙන ජාතික වනෝද්‍යාන ටික හරි විධියට ක්‍රියාත්මක කරන්න කියලා. ඒ ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි, ඔබ සියලු දෙනාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගීතා හේරත් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.15]

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. අද දවසේ විවාදයට ගනු ලබන ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කරුණු දක්වන්න මා කැමැතියි. අපේ රටේ විවිධ වෘත්තීන්ට අදාළ ආයතන තිබෙනවා. ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ වෘත්තීමය ආයතනයක් පිහිටුවා ගැනීමේ අවශ්‍යතාවෙන් තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම ගත්තාම, මේ තුළින් කිසිම වෘත්තියකට අසාධාරණයක් කිරීමට අපි අපේක්ෂා කරන්නේ නැහැ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් 1972 වර්ෂයේ සිට දේපළ කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳව විද්‍යාවේදී උපාධි පාඨමාලාවක් ආරම්භ කරලා, එය මේ වනකොට පවත්වාගෙන යනවා. එය විශේෂයෙන්ම තථ්‍ය දේපළ කළමනාකරණය, දේපළ සංවර්ධනය සහ දේපළ තක්සේරු කිරීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් තථ්‍ය දේපළ කර්මාන්තයේ වෘත්තීමය අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණය කරපු පාඨමාලාවක්.

ඒ කොහොම නමුත්, 2008 වර්ෂයේදී තථ්‍ය දේපළ සහ දේපළ තක්සේරු කරන ආයතනය සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබෙනවා. ඒත් එක්කම, තක්සේරුකරුවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය නමින් ආයතනයක් පිහිටුවා තිබෙනවා. මේ ආයතන දෙක අතර නිසි නියාමනයක් නොමැති වීම නිසා ගැටුම්කාරි තත්ත්වයන් උද්ගත වෙලා අධිකරණයට පවා ගිහිල්ලා තිබෙනවා. ඒ කොහොම නමුත්, ඒ ආයතන දෙක අතර නිසි නියාමනයක් සඳහා නීතිමය රාමුවක අවශ්‍යතාවක් තිබෙන නිසා ඒ අරමුණින් අපි මේ වනකොට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ තථ්‍ය දේපළ හා තක්සේරු වෘත්තිකයන්ගේ වෘත්තීමය පරිචය නියාමනය සඳහා ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය ස්ථාපිත කිරීමේ අරමුණින් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම මඟින් එක් පැත්තකින් තථ්‍ය දේපළ අංශයේ වෘත්තීමය ප්‍රමිතියක් හා ආචාරධර්ම ප්‍රවර්ධනයක් අපේක්ෂා කරනවා. අනෙක් අතට, ඵලදායී දේපළ කළමනාකරණයක් අපේක්ෂා කරනවා. තක්සේරුකරුවන් ගත්තාම, වෙළෙඳ පොළ වටිනාකමට අනුව තක්සේරු කිරීමක් තමයි ඔවුන් සිද්ධ කරන්නේ. හැබැයි එතැනින් එහා ගිය කාර්යභාරයක් මෙම තථ්‍ය දේපළ වෘත්තිකයන් අතින් සිදු වෙනවා. මොකද, යම් දේපළක් ගත්තාම, වසර 10ක, 15ක ඉදිරිය ගැන සලකා බලා ආර්ථිකමය වශයෙන්, එහෙම නැත්නම් ආයෝජන තුළින්, එහෙම නැත්නම් සංවර්ධන ව්‍යාපෘති තුළින් ඒ දේපළ සම්බන්ධයෙන් කොයි ආකාරයේ තක්සේරුවක් කරන්න පුළුවන්ද, එහෙම නැත්නම් එය ආර්ථිකයට කොයි ආකාරයෙන් දායක කර ගන්න පුළුවන්ද යන කාරණා පිළිබඳව තක්සේරුවක් ලබා ගන්න අපට පුළුවන්, තථ්‍ය දේපළ වෘත්තිකයන් වෙතින්.

ශ්‍රී ලංකාව තුළ මේ තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ අංශය ආර්ථික වර්ධනයේ ප්‍රධාන ධාවකයකු විධියට කටයුතු කරනවා. ඒ වාගේම ඉදි කිරීම්, නිවාස, දේපළ ආයෝජන හරහා ඔවුන් දළ දේශීය නිෂ්පාදිතයටත් දායකත්වයක් සපයනවා. අනෙක් අතට ඔවුන් රැකියා උත්පාදනයක් ද කරනවා. ඉහළ යන නාගරීකරණයත් එක්ක දේශීය, විදේශීය ආයෝජන වැඩි කර ගැනීම සඳහාත් ඔවුන්ගේ සක්‍රිය දායකත්වය උපයෝගී කර ගන්න අපට පුළුවන්.

ඒ වාගේම, නිසි නීතිමය රාමුවක් නොමැති නිසා තථ්‍ය දේපළ අංශයේ විනිවිදභාවයක් නොමැති වීම, අවිධිමත් මෙහෙයුම්, නියාමන ආයතනයක් සහ නීතිමය රාමුවක් නොමැති වීම නිසා ඇති වන මුදල් විශුද්ධිකරණයන් වැනි තත්ත්වයන්, අක්‍රමිකතා මේ ක්ෂේත්‍රයේ බහුලව සිදු වෙනවා, මේ හිඩැස් තිබෙනවා කියන එක මූල්‍යමය බුද්ධි ඒකක විසින් හඳුනාගෙන තිබෙනවා. මේ ගැටලුවලට විසඳුමක් ලබා දීමත්, නිසි නීතිමය රාමුවක් ස්ථාපිත කිරීමත් අරමුණු කරගෙන, මේ ක්ෂේත්‍රය තුළ නිසි නියාමනයක අවශ්‍යතාව පැනනැඟිලා තිබෙන නිසා මේ පනත් කෙටුම්පත මේ ආකාරයට ඉදිරිපත් කර තිබෙනවා. අනෙක් අතට, ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා දායකත්වයක් සපයා ගැනීම, ඒ වාගේම තිරසාර සංවර්ධනය වෙනුවෙන් ආයෝජන දිරිගැන්වීම, ආයෝජකයන් තුළ විශ්වාසය ගොඩනැංවීම, තථ්‍ය දේපළ දත්ත යටිතල පහසුකම් සංවර්ධනය, වෘත්තීය පිළිගැනීම සහ සුබසාධනයක් ඇති කිරීම වැනි සමාජ ආර්ථික බලපෑම් ඇති කිරීමටත් මෙවැනි වෘත්තීමය ආයතනයක් ව්‍යවස්ථාපිතව පිහිටුවා ගැනීම තුළින් අපට හැකියාව ලැබෙනවා.

ඒ පනත් කෙටුම්පතට අමතරව, කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පතත් අද දවසේදී විවාදයට ගනු ලබනවා. කන්ටේනර් ඩිපෝ ක්‍රියාකරුවන් සේවා සැපයුම්කරුවෙකු ලෙස නියාමනය කිරීමක් එමඟින් අපේක්ෂා කරනවා.

[ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගනු ලබන තුන්වැනි එක තමයි, නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ (සංශෝධන) පනත් කෙටුම්පත. මේ කටයුතු සඳහා විධිමත් නියාමන පද්ධතියක අවශ්‍යතාවක් තිබෙන නිසා තමයි මෙවැනි පනත් කෙටුම්පත් ඉදිරිපත් කර තිබෙන්නේ, විශේෂයෙන්ම වේගවත් ආර්ථික වර්ධනයක් කරා යන ගමන තුළ. මොකද, කඩා වැටී තිබුණු රටක් ගොඩ ගැනීම වෙනුවෙන් අපේ ආණ්ඩුව කටයුතු කරමින් සිටින අවස්ථාවක, මේ පනත් කෙටුම්පත් අපේ ඉලක්ක සපුරා ගැනීම සඳහා බොහෝ ඵලදායී වෙනවා කියලා මම මේ සභාවට කියන්න කැමැතියි.

ඇත්තටම මම මුලිනුත් සඳහන් කළා වාගේ කඩා වට්ටලා තිබුණු රටක් නැවත ගොඩ ගැනීම සඳහා ජනතාව අපට විශාල වරමක් ලබා දුන්නා. අපි ආණ්ඩුවක් විධියට ඒ අභියෝගය භාර ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගත වුණු 2025 වසර දිහා ආපසු හැරී බැලුවොත්, ජනතා බලාපොරොත්තු ඉෂ්ට කිරීම වෙනුවෙන් අපි සැලකිය යුතු කාර්යභාරයක් එම වසර තුළ සිද්ධ කර තිබෙනවා. ඒ වෙනුවෙන් ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය ඇතුළු ආණ්ඩුවේ සියලු බලධාරින් තීරණාත්මක පියවර රැසක් ගෙන තිබෙනවා.

විශේෂයෙන්ම මෙතැනදී මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. ඒ තමයි, අපි ආණ්ඩු බලය ලබා ගන්නා අවස්ථාව වන විට මේ රටේ තිබුණු දූෂිත දේශපාලන සංස්කෘතිය අපි මේ වනකොට වෙනස් කර තිබෙන බව. අපට ඒ ගැන සතුටු වෙන්න පුළුවන්; ජනතා බලාපොරොත්තු ඉෂ්ට කළා කියලා අපට සතුටු වෙන්න පුළුවන්. අනෙක් අතට නීතියේ අධිපත්‍යය තහවුරු කිරීමටත් ආණ්ඩුවක් විධියට අපි සමත් වෙලා තිබෙනවා. ඒත් එක්කම මූල්‍ය විනය පවත්වා ගෙන යමින් සාර්ව ආර්ථිකය ස්ථාවර කරන්නත්, රාජ්‍ය ආයතන ශක්තිමත් කරමින් විනිවිදභාවයකින් යුතුව කටයුතු කරන්නත් අපි සමත් වෙලා තිබෙනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, අපි 2026 වසරට අදාළ අය වැය ඉදිරිපත් කරමින් සිටියදී තමයි "දිට්වා" සුළි කුණාටුව නිසා අපේ රට ව්‍යසනයට පත් වුණේ කියන කාරණයත්. ඒ අවස්ථාවේදී අපි ඒ ආපදාව කළමනාකරණය කරමින් ශක්තිමත්ව ඒ තත්ත්වයට මුහුණ දුන්නා. එම ආපදාවෙන් සිදු වූ හානිය යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා අපි රුපියල් කෝටි 50,000ක විශාල මුදල් ප්‍රමාණයක් පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් වෙනමම වෙන් කර තිබෙනවා. මේ වනකොට ඒ වැඩ කටයුතු කරගෙන යනවා. විශේෂයෙන්ම ආපදා කළමනාකරණයත්, දීර්ඝ කාලීන යටිතල පහසුකම් සංවර්ධනයත් වෙනුවෙන් අපි මැදිහත් වෙමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මේ දසවැනි පාර්ලිමේන්තුව තමයි කාන්තා නියෝජනය වැඩියෙන්ම තිබෙන පාර්ලිමේන්තුව කියලා. අගමැතිතුමිය ඇතුළුව මන්ත්‍රීවරියන් 22ක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඉන් මන්ත්‍රීවරියන් 20ක් ආණ්ඩු පක්ෂය නියෝජනය කරනවා. නමුත් කනගාටුවට කාරණයක් තිබෙනවා. ඒ තමයි, අපි මේ විධියට දේශපාලනයට ඇවිල්ලා කාන්තාවන් නියෝජනය කරමින් පාර්ලිමේන්තුවේ සිටියදී, බොහෝ වෙලාවට විපක්ෂයෙන් කාන්තාවන් හිංසනයට ලක් වන ආකාරයේ ප්‍රකාශ සිද්ධ කිරීම. ඔවුන් සමාජ මාධ්‍ය ඔස්සේ විවිධ මඩ ප්‍රහාර එල්ල කරනවා. ඇත්තටම අපි ඒක තරයේ හෙළා දකිනවා. ඒ විතරක් නොවෙයි. ඔවුන් පාර්ලිමේන්තුව තුළදී කරන ප්‍රකාශවලින් පාර්ලිමේන්තුවෙන් පිටත ඉන්න කාන්තාවන් පවා හිංසනයට ලක් වනවා. අපි ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගත යුතු වනවා. නැත්නම් මේවා වැරදි පූර්වාදර්ශ විධියට දිගින් දිගටම මේ විධියට සිද්ධ වන්න පුළුවන්. මොකද, අපට ඊට එරෙහිව කථා කරන්න අවස්ථාව තිබුණත්, පාර්ලිමේන්තුවෙන් පිටත ඉන්න කාන්තාවන්ට තමන්ට වන හිංසනය වෙනුවෙන් කථා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට වෙන් කර තිබෙන කාලය අවසානයි.

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) கீதா ஹேரத்)
(The Hon. (Mrs.) Geetha Herath, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව එක කාරණයක් ගැන සඳහන් කරලා කථාව අවසන් කරන්නම්. විශේෂයෙන්ම විපක්ෂයට ආණ්ඩුවේ වැඩ පිළිවෙළ විවේචනය කරන්න අවස්ථාවක් නැහැ, මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ තුළ අඩුපාඩු නැති නිසා. ඒ නිසා ඔවුන් සමාජ මාධ්‍යවලින් ආණ්ඩුවට පහර එල්ල කරන විධියක් තමයි අපට දක්නට ලැබෙන්නේ. ඊයේ දිනයේදී අපි නිදහස් දින උත්සවය සැමරුවා. කඩා වැටුණු අවස්ථාවල අපට නැවත නැඟී සිටින්න ඒ දිනය ශක්තියක් කර ගන්න පුළුවන්. අපේ ආණ්ඩුව ශක්තිමත් අඩිතාලමක් මත සංවර්ධන වැඩසටහන් එක්ක ඉදිරියට යනවා කියන කාරණයත් මතක් කරමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.24]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற கொள்கல நிலையத் தொழிற்படுத்துநர்களுக்கு உரிமமளித்தல் சட்டமூலம், கப்பற்றொழில் முகவர்களுக்கு, சரக்கு அனுப்புநர்க்கு, கலன் செயற்படுத்தப்படாப் பொதுக் காவுநர்க்கு மற்றும் கொள்கலம் செயற்படுத்துநர்க்கு உரிமமளித்தல் (திருத்தம்) சட்டமூலம் என்பன தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு சந்தோஷமடைகின்றேன். மேற்குறித்த சட்டமூலங்களில் உள்ளடங்குகின்ற தொழில்முகவர்களுக்கு இருக்கின்ற பிரச்சினைகளை அடையாளப்படுத்தி, அவர்களுக்குரிய உரிமங்களை வழங்குவதனூடாக அவர்களுடைய தொழில்களை இலகுபடுத்தலாம். மேலும், இது இவற்றை system ஒன்றுக்குள் கொண்டுவருவதற்கான ஏற்பாடும்கூட. அந்த வகையில், இந்த முயற்சிக்கு எனது பாராட்டுக்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று காலையில் நான் நிலையியற் கட்டளை 27(2) இன்கீழ் கேட்ட கேள்விக்கு கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள் சாதகமாகப் பதில் வழங்கியிருந்தார்.

மன்னார்-புத்தளம் பாதையைப் பயன்படுத்த இயலாது என்று நீதிமன்றத் தீர்ப்பு வழங்கப்பட்டுவிட்டது என்று எமது பகுதியில் மக்கள் மத்தியில் குழப்பநிலை ஏற்பட்டிருந்தது. இது ஒரு settlementதான். அதாவது, இணக்கப்பாட்டுடனான ஒரு முடிவுதான் எடுக்கப்பட்டு இருக்கிறதே தவிர, இதை ஒரு தீர்ப்பாகக் கருதவேண்டிய தேவைப்பாடு எதிர்வரும் காலங்களில் வராது என்றும், அதற்கு ஏற்றாற்போல் இது சம்பந்தமாக சம்பந்தப்பட்ட அமைச்சரோடும் ஏனைய அனைத்துத் தரப்புகளோடும் ஒன்றிணைந்து சாதகமான ஒரு முடிவை எடுப்பதாக கௌரவ அமைச்சர் அவர்கள் கூறியிருந்தார். அதற்காக அவருக்கு நன்றி கூறுகின்றேன்.

இந்த விடயத்துக்குச் சாதகமான முடிவைப் பெற்றுத்தர முனையும்போது, இச்சபையில் மறுபடியும் விதண்டாவாதமாகப் பேசி, இப்பாதையைத் திறக்காமலே இருப்பதற்குரிய ஏற்பாடுகளைச் செய்யாமல், அரசு எப்படி இந்த விடயத்தைச் சாதகமாகப் பரிசீலிக்கின்றதோ, அதற்கேற்றாற்போல நாங்களும் அதற்கு எமது முழு ஆதரவையும் கொடுக்க வேண்டும். அந்த வகையில், இந்த வீதியை ஒரு பிரதான வீதியாக மாற்றிப் பாவிப்பதற்குரிய நடவடிக்கைக்கு அவர்கள் வழங்கும் ஒத்துழைப்பை நாங்கள் சரியாகப் பயன்படுத்திக்கொள்ள வேண்டுமென இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

78ஆவது சுதந்திர தின நிகழ்வில் மாண்புமிகு சனாதிபதி அவர்கள் மிக அழகாக உரையாற்றி இருந்தார். குறிப்பாக, கடந்த காலங்களில் தெரிவிக்கப்பட்ட கருத்துகளுக்கு மாறுபட்ட விதத்தில் அவர் உரையாற்றியிருந்தார். கடந்த 76 வருட காலத்தில் மேற்கொள்ளப்பட்ட செயற்பாடுகள் பிழையானவையெனச் சுட்டிக்காட்டப்பட்டது.

"இந்த ஆட்சியில் நல்லவையும் நடந்திருக்கின்றன; தீயவையும் நடந்திருக்கின்றன; நாங்கள் நல்லவற்றை வரவேற்று, தீயவற்றைத் திருத்திக்கொண்டு முன்னோக்கிச் செல்வோம்" என்று சனாதிபதி அவர்கள் கூறியிருந்தார். உண்மையிலே இது பாராட்டக்கூடிய விஷயமாகும். இப்போதைய நிலையில் இதுதான் நல்லது. ஏனென்றால், அன்று சுதந்திரம் கிடைக்கும்போது இருந்த நாட்டின் நிலைமையைவிட, இன்றைய நிலைமை நல்லது. பிரச்சினைகளுக்கு மத்தியிலும் அபிவிருத்திகள் நடைபெற்றிருக்கின்றன. ஒருசிலர் செய்த பிழைகளுக்காக எல்லா மக்களையும் தண்டிக்கும் விதத்தில்தான் கடந்த தேர்தல் முடிவுகள் அமைந்திருந்தன. நல்லவற்றைப் பாராட்டி, தீயவற்றைத் திருத்திக் கொண்டு முன்னோக்கிச் செல்வோம் என்ற மாண்புமிகு சனாதிபதியின் முயற்சிக்கு என்னுடைய ஆதரவு கட்டாயம் இருக்கும். அந்த வகையில், அந்த முயற்சி வெற்றிபெற வேண்டுமென நான் வாழ்த்துகின்றேன்.

அடுத்து, இன்று தொண்டர் ஆசிரியர்களுடைய பிரச்சினை பாரிய பிரச்சினையாக இருக்கின்றது. 2019ஆம் ஆண்டு Cabinet அனுமதி பெறப்பட்டு, interview நடத்தப்பட்டே அவர்களுக்குரிய நிரந்தர நியமனம் வழங்கப்பட்டது. எனினும், சில தொண்டர் ஆசிரியர்கள் விடுபட்டு இருக்கிறார்கள். குறிப்பாக, வட மாகாணத்தில் 60 பேரும் கிழக்கு மாகாணத்தில் 193 பேருமென மொத்தம் 253 தொண்டர் ஆசிரியர்களுக்கு நிரந்தர நியமனம் வழங்கப்படாமல் இருக்கின்றது. யுத்தம் முடிந்த நேரத்தில் எதையும் எதிர்பார்க்காமல், ஒவ்வொரு பிரதேசத்துக்கும் சென்று மிகுந்த கஷ்டத்துக்கு மத்தியில் இவர்கள் மாணவர்களுக்குக் கல்வியைப் புகட்டுவதில் பாரிய பங்களிப்பைச் செய்திருக்கிறார்கள். விசேட அமைச்சரவைப் பத்திரமொன்றைச் சமர்ப்பித்து, இவர்களுக்கும் நிரந்தர நியமனங்களை வழங்க வேண்டுமென நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், இன்று இவர்கள் பல்வேறு பிரச்சினைகளுக்கு முகங்கொடுக்கின்றார்கள். அது தொடர்பில் இன்றும் நிறைய தொலைபேசி அழைப்புகள் அவர்களிடமிருந்து எனக்கு வந்தன.

எனவே, இந்த விடயத்தை மனிதாபிமான அடிப்படையில் நோக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். தற்பொழுது, இவர்களில் ஒரு சிலருக்கு 45 வயதாகின்றது. இவர்களுக்கு வேறு வழியில்லை. அரசாங்கங்களை நம்பி, மாணவர்களுக்குக் கல்வியை வழங்குவதில் இவர்கள் மிகவும் பாடுபட்டு இருக்கிறார்கள். அது எமது பகுதியில் நன்கு தெரியும். ஏனெனில், எமது பகுதியில் யுத்தம் கடுமையாக நடந்தது. எனவே, இவர்களுக்கு நிரந்தர நியமனங்களை வழங்குவதற்குரிய ஏற்பாடுகளை இந்த அரசாங்கம் செய்ய வேண்டுமெனக் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දවස් ගණනාවක් තිස්සේ අපේ ගුරු සංවර්ධන නිලධාරි මහත්වරු උපවාසයක යෙදුණා. මම හිතන විදියට, ඒ කාරණයත් එක්කම ගුරු විභාගය සඳහා ගැසට් කරලා තිබෙනවා, දෙවැනි මාසයේ 2වැනි දා; මේ පසුගිය 2වැනි දා. එතැනදීත් උපාධිධාරීන් ප්‍රමාණයක් අත්හැරලා තමයි ගැසට් පත්‍රය නිකුත් කරලා තිබෙන්නේ. 2023.02.10 වැනිදා ඉඳලා 2025.06.30 වැනිදා දක්වා කාල සීමාවේදී උපාධිය සම්පූර්ණ කළ උපාධිධාරීන්ට තමයි ඒ විභාගයට ඉල්ලුම් කරන්න පුළුවන්කම තිබෙන්නේ. නමුත් දෙසැම්බර් මාසයේ 31 වැනිදා දක්වා කාල සීමාවේදීත් උපාධිය සම්පූර්ණ කළ උපාධිධාරීන් ඉන්නවා. ඒ අයටත් ඒ සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා ඒ අයගේ යෝජනාවක් තිබෙනවා. ඒ නිසා මේ ගැසට් එක සංශෝධනය කරලා, පිරිසක් ඉතුරු කර ගන්නේ නැතුව ඒ කටයුතු කරන්න. එතකොට 2025 වසර අවසන් වෙනතෙක්ම උපාධිය සම්පූර්ණ කළ අයට යම් කිසි අවස්ථාවක් ලැබෙනවා, රැකියා වරම් හිමි කර ගන්න. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද කථිකයන් ගණනාවක් කථා කළා; චෝදනා කළා. ජාතිවාදය අවුස්සනවා, ලිංගිකත්වය ගැන කථා කරනවා, හොරකම, දූෂණය ගැන කථා කරනවා කිව්වා. ඒ විදියට විවිධ කාරණා කිව්වා. ජනාධිපතිතුමා ඊයේ නිදහස ගැන කථා කරනකොට මට හිතට දැනුණේ, 76 වසරක ශාපය අවසන් කරලා අවුරුදු දෙකකට පස්සේ සමරන නිදහස් දිනය කියලා. ඉතින් ඒ ගැන කථා කරනකොට මේ අපේ 78වැනි නිදහස් සැමරුමද, නැත්නම් "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ ලැබුණු නිදහසද කියන ප්‍රශ්නය තමයි තිබුණේ. අපේ උදාර රණවිරුවෝ කරපු කාර්යභාරය මොකක්ද? සුද්දෝ බේරා ගත්ත එක; නාය ගිය පාරවල් පිළිසකර කරපු එක; ළඟා විය නොහැකි තැන්වල හිටපු අනාථ වෙච්ච අයට කෑම ලබා දීපු එක. ඒ තමයි

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

අපේ උදාර රණවිරුවන්. ජීවිත පරිත්‍යාගයෙන් වසර 30ක යුද්ධය අවසන් කරන්න කටයුතු කරපු සොල්දාදුවන්, ඒ නිලධාරි මහත්වරුන්, ඒ රණවිරුවන් පිළිබඳව අපේ ජාතික නිදහස් දිනය දවසේ විස්තර විචාරය කරනකොට අභිමානය ගැබ් වෙන්න, බොහොම ගෞරවාන්විතව තමයි කථා කරන්න ඕනෑ. අර පාබල හමුදාව යනකොට ඒ අය ගැන දැන් කියයි, දැන් කියයි කියලා මම බලාගෙන හිටියා. වැලි කොට්ට ගහමින් මේ මාලිමාවේ දැවැන්ත සංවර්ධනයට උර දුන්න, ජනාධිපතිතුමාගේ උපදෙස් මත "දිට්වා" සුළි කුණාටුවෙන් නාය ගිය, මිනිසුන්ට ළඟා වෙන්නවත් බැරි වෙච්ච තැන්වලට ගිහිල්ලා, හිතා ගන්නවත් බැරිව තිබ්බ රට නැවත ගොඩනගන්නට කටයුතු කළ, ඒ මං මාවත් ගොඩනගන්නට වැලි පුරවපු කොට්ට කර තියාගෙන, කෙනෙකුට ළඟා විය නොහැකි තැන්වලට පවා ගිහිල්ලා ඒවා තැන්පත් කරලා ඉතා ඉක්මනින් මේ රට පිළිසකර කරන්න උර දුන්න කණ්ඩායම තමයි මේ එන්නේ කියලා අපේ යුද හමුදාවේ කණ්ඩායම් යනකොට කියයි කියලා අපි බලාගෙන හිටියා. හැබැයි, එහෙම එකක් කිව්වේ නැහැ.

පසුගිය ඉතිහාසය පුරාවට ඔබතුමන්ලා මේ රටේ දේශපාලනය කරනකොට, ඔබතුමන්ලාගේ ලක්ෂ තුනක් හතරක් පමණ වෙච්ච ඡන්ද ටික එක එක කඳවුරුවලට මුදල්වලට විකුණපු බව අපි දන්නවා. දැන් ඔබතුමන්ලා මේ රට පාලනය කරන පක්ෂය බව මතක තියා ගන්න. ඒ නිසා 159ක් එක්ක පාර්ලිමේන්තුවට ඇවිල්ලා තුනෙන් දෙකක බලයක් එක්ක ව්‍යවස්ථාවට පවා අත තියන්න පුළුවන් තැනක ඉන්න පක්ෂයක් විදියට ඔබතුමන්ලා දැන් ඒ ඩීල් දේශපාලනය අවසන් කරන්න. ඔබතුමන්ලා ඒ මනෝභාවයෙන් ගැලවිලා එන්න. ඔබතුමන්ලා දැන් වගකීමක් ඇති දේශපාලන පක්ෂයක්; මේ රටේ ආණ්ඩු කරන පක්ෂයක්. ඒ නිසා ඩයස්පෝරාවට ඕනෑ විදියට හැසිරෙන්න එපා. මේ රටේ ජාතිවාදය අවුස්සන්න එපා කියලා අපට කියනවා. අපි කොහේද ජාතිවාදය ගැන කථා කරන්නේ? ජනාධිපතිතුමා යාපනයට ගිහිල්ලා කියනවා, දකුණේ මිනිස්සු උතුරට වන්දනා කරන්න එන්නේ ජාතිවාදය අවුස්සන්නය කියලා. එහෙම නම් දකුණේ කට්ටිය එන්න ඕනෑ නැහැ, අනුරාධපුර වන්දනා කරන්න. සෙනසුරාදා, ඉරිදාට මාර්ග තදබදයත් අඩු වෙයි. එහෙම නම් මෙච්චර ප්‍රමාණයක් දකුණේ ඉඳලා අනුරාධපුරයට එන්නේ මොකද? රුවන්වැලි සෑය, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වඳින්න විශාල පිරිසක් එනවා. ඉතින් කැලණිය තිබෙද්දී, මහ තවත් විවිධ ඓතිහාසික විහාරස්ථාන තිබෙද්දී අනුරාධපුරයට එන්නේ මොකටද? මේ රටේ අපට බෞද්ධයෝ විදියට වැදගත්ය කියලා හිතෙන, බුදුරජාණන් වහන්සේ වැඩම කරපු ස්ථාන තිබෙන, ඓතිහාසික වටිනාකමක් තිබෙන ස්ථාන වඳින්න, වන්දනාමාන කරන්නට කවුරුත් යනවා. ඉතින්, ඒක පවා ජාතිවාදය විදියට දැකපු කෙනෙක් තමයි අද ඇවිල්ලා කියන්නේ,- අනෙක් පැත්තෙන් ජනාධිපතිතුමා ආදර්ශ පාඨයකුත් අරගෙන ඇවිල්ලා කියනවා මම දැක්කා, වේගයෙන් යන්න ඕනෑ නම් තනියෙන් යන්න කියලා. දීර්ඝ ගමනක් යන්න ඕනෑ නම් කණ්ඩායමක් විදියට යන්න කියලා. හැබැයි එහෙම කියන ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්නේ මොකක්ද? "අනේ, please, එපා" කියලා; "අනේ, please, එපා, සද්ද නැතුව පැත්තකට වෙලා ඉන්න" කියලා. එහෙම කියපු ජනාධිපතිතුමා අතැනට ගිහිල්ලා කියනවා, "කණ්ඩායමක් විදියට ගියොත් අපට ස්ථිර ගමනක් යන්න පුළුවන් වෙයි" කියලා. ඉතින් කාටද මේ කතන්දර කියන්නේ?

අනෙක් පැත්තෙන්, හැම කෙනාම ඉන්නේ නීතියේ රේඛාවට යටත්ය කියලා කියනවා. හැබැයි නීතියේ රේඛාවට යටත් ඉන්නවාය කිව්වාට, මාධ්‍ය ප්‍රචාර ලබා දෙමින් විවිධ අයව FCID එකට, CID එකට ගෙන්වනවා අපි දැක්කා. හැබැයි, දැන් ඔබතුමන්ලාගේ පැත්තටත් ඒ වාගේම චෝදනා ඇවිත් තිබෙනවා. ඔබතුමන්ලාට ගල් අඟුරු සම්බන්ධව චෝදනා ඇවිල්ලා තිබෙනවා. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනවශ්‍ය දේවල් ඇතුළු කළාය කියලා චෝදනා ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම දැන් ගරු කථානායකතුමාටත් ඉන්ධන අවභාවිතය පිළිබඳව චෝදනාවක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා, උතුරු මැද පළාත් සභාවේ හිටපු ප්‍රධාන අමාත්‍යවරයාටයි, එතුමාගේ පෞද්ගලික ලේකම්ටයි අවුරුදු 20ක් හිරබත් කන්න නියම වෙලා, දැන් හිර ගෙදර සිටින බව. ඒ මොකද? රුපියල් ලක්ෂ 20 ගණනක ඉන්ධන අවභාවිතයක් නිසා. එහෙම නම් මේ උත්තරීතර සභාවේ ප්‍රධානියාට, රටේ තුන්වන පුරවැසියාට, අපේ භාරකාරයාටත් එම චෝදනාව තිබෙනවා. ඔබතුමන්ලා නීතිය හරි විදියට ක්‍රියාත්මක කරනවා නම්, තවමත් මේ පුටුවේ ඉඳගෙන රාජකාරි කරන්න එතුමාට පුළුවන්ද? වැදගත් විදියට එතුමාට තාවකාලිකව හෝ අයින් වෙන්න දීලා, එම විමර්ශන කටයුතු අවසන් වන තෙක් එතුමාව පැත්තකින් තියලා, චෝදනාවෙන් නිදහස් වුණාට පසුව නේද එතුමාට ධුරයේ රාජකාරි කරගෙන යන්න දෙන්න ඕනෑ? හැමෝම එක විදියට නීතියට යටත් නම්, මේ කාරණයේ දීත් නීතිය ඒ විදියට ක්‍රියාත්මක වෙන්න එපායෑ. උතුරු මැද පළාත් සභාවේ හිටපු ප්‍රධාන අමාත්‍යවරයාටයි, එතුමාගේ පෞද්ගලික ලේකම්ටයි එල්ල වුණු චෝදනාව තමයි, ඉන්ධන අවභාවිතය. රුපියල් ලක්ෂ 20 ගණනක ඉන්ධන අවභාවිතයක් වෙලා තිබෙනවා. ඒත් රජයෙන් ඒ අයට දුන් නිල රථවලට ලබා ගත් තෙල්ම තමයි. ඉන්ධන අවභාවිතයක් නිසා තමයි උතුරු මැද පළාත් සභාවේ හිටපු ප්‍රධාන අමාත්‍යවරයා සහ එතුමාගේ පෞද්ගලික ලේකම් හිරේ ඉන්නේ. දැන් ගරු කථානායකතුමාටත් දෛවයේ සරදමකින් එම චෝදනාවම ඇවිල්ලා තිබෙනවා. එහෙම නම්, එතුමා කථානායක පුටුවේ වාඩි වෙලා දෙන තීන්දු තීරණ වලංගුද? මේ රටේ නීතිය සැමට එක සේ ක්‍රියාත්මක වනවාද? කථාවට වැඩිය ක්‍රියාවෙන් ඔප්පු කරනවා නම් අපි පක්ෂ, පාට භේද අමතක කරලා මේ රට ගොඩනගන්නට සහාය දෙන්න සූදානම්. හැබැයි, ඔබතුමන්ලා දමන්නේ හැම දේම අපේ ගොඩට.

මහින්ද රාජපක්ෂ මැතිතුමන්ලාට මෙතැන ඉඳගෙන පලු යන්න බණිනවා. හැබැයි, රාජපක්ෂවරුන්ව මේ රටේ නිර්මාණය කළේ කවුද? සුනාමි අරමුදල් සම්බන්ධයෙන් චෝදනාවක් තිබුණු බව ඔබතුමන්ලා දන්නවා. දැන් ඔබතුමන්ලා ඒ ගැන කියමින් පලු අරිනවා. හැබැයි, ඒ චෝදනාව තිබියදී කරළියට ඇවිල්ලා ඔබතුමන්ලා මහින්ද චින්තන පොත පෙන්ව පෙන්වා, "මේකට අපි වග කියන්නේ, මේ තමයි මේ රටේ ගැලවුම්කාරයා. අපේ රටේම පියා. අප්පච්චි" කියලා පෙන්වලා, කථා කරලා, දැන් ඒ ඔක්කෝම පව් අපේ පිටින් දාන්නද හදන්නේ? ඉතිහාසයේදී තමන් වැරැද්දක් කළා නම් ඒක නිහතමානීව පිළිගන්න, තවත් බොරු කර කර, මේ රට අපහසුතාවට පත් කරන්නේ නැතුව. මේ රටේ ජාතිවාදය අවුස්සන්නේ නැතුව කටයුතු කරන්න. දේශපාලන පක්ෂයක් විදියට තමන්ගේ ඡන්ද ගොඩ විකුණ විකුණා ගියා වාගේ, එක එක පෝරාවලට රටත් විකුණන්න ලෑස්ති වෙන්න එපා. ඩයස්පෝරාවේ සල්ලිවලට යටත් වෙලා මේ රට පාවා දෙන්න එපා කියන කාරණය මතක් කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රුවන්තිලක ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 09ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.37]

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත සහ තවත් පනත් කෙටුම්පත් දෙකක් සම්මත කර ගැනීම සම්බන්ධයෙනුයි සාකච්ඡා කෙරෙන්නේ. මම සූදානම්, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත සහ එම වෘත්තියේ යෙදන වෘත්තිකයන්ගේ වගකීම හා කාර්යභාරය පිළිබඳව යම් අදහසක් ප්‍රකාශ කරන්න. අපි මුලින්ම හඳුනා ගන්න ඕනෑ තථ්‍ය දේපළ කියන්නේ මොනවාද කියලා. ත්‍යාය දේපළ කියලා අදහස් වෙන්නේ ජලය, ගස්, ඛනිජ ද්‍රව්‍ය, ගොඩනැඟිලි, නිවාස, වැට කඩුලු හා පාලම් ඇතුළු ස්වාභාවික හෝ මිනිසා විසින් සාදන ලද ඉඩම් සහ ඉඩම්වලට සම්බන්ධ වැඩිදියුණු කළ යම් ස්ථිර දේවල්. සාමාන්‍යයෙන් ගොඩනැඟිලි සහ නිවාස මේ යටතට ගැනෙනවා. දේපළ වෙළෙඳාම පැත්තෙන් සැලකීමේදී ගොඩනැඟිලි සහ නිවාස විකිණීම, කුලී පදනමටම ලබා දීම, මිලට ගැනීම හඳුන්වන්න පුළුවන්. පෞද්ගලික දේපළ අයිතිය ප්‍රසාරණය වීමත් සමඟ දේපළ වෙළෙඳාම් අංශය අද ශීඝ්‍ර දියුණුවක් අත් කරගෙන තිබෙනවා. විශේෂයෙන් දේපළ අංශයට යොමු වීමට නම් විශාල ආයෝජනයක් කිරීමට සිදු වනවා. එක් එක් දේපළ සම්බන්ධයෙන් ආවේණික ලක්ෂණ සමුදායක් තිබෙන නිසා ඒවා ප්‍රමිතිගත කිරීම අවශ්‍ය කාරණයක් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳ පොළ සැලකීමේදී විශාල සහභාගිත්වයක් දේපළ වෙළෙඳාම් අංශය හිමි කරගෙන තිබෙනවා.

අපි සහාධිපත්‍ය වෙළෙඳාම - condominium market එක - සම්බන්ධයෙන් ගත්තොත්, 2025 තුන්වන quarter එකේ ශ්‍රී ලංකා මහ බැංකුවේ, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව විශාල වැඩි වීමක් තිබෙනවා. සහාධිපත්‍ය වෙළෙඳාම 2017දී ඒකක 100ක් විධියට ගත්තොත්, 2025 වෙද්දී ඒකක 265ක් දක්වා වැඩි වෙලා තිබෙනවා; විශාල වර්ධනයක් වෙලා තිබෙනවා. අපි ඉඩම් සම්බන්ධ - real estate - වෙළෙඳාම ගත්තොත්, 2019දී ඒකක 100ක් විධියට ගත්තොත්, 2025 වෙද්දි ඒකක 197ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ඒ කියන්නේ ඉඩම් සම්බන්ධයෙන් විශාල වෙළෙඳ පොළක් - market එකක් - හිමි වෙලා තිබෙනවා. එයින් අදහස් වන්නේ, දේපළ වෙළෙඳාම් අංශය ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වන බවයි. මේ සම්බන්ධයෙන් අපි හිතද්දී මේ දේපළ ව්‍යාපෘති සැලසුම් කිරීමට, ආයෝජනය කිරීමට, සංවර්ධනය කිරීමට, කළමනාකරණය කිරීමට, අධීක්ෂණය කිරීමට, නිරීක්ෂණය කිරීමට, ගණනය කිරීමට අදාළව වගකිවයුතු පොදු ආයතනයක අවශ්‍යතාව මතුවනවා. අනිවාර්යයෙන්ම අපට පැහැදිලිව පෙනෙන දෙයක් තමයි, මෑත කාලීනව කළු සල්ලි සුදු කිරීම සඳහාත් මේ දේපළ වෙළෙඳාම භාවිත කිරීමේ ඉඩ ප්‍රස්ථාව තිබෙන බව. ඒ නිසා අපට අවශ්‍යයි, මේ සඳහා ආයතනයක් හදන්න. ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත අපි ගෙනෙන්නේ ඒ වෘත්තිකයන්ගේ ගරුත්වය ආරක්ෂා කර ගැනීම සඳහා යම්කිසි ක්‍රියාමාර්ග ගැනීම මෙන්න මේ මූලික කාරණා සඳහායි.

මීට ප්‍රථම ඒ තථ්‍ය දේපළ වෘත්තිකයන් සම්බන්ධයෙන් තිබුණු ආයතනය තමයි, the Institute of Real Estate and Valuation. ඒක ලියාපදිංචි වෙලා තිබුණේ සමාගම් පනත යටතේ. මීට සමාන වෘත්තිකයන් සිටින ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව කියන ආයතන යම් නීතිමය ක්‍රියාමාර්ග යටතේ මේ රටේ මහජනතාවට සේවය කරන්න තිබෙන ආයතන. වෘත්තියවේදීන් විධියට හිතුවොත්, ඒගොල්ලන්ගේ වගකීම තමයි මේ රටේ මහජනතාවට සේවය කිරීම.

ඔබට මතක ඇති, ඉස්සර ආණ්ඩුවල හිටපු වෘත්තීයවේදීන් පසු කාලයේදී මේ ආණ්ඩුව ගෙන ඒමට විශාල වශයෙන් සහයෝගය දැක්වූ බව. ඒගොල්ලන් ජාතික විද්වත් සංවිධානය හරහා එකතු වෙලා මේ ආණ්ඩුවට සහයෝගය දැක්වූවා. එසේ ඔවුන් මේ ආණ්ඩුවට සහයෝගය දක්වන්න තිබෙන හේතුව මොකක්ද? එතෙක් අක්‍රමවත්ව තිබුණු ක්‍රමවේදවලට නියමිත ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව මත තමයි ඒගොල්ලන් එහෙම එකතු වෙලා වැඩකටයුතු කළේ. මේ රටේ මහජනතාවට සමහර ආයතනවලින් සිදුවන අසාධාරණකම්වලදී ඒ ආයතනවලට අදාළව මහජනතාව ආරක්ෂා වන ක්‍රියාමාර්ගත් තිබෙනවා.

උදාහරණයක් විධියට ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ගනිමු. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව කියන්නේ ඉඩම් මැනීමේ ප්‍රමුඛයෙක්. එසේ ඉඩම් මැනීමේදී සමහර වෙලාවට සමාජයේ සිටින සමහර පුද්ගලයන්ට සිදුවන අසාධාරණකම්වලදී, ඒ පිළිබඳව මිනින්දෝරු දෙපාර්තමේන්තුවට පැමිණිලි ඉදිරිපත් කරන්න පුළුවන්. එසේ පැමිණිලි කළාට පසු මිනින්දෝරු ආයතනයෙන් ඒ සම්බන්ධව විනය පරීක්ෂණ පවත්වා අදාළ වෘත්තිකයාට දඬුවම් කරනවා. සමහර වෙලාවට යම් කාලයකට ඒගොල්ලන්ගේ ලයිසන් එක - ඔවුන්ගේ මැනීමේ බලපත්‍රය - තහනම් කරනවා. එහෙම තහනම් කර අර එළියේ ඉන්න - සමාජයේ ඉන්න- ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඒගොල්ලන් බැඳී සිටිනවා.

ඒ වාගේම වෘත්තියවේදීන්ට තමන්ගේ වෘත්තිය කරගෙන යෑමේදී ඔවුන්ගේ ගරුත්වය ආරක්ෂා කරන විධියට තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. මේ වාගේ පනතකින් ඒ වෘත්තිකයන්ගේ ගරුත්වය ආරක්ෂා වීම තුළින් ඔවුන්ට එක් unit එකක් විධියට මේ රටේ මහජනතාව වෙනුවෙන් යම් වැඩ කොටසක් කිරීමේ හැකියාව ලැබෙනවා.

නීතිඥ වෘත්තිය ගත්තත් අපි දන්නවා, සමහර වෙලාවට සමහර පුද්ගලයන්ට නීතිඥයන්ගෙන් අසාධාරණකම් වුණාම ඔවුන්ට හැකියාව තිබෙන බව ඒ අසාධාරණකම පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමයට පැමිණිලි කරන්න. ඊට පසුව ඒ සම්බන්ධව පරීක්ෂණ සිදු කර ඒ පුද්ගලයාට සාධාරණය ඉෂ්ට කර, යම් කාලයකට අදාළ නීතිඥවරයාගේ නීතිඥභාවය නැවැත්වීමේ හැකියාවත් තිබෙනවා. එහෙම කරපු අවස්ථා සඳහා උදාහරණත් තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය ගත්තත්, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව ගත්තත් ඒ හැම තැනකින්ම ඒ විධියට යම් යම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ තුළින් ඒ වෘත්තියවේදියාගේ ආරක්ෂාව වාගේම සමාජයේ පොදු පුද්ගලයන්ගේ ආරක්ෂාවත් සහතික වෙලා තිබෙනවා.

ඒ අනුව මේ ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත ඉතා වැදගත් පනත් කෙටුම්පතක් විධියට අපි දකිනවා. මේ පනත් කෙටුම්පතෙහි මූලික අරමුණු තමයි, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ගරුත්වය සහ කීර්තිය නැංවීම සහ පවත්වාගෙන යාම, ශ්‍රී ලංකාවේ තථ්‍ය දේපළ කර්මාන්තයට අදාළ වන ප්‍රතිපත්ති, ශිල්පීය ක්‍රම, ප්‍රමිතීන් සහ පරිචයන් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම කියන කාරණා. ඒ වාගේම ඒ සාමාජිකයන්ට යම්කිසි දෙයක් සිදු වුවහොත්, ඔවුන්ගේ වෘත්තීයභාවය ආරක්ෂා කිරීම සඳහාත් ඒ ආයතනය මඟින් ඔවුන්ට ආරක්ෂාව සපයනවා. හැබැයි සමහරු සමාජයේ මතයක් හදන්න උත්සාහ කරනවා අපි දැක්කා, ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය කියන දෙගොල්ලන් අතර යම්කිසි විසංවාදයක් තිබෙනවා කියලා. ඔවුන් අතර සමහර කාරණා සම්බන්ධයෙන් එකඟතාවක් නොතිබුණු අවස්ථා තිබුණා. ඒ සම්බන්ධයෙන් අපේ නියෝජ්‍ය අමාත්‍යතුමාත්, ඒ වාගේම අනුර කරුණාතිලක අමාත්‍යතුමාත්

[ගරු රුවන්තිලක ජයකොඩි මහතා]

සෑහෙන්න කාලයක් සාකච්ඡා කරලා අවසානයේදී යම් යම් සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. ඒ සංශෝධනත් එක්ක තමයි අද දවසේ මේ පනත් කෙටුම්පත සම්මත කරන්න කටයුතු කර තිබෙන්නේ.

අපි මොන විධියට මේ වාගේ පනත් ගෙනාවත්, සමහර පනත්වල අනිවාර්යයෙන්ම යම් යම් ගැටලුකාරී තත්ත්වයන් තිබෙන්නට පුළුවන්. හැබැයි, ඒවා අපට සාකච්ඡා කරලා විසඳා ගන්න පුළුවන්. නමුත් එහි අරමුණ තමයි, මේ වෘත්තිකයන්ගේ වෘත්තීයභාවය ආරක්ෂා කිරීම වාගේම මේ රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් චුවමනා කරන ඒ ආයතන පිහිටුවීම. ඒක ඉතාම වැදගත්. ඔබතුමන්ලාත් දන්නවා ඇති, අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිව කියපු දෙයක් තිබෙනවා. ඒ තමයි, මේ රට සංවර්ධනය කරද්දී තිබිය යුතු මූලිකම දෙයක් තමයි, මේ රටේ නීතිය කියන එක. නීතිය තමයි අනිවාර්යයෙන්ම ප්‍රමුඛ වන්නේ. එම නිසා මේ වෘත්තිකයන්ට අදාළවත් යම්කිසි නීති රාමුවක් තිබෙන්න ඕනෑ. අන්න එහෙම බැලුවාම අපට වෘත්තිකයන් සහ සමාජයේ සියලුදෙනාටම අදාළව අවශ්‍ය ශක්තිය සහ එකඟතා එක්ක වැඩ කිරීමේ හැකියාව මේ ක්‍රමවේදය තුළ තිබෙනවා. එම නිසා ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත අද දවසේ සම්මත කරලා මේ වෘත්තීය අයිතිවාසිකම් වාගේම මහජන අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අවශ්‍ය පදනම දමන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.48]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I have seven minutes, Sir, not five minutes.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No, you have only five minutes.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Okay.

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற போக்குவரத்து அமைச்சுடன் சம்பந்தப்பட்ட விவாதத்தில் கலந்துகொள்வதில் நான் மிகவும் மகிழ்ச்சியடைகின்றேன். குறிப்பாக, அண்மையில் ஏற்பட்ட வெள்ளம் மற்றும் 'தித்வா' புயலால் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்ட ஒரு துறைதான் போக்குவரத்துத் துறை! கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களுடைய தலைமையிலே இந்த அமைச்சினூடாக train service, bus service உட்பட போக்குவரத்துச் சேவைகளைச் சீர்செய்யும் நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டன. எவ்வளவு விரைவாக அவற்றைச் செய்ய முடியுமோ, அவ்வளவுக்கு அவர் அந்தப் பணியை மிகச் சிறப்பாகச் செய்திருக்கிறார். அதற்காக நாங்கள் அவரைப் பாராட்டுகின்றோம்.

கௌரவ அமைச்சர் அவர்களே, கோடிக் கணக்கான ரூபாய் செலவில் கட்டப்பட்ட ஒலுவில் துறைமுகம் எந்தவொரு பாவனையும் இல்லாத நிலையில் தொடர்ச்சியாக மூடப்பட்டுக் கிடக்கின்றது. அதனை மீன்பிடித் துறைமுகமாக மாற்றி மீன்பிடியாளர்களுக்குக் கொடுப்பதற்காக வர்த்தமானி அறிவித்தல்மூலம் பிரகடனம் செய்யப்பட்டபோதிலும், மீன்பிடித் தேவைக்காக இன்னும் அது பயன்படுத்தப் படவில்லை. எங்களுடைய கௌரவ பாராளுமன்ற உறுப்பினர் எம்.எஸ். அப்துல் வாசித் அவர்களும் இங்கே இருக்கிறார். அவருடைய தொகுதியுடன் சம்பந்தப்பட்ட ஒரு விஷயம் இது! கல்முனை, சாய்ந்தமருது, நிந்தவூர், ஒலுவில், பொத்துவில் போன்ற பிரதேசங்களைச் சேர்ந்த ஆயிரக்கணக்கான கரையோர மீனவர்கள் மீன்பிடிப்பதற்காக 100-160 மைல்களுக்கு அப்பாலுள்ள வாழைச்சேனைக்குச் சென்று, அங்கு தங்களுடைய படகுகளைக் கட்டி மீன்பிடிக்க வேண்டிய நிலை இருக்கிறது. ஆகவே, கடற்றொழில் அமைச்சரும் துறைமுகங்களுக்குப் பொறுப்பான அமைச்சரும் ஒன்றுசேர்ந்து எவ்வளவு விரைவாக இந்த மீன்பிடித் துறைமுகத்தை இயங்கச்செய்ய முடியும் என்பது தொடர்பில் ஆலோசித்து, அதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதற்கு ஏதாவது உதவிகள் தேவைப்படுவதாக இருந்தால், அவற்றை நிதி நிறுவனங்களிடமிருந்து பெற்று, அதனை மீளக் கட்டியமைப்பதற்குத் தேவையான உதவிகளை அரசாங்கத்துக்கு வழங்குவதற்கு நாங்கள் ஆயத்தமாக இருக்கின்றோம். அரசாங்கத்தால் செய்ய முடியாதபோது, அதனைத் தனியார் நிறுவனங்களிடம் ஒப்படைக்கும்போது, அதனைப் பொறுப்பேற்றுச் செய்வ தற்குப் பல நிறுவனங்கள் ஆயத்தமாக இருக்கின்றன. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென இச்சந்தர்ப் பத்தில் அந்த மக்கள் சார்பில் கேட்டுக் கொள்கின்றேன்.

இன்று ஆடைக் கைத்தொழில் - garment industry - மிகவும் மோசமான நிலையில் இருக்கின்றது. ஆகவே, இது தொடர்பில் உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். அமெரிக்க சனாதிபதி டொனால்ட் டிரம்ப் அவர்களுடைய திடீர் முடிவின் காரணமாக இந்தியாவுக்கு விதிக்கப்பட்டிருந்த வரி 18 சதவீதமாகக் குறைக்கப் பட்டுள்ளது. எங்களுடைய ஆடைக் கைத்தொழிலுக்கு மிகப் பெரியதோர் ஆபத்து ஏற்படவிருக்கிறது. இது அரசாங்கத்துக்கு மட்டும் உரிய விஷயம் அல்ல. மொத்த நாட்டு மக்களுக்கும் உரிய விஷயம். கௌரவ அமைச்சர் அவர்களே, அரசாங்கம் உடனடியாக இது தொடர்பில் கவனம் செலுத்த வேண்டும். ஒன்றில், அமெரிக்க சனாதிபதி அவர்களுடன் பேச்சுவார்த்தை நடாத்தி எங்களது நாட்டுக்குரிய வரியை 18 சதவீதத்துக்கு அல்லது அதற்கும் குறைவாகக் கொண்டுவர வேண்டும் அல்லது GSP வரிச் சலுகையை நாங்கள் பெற்றுக்கொள்ள வேண்டும். அதற்கான முயற்சிகளை நீங்கள் மேற்கொள்ள வேண்டு மெனக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னும் மாகாண சபைத் தேர்தல் நடாத்தப்படவில்லை.

தொடர்ச்சியாக மாகாண சபைத் தேர்தலை நடத்துவோம் என்று ஒவ்வொரு அரசாங்கமும் கூறிவந்தாலும், பல ஆண்டுகளாக அந்தத் தேர்தல் நடாத்தப்படாமல் இருக்கின்றது. உண்மையிலேயே இதுவோர் அடிப்படை மனித உரிமை மீறல்! ஒரு மாகாணத்தின் மக்கள் தங்களுடைய அரசியல் பிரதிநிதிகளைத் தெரிவுசெய்து, அந்தப் பிரதிநிதிகளூடாக மாகாண மட்டத்தில் இருக்கின்ற தங்களுடைய பிரச்சினைகளுக்குத் தீர்வைப் பெற்றுக் கொள்ள முடியும். இந்த நாட்டில் இருக்கின்ற அதிகாரங்களில் மிகக் கூடுதலான அதிகாரங்கள், அரசியலமைப்பின் பதின்மூன்றாவது திருத்தத்தின்கீழ் மாகாண சபைகளுக்கு வழங்கப்பட்டுள்ளன. அந்த அடிப்படையில், அந்தந்த மாகாண சபைகளில் செய்யப்பட வேண்டிய வேலைகளைத் தங்களுடைய பிரதிநிதிகளைக் கொண்டு செய்யவிடாமல், ஆளுநரை அல்லது மாகாண செயலாளரை வைத்துக்கொண்டு ஆட்சி செய்வதென்பது ஜனநாயகத்துக்கு முழுக்க முழுக்க விரோதமான ஒரு செயலாகும். ஆகவே, அரசாங்கம் உடனடியாக மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்கான ஏற்பாட்டைச் செய்ய வேண்டும். கௌரவ பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்களும் இங்கே இருக்கின்றார். அவர் மிகவும் அர்ப்பணிப்போடு எங்களுக்கு ஒத்துழைப்பு வழங்குகின்ற, எங்களுடைய விடயங்களை எப்பொழுதும் நிதானமாகக் கேட்கின்ற ஓர் அமைச்சர்! அந்த வகையில், மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்கான ஒழுங்குகள் செய்யப்பட வேண்டும். அந்தந்த மாகாணத்தை ஆளுகின்ற உரிமையை, அதிகாரத்தை அந்தந்த மாகாண மக்களால் தெரிவு செய்யப்படுகின்ற பிரதிநிதிகளிடம் ஒப்படைக்க வேண்டும். அதற்குரிய முயற்சிகளை நீங்கள் மேற்கொள்ள வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up in a minute, Sir.

கடந்த 'தித்வா' புயலால் ஏற்பட்ட அனர்த்தத்தால் மட்டக்களப்பு மாவட்டத்தில் நிறைய பிரதேசங்கள், வீதிகள் பாதிக்கப்பட்டுள்ளன. போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சர் கௌரவ பிமல் ரத்நாயக்க அவர்களும் இங்கே இருக்கிறார். நான் அவரைத் தனிப்பட்ட முறையில் சந்தித்தும் இது தொடர்பில் கதைத்திருக்கிறேன்.

ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මේ පාරවල් ටිකක් හදා ගන්න ඕනෑ කියලා මම ඔබතුමාව හමු වෙලාත් කථා කළා. "Ditwah" cyclone එක නිසා මඩකලපුව දිස්ත්‍රික්කයේ තිබෙන පාරවල් විශාල වශයෙන් කැඩී ගියා. එම නිසා ඔබතුමා ඒ සම්බන්ධයෙනුත් අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් අපි සලකා බැලිය යුතු සුවිශේෂීම ක්ෂේත්‍රයක් පිළිබඳව ගෙන එන පනත් කෙටුම්පතක් තමයි, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත. ලංකාව ගත්තොත්, ඉඩම් හා දේපළ සම්බන්ධයෙන් විධිමත් භාවිතයක්, විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සංවර්ධනය වීමක් මෙතෙක් අපි දැකලා නැහැ. නගරයක් උදාහරණයක් ලෙස ගත්තාම, ඒ නගරය තුළ නේවාසික භාවිත, කාර්මික භාවිත, වෙළෙඳ භාවිත ආදී දේවල් නිසි පරිදි සැලසුම් සහගතව සිද්ධ වෙලා නැහැ.

ඒ නිසා කර්මාන්තකරුවාත්, නේවාසිකයාත්, ව්‍යාපාරවල යෙදෙන අයත් විශාල ගැටලුවකට මුහුණ පානවා විතරක් නොවෙයි, ඔවුන් අතර ගැටුම් පවා ඇති වෙනවා. ඇයි, එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ? ඉඩම් හා දේපළ භාවිතයේ ප්‍රමිතීන් අපි හදාගෙන තිබුණේ නැහැ. ඒ වෙනුවෙන් අපි විධිමත්ව කටයුතු කරලා නැහැ. ඒකට බලපාන හේතුවක් තිබුණා. ඒ හේතුව තමයි, සංවර්ධනය පටන් ගන්න අවස්ථාවේ ඉඳලා මේ ක්ෂේත්‍රය කෙරෙහි අඩු අවධානයක් යොමු කිරීම.

මේ දවස්වල අපට තිබෙන ප්‍රධාන ගැටලුවක් තමයි, පළාත් පාලන ආයතනවලටම ආවේණික ආදායම් සංවර්ධනය කර ගන්නේ කොහොමද කියන එක. ඒ කාරණයේදී මේ දේපළ තක්සේරුකරුවන්ගේ සේවය අතිශය තීරණාත්මකයි. මට අද දැනගන්න ලැබුණා, මේ කිට්ටුව තිබෙන නගර සභාවක අවසාන වශයෙන් දේපළ තක්සේරු කරලා තිබෙන්නේ 2003දී කියලා. ඒ අනුව අවුරුදු 23ක් ඔවුන්ගෙන් කෙරෙන්න ඕනෑ කාර්යය නිසියාකාරව කෙරිලා නැහැ. එහෙම නම් ලංකාවේ අනෙක් පළාත් පාලන ආයතනවලත් එවැනි තත්ත්වයක් තිබෙන්න පුළුවන්. මම මේ අවධාරණය කරන්නේ දේපළ තක්සේරුකරණය සහ තථ්‍ය දේපළ සම්බන්ධ වෘත්තිකයින්ගේ අවශ්‍යතාව සහ වටිනාකම පිළිබඳවයි.

මෑත කාලීන අය වැය දෙකෙන්ම අපි වෙනදාට වඩා විශාල අරමුදල් ප්‍රමාණයක් ප්‍රාග්ධන වැය විධියට රටේ සංවර්ධනය වෙනුවෙන් යොමු කරමින් සිටිනවා. ඒ අරමුදල් සැබෑ අවශ්‍යතා වෙනුවෙන් සංවිධිතව, නිරවුල්ව යෙදවීමට මෙන්න මේ තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ සේවාව විශේෂ වටිනාකමක් ගන්නවා. මේ වනකොට අපි ව්‍යාපාර වෙනුවෙන් සහ නිවාස වෙනුවෙන් විවිධාකාර වූ අනුග්‍රහය යටතේ විවිධ ණය මුදල් සම්පාදනය කරමින් ඉන්නවා. ඒ ණය මුදල් හරියාකාරව යොදවනකොට බැංකුවලට විශාල සහායක් මේ දේපළ තක්සේරුකරුවන්ගෙන් සහ මේ වෘත්තිකයන්ගෙන් ලැබෙනවා. ඒ නිසා එවැනි වෘත්තිකයන්ගෙන් සමන්විත විධිමත්, සංවිධිත ආයතනයක් ගොඩනහලා ඔවුන්ගේ වෘත්තීය ප්‍රමිති පවත්වාගෙන යන්න, ඒ

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

සේවාවේ ඒකීය බව ආරක්ෂා කර ගන්න, ඒ තුළින් අනාගත සංවර්ධනය සඳහා නිවැරදි මඟ පෙන්වීම් ලබා ගන්න, විශේෂ වටිනාකමක් ලබා ගන්න අද දවසේ කථා බහට ලක් වන මේ පනත් කෙටුම්පත තුළින් අපි බලාපොරොත්තු වෙනවා. මේ පනත් කෙටුම්පත අදාළ සංශෝධන සහ එකඟතා සහිතව සම්මත වුණාට පසුව අපට ලංකාවේ දියුණු තථ්‍ය දේපළ අංශයක් ගොඩනඟා ගන්න පුළුවන් වනවා වාගේම ඒ අංශයේ ව්‍යාපාර කටයුතු දියුණු කිරීම සඳහා අවශ්‍ය වෘත්තිකයින් පිරිසකුත් ගොඩනැඟෙනවා. ඒ හරහා ඒ අංශයත් දියුණු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට මේ ගෙනැවිත් තිබෙන්නේ ලංකාවේ අනාගත සංවර්ධනය සම්බන්ධයෙන් ඉතා අත්‍යවශ්‍ය වන, විය යුතුව තිබූ කාර්යයන් ඇතුළත් පනත් කෙටුම්පතක්.

ඒ වෙනුවෙන් අපි කැප වෙලා කටයුතු කරලා, ඒ අංශය දියුණු කරලා, රටේ සංවර්ධනයට ඒ වෘත්තිකයින්ගේ සේවාව, සහාය ලබා ගත යුතුයි කියන යෝජනාව කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
න්‍යාය පත්‍රයේ විෂය අංක 01, සභාව එකඟද?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණ පිළිබඳව එකඟතාව පළ කිරීමට පෙර, කාරක සභා අවස්ථාවට යැමට පෙර, යම්කිසි කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න ඔබතුමාගෙන් යම් වේලාවක් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත දිගු ඉතිහාසයක් තිබෙන පනත් කෙටුම්පතක්. එය 2017 පමණ කාලයේ සිට විවිධ කැබිනට් මණ්ඩල යෝජනා ගණනාවකින් ඉදිරිපත් වුණු පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පතට අදාළව 2017, 2023 හා 2025 වර්ෂවලදී කැබිනට් මණ්ඩල නිර්දේශ ලැබී තිබෙනවා. මේ පනත් කෙටුම්පතට අදාළව ප්‍රධාන වශයෙන්ම the Institute of Valuers of Sri Lanka අධිකරණයට ගියා. ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් තීන්දුවක් ලබා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පෙර මේ පනතේ අවශ්‍යතාව ගැන කථා කළොත්, එම Supreme Court Determination එකේ ආචාර්ය එන්.එම්. පෙරේරා, බර්නාඩ් සොයිසා වාගේ අතීතයේ හිටපු මේ හා සමාන පනත් සම්මත කරපු ඇමතිවරුන්ගේ ප්‍රකාශ සඳහන් කර තිබෙනවා. ඒ නිසා නැවත මෙවැනි පනතක් සංශෝධනය කරද්දී ඒ පනත ඉදිරිපත් කරපු වෙලාවේ ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද කරුණු, ශ්‍රේෂ්ඨාධිකරණය විසිනුත්, මේ පාර්ලිමේන්තුව විසිනුත් අනාගතයේදී සැලකිල්ලට ගන්නවා කියන එක සහතිකයි. එම නිසා මේ පනත ගෙන එන්නේ, මූලික වශයෙන්ම මේ තථ්‍ය දේපළ වෘත්තිකයන්ට අදාළ ආයතනයක් ගොඩ නැඟීම සඳහායි.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි අවශ්‍යතාව එක පැත්තකින් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සඳහන් කර තිබෙනවා. ඒ වාගේම, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික), ජනාධිපති නීතිඥ බුවනෙක අළුවිහාරේ මැතිතුමා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්ය සාධක බළකායේ සභාපතිවරයා වශයෙනුත් මෙවැනි පනතක අවශ්‍යතාව සඳහන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, "රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ අරමුණු හා කර්තව්‍යයන් සමඟ ගැටුමකට තුඩු දෙන යෝජිත ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය ස්ථාපිත කිරීමට අදාළ පනත් කෙටුම්පත සම්බන්ධවයි" කියලා, මේ සම්බන්ධව වෘත්තික සංවිධානවලින් විවේචන ඉදිරිපත් කරලා තිබෙනවා. එම නිසා මේ පනත පිළිබඳව අපි ඉතා පුළුල් සාකච්ඡා රාශියක් පැවැත්වූවා. ඒ සාකච්ඡා රාශිය පවත්වලා අදත් විවාදයක් පැවැත්වූවා. ඒ නිසා අවසාන මොහොතේදී කිසිම ගැටුමකින් තොරව, මේ වෘත්තික ආයතන අතර ගැටුමකින් තොරව, overlap වීමකින් තොරව, මේ පනත සම්මත කර ගැනීමට අපි සුවිශාල උත්සාහයක් ගත්තා. ඒ අනුව එම සංවිධානවලින් එවන ලද යෝජිත සංශෝධන අමාත්‍යාංශ මට්ටමින්, Attorney-Generalට, Legal Draftsmanට ඉදිරිපත් කරනු ලැබුවා. එම යෝජිත සංශෝධන ඇතුළත් ලේඛන මම **සභාගත*** කරනවා.

ඒ අනුව "තථ්‍ය දේපළ ව්‍යාපෘති" කියන එක වෙනුවට "ආයෝජනයන්ට අදාළව" කියන එක. "මිල කිරීමට සහ ඇගයීමට අදාළ" කියන වචන වෙනුවට "ගණනය කිරීමට සහ සමාලෝචනයට අදාළ" කියන සංශෝධන අප විසින් යැව්වා. ඒ සංශෝධන අමාත්‍යාංශය මට්ටමින් යැව්වාට පස්සේ, නීතිපතිතුමා නියෝජනය කරමින් නීතිපති දෙපාර්තමේන්තුව අපට ලිපියක් ලබා දීලා තිබෙනවා. මම ඒ ලිපියත් **සභාගත*** කරනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123.(4) ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වෙනවා:

> "යම් පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතක විධිවිධාන හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරනු ලැබ ඇත්තා වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරන ලද සේ සැලකෙන්නා වූ අවස්ථාවක ඒ පනත් කෙටුම්පත හෝ ඒ විධිවිධාන හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයේ ප්‍රකාශ කර ඇති ආකාරයට හැර සම්මත නොකළ යුත්තේ ය:
>
> එසේ වුව ද, ඒ පනත් කෙටුම්පතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇති අනනුකූලතාව ඉවත්වන සේ සංශෝධනය කරනු ලැබීමෙන් පසුව ඒ පනත් කෙටුම්පත සම්මත කිරීම නීත්‍යනුකූල වන්නේ ය."

ඒ අනුව ගරු නීතිපතිතුමා විසින් මේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවට අදාළව කරුණුත් සඳහන් කරමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123.(4) ව්‍යවස්ථාවට අනුව කාරණා සඳහන් කර තිබෙනවා. අප වෙත ඉදිරිපත් කර තිබෙන නීතිපතිතුමාගේ ලිපියේ මෙන්න මෙහෙම තිබෙනවා:

> " 05.02.2026
>
> Draft Bill of the Institute of Real Estate Professionals, Sri Lanka
>
> I write with reference to the letter dated 5 February, 2026 addressed to the Legal Draftsman by the Additional Secretary of the Ministry of Transport, Highway and Urban Development. The said letter proposes Committee Stage Amendments to Clauses 3(b)(i), 3 (b)(iii) and 3(b)(v).

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

The same Clauses were challenged before the Supreme Court in terms of Article 121 of the Constitution. The Supreme Court by its determination [SC (SD) No.30/2025 and SC (SD) No. 31/2025] upheld the constitutionality of the said Clauses.

I have considered in this regard the provisions of Article 78(3) of the Constitution, Article 121 of the Constitution and the determination of the Supreme Court in respect of the Sri Lanka Telecommunications (Amendment) Bill [SC(SD) No.56/2024 to SC (CD) No. 60/2024].

Having regard to the above, I am of the opinion that the proposed Committee Stage Amendments in the above letter of 5 February, 2026 are inconsistent with the said provisions of the Constitution."

ඒ විධියට නීතිපති දෙපාර්තමේන්තුවෙන් දැනුම් දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් තව කාරණයක් මතක් කරන්න මම කැමැතියි. මේ Supreme Court Determination එක 2026.01.06 දින ගරු කථානායකතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. අනාගතයේදී ව්‍යවස්ථා සම්පාදනයට උදව්වක් වශයෙන් මම එය **සභාගත*** කරනවා.

මේ Supreme Court Determination එකේදී ඉතා පැහැදිලිවම මේ කරුණ - the Institute of Valuers of Sri Lankaහි බලතල අලුතෙන් හදන්න යන ආයතනයෙන් ගන්නවාද කියන එක - විවාදයට ලක් කර තිබෙනවා. ඒ අනුව Justice Arjuna Obeyesekere, Justice Priyantha Fernando, Justice Menaka Wijesundera යන විනිශ්චයකාරවරුන් තිදෙනා දීපු Supreme Court Determination එකේ ඉතා පැහැදිලිව මෙහෙම තිබෙනවා. ඔබතුමාගේ අවසරය මත මම එය quote කරනවා.

"The Bill only seeks to create a professional body of members and does not confer upon the members a specific right to engage in the practice of real estate management and/or valuation. The only benefit that a member of the lnstitute would receive in terms of the Bill is an embellishment in the form of an acronym of the title 'FIREPSL' or 'MIREPSL' against their name. Having said so, we must reiterate that the profession of valuers has so far not been regulated unlike in the case of surveyors, engineers, architects and medical practitioners, and even though it may appear by looking at the objects clause that the Bill has gone beyond the policy objective of the Cabinet of Ministers, a closer examination would reveal that the members of the lnstitute have not been conferred...."

Hon. Presiding Member, this is very important, "...a closer examination would reveal that the members of the institute have not been conferred...".

".....with the right to engage in the practice of valuation by virtue of being members of the lnstitute, thus demonstrating that the Bill is within the stated objective of the Cabinet of Ministers.

Conclusion

[30] ln the above circumstances, we are of the opinion that the Bill as a whole or any provision thereof is not inconsistent with the Constitution and may be passed by the simple majority of Parliament."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කරුණු ටික කිව්වේ සමාජය තුළ අනවශ්‍ය බෙදීමක්, අනවශ්‍ය ගැටුමක්, අනවශ්‍ය සංවාදයක් ඇති වන එක වළක්වන්න ඕනෑ නිසයි. මේ පනත් කෙටුම්පතේ එකම ප්‍රධාන අරමුණ තමයි තථ්‍ය දේපළ වෘත්තිකයන් සම්බන්ධව ආයතනයක් පිහිටුවීම. එම ආයතනය පිහිටුවීම සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේත්, අපේ ගරු එරංග ගුණසේකර නියෝජ්‍ය ඇමතිතුමා, ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා ඇතුළු අප අමාත්‍යාංශ මට්ටමින් කරපු සාකච්ඡාවලදීත් විවාදාත්මක කරුණු ඉදිරිපත් වුණා. ඒ අනුව අපට ඉතා පැහැදිලිව කියන්න පුළුවන්, ශ්‍රේෂ්ඨාධිකරණයේ මඟ පෙන්වීම සහ මේ දෙපාර්ශ්වයේම තිබෙන යම් යම් සැකයන් සහ අවශ්‍යතා සැලකිල්ලට ගෙන මෙය සකස් කර තිබෙන බව. ඉතාම පැහැදිලියි, ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය. මෙම ක්‍රියාව මඟින් වෙනත් ආයතනයක බලතල අලුතින් හදන ආයතනයේ සාමාජිකයන්ට ලැබෙන්නේ නැහැ. ඔවුන්ට නිශ්චිත වශයෙන් පවරන බලතල තමයි තිබෙන්නේ. එසේ තිබියදීත්, ඒ බරපතළ ඉල්ලීම මත අපි එය නැවත නැවතත් නීතිපතිතුමාට, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළා. නමුත් නීතිපතිතුමා අපට සඳහන් කර තිබෙනවා, එය ව්‍යවස්ථාවට අනුව කළ නොහැකි දෙයක් විධියට.

මේ පනත් කෙටුම්පතේ සම්පූර්ණම අරමුණ වී තිබෙන්නේ, වෘත්තිකයන්ට අලුත් ආයතනයක් පිහිටුවීමයි. ඒ හැර, වෙන අරමුණක් නොවෙයි තිබෙන්නේ. ඒ ආයතනය ගොඩ නඟලා ක්‍රියාත්මක වීමේදී යම්කිසි දවසක අපට - රජයට - පෙනුණොත්, එහෙම නැත්නම් සමාජයීය වශයෙන් දැනුණොත් මෙහි සැලකිය යුතු ගැටලු ප්‍රමාණයක් අනාගතයේදී ඇති වීමට ඉඩ තිබෙනවා කියලා, එතැනදී ව්‍යවස්ථාදායකට පුළුවන් එම කරුණු සැලකිල්ලට අරගෙන නැවත ඒවා සංශෝධනය කරන්න. මෙවැනි ආයතන ගොඩ නැඟිලා තිබෙන්නේම ඒ ආකාරයටයි. අපි දැඩි ලෙස විශ්වාස කරනවා, මෙම පනත් කෙටුම්පත මඟින් එක පිරිසකගේ අයිතිවාසිකම් ප්‍රමාණයක් අලුතින් තහවුරු වනවා මිස තව කෙනෙකුගේ අයිතිවාසිකම්වලට ගැටලුවක් ඇති නොවන බව. ඒ වාගේම අපි ඉතාම වෙහෙසකර, දිගු කාලීන මහන්සියක් ගත්තා මේ ආයතන දෙක අතර යම් සම්මුතියක් හදන්න. යම් යම් ආකාරයට ඒවාත් ඇතුළත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය පැහැදිලි කරන්න ඔබතුමා මට මේ අවස්ථාව ලබා දීම ගැන මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත රීට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු බිමල් රත්නායක මහතා]***
*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு பிமல் ரத்நாயக்க]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Bimal Rathnayake.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සහ 2 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## 3 වන වගන්තිය.- (ආයතනයේ අරමුණු)
වாசகம் 3.- (நிறுவகத்தின் குறிக்கோள்கள்)
CLAUSE 3.- *(Objects of the Institute)*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "4 වන පිටුවේ, 1 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> '(ඇ) ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම මත තථ්‍ය දේපළ වෘත්තිකයින් ඇතුළත් කර ගැනීම සහ ඔවුන් ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සැලසීම මඟින් තථ්‍ය දේපළ වෘත්තියේ ප්‍රමිතීන්, වෘත්තීයභාවය' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, as amended, ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය)
வாசகம் 4.- (நிறுவகத்தின் தத்துவங்களும் கடமைகளும் பணிகளும்)
CLAUSE 4.- *(Powers, duties and functions of the Institute)*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "5 වන පිටුවේ, 16 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:
>
> '(ආ) ආයතනයේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම;' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, as amended, ordered to stand part of the Bill.*

***5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5 ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ආයතනයේ සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීම)
வாசகம் 6.- (நிறுவகத்தின் உறுப்பாண்மைக்கான விண்ணப்பம்)
CLAUSE 6.- *(Application for membership of the Institute)*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "8 වන පිටුවේ, 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> 'සාමාජිකයකු ලෙස ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම කරනු ලැබිය හැකි ය.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***6 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 6, as amended, ordered to stand part of the Bill.*

***7 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*7ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 7 ordered to stand part of the Bill.*

## 8 වන වගන්තිය.- (සාමාජිකයකු වීමට නුසුදුසුකම්, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම, විනය පිළිබඳ බලතල සහ කාර්යපටිපාටිය)
வாசகம் 8.- (உறுப்பினராக இருப்பதற்கான தகைமையீனங்கள், நிரலிலிருந்து அகற்றுதல், ஒழுக்காற்று தத்துவங்களும் நடைமுறைகளும்)
CLAUSE 8.- *(Disqualifications to be a member, disenrollment, disciplinary powers and procedure)*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

> (1) "9 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> 'වන්නේ නම්, ඒ තැනැත්තා සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට සහ ඒ තැනැත්තාගේ ලියාපදිංචිය අවලංගු කිරීමට' "
>
> (2) "9 වන පිටුවේ, 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> 'එසේ වුව ද, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම වෙනුවට, සභාව' "
>
> (3) "9 වන පිටුවේ, 22 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> 'එසේ ම තවදුරටත්, ඒ තැනැත්තා නැවත සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීමට සහ නැවත

ලියාපදිංචි කිරීමට සුදුසු බවට සභාව විසින් සෑහීමට පත්වන්නේ නම්, ඒ තැනැත්තා සාමාජිකත්වයෙන් ඉවත් කිරීමේ සහ ලියාපදිංචිය අවලංගු කිරීමේ හේතු මඟින්, ඔහුව සභාව විසින් පසුව නැවත සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සහ නැවත ලියාපදිංචි කිරීම වළකුවනු නොලැබිය යුතු ය.' "

(4) "10 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවීම' "

(5) "10 වන පිටුවේ, 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(4) මේ වගන්තිය යටතේ සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබ සහ ලියාපදිංචිය අවලංගු කරනු ලැබ' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 8, as amended, ordered to stand part of the Bill.*

***9 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*9ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 9 ordered to stand part of the Bill.*

## 10 වන වගන්තිය.- (සාමාජිකයන්ගේ රෙජිස්ටරය)
### வாசகம் 10.- (உறுப்பினர்கள் இடாப்பு)
CLAUSE 10.- *(Register of members)*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"12 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සම්බන්ධයෙන් විය යුතු අතර, ඒ ඒ ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා ලද සහ ලියාපදිංචි කරන ලද' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 10, as amended, ordered to stand part of the Bill.*

***11 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*11ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 11 ordered to stand part of the Bill.*

## 12 වන වගන්තිය.- (සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය)
### வாசகம் 12.- (பேரவையின் உறுப்பினர்களின் பதவிக்காலம்)
CLAUSE 12.- *(Term of office of the members of the Council)*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"14 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ සාමාජිකත්වය අත්හිටුවීම මත,' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***12 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*12ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 12, as amended, ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (සභාවේ රැස්වීම්)
### வாசகம் 13.- (பேரவையின் கூட்டங்கள்)
CLAUSE 13.- *(Meetings of the Council)*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"15 වන පිටුවේ, 19 වන පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මිස, සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සහ ලියාපදිංචිය අවලංගු කිරීම හෝ ඒ සාමාජිකයාගේ' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*13ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 13, as amended, ordered to stand part of the Bill.*

***14 සිට 31 තෙක් වගන්ති, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*14ஆம் வாசகத்திலிருந்து 31ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 14 to 31 ordered to stand part of the Bill.*

## උපලේඛනය
## அட்டவணை
## SCHEDULE

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "30 වන පිටුවේ, 'යටතේ ඇතුළත් කරගත් සංස්ථාගත සාමාජිකයකුගේ' යන වචන ඉවත් කර ඒ වෙනුවට 'යටතේ ඇතුළත් කරගත් සහ ලියාපදිංචි කරන ලද සංස්ථාගත සාමාජිකයකුගේ' යන වචන ආදේශ කරන්න."

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***උපලේඛනය, සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*அட்டவணை திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Schedule, as amended, ordered to stand part of the Bill.*

***පූර්විකාව, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*முன்னுரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Preamble ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சட்டமாகு வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Enacting Clause ordered to stand part of the Bill.*

## දීර්ඝ නාමය
## விரிவுப் பெயர்
## LONG TITLE

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "1 වන පිටුවේ, 'ආයතනය පිහිටුවීම සඳහා ද;' යන වචන ඉවත් කර ඒ වෙනුවට 'ආයතනය පිහිටුවීම සඳහා ද; ආයතනයේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද' යන වචන ආදේශ කරන්න."

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*விரிவுப் பெயர் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Long Title, as amended, ordered to stand part of the Bill.*

***නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*தலைப்பு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Title ordered to stand part of the Bill.*

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*
*Bill reported with Amendments.*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත
## கொள்கல நிலையத் தொழிற்படுத்துநர்களுக்கு உரிமமளித்தல் சட்டமூலம்
## LICENSING OF CONTAINER DEPOT OPERATORS BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***'පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු බිමල් රත්නායක මහතා]***
*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு பிமல் ரத்நாயக்க]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Bimal Rathnayake.]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 19 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 19ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 19 ordered to stand part of the Bill.*

## 20 වන වගන්තිය.- (අර්ථ නිරූපණය)
வாசகம் 20.- (பொருள்கோடல்)
CLAUSE 20.- (*Interpretation*)

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

> "13 වන පිටුවේ, 17 වන පේළියේ සිට 20 වන පේළිය දක්වා වන පේළි (එම පේළි දෙක ද ඇතුළුව) ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:
>
> 'යන්නෙන්, 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 2 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ද නිශ්චිත වරායක් ඇතුළත වූ කන්ටේනර් පර්යන්තයක් හැර, ශ්‍රී ලංකාව තුළ කන්ටේනර් පර්යන්ත, කන්ටේනර් ඩිපෝ සහ කන්ටේනර් නැව් බඩු තබා ඇති ස්ථාන මෙහෙයවීමේ ව්‍යාපාරවල යෙදී සිටින' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***20 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*20ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 20, as amended, ordered to stand part of the Bill.*

***21 වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*21ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 21 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

# නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## கப்பற்றொழில் முகவர்களுக்கு, சரக்கு அனுப்புநர்க்கு, கலன் செயற்படுத்தப்படாப் பொதுக் காவுநர்க்கு மற்றும் கொள்கலம் செயற்படுத்துநர்க்கு உரிமமளித்தல் (திருத்தம்) சட்டமூலம்
## LICENSING OF SHIPPING AGENTS, FREIGHT FORWARDERS, NON-VESSEL OPERATING COMMON CARRIERS AND CONTAINER OPERATORS (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

[ගරු බිමල් රත්නායක මහතා]

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු බිමල් රත්නායක මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு பிமல் ரத்நாயக்க]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Bimal Rathnayake.]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

***1 සිට 6 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*1ஆம் வாசகத்திலிருந்து 6ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 1 to 6 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, accordingly read the Third time, and passed.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න.

පළමුවැනි ප්‍රශ්නය, ගරු දයාසිරි ජයසේකර මහතා.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ, අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් මම මේ ප්‍රශ්නය අහනවා. මම හිතන විධියට, අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා.

1. අද වනවිට ලංකාවේ සිටින රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද?
2. වත්මන් රජය යටතේ උපාධිධාරීන් කොපමණ ප්‍රමාණයකට රැකියා ලබා දී තිබේද?
3. ලබා දුන් රැකියා, ක්ෂේත්‍ර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද?
4. සංවර්ධන නිලධාරි සේවයේ නියුතු සේවකයින් කොපමණ ප්‍රමාණයක් ගුරුවරුන් ලෙස කටයුතු කරන්නේද?
5. සංවර්ධන නිලධාරීන් අතරින් වත්මන් රජය යටතේ කොපමණ ප්‍රමාණයක් ස්ථිර ගුරු සේවයට බඳවා ගෙන තිබේද?
6. ගුරු සේවයට බඳවා ගෙන නොමැති, නමුත් ගුරුවරුන් ලෙස වැඩ ආවරණය කරන සංවර්ධන නිලධාරීන් ගුරු සේවයට බඳවා ගැනීමට කටයුතු කරන්නේද?
7. බඳවා ගන්නා දිනය කවදාද?
8. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 72, "රැකියා විරහිත උපාධිධාරීන් විධිමත් ක්‍රමවේදයක් යටතේ කඩිනමින් රැකියා ලබා දීම" යන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නේ කවදාද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙහිදී කාරණා කීපයක් මතු කරන්න කැමතියි. විශේෂයෙන්ම ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ බොහොම පැහැදිලිව සඳහන් වෙලා තිබුණා, 35,000කට රැකියා ලබා දීම ඉතා ඉක්මනින් සිදු කරනවාය කියලා. ඒක ඉතා වැදගත් යෝජනාවක් විධියට ඔවුන් ඉදිරිපත් කරලා තිබුණා. ඒක, එක එක විධියට categorize කරලා තිබුණා. හැබැයි, මේ රජය බලයට පත් වෙලා අවුරුද්දකුත් මාස ගණනක් ගත වුණාට පසුව ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, විභාග ලියලා එන්න කියලා. එතැනින් පස්සේ ඒ අය විශාල වශයෙන් බලාපොරොත්තු සුන් වුණු තත්ත්වයට පත් වුණා. අද වනකොට ඇති වෙලා තිබෙන තත්ත්වය මේකයි. ගුරු සංවර්ධන නිලධාරින් 16,000කට ආසන්න සංඛ්‍යාවක් මම දන්නා විධියට පාසල්වල සේවය කරනවා. ඔවුන් දිගටම උද්ඝෝෂණ ක්‍රියාවලියක නිරත වුණා. ඒ වාගේම ඔවුන් මාරාන්තික උපවාසයකත් නිරත වුණා. එතැනින් පස්සේ ජනාධිපතිතුමා ගිය අඟහරුවාදා ඒ අයව ගෙන්වලා සාකච්ඡා කරලා, විභාගය ලියලා ඒ අයට මේ වැඩ පිළිවෙළට සම්බන්ධ වෙන්න අවස්ථාව දෙනවා කියලා කිව්වා. ඒ වාගේම කිසිම වෙලාවක ඔවුන් පාසල්වලින් ඉවත් කරලා වෙනත් තැන්වලට දාන්නේ නැහැ කියන පොරොන්දුවත් වුණා. එතුමා ඒ සාකච්ඡාව දෙන්නේ 03වැනි දා. හැබැයි, ආණ්ඩුව 2026.02.02 දින ගැසට් පත්‍රයක් ගහනවා. ඒ ගැසට් එක ඒ අයත් එක්ක සාකච්ඡා කරපු එකක් නොවෙයි. ඒක ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වන විභාගය පැවැත්වීම සම්බන්ධව ගහපු ගැසට් එක. 2025.06.30 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි කියලායි මේකේ තිබෙන්නේ. හැබැයි, 2026.02.02 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ තමයි මේක දාන්නේ. ගැසට් එක ගහන්නේ 02වැනි දා. සාකච්ඡාව දෙන්නේ 03වැනි දා. ඇත්තටම රවට්ටලා තිබෙන්නේ කවුද කියන එක තමයි පළමුවෙන් අහන්න තිබෙන්නේ.

දෙවන කාරණය මෙයයි. මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. දැන් සාකච්ඡාව අවසන් නිසා කරුණාකරලා ඒ අයට ඉල්ලුම්පත්‍ර දාන්න ඉඩ දෙන්න, ගැසට් එක ගහපු දිනයට. මොකද, 2025.06.30 දිනට පසුව උපාධිධාරින් විශාල සංඛ්‍යාවක් convocation එක ඉවර වෙලා මෙතැනට ඇවිල්ලා තිබෙනවා. ඒ අයට විශාල අසාධාරණයක් සිදු වෙනවා. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, ඒ ගැන නැවත සලකා බලලා කරුණාකරලා ඒ සම්බන්ධව විසඳුමක් දෙන්න කියලා. ඒ වාගේම විශේෂයෙන්ම පෙර ගැසට්වල තිබෙන අඩුපාඩු මේකට ඇතුළත් කරලා නැහැ. Sociology ඇතුළත් කරලා නැහැ; Archaeology, ඉතිහාසය ඇතුළත් කරලා නැහැ. මේ වාගේ ගණනාවක් මේකට ඇතුළත් කරලා නැහැ. ඒක නිසා මේක ඔවුන්ට කරන විශාල අසාධාරණයක් විධියට මම දකිනවා. කොවිඩ්වලට අහුවුණු ළමයි මේ ඉන්නේ. පාසල් නතර වුණු අය ඉන්නේ. කොවිඩ් නිසා අවුරුදු එකහමාරක්, දෙකක් පාසල් වහලා තිබුණා.

අනෙක් පැත්තෙන්, 2022දී ඔවුන්ට විශාල අර්බුදයක් ආවා. ඒ අර්බුදයටත් ඔවුන් අහුවුණා. ඒ වාගේ විශාල ප්‍රශ්න ගණනාවකට ඔවුන් මුහුණ දුන්නා. ඒක නිසා කරුණාකරලා ඒ අයට සහනයක් දෙන්න කටයුතු කරන්න. එතකොට සියලු දෙනාම මේකට අයිති වෙනවා. ගැටලුවක් නැහැ. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, කරුණාකරලා 2025.06.30 කියන දිනය 2026.02.02 කියන දිනට ඇතුළත් කරලා සංශෝධනයක් කරලා ගැසට් එක ගහන්න කියලා. එතකොට ගැටලුවක් නැහැ. එතකොට හැම කෙනෙකුටම ඒකට ලියන්න පුළුවන්. එතැනින් පස්සේ අවශ්‍ය කරන දෙය කරන්න පුළුවන්.

අනෙක් කාරණය මෙයයි. පිරිසක් අධ්‍යාපන සේවා විභාගය ලියලා ඉන්නවා. මම පළාත් සභාවේ මහ ඇමතිවරයා විධියට වැඩ කළ කාලයේ අධ්‍යාපන සේවා විභාගයට සුදුසුකම් ලබලා ඒක පාස් කරන අය අනිවාර්යයෙන් පළාත් සභා පාසල්වලට ඇතුළත් කර ගත්තා. නමුත්, මේ වනතුරුත් තවම අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් සභාවලට ඒ සම්බන්ධව ලිපියක් නිකුත් කරලා නැහැ. 500ක් විතර ඉන්නවා. ඒ අය ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය ඉස්සරහට ඇවිල්ලා උද්ඝෝෂණයක් කළා. මම ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ ලිපිය යවන්න කියලා. මොකද, දැන් විශ්‍රාම ගිය අයගේ පුරප්පාඩු තිබෙනවා. පොඩි ගණනක් තිබෙන්නේ. ඒ අය වෙනුවට ඔවුන්ව බඳවා ගන්න පුළුවන්. සාමාන්‍යයෙන් ඉස්සර කරන්නේ අධ්‍යාපන සේවා එකෙන් ඉවත් වෙලා ආපු ගමන් ඒ අය බඳවා ගන්න එකයි. මොකද, ගුරු පුරප්පාඩු තිබෙන නිසා. විශ්‍රාම ගිය විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඒකට පොඩි ගණනක් තිබෙන්නේ. ලංකාවේම ඉන්නේ 500ක් විතර. ඒක කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් තව ඉතිරි 50,000ක විතර ප්‍රමාණයක් ඉන්නවා. සංවර්ධන නිලධාරින් විධියට ගන්නේ නැතුව, අනෙක් තනතුරුවලටත් ගන්නේ නැතුව 50,000ක් විතර උපාධිධාරින් පිරිසක් එළියේ ඉන්නවා. ඒ අය විශාල බලාපොරොත්තුවක, අවුලක ඉන්නවා, මේකට ඉදිරිපත් වෙලා ලියන්න පුළුවන් වුණත්, ඒ සඳහා බඳවා ගන්න පුළුවන් වෙන්නේ ඉතා කුඩා සංඛ්‍යාවක් නිසා. මේ ක්‍රියාදාමය තුළ, මේකට අයිති වෙන්නේ නැති තවත් 25,000කට වැඩි ප්‍රමාණයක් ඉතුරු වෙනවා. ඔබතුමන්ලා දාලා තිබෙන අග්‍රාමාත්‍යතුමියගේ කමිටුවෙන් අනුමත කරලා තිබෙන බඳවා ගැනීම්වලට උපාධිධාරින්ට එන්න පුළුවන්කම තිබුණාට, ඒවා ගොඩක් technical subjectsවලට අදාළව තිබෙන්නේ. කලා උපාධිය සහ අනෙකුත් උපාධි ගත් අයට මේකට ඇතුළත් වෙන්න පුළුවන් තත්ත්වයක් නැහැ.

මම ඉල්ලා සිටිනවා කරුණාකර ආණ්ඩුව විධියට මේකට මැදිහත් වෙන්න කියලා. මොකද, අද උදේ අපේ බිමල් රත්නායක මැතිතුමා කිව්වා, අපට ඒගොල්ලන් එන්න කියලා අපිව ඕනෑ නැහැ කියලා විශාල අවුලක් කළා කියලා. ඒ සංවර්ධන නිලධාරින් නැවත ප්‍රකාශයකුත් නිකුත් කරලා තිබුණා. මම එම CD තැටිය මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රියාදාමය තුළ අපට දේශපාලන වාසි ගන්න වුවමනාවක් තිබුණේ නැහැ. දේශපාලන වාසි අරගෙන මේ අයව පාරට දැක්කුවේ ඔබතුමන්ලා.

ඒ අය බොහොම පැහැදිලිව පෙන්වා දෙනවා, වසන්ත සමරසිංහ ඇමතිතුමා, ලාල් කාන්ත ඇමතිතුමා, චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු ගණනාවක් ඒ අයව අරගෙන දිස්ත්‍රික්ක හැම එකකටම ගිහිල්ලා පාරට දැක්කුවා කියලා. මේ රටේ හැම දෙයක්ම ඇති වුණාම, මොකක් හරි හොඳ දෙයක් කරන්න හැදුවාම මේ රටේ මිනිස්සු පාරට බැස්සුවේ අපි නොවෙයි. ඒ දේශපාලනය අපි කළේ නැහැ. අපි දේශපාලන වාසිවලට සංවර්ධන නිලධාරින් හෝ උපාධිධාරින් පාරට දැම්මේ නැහැ. අපි බොහොම අවංකව කියන්න කැමැතියි, මෙතැනදීත් අපට දේශපාලන වාසියක් ගන්න කිසිම වුවමනාවක් නැහැ කියලා. අපි අවංකව විශ්වාස කරනවා, ඔබතුමන්ලා රවට්ටපු අය වෙනුවෙන් දැන්වත් ඔබතුමන්ලාගේ පැත්තෙන් දෙයක් සිද්ධ වෙන්නේ නැත්නම්, විපක්ෂයේ අය විධියට අපි පාරට බැහැලා ඉන්න ඒ මිනිස්සුන්ට යම්කිසි විධියකින් සහයෝගයක් දෙන්න ඕනෑ කියලා. මොකද හේතුව, ඔවුන්ගේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ නිසා. ඔවුන්ව දේශපාලන පක්ෂවලට බඳවා ගන්න හෝ ඔවුන්ව අරගෙන දේශපාලනය කරන්න හෝ ඔවුන්ව ඉස්සරහට දාගෙන

***  පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

පෙළපාළි ගිහිල්ලා ආණ්ඩුව අපහසුතාවට පත් කරන්න අපට වුවමනා නැහැ. ඔබතුමන්ලා කරපු වැරැද්දේ ප්‍රතිඵලය තමයි දැන් ඉස්සරහට ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අවසාන වශයෙන් මම ඉල්ලනවා, කරුණාකරලා මේ සම්බන්ධව නිවැරැදි තීරණයක්, නැත්නම් නිවැරදි තීන්දුවක් දෙන්න කියලා. මොකද, ලබන සිකුරාදා වෙනකොටත් -හෙට වෙනකොටත්- උපාධිධාරින් අතිවිශාල ප්‍රමාණයක් පාරට එන තැනට තල්ලු වෙලා තිබෙනවා කියන එකත් මම මතක් කරනවා. ඔබතුමා මේ සම්බන්ධව දෙන පිළිතුර මොකක්ද කියලා බලලා, මම තව පොඩි ප්‍රශ්න කීපයක් අහන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් මම ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා.

1. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි මූලාශ්‍ර විධියට අපි ගන්නේ ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය 2025. දත්ත මත පදනම්ව, ඇස්තමේන්තුගත රැකියා විරහිත උපාධිධාරින් 50,786ක් පමණ සංඛ්‍යාවක් ඉන්නවා.

2. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා සහ කොමිෂන් සභාවල පවතින පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කිරීමට අදාළව එකී ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්, රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුව හරහා විධිමත් සමාලෝචනයකින් අනතුරුව එම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට යොමු කිරීම සිදු කරනු ලැබේ. 2026.02.05 දින වන විට මෙම කමිටුව විසින් රාජ්‍ය සේවයේ පුරප්පාඩු 105,367ක් සම්පූර්ණ කිරීමට අදාළ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර, ඒ සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අතරින් උපාධිධාරි තනතුරු පුරප්පාඩු 38,571ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2025.10.15 දිනට - එදින වන විට - උපාධිධාරින් 5,250ක් පමණ බඳවා ගෙන ඇත. අනෙකුත් උපාධිධාරින් බඳවා ගැනීමේ කටයුතු මේ වන විට අදාළ ආයතන විසින් සිදු කරමින් පවතියි.

   මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදාළ ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කරමින්,-

3. අමාත්‍ය මණ්ඩලය විසින් 2026.01.12 දින දක්වා බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දුන් උපාධිධාරි තනතුරු ප්‍රමාණය 38,571කි.

   ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව මේ සම්බන්ධයෙන් නිශ්චිත සංඛ්‍යාව තිබෙනවා. විවිධාකාර අමාත්‍යාංශ තිබෙන නිසා එම සංඛ්‍යාලේඛන සියල්ල ඇමුණුම 01 ලෙස මා **සභාගත*** කරනවා.

4. අපි මේ සම්බන්ධයෙන් සමාලෝචනයක් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

   දිවයිනේ පාසල්වල සේවය සඳහා සංවර්ධන නිලධාරින් අනුයුක්ත කර ඇති අතර, ඉන් යම් යම් නිලධාරින් යම් යම් අවස්ථාවලදී ඉගැන්වීම් කාර්යය සඳහා යොදවා ගෙන ඇති බවට වාර්තා වී ඇත.

   ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා සංඛ්‍යාත්මකව දෙන දත්ත අපට නිශ්චිතව දෙන්න වෙනවා. ඉගැනුම් කාර්යයට යෙදවෙන සංඛ්‍යාව සම්බන්ධයෙන් අපට නිශ්චිත සංඛ්‍යාවක් දෙන්න අමාරුයි. ඒ සඳහා යම් යම් අවස්ථාවලදී ඔවුන්ව යොදා ගෙන තිබෙනවා.

5. 2021 වර්ෂයේ සිට අවස්ථා කිහිපයකදී විවෘත තරග විභාග මඟින් ජාතික සහ පළාත් පාසල් සඳහා අයදුම් කර තරග විභාග මඟින් තේරී පත් වී ගුරු පත්වීම් ලබා දී ඇති අවස්ථා පැවතියද, එලෙස ගුරු පත්වීම් ලද ප්‍රමාණය පිළිබඳ තොරතුරු හඳුනා ගැනීමෙන් පසුව ලබා දිය හැක.

   සමහර අවස්ථාවලදී සංවර්ධන නිලධාරින් මේ විවෘත තරග විභාගවලට මුහුණ දීලා තිබෙනවා. නිශ්චිත සංඛ්‍යාව අපට එක්වරම ලබා ගන්න බැහැ. මම මෙතැනදී සඳහන් කරන්න ඕනෑ, 2021, 2023 සහ 2024 අවුරුදුවල තමයි එම තරග විභාගවලට මුහුණ දීලා තිබෙන්නේ කියන කාරණය. එම නිසා සංවර්ධන නිලධාරින් යම් කිසි ප්‍රමාණයක් මේ පද්ධතිය තුළට එකතු වෙලා තිබෙනවා.

6. මෙය නිරන්තරයෙන් සාකච්ඡා වුණු කාරණයක්. අද දිනයේත් සාකච්ඡා වුණා. ඒ නිසා මම ඉක්මනින් පිළිතුර කියවන්නම්.

   දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරින් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීමේ තරග විභාගය අත්හිටුවමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලදී. එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක 77/2023 හා 88/2023 දරන නඩු 2025.08.06 දිනැතිව නිෂ්ප්‍රභ කරන ලද අතර, අංක 78/2023 හා 95/2023 දරන නඩු අනුව අංක 2317 හා 2023.01.27 දිනැති ගැසට් නිවේදනය අනුව විභාගය සඳහා අයදුම් පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්කරුවන්ගේ උපරිම වයස අවුරුදු 40 යන්න වයස අවුරුදු 45 දක්වා මෙම අවස්ථාවට පමණක් සීමා වන පරිදි දීර්ඝ කිරීමට නියම කර ඇත.

   ඒ අනුව එම ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අවසන් වුවද, ඒ වන විට අභියාචනාධිකරණයේ පවතින CA 92/2023 (Writ) නඩුවේ අවසන් තීරණයක් ලබා දී නොමැති වූ බැවින්, විභාගය පැවැත්වීමට මේ දක්වා නොහැකි වී තිබුණි. ඒ අනුව උක්ත ශ්‍රේෂ්ඨාධිකරණ නඩු මඟින් ලබා දෙන ලද උපරිම වයස සංශෝධනය කිරීමේ නියෝගය පරිදි ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යටතේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරින් බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සපුරනු ලබන අය බඳවා ගැනීමට කටයුතු කිරීම පිණිස පාසල්වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරින්ද ඇතුළුව, "රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරින් හා සෙසු උපාධිධාරින් ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම" මැයෙන් අමාත්‍ය මණ්ඩල සන්දේශයක් 2025.10.08 දිනැතිව ඉදිරිපත් කර ඇත. ඒ සඳහා 2025.10.26 දිනැති අමාත්‍ය මණ්ඩල

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තීරණය ලැබී ඇති අතර, එම තීරණය සම්බන්ධව නැවත අභියාචනාධිකරණය වෙත කරුණු වාර්තා කළ පසු එම අභියාචනාධිකරණ නඩුව ද 2025.11.20 දින අවසන් කර ඇත.

ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති නඩු තීන්දුව ප්‍රකාරව රජයේ සේවයේ නියුතු උපාධිධාරීන් හා රාජ්‍ය සේවයේ නියුතු නොවන අනෙකුත් උපාධිධාරීන් සඳහා බඳවා ගැනීමේ වයස් සීමාව සංශෝධනය කරමින් වෙන වෙනම විභාගය පවත්වා ගුරු සේවයේ පවතින පුරප්පාඩු සඳහා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීමට කටයුතු සිදු කර ඇත. ඒ අනුව අංක 2474/18 හා 2026.02.02 දිනැති - ඔබතුමා සඳහන් කළ දිනයත් එයමයි - අතිවිශේෂ ගැසට් නිවේදනය සහ අංක 2474/19 හා 2026.02.02 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සුදුසුකම්ලාභී උපාධිධාරීන් වෙතින් තරග විභාගය සඳහා අයදුම් පත් කැඳවා ඇත. බඳවා ගැනීමේ වයස අවුරුදු 45 දක්වා වැඩි කර තිබේ.

7. අංක 2474/18 හා 2026.02.02 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය සහ අංක 2474/19 හා 2026.02.02 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් සුදුසුකම්ලාභී උපාධිධාරීන් වෙතින් තරග විභාගය සඳහා අයදුම් පත් කැඳවා ඇති අතර, 2026 වර්ෂය අවසන් වීමට පෙර සුදුසුකම්ලාභීන් බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

එතැනදී අපි තරග විභාගය මේ මාසය අවසන් වීමට පෙර පැවැත්වීමට කටයුතු කරනවා. ඒ අනුව මාර්තු මාසය අවසානයේ බඳවා ගැනීමේ කටයුතුත් කරනවා.

8. එය ක්‍රියාත්මක කරමින් පවතී. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණ කමිටුව මඟින් රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ව්‍යවස්ථාපිත ආයතන සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ. ඒ අනුව තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමේදී බඳවා ගැනීම් පටිපාටි, සේවා ව්‍යවස්ථා ප්‍රකාරව උපාධිය මූලික සුදුසුකමක් වන තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබයි. 2025.10.15 දිනට උපාධිධාරීන් 5,250ක් පමණ බඳවාගෙන ඇති අතර, මෙතෙක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ලබා දී ඇති උපාධිධාරී තනතුරු 38,571ක් අතුරින් ගුරු සේවය සඳහා උපාධිධාරීන් 23,344ක් කඩිනමින් බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අදාළ ආයතන විසින් මේ වන විට ගනු ලබනවා.

ඔබතුමා සඳහන් කළ තවත් කාරණා කිහිපයක් සම්බන්ධයෙන් මම පිළිතුරු ලබා දෙන්නම්.

පළමුවැනි කාරණය තමයි, convocation එක අවසන් වී පැමිණි අයට යම් කිසි අසාධාරණයක් වීම සම්බන්ධයෙන් ඔබතුමා සඳහන් කළා. ගුරු මන්ත්‍රීතුමනි, මේ දිනය නිශ්චිත කරගන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව මත. ඒ නිසා නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසා තමයි දිනය වෙනස් කිරීම සම්බන්ධයෙන් අපි කටයුතු කළ යුතු වන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව මත තමයි මේ දිනය නිශ්චිත කරලා තිබෙන්නේ. විශේෂයෙන් කැලණිය විශ්වවිද්‍යාලයෙන් සහ තවත් විශ්වවිද්‍යාල කිහිපයකින් මේ සම්බන්ධයෙන් අපට කරුණු ඉදිරිපත් වුණා. අපි මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසීමක් කරමින් පවතිනවා.

ඊළඟ කාරණාව මේකයි. ඔබතුමා අධ්‍යාපන සේවා කියලා අදහස් කරන්න ඇත්තේ BEd වෙන්න ඕනෑ. මම හිතන විධියට ඒක අධ්‍යාපනවේදී විය යුතුයි. එතැනදි අධ්‍යාපනවේදී උපාධිය සම්බන්ධයෙන් අපට කරුණු කිහිපයක් පැන නැඟුණා, මූලාසනාරූඪ ගුරු මන්ත්‍රීතුමනි. පෞද්ගලික විශ්වවිද්‍යාල මඟිනුත් මේ සම්බන්ධයෙන් උපාධිය ලබා දීමක් සිද්ධ කෙරෙනවා. ඒ නිසා මෙය නිසි ප්‍රමිතිගත කිරීමකට යටත් කරන්න අපට අවශ්‍ය වුණා. උපාධි ලබා දෙන පෞද්ගලික ආයතන සම්බන්ධව ප්‍රමිතිගත කිරීමක්, නිරීක්ෂණය කිරීමක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් කරනවා. උපාධි ලබා දෙන එවැනි පෞද්ගලික ආයතන අටක් පමණ දැන් අපි හඳුනාගෙන තිබෙනවා. රාජ්‍ය විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල හරහා උපාධිධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අපි කරුණු ඉදිරිපත් කර අවසන්. ඒ අනුව ඉතාම ඉක්මනින් ඒ බඳවා ගැනීමේ කටයුතු කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට අපි බලාපොරොත්තු වනවා.

එතකොට අනෙකුත් උපාධි සඳහා, ඔබතුමා සඳහන් කරපු archaeology හෝ වෙනයම් හෝ උපාධි සඳහා මෙන්න මෙහෙම අවස්ථාවක් තිබෙනවා. පළමු උපාධියේ තුනෙන් එකක් credits සම්පූර්ණ වෙනවා නම්, ඔවුන්ට ඒ විෂය සම්බන්ධයෙන් ඉල්ලීමක් කළ හැකියි. සමහර විට එය පුරාවිද්‍යාව වෙන්න පුළුවන්. ඒ අනුව ඔවුන්ට ඒ අවස්ථාව හිමි වෙනවා. කෙසේ වෙතත්, කරන ඉල්ලීම් සම්බන්ධයෙන් අපි සැලකිලිමත් වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තත්පර 30ක් ලබා දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම වැඩිය වෙලාව ගන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම සම්බන්ධව මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. අර නඩුව පවරන්න මහන්සි වුණු අය තමයි අපි. මමත්, ෆයිසර් මුස්තාපා මැතිතුමාත් තමයි ඉදිරිපත් වුණේ, අවුරුදු 45 දක්වා මේ වයස් සීමාව වැඩිකර ගන්න. පසුගිය ආණ්ඩුව කාලයේ තමයි අපි ඔය නඩුව දැම්මේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එතැනදී මේ ගැසට් එක නිකුත් කරන දින පිළිබඳව අපි සාකච්ඡා කළේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධව යම් තීරණයක් ගන්න කියලා.

අනෙක් කාරණය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, archaeology සහ sociology උපාධිධාරීන් බොහොම අඩු සංඛ්‍යාවක් ඉන්නේ. ඒ නිසා අලුතින් ගැසට් එකක් නිකුත් කරනවා නම් ඒ අයවත් ඒකට ඇතුළත් කරගන්න පුළුවන් නම් එතැනින් පස්සේ ඒ අයගේ ප්‍රශ්නයත් ඉවර වනවා. නැත්නම් categorize කරපු ගමන් ආයෙත් ප්‍රශ්නයක් ඇති වනවා. ඒකයි මම කියන්නේ.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
අපි ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ දෙවැනි ප්‍රශ්නය, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මම පහත ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

පළාත් සභා විසුරුවා හැර මේ වන විට සෑහෙන කාලයක් ගතවී ඇතත්, ඒ ඒ පළාත් සභාවන්හි සභාපතිවරු ලෙස පත් වී සිටින මහජන නියෝජිතයන් වෙනුවෙන් රජයේ මුදල් විශාල වශයෙන් වැය වන බව සමාජයේ නිතර කථා බහට ලක්වේ. මේ සම්බන්ධයෙන් පහත ප්‍රශ්න ඔබ වෙත යොමු කරමි.

01. එක් එක් පළාත් සභාවේ නිල කාලය අවසන් වූ දිනය කවදාද?

02. පළාත් සභාවක නිල කාලය අවසන් වුවත්, ඒ ඒ පළාත් සභාව සඳහා පත් වන සභාපතිවරයා ඒ පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව ද රැඳී සිටින්නේ නම් ඒ කවර පදනමින්ද?

03. එක් එක් පළාත් සභාවක සභාපතිවරයා වෙනුවෙන් පසුගිය වසර පහ තුළ වියදම් කර ඇති මුදල, පළාත් සභාව, වර්ෂය සහ කාරණය අනුව වෙන් වෙන් වශයෙන් දක්වන්න.

04. පළාත් සභාව විසුරුවා හැර ඇති අවස්ථාවක සභාපතිවරයාගේ කාර්යභාරය කුමක්ද?

05. දැනට එවැනි සභාපතිවරු නොමැති පළාත් සභා පවතින්නේද? පවතින්නේ නම් ඊට බලපා ඇති හේතු කවරේද?

06. එවැනි පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට සභාපතිවරයෙකු නොමැතිවීම හේතුවෙන් යම් බලපෑමක් වී තිබේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය මතුකරන්න හේතු වුණු ප්‍රධාන කාරණා ගණනාවක් තිබෙනවා. මොකද, පළාත් සභා ක්‍රියාත්මක වෙනවා නම් ඒ පළාත් සභා තුළ ප්‍රධානම කෙනා හැටියට වාගේම ගෞරවයක් සහිත කෙනා හැටියට තමයි පළාත් සභාවේ සභාපතිවරයා කටයුතු කරන්නේ. ඔහු දැන් සැබවුණු අමුත්තෙක් බවට පත් වෙලා තිබෙනවා. පළාත් සභා විසුරුවා හැරියා කිව්වොත් වැරදියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට, පළාත් සභාවල සිද්ධ වෙන්නේ නියමිත දිනයට පළාත් සභා විසුරුවා හැරෙන එකයි. නමුත්, පළාත් සභාවක සභාපතිවරයා ඉන්නවා. ඔහුට ගෙවන්න තිබෙන වැටුප්, දීමනා, අවශ්‍ය පහසුකම්, කාර්ය මණ්ඩලය ඇතුළු හැම දෙයක්ම තිබෙනවා. පුද්ගලයෙක් ඉන්නවා. නමුත්, ඒ පුද්ගලයා පෙනෙන්න නැහැ. ඒක තමයි මම කිව්වේ පළාත් සභාවක සභාපතිවරයා සැබවුණු අමුත්තෙකු බවට පත් වෙලා තිබෙනවා කියලා. මේක එතුමාටත් කරන අගෞරවයක්.

ඇත්තටම පාර්ලිමේන්තුවේ කථානායකතුමාට තිබෙනවා නේ, විශාල ගෞරවයක්. මේ උත්තරීතර යැයි කියන පාර්ලිමේන්තුවට නායකත්වය දෙන්නේ එතුමා නේ. එතකොට ඉන්න පුද්ගලයා කවුද කියන එක නොවෙයි ප්‍රශ්නය. අපි ඒ තනතුරට ඒ විධියට සලකනවා නම් එතුමාට ගෞරවයක් තිබෙනවා. එතුමාට වැඩ කොටසක් පැවරී තිබෙනවා. අද උදේ වුණත් මේ පාර්ලිමේන්තුවේදී ගරු කථානායකතුමාට කරපු අපහාස බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කාටද මේ අපහාස කරන්නේ? එතුමන්ලාම තමයි කියන්නේ "මේ උත්තරීතර පාර්ලිමේන්තුව" කියලා. ඒ, ඒ නිලතලවල ඉන්න අය සම්බන්ධව මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් අනුගමනය කරන්න ඕනෑ යම් විධි ක්‍රමයක් තිබෙනවා. මෙතැනට ඇවිල්ලා ගල්වලින් ගහනවා වාගේ පහර ගහන එක නොවෙයි කරන්න තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)

ඒකත් ප්‍රශ්නයක් තමයි. මම ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ ප්‍රශ්නයත් එක්ක පූර්විකාවක් ඉදිරිපත් කරන්නත් මට කාලයක් ලබා දෙනවා. පළාත් සභාවක වුණත් දැනට සභාපති කෙනෙක් ඉන්නවා නම් මේක ඒ මනුස්සයාට කරන අගෞරවයක්. ඒ වාගේම, එතුමා කාගේත් සමච්චලයට භාජන වෙලා තිබෙනවා. හරියට නිකම් කකා බිබී, දේවල් භුක්ති විඳිනවා වාගේ එකක් කියලා තිබෙනවා නේ. ඒ නිසා මේකට මොකක් හරි පියවරක් ගත යුතුයි. අපි දන්නවා, පළාත් සභාව ක්‍රියාත්මක නොවන්න හේතු තිබෙනවා කියලා. එක්කෝ පෙර වැරදි; පෙර තිබුණු තත්ත්වයන් වෙන්න පුළුවන්. ඇත්තටම නීතියක් නැහැ; මැතිවරණ නීතියක් නැහැ, පළාත් සභාවට. පළාත් සභාවක සභාපති කියන්නේ, විශාල මුදලක් ගෙවන, කිසි වැඩක් කරන්නේ නැති, කිසිම ක්‍රියාකාරිත්වයක් නැති කාමරයක ඉන්න පුද්ගලයෙක් කියලා මේ සමාජය තුළ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට, එතුමා හැම දාම එන්නේත් නැහැ. කලාතුරකින් තමයි එතුමා, එතුමාගේ කාමරයට හරි එන්නේ. නමුත්, කිසිම වැඩක් කරන්නේ නැතුව ඔහු වෙනුවෙන් මේ රටේ ජනතාවගේ විශාල මුදල් කන්දරාවක් වියදම් කරනවා. එම නිසා මේකට මොකක් හරි උත්තරයක් තිබෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. අදාළ විෂයභාර ඇමතිවරයාගෙන් මම මේ ප්‍රශ්නයට පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01.

| පළාත | නිල කාලය අවසන් වූ දිනය |
|---|---|
| උතුරු පළාත | 2018.10.24 |
| දකුණු පළාත | 2019.04.09 |
| නැගෙනහිර පළාත | 2017.09.30 |
| මධ්‍යම පළාත | 2018.10.08 |
| වයඹ පළාත | 2018.10.10 |
| උතුරුමැද පළාත | 2017.10.01 |
| සබරගමුව පළාත | 2017.09.26 |
| බස්නාහිර පළාත | 2019.04.21 |
| ඌව පළාත | 2019.10.08 |

මේ විධියට මේ පළාත් සභාවල නිල කාල අවසන් වුණු දින සඳහන් කරන්න පුළුවන්.

02. 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 7වන වගන්තිය අනුව පළාත් සභා විසුරුවා හරිනු ලබන කවර අවස්ථාවක වුවද එසේ විසුරුවා හැරීමෙන් පසුව පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීම වන තෙක් පළාත් සභාවේ ගරු සභාපතිවරයා සිය ධුරය හිස් නොකර පවත්වාගෙන යා යුතු බැවින් පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුවද සභාපතිවරයා ධුරයේ රැඳී සිටිය යුතුය. ඒ අනුව තමයි මේ සභාපතිවරු තමන්ගේ ධුරයේ රැඳී සිටින්නේ.

03. ඇමුණුම මඟින් දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කර තිබෙනවා. එම ඇමුණුම මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

නමුත්, මම එහි මූලික කාරණා ටිකක් පමණක් මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

බස්නාහිර පළාත් සභාව තුළ වැටුප්, අතිකාල දීමනා, ඉන්ධන, දුරකථන සහ වෙනත් කියන කාරණා සඳහා 2021 වර්ෂයේදී රුපියල් මිලියන 9.17කුත්, 2022 වර්ෂයේදී රුපියල් මිලියන 11.97කුත්, 2023 වර්ෂයේදී රුපියල් මිලියන 6.11කුත්, 2024 වර්ෂයේදී රුපියල් මිලියන 6.51කුත්, 2025 වර්ෂයේදී රුපියල් මිලියන 6.28කුත් වියදම් කර තිබෙනවා. ඒ අනුව, 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වියදම් කර ඇති මුළු මුදල රුපියල් මිලියන 40.06ක් වශයෙන් දක්වන්න පුළුවන්.

ඊළඟට, දකුණු පළාත් සභාව තුළත් ඒ ආකාරයටම වැටුප්, අතිකාල දීමනා, ඉන්ධන, දුරකථන සහ වෙනත් දීමනා යටතේ ගත්තාම, 2021 වර්ෂයේදී වැටුප් සඳහා රුපියල් මිලියන 3.15ක්, අතිකාල දීමනා සඳහා රුපියල් මිලියන 0.3ක්, ඉන්ධන සඳහා රුපියල් මිලියන 2.63ක්, දුරකථන සඳහා රුපියල් මිලියන 0.14ක්, වෙනත් දීමනා සඳහා රුපියල් මිලියන 4.17ක් වශයෙන් වියදම් කර තිබෙනවා. ඒ අනුව රුපියල් මිලියන 10.41ක් 2021 වර්ෂයේදී සමස්ත වියදම විධියට දක්වන්න පුළුවන්. දකුණු පළාත් සභාව තුළ 2022 වර්ෂයේදී සමස්ත වියදම විධියට රුපියල් මිලියන 13.14ක්, 2023 වර්ෂයේදී රුපියල් මිලියන 6.30ක්, 2024 වර්ෂයේදී රුපියල් මිලියන 6.69ක්, 2025 වර්ෂයේදී රුපියල් මිලියන 12.48ක් වියදම් කර තිබෙනවා. ඒ අනුව එම අවුරුදු 5 සඳහා දරා තිබෙන සමස්ත වියදම රුපියල් මිලියන 49.04ක් වෙනවා.

මධ්‍යම පළාත් සභාව තුළ 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 11.62ක්, 2022 වර්ෂය සඳහා රුපියල් මිලියන 8.28ක්, 2023 වර්ෂය සඳහා රුපියල් මිලියන 6.32ක්, 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 6.76ක්, 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 7.45ක් වශයෙන් එම අවුරුදු 5ට රුපියල් මිලියන 40.45ක වියදමක් සිදු කර තිබෙනවා.

ඊළඟට, ඌව පළාත් සභාව තුළ 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 9.30ක්, 2022 වර්ෂය සඳහා රුපියල් මිලියන 9.37ක්, 2023 වර්ෂය සඳහා රුපියල් මිලියන 8.19ක්, 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 7.73ක්, 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 7.29ක් වශයෙන් වියදම් කර තිබෙනවා. ඒ අනුව එම අවුරුදු 5 තුළ සිදු කර ඇති සමස්ත වියදම රුපියල් මිලියන 41.90ක් වෙනවා.

උතුරු මැද පළාත් සභාව සඳහා කිසිම වියදමක් වෙලා නැහැ, සභාපතිවරයා අභාවප්‍රාප්ත වී ඇති නිසා.

ඊළඟට, උතුරු පළාත් සභාව තුළ 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 5.21කුත්, 2022 වර්ෂය සඳහා රුපියල් මිලියන 4.90කුත්, 2023 වර්ෂය සඳහා රුපියල් මිලියන 3.69කුත්, 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 4.35කුත්, 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 3.40කුත් වියදම් කර තිබෙනවා. ඒ අනුව එම පළාත් සභාව තුළ 2021 වසරේ සිට 2025 දක්වා සමස්ත වියදම රුපියල් මිලියන 21.57ක් වෙනවා.

ඊළඟට, නැඟෙනහිර පළාත් සභාව තුළ 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 10.93කුත්, 2022 වර්ෂය සඳහා රුපියල් මිලියන 16.78කුත්, 2023 වර්ෂය සඳහා රුපියල් මිලියන 7.42කුත්, 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 8.63කුත්, 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 6.87කුත් වියදම් කර තිබෙනවා. ඒ අනුව සමස්ත වියදම රුපියල් මිලියන 50.64යි.

ඊළඟට, වයඹ පළාත් සභාව තුළ 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 11.73කුත්, 2022 වර්ෂය සඳහා රුපියල් මිලියන 12.32කුත්, 2023 වර්ෂය රුපියල් මිලියන 7.26කුත්, 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 9.13කුත්, 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 8.04කුත් වියදම් කර තිබෙනවා. ඒ අනුව අවුරුදු 5ට සමස්ත වියදම රුපියල් මිලියන 48.50ක් වෙනවා.

ඊළඟට, සබරගමුව පළාත් සභාව තුළ 2021 වර්ෂය සඳහා රුපියල් මිලියන 9.32කුත්, 2022 වර්ෂය සඳහා රුපියල් මිලියන 12.34කුත්, 2023 වර්ෂය සඳහා රුපියල් මිලියන 6.07කුත්, 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 6.60කුත්, 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 6.38කුත් වියදම් කර තිබෙනවා. ඒ අනුව එම වර්ෂ 5ට සබරගමුව පළාත් සභාව තුළ සිදු කර තිබෙන සමස්ත වියදම රුපියල් මිලියන 40.73යි. පළාත් සභා නවයෙන් උතුරු මැද පළාත් සභාව හැර අනෙක් පළාත් සභා අට පසුගිය වර්ෂ පහ සඳහා වැටුප්, අතිකාල දීමනා, ඉන්ධන, දුරකථන සහ වෙනත් වියදම් සඳහා රුපියල් මිලියන 332.935ක් වියදම් කරලා තිබෙනවා.

04. පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව පැවැත්වෙන නව පළාත් සභාවේ ප්‍රථම රැස්වීම වන තෙක්, පළාත් සභාවේ ගරු සභාපතිවරයා සිය ධුරය හිස් නොකර පවත්වාගෙන යා යුතු බව පළාත් සභා පනතේ සඳහන් වන නිසා රැඳී සිටිනවා. නමුත් නිශ්චිත කාර්යභාරයක් සඳහන් වෙන්නේ නැහැ.

05. ඊළඟට, උතුරු මැද පළාත් සභාව. එහි සභාපතිවරයෙක් නොමැති වීමට හේතුව, කලින් සඳහන් කළ ආකාරයට සභාපතිවරයා මිය යෑම. ඒ හේතුවෙන් තමයි උතුරු මැද පළාත් සභාවේ සභාපතිවරයෙක් දැනට නැත්තේ.

06. මේ වනවිට එහෙම කිසිම ගැටලුවක් නැහැ. ආණ්ඩුකාරතුමා සහ එතුමාගේ කාර්ය මණ්ඩලය ඒ සියලු කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.01ට, 2026 පෙබරවාරි 06වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.01க்கு, பாராளுமன்றம் 2026 பெப்ருவரி 06, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.01 p.m. until 9.30 a.m. on Friday, 06th February, 2026.*

---

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.